IV කොටස—අධ්‍යාපන, විද්‍යා සහ කලා (B)

1962-63 වර්ෂය පිළිබඳ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ පාලන වාර්තාව

වී. ටී. හේරත් ගුණරත්න

1965 ජූලි

PART IV—EDUCATION, SCIENCE AND ART (B)

Administration Report of the Director of Health Services for 1962-63

V. T. Herath Guneratne

July, 1965

ලංකාවේ වාලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්"හි නිපදවන ලද කඩදාසිවල ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි
කොළඹ මහ ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි තැ. පෙ. අංක 500 දරන රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල *Price*: 10/60 තැපැල් ගාස්තුව *Postage*: -/75

කෙටුම්පත් ලැබුණ දිනය " *Copy* " *received*	*1964. 7. 28*
ඉද්ධි පත්‍ර යැවූ දිනය *Proof sent*	*1964. 9. 18*
ඉද්ධි පත්‍ර ලැබුණු දිනය *Proof returned*	*1965. 6. 19*
ප්‍රසිද්ධ කළ දිනය *Published*	*1965. 7. 23*

පටුන

සටහන් ලේඛනය

ජීවිත සංඛ්‍යා ලේඛන

වෛද්‍යාරක්ෂාව

වසංගත රෝග

ක්ෂය රෝගය මර්දනය

මැලේරියා මර්දනය

බරවා රෝගය

ලාදුරු රෝගය

රති රෝග මර්දනය

පාරිසරික සෞඛ්‍යය

ප්‍රස්ථාර සටහන්, සිතියම් සහ උප ග්‍රන්ථ ලේඛනය

1962-63 වර්ෂය පිළිබඳ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ පාලන වාර්තාව

හැඳින්වීම

භාණ්ඩාගාරය් නියෝගය අනුව, 1962 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1963 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙ වැඩ කටයුතු මෙම වාර්තාවේ අඩංගු කර ඇත. සීඝ්‍ර ලෙසත් කාර්යක්ෂම ලෙසත් බෙහෙත් ද්‍රව්‍ය බෙදා හැරීමේ අඩුලුහුඬුකම්, මුහුණ පෑමට සිදුවූ ඇතැම් ගැටළුවලින් සමහරකි. බොහෝ අවස්ථාවල දී බෙහෙත් ද්‍රව්‍ය සැපයීමට පොරොන්දුවූ කොන්ත්‍රාත්කරුවෝ නියමිත දිනට එම බෙහෙත් ද්‍රව්‍ය නොසැපයීමෙන් තම පොරොන්දුව කඩ කළහ. මේ අයුරින් පොරොන්දු කඩ කිරීමෙන් සිදු වූයේ රජයේ බෙහෙත් බඩු ගබඩාවේ තැන්පත් බෙහෙත් ද්‍රව්‍ය තොගය පවා අඩුවීමයි. රජයේ වැඩ දෙපාර්තමේන්තුව සහ රජයේ විදුලිය දෙපාර්තමේන්තුව මගින් කෙරුන වැඩවල සීඝ්‍රතාව මත ගොඩනැගිලි වැඩ වල ප්‍රගතිය බොහෝ සෙයින් රඳා පැවතුනි. මෙ වැනි ගැටළු විසඳීමට එකී දෙපාර්ත-මේන්තු දරන ප්‍රයත්න මහෝපකාරිවන බැව් මෙහිලා සඳහන් කළ යුත්තක් නොවේ.

වැය

පසුගිය වර්ෂය තුළ දී වැය කරන ලද මුදලට රුපියල් 40,00,000ක් වැඩි වූ රුපියල් කෝටි 14.69ක මුදලක් 1962/63 මුදල් වර්ෂය තුළ දී දිවයිනේ සෞඛ්‍ය සේවාවන් සඳහා වැය කරන ලදි. වර්ෂය තුළදී ලැබුණු ආදායම රුපියල් 20,90,435ක් වූ අතර, එම මුදල පසුගිය වර්ෂයේ දී ලැබුණු මුදලවූ රුපියල් 26,30,859ට තරමක් අඩුවිය. දොළොස් අයුරකින් ලැබුණු ආධාර මුදල රු. 77,87,914ක් විය.

ජීවිත සංඛ්‍යා

1961 වර්ෂයේ දී දක්නට ලැබුණු සංඛ්‍යාවට වඩා 2.7%කින් වැඩි වූ 1962 මධ්‍ය වාර්ෂික ජනගහණය 1,04,42,000ක් විය. එ තෙකුදුවුවත්, 1963 ජූලි මාසයේ දී ජනගහණය ගණන් බැලීමේදී 1,06,44,809ක ජනගහණයක් දක්නට ලැබිණ. උපත් අනුපාතය 1,000කට 35.5 දක්වා පහත බැස ඇති අතර, 1961 වර්ෂයේ දී ජනගහන යෙන් 1,000කට 8ක් වූ මරණ අනුපාතය 1962 වර්ෂයේ දී ජනගහණයෙන් 1,000 කට 8.5ක් වීමෙන් මරණ අනුපාතයේ වැඩි බවක් දැක්විය. වර්ෂය තුළ දී සජීව උපත් වලින් 1,000කට බිළිඳු මරණ 53ක් වීමෙන් එහි අනුපාතය නො වෙනස් ව තිබිණ. මෙම වාර්තාව සකස් කරගෙන යන විට මාතෘ මරණ සංඛ්‍යාව ලබා ගෙන නො තිබිණ.

රෝගීන් රැක බලාගැනීම

වර්ෂය තුළ දී ප්‍රතිකාර කළ අභ්‍යන්තර රෝගීන්ගේ සංඛ්‍යාව මේ වනතුරු වාර්තා කරන ලද වැඩිම සංඛ්‍යාව ලෙස සැලකිය හැක. පසුගිය වර්ෂය තුළ දී වෛද්‍ය ආයතන වලට ඇතුල් කරන ලද රෝගීන් 16,60,939ක් වූ සංඛ්‍යාව සමග සසඳා බලන කල මේ වර්ෂය තුළ දී රෝගීන් 10,67,414 දෙනෙක් ඇතුල් කරන ලදී.

මෙම වර්ෂය තුළ දී නා නා ආයතනවලින් පළමුවැනි වරට බාහිර ප්‍රතිකාර ලත් රෝගීන් ගේ සංඛ්‍යාව 2,62,66,701ක් වීමෙන් 2,62,49,901ක් වූ පසුගිය වර්ෂයේ සංඛ්‍යාවට සුළු වශයෙන් වැඩිවිය.

පසුගිය වර්ෂය තුළ දී, ඇඳන් සංඛ්‍යාව 32,735ක් වූ අතර මෙම මුදල් වර්ෂයේ අවසානය වන විට ඇඳන් 33,636 තිබුණි. ලංකාවේ ජනගහණයෙන් 1,000 කට ඇඳන් 3.3ක් වූ මෙම අනුපාතය ලංකාවේ ජනගහණයේ සෞඛ්‍යය නහා සිටුවීමට මෙම ප්‍රමාණය ප්‍රමාණවත් නොවේ.

දිවයිනේ පසුගිය වර්ෂයේ 781ක් වූ වෛද්‍ය ආයතන සංඛ්‍යාව මෙම වර්ෂයේ දී 793ක් දක්වා වැඩිවිය. මේවා අතුරින් 689ක් නා නා රෝග සුව කිරීමේ ආයතන විය. රෝහල්වල තදබදය තවමත් පැවතෙමින් තිබෙන ප්‍රධාන ගැටළුවකි. ප්‍රාදේශීය රෝහල්වල සාමාන්‍ය තදබදය සියයට 119ක් විය. මෙය, 1962/63 වර්ෂය තුළ දී තිබූ 121% ට වඩා සතුටුදායක බැව් කිව හැකිය. කොළඹ රෝහල් මණ්ඩලයට අයත් මහ රෝහලේ සහ ද සොයිසා මාතෘ නිවාසයේ තදබදය 118%ක් දක්වා විය. තදබදය 106% පමණ වූ ප්‍රාදේශීය රෝහල්වල මෙම ප්‍රශ්නය බොහෝ සෙයින් සතුටුදායක විය. එ තෙකුදු වුවත්, ඇඳන් ප්‍රමාණය 1,749ක් ව තිබූ අංගොඩ මානසික රෝහලේ තදබදය 273%ක් විය. ක්ෂය රෝග සහ ලාදුරු මර්දන ආයතනවල තදබදයක් තිබූ බවක් සඳහන් නො වී ය.

විශාල රෝහල්වලට වැඩි වැඩියෙන් විශේෂිත සේවා ලබා දීම දියුණුවෙමින් පැව තින. ප්‍රසව විද්‍යාව හා ස්ත්‍රී චිකිත්සාව, කන්වල රෝග, නාසයේ හා කණ්ඨයේ රෝග, සාමාන්‍ය ශල්‍ය කර්මය සහ ක්ෂය රෝගය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා, වර්ෂය තුළ දී අව දෙනෙක් දිවයිනට පෙරළා පැමිණියහ. එම වර්ෂයේ දී වැඩිදුරට විශේෂඥ තාවක් ලබාගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 21 දෙනෙක් පිටරට යැවින.

දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද ඖෂධ කමිටුව නොකඩවා රැස්වෙමින් වර්ෂය තුළ දී රැස්වීම් 20 ක් පැවැත්විය. සිරිත් පරිදි කෙරෙන වැඩවලට අතිරේක වශයෙන්, ගරු මුදල් ඇමති තුමාගේ අයදුම පිට ලංකාවට බෙහෙත් ද්‍රව්‍ය ගෙන්වීමට අදාළ උපදෙස් ආනයන කොමසාරිස් වෙත දීමේ කර්තව්‍ය බාර ගන්නා ලදි. මෙම කමිටුව මගින් කෙරෙන වැඩ වල වැදගත්කම නිසා ගරු සෞඛ්‍ය ඇමතිතුමා මෙම කමිටුවේ සාමාජිකත්වය කෙතරම් දුරට වැඩි කළ හැකි දැයි යන්න ගැන සලකා බලා ගෙන යනු ලැබේ.

වෛද්‍ය කටයුතු සඳහා අවශ්‍ය සැපයීම්

වැලිසර ගොඩනැගීමට තිබෙන නව රජයේ බෙහෙත් ගබඩාවට අයත් ගොඩනැගිලි වල සැලැස්ම හා අවශ්‍ය ඇස්තමේන්තු පිළියෙල කිරීම දැනට රජයේ වැඩ දෙපාර්ත-මේන්තුව මගින් අවසාන කර ඇත. අවශ්‍ය මුදල් ප්‍රමාණය වෙන් කර ඇත. දැනට පවත්නා බෙහෙත් බඩු ගබඩා කිරීමේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම පිණිස නව ගොඩනැගිල්ලට අයත් ගබඩා අංශය කලින් ඉදිකිරීමට බලාපොරොත්තුවේ. ඒ අතර වාරයේ ම රජයේ බෙහෙත් බඩු ගබඩාවේ තැන්පත් බෙහෙත් ද්‍රව්‍ය තොගයක් තබා ගැනීමට කටයුතු සලස්වා ඇත.

ප්‍රසිද්ධියේ විකුණන වස විස අඩංගු බෙහෙත් ද්‍රව්‍ය විකිණීමෙන් මහජනයාට මුහුණ පෑමට සිදුවන අනතුරු වැලැක්වීමේ අටියෙන්, වස විස, අබින් හා අනතුරුදායක බෙහෙත් ද්‍රව්‍ය විකිණීමේ අඥපනතේ රෙගුලාසි කොතෙක් දුරට පිළිපදින්නේ දැයි සොයා බලමින් දෙපාර්මේන්තුව මගින් බෙහෙත් ද්‍රව්‍ය විකුණන සාප්පුවල සමීක්ෂණ යක් පවත්වා ගෙන යනු ලැබේ.

වර්ෂය තුළ දී නව ආයතනයකට උපකරණ ලබාගැනීම පිණිස රුපියල් 20,00,000ක රුපියල් 10,00,000ක මුදලක් ණය ලකුණු කිරීමට වෙන්කර ඇත. නව ආයතන 120ට උපකරණ සැපයීමටත් දැනට පවත්නා ආයතනයට වැඩිපුර කොටස් ඇදීමටත් නව සේවා සඳහාත් මුදල් යොදවා ඇත.

මෑතදී වැඩකටයුතු ප්‍රමාණය අධික වූ විද්‍යුත්—වෛද්‍ය ඉංජිනේරු අංශයට වැඩියෙන් ඉඩකඩ සලසා දෙන ලදි. විද්‍යුත්—වෛද්‍ය උපකරණ පිහිටුවීම, අළුත් වැඩියා කිරීම, නඩත්තු කිරීම සහ පිරිසිදු කිරීම මෙම අංශය මගින් කෙරින. නියමයෙන් ම, ක්‍රියා විරහිතවූ උපකරණ 2,683ක් ම යථා තත්ත්වයට ගෙනෙන ලදි. මේවායින් 1850ක් පිටපළාත්වලිනි. ඉතා ඉක්මණින් තම වැඩකටයුතු කිරීමට හැකිවන ලෙස මෙම අංශයේ ප්‍රයෝජනය සඳහා වාහන 8ක් ම තබා තිබුණි.

ජන සෞඛ්‍ය කටයුතු

පාසල් යාමේ වයසට නොපැමිණි ළමුන් අතර මරණ ප්‍රමාණය වෙනත් වයස් සීමාවලට වඩා වැඩියෙන් තවමත් පවතී. මෙම ප්‍රශ්නයේ තත්ත්වය ගැන සොයා බැලීම පිණිස පානදුර සෞඛ්‍ය ප්‍රදේශයේ සමීක්ෂණයක් පවත්වන ලදි. ලංකා මහජන සෞඛ්‍ය සංගමය රැස්වී මේ ගැන සාකච්ඡා කොට, මෙම මරණ ප්‍රමාණය අඩු කිරීමේ ක්‍රම දක්වමින් අවශ්‍ය නිර්දේශ ගරු සෞඛ්‍ය ඇමතිතුමාට දක්වන ලෙස උපකාරක කමිටුවක් පත්කරන ලදි. පාසල් යන ළමුන් අතර ඇති වැඩි මන්ද පෝෂණය මගහැරවීමත් සෞඛ්‍ය අධ්‍යාපන කටයුතුවලට පෝෂණය සම්බන්ධව වැඩ ඇතුලත් කිරීමත් මෙම කමිටුව නිර්දේශ කරන ලදි.

රජයේ රෝහල්වලදී ලැබෙන විශේෂිත ප්‍රතිකාරය සහ හෙදකම ගැන සලකා මේ වර්ෂය තුළ දී මහජනයා වැඩි වැඩියෙන් ප්‍රසූති සඳහා රජයේ රෝහල්වලට ඇතුල්වීමට දැඩි කැමැත්තක් දැක්වූහ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ක්ෂේත්‍ර විත්තඹු මාතාවන් 1961 වර්ෂයේ දී ආධාර කරන ලද ප්‍රසූති ප්‍රමාණය 56,354ක් වූ නමුත් 1962/63 වර්ෂයේ දී ප්‍රසූත 53,745 දක්වා අඩු විය.

පාසල් සෞඛ්‍ය වැඩ කටයුතු පිළිවෙලින් විශාල රෝහල්වල ළමා රෝග විද්‍යාඥ, පාසල් වෛද්‍ය නිලධාරීන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ ඇපොතිකරිවරුන් විසින් සතුටුදායක අන්දමින් ඉටු කරන ලද මුත් වැඩට ලබාගත හැකි වූ නිලධාරීන්ගේ ගණන ප්‍රමාණවත් නොවිය. පාසල් සනීපාරක්ෂාව, පාසල් සෞඛ්‍ය වැඩ පිළිවෙළේ ප්‍රධාන තම අංගය විය. තවද, මේ වර්ෂය තුළ දී ගුරු දෙගුරු සංගම් මේ සඳහා දැක්වූ සැලකිල්ල ගැන ඉතාමත් සතුටු විය යුතු යි.

මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, ළමා රෝග විශේෂඥයින් හා ප්‍රසව විද්‍යාඥයින් විසින් ද පර්යන්තික රෝහල්වල කායික භාර වෛද්‍ය නිලධාරීන් විසින් ද ඉටුකරන ලදී.

වසංගත රෝග

1962දී හටගත් බාලක පක්ෂඝාත රෝගය 1962/63 වර්ෂය මුලදී එහි අන්තිම හටගැනීම දැක්විය. මේ වර්ෂය තුළ දී 293 දෙනකුට රෝගය වැළඳින. මුඛය මාර්ග යෙන් ගන්නා සේබින් වයිරස් වර්ගයේ එන්නත් බෙහෙත් දීමෙන් විශාල ප්‍රතිශක්ති කරණ ව්‍යාපාර දෙකක්ම සාර්ථක ලෙස පැවැත්විණ. 1963 ඔක්තෝබර් අවසානයේ දී මෙම රෝගය බිඳ හෙලන ලදී.

මෙම ව්‍යාපාරයට උපදෙස් දීම සඳහා කැඳවූ වෛද්‍යාචාර්ය සේබින් මහතා, මාස 3 සිට අවුරුදු 8 දක්වා ළමුන් සියල්ලට සීමාකර තිබූ මේ විශාල ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙලට උපකාරී වූයේ ය.

පසුගිය වර්ෂයේ දී මෙන් මෙම වර්ෂයේ දී උණසන්නිපාත රෝගය වැළඳීම ගැන වාර්තා නොවින.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ පාවන රෝග පිළිබඳ සමීක්ෂණ කමිටුව විසින් පවත් වන ලද සමීක්ෂණයක් අවසාන කිරීමේ දී සොයා ගෙන තිබුණේ පාසල් යන වයසට නොඑළඹුන (අවුරුදු 1—5 දක්වා) ළමුන් අතර සිදුවන මරණ සියල්ලෙන්

24%ක් ම ආන්ත්‍රික රෝගවලින් සිදුවන බවත් රෝහල්වලට ඇතුළුවන රෝගීන් ගෙන් 20%ක් පාචන රෝගවලින් පෙළෙන බවත් ය. තවද ආන්ත්‍රික රෝග වැළ දෙන සීමාවෙන් 3/4කට ගැස්ට්‍රොඑන්ටරයිටිස් ඇති බවත් පෙනින.

ක්ෂය රෝග මර්දනය

පුද්ගලයින්ට ක්ෂය රෝගය බෝවීමට ඉඩකඩ තිබෙනතාක් කල් ක්ෂය රෝගය ප්‍රධාන මහජන සෞඛ්‍ය ගැටලුවක් ලෙස පවතිනු ඇත. 1956 දී ජ. සෞ. සං. සමීක්ෂණ කණ්ඩායම සොයා ගත් පරිදි සියයට 1 වන රෝග පවතින බැගිනුවක් තිබිය දී සහ අවුරුදු පතා රෝගීන් සොයා ගැනීම ජනගහණයෙන් 10,000කටත් 8ක් වනසේ තිබිය දී, ක්ෂය රෝගය බෝවීමෙන් රට නිදහස් යැයි කියා හැකි නොවේ.

ක්ෂය රෝගය මර්දනය කිරීමේ ව්‍යාපාරයට වඩාම අවශ්‍ය ප්‍රධාන වුවමනාව නම්, රෝග මර්දන විධි-විධාන තර කිරීමත් ඒවා දිවයිනේ සියලු මැ පෙදෙස් තුළ විහිදුවා හැරීමත් යැ. රෝග මර්දන වැඩ පිළිවෙලට මෙ තෙක් කරන ලද සියලු දේ කුමක් වුවත්, රෝගය පැතිර යාමට අනුබල දෙන සමාජ ආර්ථික තත්ත්වය එලෙස මැ පව තිද්දී, සමූහ කුඩා විකිරණ රූප යන්ත්‍ර සහ රෝගීන් බලා කියා ගැනීමේ සේවක පිරිස සීමා වී තිබීම නිසා රෝගීන් සොයා ගැනම්, බලා-කියා ගැන්ම සහ පුනරුත්ථාපනය වැනි ඇතැම් අංශවලින් මෙම වැඩ පිළිවෙල තවමත් සැහෙන තරම් ශක්තිමත් වී නැත.

එකී බාධක අවහිර කෙසේ වෙතත්, මේ වර්ෂය තුළැ දී රෝගයට විරුද්ධ වැ සැලකිය යුතු අඩි කිහිපයක් ඉදිරියට තබා ඇත. එනම්:—(I) හැකි ඉක්මනින් අනෙකුත් රෝහල්වලටත් විහිදුවීමට යන, අලුත උපදින බිළිඳුන් "බීසීජී" යෙන් එන්නත් කිරීමේ පිළිවෙලක් කොළඹැ ගැහැණු රෝහල්වලැ ඇරඹීම, (II) රජයේ ගුරු අභ්‍යාස පාසැල්හි උගන්නා සියලු මැ ගුරු සිසු-සිසුවියන් විකිරණ රූ (එක්ස්රේ) සෝදිසියට ලක් කිරීම සහ සැම, තුන් වසරකට වරක් සියළු මැ ගුරුවර-ගුරුවරි යන්ගේ විකිරණ සේයා රූ ගැනීමේ වැඩ පිළිවෙලක් සැකසීම, (III) පෙර-පාසල් වයසේ ළමුන්ට අයි. එන්. ඒ. එච්. වලින් දුන් ප්‍රතිකාරවල ප්‍රතිඵල මැනීම සඳහා පාදුක්ක සෞඛ්‍ය පේරුවේ රසායනික-රෝග හරන අරමුණක් ඇති කිරීම සහ (IV) ඔහ රෝහල්වලට ඇතුළත් කොටැ ඇති සියලු රෝගීන් සිරිත් පරිදි විකිරණ සේයා රූවට නැඟීම කෙතෙක් දුරට පිළිවන් දැයි නිගමනය කිරීමේ සමීක්ෂණයක් යෙදීම.

ව්‍යාපාරයේ අධිකාරි වෙත ලැබුණු ක්ෂය රෝග සැලකුරු 9,339කින් සියයට 6.8ක් ආයේ ළය විකිත්සාගාරවලින් සහ ශාඛා විකිත්සාගාරවලින් යැ. මෙයින් 1,015 ක් පරණ රෝගීන් ගැන යැ. එ සේ හෙයින් මධ්‍යම ලේඛනයට ඇතුළත් වූ අලුත් රෝගීන් ගණන 8,528ක් වේ. වර්ෂය අවසානයේ දී ලේඛනයේ සිටි මුළු රෝගීන් ගණන 48,242කි. පෞද්ගලික අංශයෙන් ලැබුණේ සැලකුරු 86 ක් පමණක් බව සැලකීම වැදගත් යැ.

රෝගයට ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් පැන නැගි අපහසුවක් වෙයි. රෝගීන් කිහිප දෙනෙකු රෝහල්හි නැවතීමට කැමැති නොවීමත් තවත් කොටසක් වෛද්‍ය උපදේශ නො තකා රෝහලෙන් නික්ම යාමත් වේ. ඒ අපහසු ඇවිදිල්ල බොහෝ විටැ නිෂ්ඵල වී ඇත. බලෙන් රෝහල්වල නවතා ගැනීමට නීතියෙන් ඉඩ සැලසී නැති හෙයින් දැනට මේ ගැන කළ හැකි දෙයක් නැති.

මැලේරියා මර්දනය

රෝගය පැතිර යාම වැළැක්වීමට ගිය අවුරුද්දේ මුදුන් පත් කර ගන්නා ලද අවහිරය තව දුරටත් බල ගන්වන ලදුයෙන් මැලේරියා මුලිනුපුටා දමන අඩිය වර්ෂය අවසානයේ දී නුදුරින් මැ පෙනෙන්නට වී යැ.

සැබැවින් මෑ මෙ රට මැලේරියා රෝගීන් 6 දෙනෙක් පමණකි සිටියේ. පිට රටින් ආ රෝගීන් නම් දස දෙනෙක් හසු වූහ. ඔවුනතුරෙන් 9 දෙනෙක් මාලදිවයිනේ සිටැ පැමිණි අය වූ අතර ඉතුරු අය මෙ රටැ ඔස්සේ ගමන් කරන මගින් වූහ. මුළු රෝගීන් ගණන 16කි. ගිය අවුරුද්දේ මුළු ගණන 31ක් වීමෙන් මේ අවුරුද්දේ ගණන කෙතරම් පහළ බැස ඇත්දැයි මොනවට පෙනේ.

මෙරටැ රෝගීන් සදෙනාගෙන් සිව් දෙනෙක් නැවත රෝගාතුර වූ අයයි. එක් අයෙ කුට රෝගය බෝවී ඇත්තේ ලේ ගනු-දෙනුවකින් බව පෙනෙන අතර, අනෙක් තැනැත්තාට කෙසේ රෝගය වැළඳුනේ දැයි නියතයෙන් කියැ නො හැකි ය.

මෙරටැ මැලේරියා මුලිනුපුටා දැමීමේ දැනට පවතින සාමාන්‍ය තත්ත්වය මෙසේ වෙයි. ජනගහණයෙන් සියයට 49 වසන පෙදෙස "නඩත්තු තලයේ" වෙති. බැහැ රින් එන (පිට රටින් හෝ දිවයිනේ අනෙකුත් පෙදෙසින් හෝ) රෝගීන් ගැන සෝදිසියෙන් සිටීම එහි දී පැවැත්වේ. ජනතාවගේ සියයට 20ක් වෙසෙනුයේ (සෝදිසියෙන් සිටීමේ විධිවිධාන සලසනු ලැබ, කලින් වසංගත පෙදෙස් ලෙස සැලකූ) ඒකාබද්ධ තලයේ යැ. ඉතිරි සියයට 31ක වෙසෙනුයේ, ඒකාබද්ධ තලයේ පෙදෙසකට වැටෙනු ඇතැයි සිතෙන 1964 අප්‍රේල් වන විටැ ජනයා වෙසෙන ගේ-දොරවලින් සැතැපුම් බාගයක් ඇතුලත පිහිටි සියලු වන ලැහැබවල බෙහෙත් ඉසීම සම්පූර්ණ යෙන් මැ නවතා දැමීමට යන, කලින් රෝගය මුල් බැස ගෙනැ තිබූ පෙදෙසේ යැ.

ඒකාබද්ධ තලයට තව තවත් පෙදෙස් ඇතුළු වන විටැ, සැනෙකින් රෝගීන් හසු කර ගැනීම උදෙසා සෝදිසියෙන් සිටීමේ වැඩ කටයුතු විහිදුවා බලගන්වා ඇත.

මැලේරියාවෙන් සිදුවූ එක් මරණයක් ගැන දැන ගන්නට ලැබුණි. මාලදිවයිනේ දී බෝවීම ලත් මෙම රෝගියා මෙ රටැ පැමිණීමෙන් පසු දරුණු ලෙස රෝගාතුර වූ බවත්, ප්‍රතිකාර දීමට මත්තෙන් මරු වැළඳ ගත් බවත් කරුණු විමසා බැලීමේ දී පෙනී ගියේ යැ.

මෙහි සෝදිසියෙන් සිටීමේ කටයුතු ගැන සාක්ෂි සලකා බලන කල, ලංකාව වැනි රටෙක, නිරායාසයෙන් රෝගීන් හසු කර ගැන්මට සහ ලේ සමීක්ෂණවලින් පණ ගැන්වුණ සාර්ථක වසංගත විද්‍යා විමර්ශන මෙහෙයවීමට මනාව සංවිධානය වූ පහසු කම්වලින් ඒකාබද්ධ තලයේ අරමුණ සැහෙන තරම් මුදුන්පත් වියැ යුතු යැ.

බරවා මර්දනය

බරවා මර්දන පෙරමුණේ ප්‍රධාන අංග වූයේ, 1963 මැයි 1 වන දා අරඹන ලද රෝග මැඩ පැවැත්වීමේ විධිවිධාන තර කිරීමේ වැඩ පිළිවෙල යි.

අලුතෙන් පෙදෙස් පහකට රෝග මැඩ පැවැත්වීමේ විධිවිධාන විහිදුවන ලදී. එම පෙදෙස් නම්, ගාලු මහ නගර සභා පෙදෙස, ජාඇල නගර සභා පෙදෙස, කොළඹ වරාය පෙදෙස, අලුත්ගම සහ ධර්ගා පුර සුළු නගර සභා පෙදෙස් වෙයි. පිළිවුන් මැඩීමේ වැඩ පිළිවෙල දැනට මැඩ පැවැත්වීමේ විධිවිධාන පවතින සියලු මෑ පෙදෙස් වලින් සැතපුම් බාගයක් දුරට විහිදුවන ලදී.

ආවේනික වූ තීරුවෙන් පිටතටත් රෝගය පැතිර යා දැයි සැක හැර දැනැගනු පිණිස, රසායනාගාර පහසුකම් ඇති සියලු රෝහල්වලට ඇතුළත් වූ රෝගීන් සියලු දෙනා මැ කීට විද්‍යා විමර්ශනවලට භාජනය කරවන ලදී. එසේ පරීක්ෂා කරන ලද ලේ නහඩු, 1,35,000කට වැඩි ගණනෙකින් ව. බැන්ක්‍රොප්ටයි හසු වූයේ 21 දෙනෙකු ගෙනි. එහෙත් මීට හසු වූ රෝගීන් සියලු දෙනා මැ රෝගය මුල් බැසගත් තීරුවේ විසූ බව තහවුරු කරන ලදි. බරවා රෝගය දිවයිනේ අනෙකුත් පෙදෙස්වලට පැතිර යන බවට ලකුණු දැනට නොමැති වීම සොම්නසට හේතු වෙයි.

කිට විද්‍යාව අතින් සැලකිය යුතු තවත් විමර්ශනයක් වූයේ, සී. පැටිගන් මදුරු වන්ගේ පියාසර මානය නිගමනය කිරීම අරබයා ගෙන ගිය තතු හදාරුවකි. විකිරණ සමස්ථානිකවලින් ලභ කැන්වුන මදුරුවෝ, මුදා හරින ලද තැනින් යාර 35 සිට සැතැපුම් 1½ක දුරකින් සොයා ගෙන හඳුනා ගන්නා ලදහ.

මහරු ජයක් හැටියට ලියා තැබිය හැක්කෙකි, ඉඩ-කඩ සහ සේවක පිරිස අඩු-පාඩු වීම නමැති අවහිර මධ්‍යයේ ඉහළ අඩියෙන් මැ රෝගය මැඩ පවත්වා ගැනීම. අමතර සේවක-සේවිකාවන් බඳවා ගෙන පුහුණු කරවීමෙන් සේවක පිරිස පිළිබඳ ප්‍රශ්නය නම් තරමක් දුරට විසඳා ගෙනැ යනු ලැබේ.

ලාදුරු මර්දනය

වර්ෂය තුළ දී තවත් රෝගීන් 264 දෙනෙකු ලේඛ්‍යාරූඪ කිරීමෙන් මුළු රෝගීන් ගණන දැන් 4,117ක් වී යැ. මරණ සහ අනෙකුත් හේතු නිසා, 115 දෙනෙක් රෝගීහු ලේඛනයෙන් ඉවත් කරනු ලැබූහ.

අලුත් රෝගීන් සංඛ්‍යා ලේඛන අනුසාරයෙන් විග්‍රහ කිරීමේ දී, වැඩි මැ රෝගීන් ගණනක් වූයේ 30—30 වයස් ගොල්ලේ බවත්, ඊළඟ තැන 40—49 වයස් ගොල්ල ලැබූ බවත්, ඉන් අනතුරුව 50—59 වයස් ගොල්ල එළඹිය බවත් පෙනේ. ලිංග භෙදය අනුව අනුපාතය පිරිමි 3ට ගැහැණු 1ක් යැ.

ලාදුරු රෝගීන් ස්පර්ශය කළ ගෙ—දොර වැසියන් 14,667ක් වූහ. ඒ ඒ පෙදෙස් වල සෞඛ්‍ය නිලධාරීන් සමග අත්වැල් බැඳගෙන ව්‍යාපාරය ගෙන ගිය වාර්ෂික ස්පර්ශක සමීක්ෂණයේ දී ඔවුන් සියළු දෙනා මැ, පරීක්ෂා කරනු ලැබූහ. රෝගියාට වැඩියෙන් මැ ගොදුරු වීමට ඉඩ ඇති වයස අවුරුදු 15ට පහළ අය ගැන විශේෂයෙන් සැලකිල්ල දක්වන ලදී.

ස්පර්ශකයින් පරීක්ෂා කිරීමේ මා හැඟි අංශයක් වූයේ මාස් පතා ස්පර්ශකයින් ගැන සොයා බලා සැකැ කටයුතු තුවාල කිසිත් වෙතොත් එය සෞඛ්‍ය නිලධාරීන් වෙත සැල කිරීමට බැඳී සිටින ප්‍රධානියා හෝ වෙනත් වගකිව යුත්තෙකු හෝ ස්වජන් දයෙන් තේරීම යි.

සමකාලීන අදහස් අනුව යමින් ප්‍රතිකාර දීමේ ක්‍රියා දාමයෙහි ලා වෘත්තීය ප්‍රතිකාරය බලගතු තැනක් දැරීයැ. රෝගීන් විසින් නිපදවන ලද අනෙකුත් බඩු අතරැ, පාවහන්, විකලාංග කරු සහ රෙදි-පිළි යනාදිය වෙයි. මාන්තිවූ රෝහලේ රෝගීහු අලුත් කාර්‍යයක් ඇරඹූහ. එනම් ඔවුන් මැ පවත්වා ගනු ලබන සමුපකාර ගව පට්ටියක් මගින් රෝහලට කිරි සැපයීමත් ගොයම් වගාවෙහි යෙදීමත් ය.

අප රටැ මහජනයා මේ රෝගය දෙස හෙලන බැල්ම අනුව, ලාදුරු රෝගයෙන් ඇති වන බෙලහීන කම සහ විකෘතිය සාදා ගැනීමටත්, මග හරවා ගැනීමටත්, අලුත් වැඩ පිළිවෙලක් යොදා ගැනීම සුදුසු බව යස රඟහට පෙනේ. මහජන පිළිකුල සහ පුහු අදහස් බොහෝ විටැ නැඟ එනුයේ මේ රෝගයේ ඇති විරූපදායක ප්‍රතිඵල නිසා වෙන්, රෝගයට විරුද්ධ වැ ගෙන යන සටනේ දී එ බඳු වැඩ පිළිවෙලක් ඉතාමත් අවශ්‍ය සේ සැලකිය යුතු යැ.

සමාජ රෝග මර්දනය

සමාජ රෝග නම් ගැටලුව අනවරතයෙන් මැ පැවතියත්, කොළඹ, සමාජ රෝග චිකිත්සාගාරයට පැමිණි බෝවෙන උපදංශ සහ සුද බිංදුව රෝගීන් සංඛ්‍යාවෙහි ඉහළ යමින් තිබුණ ආරය නවතා ගන්නට ලැබීමට සතුටට කරුණක් වී යැ. කොළඹ

චිකිත්සාගාරයට පැමිණි මෙකී රෝගීන් ගණන 1960 සිටැ ක්‍රමයෙන් ඉහළ නගිමින් තිබූ නමුත්, මේ වර්ෂය තුළ දී කැපී පෙනෙන බැසීමක් දක්නට ලැබුණි. ගිය අවුරුද්දේ දී උපදංශ රෝගීන් 502කුත් සුද බිංදුම රෝගීන් 2,185 කුත් පැමිණි අතරැ එම ගණන මේ වරැ පිළිවෙලින් 367 සහ 1,969 දක්වා පහත බැස තිබීමෙන් යට කී දෙය සනාථ වෙයි.

කොළඹ ප්‍රදේශයේ, බෝවෙන සමාජ රෝග පහත බැසීමට හේතුව, පොලිස් අපරාධ මර්දන කණ්ඩායමේ ප්‍රබල ප්‍රයත්න නිසා වියැ හැක.

බෝවෙන උපදංශ සහ සුද බිංදුම රෝග ගැන පූර්ණ කාලීන පිට පළාත් චිකිත්සාගාරවලැ සැලකියැ වෙනසක් දක්නට නො වී යැ. එහෙත් කටුගස්තොට නම් බෝවෙන උපදංශ රෝගීන් ගිය අවුරුද්දට වඩා බෙහෙවින් විශාල සංඛ්‍යාවක් පැමිණ ඇති බව පෙනෙන්ට තිබේ.

කොළොඹ, චිකිත්සාගාරයෙන් ප්‍රතිකාර ලබන පිරිස රක්ෂාව අනුව වර්ග කළ විටැ, මේ වරත් කම්කරුවන්ට මුල් තැන ලැබුණි. බෝවෙන උපදංශ රෝගීන් ගෙන් සියයට 39ක් ඔවුනතුරෙහි වූහ. ඊළඟ තැන හිමි වූයේ උපදංශ සහ සුද බිංදුම යන දෙකෙන් මැ දෙවන තැන දිනාගත් වෙළෙඳුන්ට යැ.

රෝග මූලාශ්‍රය හැටියට මේ වරත් මුල් තැන හිමි වූයේ අහඹු හාදකම් සහ ගණිකා සේවනය යි.

දිවයිනේ සියළු මැ ආයතනවලට සහ චිකිත්සාගාරවලට යන ගැබිනි මව්වරුන්ගේ පරීක්ෂා කිරීම සිරිත්හුරු කටයුත්තක් හැටියට පටන් ගන්න ලද අතරැ, මේ සඳහා පහසුකම් ද සලසන ලදී. මෙම වැඩ සටහන හැකි තරම් සපල කිරීමටත්, විස්තර සහිත කිරීමටත් විශේෂ විධාන නිකුත් කරන ලදී.

ස.රෝ.ර. පරීක්ෂණ කිරීම සඳහා අනුරාධපුර, මඩකලපුව, යන තවත් රසායනාගාර දෙකට උපකරණ සපයන ලදින්, දැන් එබඳු රසායනාගාර ගණන දසයෙක් වේ.

මානසික සෞඛ්‍ය

වර්ෂය ආරම්භයේ දී මනෝ චිකිත්සකයින් ගේ හිඟයක් පැවතීම නිසා තරමක් කරදර සහිත වූ නමුත් වර්ෂය අවසන් වන විට, පුහුණුව සඳහා කලින් පිටරට යවන ලද වෛද්‍යවරුන් තිදෙනෙකු සුදුසුකම් ලබා පෙරළා පැමිණීමෙන් මුලින් පැවති තත්ත්වය මඟ හැරී ගියේ ය.

"මානසික රෝග පිළිබඳ වසංගත විද්‍යාත්මක සමීක්ෂණ පැවැත්වීමේ න්‍යායන්" යන මාතෘකාව යටතේ ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මැනිලාහි පැවැත්වූ අන්තර් ප්‍රාදේශීය සම්මන්ත්‍රණයට ලංකාව සහභාගි වීම වැදගත් විය. මෙම රැස්වීමට සහභාගි වීම නිසා, මානසික රෝග පිළිබඳ මෙම අංශයට අයත් කරුණු අධ්‍යයනයෙහි ලා වටිනා අවබෝධයක් හා අත්දැකීමක් ලබා ගැනීමට හැකි විය.

ගිය වසරේ දී ඇරඹුණ මනෝ චිකිත්සා පශ්චාත්—මූලික හෙද පාඨමාර්ගය මෙම වර්ෂයේ මාර්තු මස දී අවසන් වූයේ ඉතාමත් සතුටුදායක අයුරැනි. මෙම පාඨමාර්ගය අවසාන කිරීමෙන් පසු මානසික රෝහල්වලට පත් කරන ලද හෙදියන් විසින් තමන්ගේ සමත් කම් වැඩි දියුණු කරගෙන තිබෙනු දක්නා ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මනොචිකිත්සක හෙද සේවයේ නව අංගයක් වන "කණ්ඩායම් වැඩ ක්‍රමය" හඳුන්වා දීමට හැකි විය.

මෑත වර්ෂවල දී ඉදිරිපත් කරන ලද ප්‍රත්‍යාවපීඩක ඖෂධ වර්ග හේතු කොටගෙන අවපීඩක සයිකෝසිස් රෝගීන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ විප්ලවයක් සිදු වී ඇත. මෙම ඖෂධ වර්ගවල පාවිච්චිය වැඩිවනවාත් සමගම ඉලෙක්ට්‍රෝ—කන්වල්ෂන් ප්‍රතිකාර ක්‍රමයේ අවසානය ළංවේ.

මානසික රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ දී වෘත්තීය ප්‍රතිකාරය කෙරෙහි විශේෂ සැලකිල්ල දැක්වේ. මේ සම්බන්ධයෙන් සිදුවූ වැදගත් කරුණක් නම්, වෘත්තීය ප්‍රතිකාර අංශයේ නව ගොඩනැගිල්ල ලකිසුරු උතුමාණන් වහන්සේ විසින් විවෘත කරනු ලැබිය. මෙම වර්ෂයේ දී මුල්ලේරියාව රෝහලේ දී පූර්ණ කාලීන වෘත්තීය ප්‍රතිකාර ක්‍රම ඇරඹිණ.

"විවෘත රෝහල්" ක්‍රමය යටතේ අරඹන ලද මුල්ලේරියාවේ රෝහලට වඩ වඩා රෝගීන් ඇතුළු වීමෙන් එය ජනප්‍රිය භාවයට පත්වී ඇති බැව් පෙනේ. මෙම රෝහලේ පිහිටීමත් අවට දර්ශනයත් පිටරටවලින් පැමිණි අමුත්තන් බොහෝ දෙනකුගේ සිත් ගැනීමට හේතු වී ඇත.

අධිකරණ වෛද්‍ය කටයුතු

අධිකරණ වෛද්‍ය අංශය කෙරෙහි පැවරුණ කාර්‍ය භාරය අධික විය. ගතවූ වර්ෂවල දී මෙන් ම, මේ වර්ෂයේ දීත් ප්‍රාදේශීය අධිකරණය, පොලිසිය හා ඇටෝර්නි ජනරාල් වරයා ගේ දෙපාර්තමේන්තුව වැදගත් වූත් දුෂ්කරවූත් නඩු සම්බන්ධයෙන් කොළඹ සිටින අධිකරණ වෛද්‍ය නිලධාරියා ගේ සහාය පැතීය. ප්‍රාදේශීය අධිකරණවලින් පමණක් කැඳවීම් 22ක් ලැබිණ.

මහජන ආන්දෝලනයක් ඇතිකළ පුත්තලමේ මංගලඑළියේ සිදුවූ මිනිමැරුම එබඳු නඩුවලින් එකකි. අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාත් ඔහුගේ සහායකයනුත් ඉන්ක්වෙස්ට් විභාග 1,200කට සහභාගි වූහ. මේවායින් 643ක් පශ්චාත් මරණ පරීක්ෂණ විය.

නීතිමය කටයුතුවල යෙදෙන නානා තරාතිරම්වලට අයත් නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා පැවැත්වෙන සංස්කරණ පාඨමාර්ගයන් මේ වර්ෂයේ දී නොකඩවා පැවැත්විය.

පිළිකා රෝගය

මහරගම පිළිකා රෝග ආයතනයේ නැවති ප්‍රතිකාර ලත් රෝගීන්ගේ සංඛ්‍යාව හා එහි බාහිර රෝගීන්ගේ අංශයෙන් ප්‍රතිකාර ලත් රෝගීන්ගේ සංඛ්‍යාව අනුක්‍රමයෙන් ඉහළ ගියේ ය.

පිට පළාත්වල චිකිත්සාගාර මගින් මෙම ආයතනය වෙත යොමු කරවන ලද පිළිකා රෝගීන්ගේ සංඛ්‍යාව විශාල විය. මෙම සංඛ්‍යා අනුව සලකා බලන විට පිළිකා රෝග මර්දනය පුළුල් කරනු සඳහා පිටපළාත්වල ද චිකිත්සාගාර පැවැත්වීමේ ඇති අවශ්‍යතාවය පැහැදිලි වේ.

දිවයිනේ සිටින සියලුම පිළිකාරෝගීන් විකිරණයට භාජන කර ප්‍රතිකාර කරනු ලබන මධ්‍යස්ථානය වූයේ රේඩියෝ ප්‍රතිකාර ඒකකයි. මෙම ඒකකය මගින් රෝගීන් 880 දෙනෙකුට අධිරශ්මි ප්‍රතිකාරයත් ද 511 දෙනෙකුට කෝබල්ට් ප්‍රතිකාරයත් ලබා දෙන ලදී.

දැනට මුහුණ දීමට සිදුවී ඇති බරපතලම ප්‍රශ්නය වනුයේ බාහිර පිළිකා රෝගීන්ට ආරක්ෂාව සැපයීමය. දැනට පවත්නා ක්‍රමය අනුව සහන දායක ප්‍රාදේශීය රෝහල් වෙත යොමු කෙරේ. බොහෝවිට මෙම රෝගීන් එම රෝහල්වලට භාර ගැනීමට

නොහැකි වන නිසා මේ ප්‍රශ්නය මතු වී ඇත. ලංකා පිළිකා රෝග සංගමය මගින් පරිත්‍යාග කර ඇති බණ්ඩාරනායක නිවාසයේ මෙවැනි රෝගීන් 50 දෙනෙකුට ඉඩ කඩ සලසා ඇත.

වෛද්‍ය පර්යේෂණ

මෙම ආයතනය වෙත පැවරෙන සාමාන්‍ය කටයුතුවල ප්‍රමාණය ඉතා අධිකව තිබෙද්දීත් විශේෂ පර්යේෂණ අංශ කිපයක් සම්බන්ධයෙන් ඉදිරියට පිය නඟා තිබීම සතුටට කරුණකි.

බැක්ටීරියාවේද අංශයෙහිලා කරන ලද පර්යේෂණයක් නම්, ආහාරය පිණිස මරා විකුණනු ලබන සතුන්ගේ ඇටවල පවත්නා බැක්ටීරියා සංක්‍රමණ පිළිබඳ ව විමර්ෂණ යක් ඇරඹීමය. මෙම පරීක්ෂණයේ දී වෙළෙඳ පොළේ දී විකුණනු ලබන කුකුල් මස් කටුවල හා හරක් මස් කටුවල බැක්ටීරියා පවතින බැව් සොයා ගනු ලැබිය. මෙම විමර්ෂණ පැවැත්වෙනුයේ හුදෙක් අධ්‍යයන කටයුතු සඳහා ය. මේ මස් අනුභවයට ගනු ලබන්නේ හොඳට පිස ගැනීමෙන් පසුව බැවින් මෙම සොයාගැනීම් ගැන බියවීමට කරුණක් නැත.

ගනු ලබන ආහාරය, ගල කණ්ඨය ඇති වීම සඳහා කොතෙක් දුරට බලපාන්නේ ද යනු නිශ්චය කරනු වස් පවුල් පදනම මත සීමා කරන ලද පෝෂණය හා භෝජන සමීක්ෂණයක් පැවැත්විය. කොළඹ ළමා රෝහලේ සිටින මැරසොමික් ළමයින්ට අත්හදා බැල්මේ ආහාර දීමෙන් ලැබෙන ප්‍රතිඵල සොයා බැලීම සඳහා භෝජනීය විමර්ෂණයක් ලංකා විශ්ව විද්‍යාලය සමග හවුල් වී පැවැත්විය. පියලි ඇට වර්ග හා හාල් මැස්සන් ආහාර වශයෙන් දී සිදුවන ශාරීරික බර හා රුධිරයේ වෙනස් කම් සොයා බැලීම පිළිබඳ විශේෂ සටහන් තබා ගන්නා ලදී. මෙම අත්හදා බැලීම කෙරීගෙන යයි.

පාරිසරික සෞඛ්‍යය

අයහපත් පාරිසරික සෞඛ්‍ය තත්ත්වයන් මැඩලීමේ අදහසිනුත් විශේෂයෙන් පාසල් නොයන වයසේ ළමුන්ට ආරක්ෂාව සැලසීමත් සඳහා වයස අවු. 1 සිට 4 දක්වා වයස් සීමාවල සිටින ළමුන් සම්බන්ධයෙන් සෞඛ්‍ය සමීක්ෂණයක් පවත්වන ලදී.

කුරුණෑගල පිහිටි පාරිසරික සෞඛ්‍ය යෝජනා ක්‍රමය එම කටයුතු මාතර, කොළඹ, ගාල්ල හා පුත්තලම යන දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කර, තෝරා ගනු ලැබූ ගම්වලට ආරක්ෂා සහිත ජලය සැපයීම හා සෞඛ්‍ය ක්‍රමානුකූල වැසිකිලි සැපයීම ද කරන ලදී.

අනතුරු වැළැක්වීමේ අන්තර් දෙපාර්තමේන්තු කමිටුව මගින් කළ වැදගත් කරුණක් නම්, මෝටර් බයිසිකල් පදවන්නන් විසින් "හෙල්මට්" පාවිච්චි කළ යුතු යැයි මෝටර් කොමසාරිස්වරයාට නිර්දේශ කිරීමය. මේ නියමයෙන් මෝටර් බයිසිකල් අනතුරුවල දී සිදු විය හැකි මරණ සංඛ්‍යාව අඩු කිරීමට හේතු වනු ඇත.

බෙහෙත් වර්ගවලට යම් යම් දේ මිශ්‍ර කරන්නේ දැයි නිශ්චය කිරීම සඳහා නියමිත බලධාරි නිලධාරීන් 5 දෙනෙකු විසින් ඖෂධ වර්ග 15 පිළිබඳ අධ්‍යයනයක් පවත්වන ලදී. මෙහි ප්‍රතිඵල දැනට රජයේ රස පරීක්ෂකයා විසින් ස්කෑන් කරගෙන යනු ලැබේ.

අන්තර් දෙපාර්තමේන්තු කමිටුව හා ඖෂධ කමිටුව යන කමිටු දෙක වෙනුවට පත් කරන ලද ආහාර හා ඖෂධ උපදේශක කමිටුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ සභාපතිත්වයෙන් පැවැත්විය.

සෞඛ්‍ය අධ්‍යාපනය

සෞඛ්‍ය අධ්‍යාපන උප අංශය හා සම්බන්ධ කටයුතු කිප අතකින් තවදුරටත් දියුණුවී ඇති බැව් දක්නා ලදී.

මෙම අංශය යටතේ කර ඇති වැදගත් කාර්යයක් නම්, නා නා තරාතිරම්වලට අයත් මහජන සෞඛ්‍ය නිලධාරීන්ට පුහුණුවක් ලබා දීමය. උදාහරණයක් වශයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා ප්‍රාදේශීය පරිපාලන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පුහුණු කිරීම සඳහන් කළ හැකි ය.

ප්‍රජා සංවිධාන ක්‍රමවලින් තවදුරටත් ප්‍රතිඵල ලබාගත හැකි විය. ජාතික පෝලියෝ ප්‍රතිශක්තිකරණ ව්‍යාපාරයේ දී ස්වේච්ඡා සේවකයන් 1,00,000ක් පමණ ඉදිරිපත් වී දෙපාර්තමේන්තුවට, ආධාර වෙමින්, ළමයින්ගේ සංඛ්‍යා ලේඛන සකස් කිරීම, ප්‍රතිශක්තිකරණ මධ්‍යස්ථාන පවත්වා ගෙනයාම හා සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රචාරක වැඩවලට සහභාගිවීම නිසා මෙම ක්‍රමයේ ඇති වැදගත් කම වැඩිදුරටත් ප්‍රදර්ශනය විය.

සෞඛ්‍ය හා අධ්‍යාපන යන දෙපාර්තමේන්තු අතර පැවති සම්බන්ධය තවදුරටත් තහවුරු කිරීමෙන් ඒකාබද්ධ පාඨශාලා සෞඛ්‍ය කමිටුවේ වැඩ වඩ වඩා සාර්ථක කර ගත හැකි විය. තම තමන්ගේ කොට්ඨාශවලින් පාඨශාලා දෙක බැගින් තෝරා ගෙන පාඨශාලා සෞඛ්‍ය කටයුතු මෙහෙයවීම සඳහා ඒකාබද්ධ කමිටු පිහිටුවා වඩා ක්‍රමානුකූලව පාඨශාලා සෞඛ්‍ය කටයුතු සංවිධානය කරන ලෙස සියලු ම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට නියෝග කරන ලදී.

පාරිසරික සෞඛ්‍ය ඒකක ක්‍රමය යටතේ සෑම තැනකදීම ලබා ඇති දියුණුව විවිධාකාර බැව් පෙනිනි. මීට හේතුවී ඇත්තේ මහජනයාගේ දුප්පත්කම, වැඩසටහන්වල දී නියම මාර්ගදේශකත්වයක් නොලැබීම හා ඇතැම් ප්‍රජා සංවිධාන සකස් කිරීමේ ඇති දුෂ්කරතාවයන් බැව් අනාවරණය වී ඇත.

ජූනි මස 10 වැනි දින සිට 16 වැනිදා දක්වා පැවැත්වූ මහජන සෞඛ්‍ය සතියේ මාතෘකා පාඨය වන "පූර්ව පාඨශාලා ළමයාගේ සෞඛ්‍ය" කෙරෙහි මහජන සැලකිල්ල සැහෙන පමණ යොමු විය. මෙම වර්ෂයේ දී පැවැත්වූ සෞඛ්‍ය සති උත්සවයේ විශේෂ ලක්ෂණය වූයේ සෑම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුගේ කොට්ඨාශයකම "මහජන සෞඛ්‍ය කමිටු" පිහිටු වීමය. මෙම කමිටුවලින් බොහොමයක් වාගේ "ශ්‍රමදාන වැඩ කඳවුරු" පිහිටුවීමේ ප්‍රතිපත්තිය කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කරවන ලදී.

වැඩිවන ජනතාවට ආහාර සැපයීමේ අවශ්‍යතාවය අවබෝධ කරවනු සඳහා ආහාර හා කෘෂිකර්ම ආයතන මගින් මෙහෙයවන ලද "සාගිනි නිවීමේ සතියට" මෙම දෙපාර්තමේන්තුව ද සහභාගි විය. මෙම සතිය සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනයෙන් ඌණ පෝෂණය නිසා වැළඳෙන ලෙඩ රෝගත් පෝෂ්‍යදායක වූත් ලාබවූත් ආහාර පිළියෙල කර ගැනීම සඳහා ස්වභාවික මාර්ග යොදාගන්නේ කෙසේ ද යන්නත් කෙරෙහි මුල් තැනක් ලැබිණ.

දෙපාර්තමේන්තු ස්වේච්ඡා සංවිධාන රාශියක් සමග කිට්ටු සම්බන්ධතාවයක් පවත්වමින් ඒවාට හැකි හැම අයුරින්ම ආධාර කළේ ය.

ගුවන් විදුලිය, පුවත්පත් හා ප්‍රකාශන මගින් කෙරෙන ප්‍රචාරක කටයුතු නොන වත්වා ම පවත්වා ගෙන යන ලද අතර පුස්තකාල සේවාව සාමාන්‍යයෙන් වැඩි දියුණු කරන ලදී.

අභ්‍යාසය යෝජනා ක්‍රම

පිටරටවල දී කරනු ලබන පශ්චාත් උපාධි පාඨමාර්ගයන් යටතේ නා නා අංශවලට අයත් වෛද්‍ය නිලධාරීන් 9 දෙනෙක් විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂඥ පුහුණුවක් ලැබීම

සඳහා එතෙර යවන ලදී. නානා හෙද අභ්‍යාස විද්‍යාලයන්හිදී පුහුණු කිරීම සඳහා හෙද ශිෂ්‍යාවන් 617 දෙනෙක් බඳවා ගනු ලැබූ අතර පුහුණුව ලැබූ හෙදියෝ 265 දෙනෙක් අභ්‍යාස විද්‍යාලවලින් පිට වූහ. ඔවුන්ට නානා ආයතනවල පත්වීම් දෙන ලදී.

පුහුණු කිරීම සඳහා බඳවා ගනු ලැබූ සෙසු සේවකයන් අතර ආධුනික මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 49 දෙනෙක් හා ඇපොතිකරි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 49 දෙනෙක් වූහ.

පරිපාලනය

රාජ්‍ය භාෂා පණත ක්‍රියාත්මක කිරීමේ කටයුතු තවදුරටත් දියුණු වූයෙන් ගණක හා පරිපාලනමය කටයුතුවල දී යොදා ගනු ලබන භාෂා මාධ්‍යය බොහෝ දුරට සිංහල විය.

දෙපාර්තමේන්තුවේ මුළු සේවක සංඛ්‍යාව 32,139 දෙනෙක් වූ අතර ඔවුන්ගෙන් 24,749 දෙනෙකුම වෛද්‍ය සේවා අංශයට අයත් විය.

දෙපාර්තමේන්තුවේ ඇති වෘත්තීය සමිති 61කි. මෙම වෘත්තීය සමිතිවලින් දෙපාර්තමේන්තුවට ලැබුන නියෝජිත සංඛ්‍යාව අති විශාල වුවත් අනපසුවී පැවති ප්‍රශ්න ගණනාවක් සතුටුදායක පරිදි විසඳා ගත හැකි විය.

සෞඛ්‍ය සභාව

සෞඛ්‍ය සභාව රැස්වීම් වාර 9ක් පැවැත්වූවා ය. වෙනත් කරුණුවලට අමතරව ස්ථාවර ලේකම් තුමා විසින් නිරීක්ෂණය සඳහා යොමු කරවන ලද කරුණු සමහරක් සභාවේ විමංසනයට භාජනය කෙරිණ. විශේෂඥ වෛද්‍යවරුන්ගේ සුදුසුකම් වර්ග කිරීම ද මෙම කරුණු අතර විය. මේ සම්බන්ධයෙන් සාමාජිකයින් සතර දෙනෙකු ගෙන් සමන්විත උප කමිටුවක් විසින් මැනවින් පරීක්ෂාකර බලා පිළියෙල කරන ලද විස්තරාත්මක වාර්තාවක් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

ඔප්ටිමෙට්‍රි පාසලක් හා රිෆ්‍රැක්ෂන් රෝහලක් ලංකාවේ පිහිටු වීම සම්බන්ධ යෙන් කරන ලද යෝජනාව පළමුවෙන් ලංකා අක්ෂි වේදීන්ගේ සංගමයට හා ලංකා විශ්ව විද්‍යාලයට දන්වා ඔවුන්ගේ අදහස් දැන ගත යුතු යයි සභාව තීරණය කළා ය.

ප්‍රවාහන සේවා

දෙපාර්තමේන්තුවේ රථ වාහන සංඛ්‍යාවට තවත් අළුත් රථ 22ක් එකතු කිරීමෙන් දැනට පාවිච්චියට ගනු ලබන රථ සංඛ්‍යාව 336ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන සේවය තවදුරටත් බලසම්පන්න විය.

තවත් අළුත් ගිලන් රථයක් මිලදී ගැනීමට විධි විධාන යොදන ලදින්, දැනට ඇති ගිලන් රථ සේවාව තවදුරටත් කාර්යක්ෂම වෙනු ඇත. මෙම රථය ඊළඟ වර්ෂයේ දී ලබා ගත හැකි වනු ඇත.

කලක් තිස්සේ පැවති වැදගත් ප්‍රශ්නයක් වූයේ දෙපාර්තමේන්තුවට අයත් සියලුම රථවාහන ප්‍රතිසංස්කරණ වැඩපළක් පිහිටුවීමයි. මේ ප්‍රශ්නය ගැන සොයා බලා සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් කමිටුවක් පත් කර ඇත.

තරමක් සිත චංචල කරවන සුළු එක් කරුණක් වූයේ දෙපාර්තමේන්තුවට අයත් රථ අනතුරුවලට භාජනවීම වැඩිවී තිබෙනු දැක්මයි. මෙවැනි අනතුරු 23ක් සිදු වී ඇති අතර මින් කීපයක් සිදු වී ඇත්තේ රියදුරන්ගේ නොසැලකිල්ල නිසා යැයි වාර්තා වී ඇත.

ජාත්‍යන්තර සම්මන්ත්‍රණ

ජාත්‍යන්තර සෞඛ්‍ය සම්මන්ත්‍රණ දහයක දීම ලංකාව නියෝජනය විය. මින් ප්‍රධාන තැන් හිමි වන්නේ ජර්මන් ජනරජයේ ලංකා තානාපති අතිගරු බී. ඇප්. පෙරේරා

උතුමාණන් හා එවකට නියෝජ්‍ය අධ්‍යක්ෂව (වෛද්‍ය සේවා) සිටි වී. ටී. හේරත් ගුණරත්න දොස්තර මහතා ගෙන් සමන්විතවූ ලංකා නියෝජිත කණ්ඩායම සහභාගි වූ මැයි මාසයේ දී ජිනිවාහි පැවැත්වූ 16 වැනි ලෝක සෞඛ්‍ය සම්මේලනයයි.

තවද වැදගත් සම්මන්ත්‍රණයක් වූයේ මැයි මාසයේ ම පැවැත්වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ 32 වැනි කාරක සභා රැස්වීමයි. මෙම රැස්වීමට වී. ටී. හේරත් ගුණරත්න දෙස්තර මහතා සහභාගිවූ අතර ඒ මහතා එම රැස්වීමේ ලේකම් තනතුරට හා පරිපාලනය හා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට පත් කර ගන්නා ලදී. එපමණක් ද නොව, එ. ජ. හ. ළ. අරමුදලේ—ලෝ. සෞ. සංවිධානයේ ඒකාබද්ධ සාමාජිකත්වය කට ද ඒ මහතා පත්කරගනු ලැබිය.

1963 සැප්තැම්බර් මස බැංකොක්හි පැවැත්වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ 16 වැනි (අග්නිදිග ආසියාතික) ප්‍රාදේශික කමිටු රැස්වීමේ දී නියෝජ්‍ය අධ්‍යක්ෂ (මහජන සෞඛ්‍ය සේවා) බී. කේ. ද සිල්වා දෙස්තර මහතා ලංකාව නියෝජනය කළේ ය. මෙම කණ්ඩායමේ ප්‍රධාන නියෝජිතය වූයේත් බී. කේ. ද සිල්වා දෙස්තර මහතාමය.

සුභසාධක කටයුතු

දෙපාර්තමේන්තුවට අයත් නානා ආයතනවල පිහිටි සුභසාධක කමිටු රැසකින් සේවක මණ්ඩලවලට අයත් සියලුම සාමාජික සාමාජිකාවන්ට සුභ සාධක පහසුකම් සලසන ලදී.

සේවක සේවිකාවන්ට මුහුණ දීමට සිදුවූ සුභසාධනයෙහි ලා සැලකෙන නානා දුෂ්කරතාවයන් සුභසාධක පහසුකම් සපයා දී ඇති ආයතනවල දී සතුටුදායක අන්දමින් විසඳා දෙනු ලැබී ය.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා සමාජය හා සකසුරුවම් සමිතිය තවදුරටත් ඉදිරියට පා නගමින් පැවතින.

ගොඩනැගිලි

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයන් යටතේ රුපියල් 1,19,45,910ක් වෛද්‍ය ගොඩනැගිලි සඳහා ඇස්තමේන්තුවලින් වෙන් කර දෙන ලදී. මීට අමතර වශයෙන් ජල සම්පාදනය, කසළ බැහැර කිරීම හා උපකරණ සැපයීම සඳහා තවත් රුපියල් 52,24,426ක් වෙන් කරන ලදී.

ජානපදිකව පවත්නා ගලගණ්ඩ රෝගය පිටු දකිනු වස් සාමාන්‍ය ලුණුවලට අයඩින් එක් කිරීම සඳහා නියමු යන්ත්‍රයක් සවිකිරීමට රුපියල් 10,000ක් වෙන් කරන ලද නමුත් ඒ සඳහා වැය වූයේ රුපියල් 2,545කි.

ස්තුතිය

මෙම වාර්තාව පිළියෙල කරන ලද්දේ මෙම දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන් සමූහයක් විසින් බැව් සඳහන් කළ යුතු ය. මෙම වාර්තාවේ සාමාන්‍ය සකස් කිරීම කරන ලද්දේ අදාල මාණ්ඩලික නිලධාරීගේ සහාය ලැබූ වෛද්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ හා මහජන සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ විසිනි. මට උපකාර කළ පරිපාලන නියෝජ්‍ය අධ්‍යක්ෂ හා ප්‍රධාන ගණකාධිකාරි ඇතුළු මේ සියලුම නිලධාරීන්ට මම ණය ගැති වෙමි. මෙම වාර්තාවට අයත් සංඛ්‍යා ලේඛන රැස් කර දුන්නාවූත් වාර්තාව සංස්කරණය කිරීමට ආධාර කළාවූත් නිලධාරීන්ගේ සේවය ගැන ද සඳහන් කරනු කැමැත්තෙමි.

වී. ටී. හේරත් ගුණරත්න,
සෞ. සේවා අධ්‍යක්ෂක.

1964 ජූනි මස 27 දා,
කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

I වැනි පරිච්ඡේදය—ජීවිත සංඛ්‍යා ලේඛන

සෞඛ්‍යය අතින් රට ලබා ඇති දියුණුව මැනීමෙහි ලා ජීවිත සංඛ්‍යා-ලේඛන අගනා තොරතුරු සපයයි. උපත් බැගිනුව, මරණ බැගිනුව, මාතෘ සහ බිළිඳු මරණ බැගිනුව වැනි සූචි අංක, සෞඛ්‍ය වැඩෙහි විවිධ තලවලැ ලබා ඇති තත්ත්වය මැනීමෙහි ලා ප්‍රයෝජනයට ගනු ලැබේ.

මෙම වාර්තාව ලියන අවස්ථාවේ දී, රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත තිබුණ අලුත් මැ තොරතුරු වූයේ 1962 අවුරුද්දේ ඒවා යැ.

ජන ගහණය

1. 1962ට තක්සේරු කරන ලද මැදි-වසර ජන ගහණය, 10,443,000කි. මේ අනුව 1961ට මැදි-වසර, ජනගහණය වූ 10,168,000 ඉක්මවා සියයට 27ක වැඩිමක් පෙනුණි. 1963 ජූලි 8 වන දා, මෙහෙයැවුණු ජන-ලේඛනය අනුව නම් ජනගහණය 10,644,809ක් වී යැ.

උපත්

2. 1962 දී දිවයිනේ උපත් 370,947ක් වීමෙන්, උපත් බැගිනුව 35.5 කට අඩු වී ගියේ ය. උපත් බැගිනුව 1959 යේ 37.0 සිටැ මේ වරැ 35.5 දක්වා ක්‍රමිකව පහත බසිමින් තිබේ. 1958 උපත් බැගිනුව 35.8 ක් වී යැ.

මරණ

3. 1961 දී ලේඛ්‍යාරූඪ වූ මරණ ගණන 88,935කි. මෙතෙක් සටහන් වී ඇති අඩු මැ ගණන වූ 8.0 දක්වා 1961 දී පහත බට මරණ බැගිනුව, 1962 දී 8.5 දක්වා නැගී මෙන් 1959 තිබූ මට්ටමට මැ ළඟා වූවා සේ පෙනේ.

1946-62 කාල සීමාවට උපත් සහ මරණ සංඛ්‍යාව—1 වන සටහනේ දක්වා ඇති අතරැ, 1 වන ප්‍රස්ථාරයේ එය රූවා දක්වා ඇත.

බිළිඳු මරණ

4. 1962 දී බිළිඳු මරණ 19,593ක් වාර්තා වී යැ. 1959 අවුරුද්දේ 57 සිටැ 1961 අවුරුද්දේ 52 දක්වා වේගයෙන් පහත බසින ලෙසක් පෙන්වූ, මෙම බැගිනුව 1962 දී යන්තමින් 53 දක්වා නැගී යේ යැ.

ලංකාවේ සහ අනෙකුත් රටැවල බිළිඳු මරණ බැගිනුව බී 142 වන පිටුවේ 2 වන සටහනේ දැක්වේ. බටහිර රටවලැ බිළිඳු මරණ බැගිනු සමග සසඳන ලංකාවේ බැගිනුව ඉතා ඉහළ බව පෙනේ.

මව් මරණ

5. සජීවී උපත් 1000කට 2.6 බැගින් වූ මව් මරණ බැගිනුව 1961 තෙක් වාර්තා වූ පහළ මැ ගණන වේ. 1962 ගණන මෙතෙක් ලැබී නැත. සජීවී උපත් 1000කට බිළිඳු මරණ සහ මව් මරණ බැගිනු, II වන ප්‍රස්ථාරයේ විදහා දක්වා ඇත.

අවුරුදු 50ක් සහ ඊට වැඩි වයස් වූවන්ගේ මරණ, මුළු මරණ ගණන අනුව, සියයට පවසා දක්වන සමානුපාත මරණ ප්‍රමාණ පැලුම ද ජාතියෙකැ සෞඛ්‍ය වර්ධනය මිනීම පිණිස යොදා ගනු ලැබේ. සමානුපාත මරණ ප්‍රමාණ පැලුම 1962 දී 31.1කින් 1961 දී 42.5 දක්වා නො සැලී නැඟ ඇත.

1962 අවුරුද්දේ ගණන්-මිමි මේ දක්වා නැත.

II වැනි පරිවෙජ්දය—වෛද්‍ය සැලකිල්ල

අ.—අභ්‍යන්තර රෝගීන්

සාමාන්‍ය

1. පසුගිය දස අවුරුද්ද අනුව සසඳා බලන කලැ මේ අවුරුද්ද තුළැ දී රජයේ ආයතන වලැ නැවතී ප්‍රතිකාර ලැබූ අභ්‍යන්තර රෝගීන් ගණන මෙතෙක් සටහන් වී අති ඉහළ මැ ගණන බැව්, VI වන පිටුවේ 4 වන සටහනින් පෙනේ. ගිය අවුරුද්දේ දී 16,60,939 දෙනෙක් ප්‍රතිකාර ලැබූ අතරැ මේ අවුරුද්දේ දී 16,67,414 දෙනෙක් ප්‍රතිකාර ලැබීමෙන් ගණන තවත් ඉහළ නැගී. එකී 16,67,414 ක් දෙනා රෝගීන් ඒ ඒ ලෙඩ රෝග යටතේ වර්ග කැරැමත්, පෙදෙසින් පෙදෙස සහ ආයතන ප්‍රභෙද අනුව දැක්වීමත් VI වන සටහනෙන් ඉටු වන අතරැ, එම රෝගීන් මැ පළාත් සහ දිසා අනුව ගලපා දැක්වීම VII වන සටහනෙන් ඉටු වේ. පසුගිය අවුරුද්දේ මෙන් මැ වැඩි මැ රෝගීන් ගණනක් ප්‍රතිකාර ලැබූ වේ කොළොඹැ කොට්ඨාශයේ දී යැ. ඒ රෝගීන් ගණන 2,30,579 කි. රෝගීන් 1,25,396 ක් ප්‍රතිකාර ලත් මහනුවරැ කොට්ඨාසය දෙ වන තැන ලැබී යැ. ඊළඟ තැන රෝගීන් 1,21,382ක් ප්‍රතිකාර ලැබූ කුරුණෑගල කොට්ඨාසයට ලැබුණි. අඩු මැ ගණන වූ 25,687ක් වාර්තා වූයේ වවුනියාව කොට්ඨාසයෙනි.

මේ වරත් වැඩි මැ රෝගීන් ගණනක් (1,67,177ක්) ප්‍රතිකාර ලබා ඇත්තේ කොළඹ, රෝහල් කැටියෙනි. එම ගණනින් 45,718ක් තරම දෙනා ද සොයිසා සහ කාසල් විදි ගැහැණු රෝහල්වලින් ප්‍රතිකාර ලද්දවුන් යැ. අංගොඩ, මානසික රෝහලේ රෝගීන් 2,632 දෙනෙක් සිටි අතරැ 225 දෙනෙක් මිය ගියහ. අංගොඩැ බෝවෙන ලෙඩ රෝහලේ රෝගීන් 5,025 ක් සිටි අතරැ, මරණ 155ක් වී යැ.

රෝහල්

2. දිවයිනේ පිහිටි වෛද්‍ය ආයතන ගණන ගිය අවුරුද්දේ 781ක් වී තිබී 793 ක් දක්වා වැඩි වී යැ. මෙයින් 194ක් මහජන සෞඛ්‍ය ආයතන ද 689ක් සුව කිරීමේ ආයතන ද වී යැ. මේවා B 154 පිටුවේ X සටහනේ ඒ ඒ වර්ග අනුව බෙදා ඇත.

ඇඳන් ගණන සහ ජන ගහණ අනුපාතය

3. කලින් අවුරුද්දේ වූයේ ඇඳන් 32,735 ක් නමුත් මේ මුදල් වර්ෂය අවසානයේ දී ඇඳන් 33,636 ක් වී යැ. මේ ඇඳන් ගණන ඒ ඒ රෝහල් අනුව සහ ඒ ඒ සෞඛ්‍ය සේවා අධිකාරි අනුව බෙදී ගිය අයුරු XI සටහනෙන් දැක්වේ. ඇඳන් ගණන හා ජන ගහණය හා අතරැ අනුපාතය දශම එකෙකින් වැඩි වී ඇත. තැනැත්තන් 1000කට වැටෙන ඇඳන් සාමාන්‍ය ගණන ඒ ඒ සෞ. සේ. අධිකාරිය අනුව XII සටහනේ

විදහා දැක්වේ. ඇඳන් අනුපාතය ඉහළින් මැ තිබුණේ (5.7) කොළඹ, කොට්ඨාශයේ යැ. පහළ මැ මට්ටම වූයේ (1.8) කෑගල්ල කොට්ඨාශයේ යැ. මුළු දිවයිනට මැ වැටෙන අනුපාතය 1000කට 3.3ක් වී යැ.

තදබදය

4. පළාත් රෝහල්, පාදක රෝහල් සහ කොළොඹ රෝහල් කැටිය යන ආයතන අනුව තද-බදයේ සියයට ගණන XIII සටහනෙන් ද, දිසා රෝහල්හි තත්ත්වය XIV සටහනෙන්ද, විශේෂ සේවා රෝහල්හි තත්ත්වය XV සටහනෙන් ද දැක්වේ.

පසුගිය අවුරුද්දේ ගණන අනුව සසඳන කැලැ, කොළෙඹැ රෝහල් කැටියේ තද-බදය සොච්චමකින් පහළ බස තිබේ. ඒ ලෙස මැ, වඩා විශාල දිසා රෝහල් හි මෙන් මැ විශේෂ ව්‍යාපාර රෝහල්හි ද තත්ත්වය සොච්චමකින් දියුණු වී ඇත.

පෞද්ගලික තලය

5. පෞද්ගලික වෛද්‍ය ආයතනවලැ ද ඇඳන් ගණන ගිය අවුරුද්දේ 4,389ක් වැ තිබී මේ අවුරුද්දේ 5,018ක් දක්වා වැඩි වී ඇත.

විස්තර සහිත ගණන XVI සටහනේ දැක්වේ.

ආ.—විශේෂිත සේවා

සාමාන්‍ය

1. විශාල රෝහල්වලැ වැඩි වැඩියෙන් විශේෂිත සේවා දියුණු කරලීම අනවරතයෙන් මැ සිදු වී යැ. විශේෂඥ සුදුසුකම් ඇතුවැ නිලධාරීන් 8 දෙනෙක් දිවයිනට පෙරළා පැමිණියහ. එක් එක් විශේෂඥතාව යටතේ නිපුණත්වය ලත් ගණන XVII සටහනේ විදහා දැක්වේ. පෙරළා පැමිණි ගණන මෙන් දෙගුණයක්, නිලධාරීහු දෙපාර්තමේන්තු පටිපාටි සහ කොළඹැ ක්‍රමය යටතේ විශේෂඥ සුදුසුකම් ලැබීමට රටින් නික්ම ගියහ. විස්තර XVIII සටහනේ දැක්වේ.

අනෙකුත් විශේෂඥයින්

2. ශල්‍ය වෛද්‍යවරයෙක් හා කායික වෛද්‍යවරයෙක් හා මෙහි කියැවෙන වර්ෂය තුළැ දී දකුණු කොළඹැ, රෝහලට පත් කරනු ලැබූහ. විකලාංග ශල්‍ය කර්ම විශේෂය ගාල්ලේ ද උරස් ශල්‍ය කර්ම විශේෂය යාපනේ ද, සලසන ලදි, අවුරුද්ද තුළැ දී.

පරීක්ෂණාගාර (රසායනාගාර) සේවා

3. කොළැඹැ රෝහල් කැටියේ, පළාත් රෝහල්හි, පාදක රෝහල්හි, දිසා රෝහල්හි සහ විශේෂිත ව්‍යාපාරවලැ කරන ලද පරීක්ෂාගාර සෝදිසි, තත් රෝහල් වර්ගය සහ සෝදිසි වර්ගය අනුව XIX සටහනේ බෙදා දක්වා ඇත.

වෙනත් සේවා

4. කලින් මුදල් වර්ෂය අවසානයේ දී සිටි වෛද්‍ය නිලධරීන් ගණන 1,311ක් වූ නමුත්, මේ වර්ෂය අවසානය වන විටැ ඒ ගණන 1396ක් වී යැ.

ඉ—බාහිර රෝගීන්ට ප්‍රතිකාර

රෝහල්හි පවත්වන ලද විකිත්සාගාර කරා පැමිණි ලෙඩුන් ගණන ගිය අවුරුද්දේ 29,33,577ක වී තිබී මේ අවුරුද්දේ 31,13,018ක් දක්වා නැංගේ යැ. රෝහල් වර්ගය අනුව එක් එක් වර්ගයේ විකිත්සාගාර වෙනුවෙන් වැඩි විස්තර XX සටහනේ දැක්වේ.

රජයේ වෛද්‍ය ආයතන කරා "මුල් වතාවට" රෝගීන් පැමිණි වාර ගණන 2,62,66,701ක් වූ අතරැ, රෝගීන් පැමිණි මුළු වාර ගණන 3,17,82,290ක් වී යැ. මුල් වතාවට පැමිණීම් ගණන සහ මුළු පැමිණීම් ගණන පිළිබඳ විස්තර, සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශ, කොළොඹැ රෝහල් කැටියේ රෝහල් සහ විශේෂ ආයතන අනුව බෙදී XXI සටහනේ දැක්වේ.

III වැනි පරිච්ඡේදය—වෛද්‍යමය සැපයීම්

අ—රජයේ ඖෂධ ගබඩාව

ඉඩකඩ

රජයේ ඖෂධ ගබඩාව සඳහා වෙන් කරන ලද ඉඩම බාර ගන්නා ලදි. අළුත් ඖෂධ ගබඩාව ගොඩ නැගීම සඳහා රජයේ වැඩ දෙපාර්තමේන්තු මගින් දැන් අවසාන සැලැස්ම පිළියෙල කරගෙන යනු ලැබේ. මෙම ඉඩමේ පරිපාලන ගොඩනැගිල්ල හා ගබඩා ගොඩනැගිලි ද තැනෙනු ඇත. දැනට රජයේ ඖෂධ ගබඩාවට මුහුණ දීමට සිදු වී ඇති ප්‍රධාන ප්‍රශ්නය, ගබඩා කිරීමේ ඉඩකඩ සොයා ගැනීම බැවින් පළමුවෙන් ගබඩා ගොඩනැගිලි නිම කිරීම කෙරෙහි සැලකිල්ල යොමු කරන ලෙස රජයේ වැඩ දෙපාර්තමේන්තුවට උපදෙස් දී ඇත.

සේවක මණ්ඩලය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී, ඖෂධ ගබඩාවට සේවකයින් අමතර වශයෙන් පත් කරනු නොලැබිණ. ඇනවුම් නිලධාරියාගේ ඇබැර්තුව එසේ ම පැවතින.

කරන ලද වැඩ

සැපයීම් ඉල්ලා සිටිනු ලැබුයේ ගතවූ වර්ෂවල සංඛ්‍යා මත පිහිටමිනි. රජයේ ඖෂධ ගබඩාවෙන් බෙහෙත් වර්ග ඉක්මනින් සැපයීම සඳහාත් ඖෂධ හිඟවීම සම්බන්ධ යෙන් කෙරෙන පැමිණිලි අඩු කිරීමත් සඳහා අත්හදා බැලීමක් වශයෙන් තෙමසකට අවශ්‍ය ඖෂධ ප්‍රමාණය සියලුම සෞඛ්‍ය සේවා අධිකාරීන් වෙත මේ වර්ෂය තුළ දී නිකුත් කරන ලදී. මෙම ඖෂධ ප්‍රාදේශීය රෝහල් හා ප්‍රධාන රෝහල් යන පිළිවෙලින් බෙදා අසුරන ලදි. මේ ක්‍රමය නිම කිරීම සඳහා සති 4ක පමණ කාලයක් මිඩංගු කිරීමට සිදුවූ අතර ප්‍රාදේශීය කාර්යාලවලින් ලැබෙන වාර්තා අනුව මෙම වැඩ පිළිවෙල සතුටුදායක වී ඇත.

වස හා හානිකර ඖෂධ

වස හා මාරක ඖෂධ වගී විවෘත වෙළෙඳ පළේ විකිණීම නිසා මහජනයා අනතුරකට මුහුණ පා ඇති බැව් දැක්වෙන දෝෂාරෝපණ මෑතකදී සිට ඉදිරිපත් වී ඇත. වස, අබිං හා හානිකර ඖෂධ පිළිබඳ ආඥාපනතේ නියමයන් ඖෂධ වෙළඳුන් විසින් කෙතරම් දුරට අනුගමනය කරනු ලැබේ ද යනු නිශ්චය කිරීම සඳහා කොළඹ පිහිටි වස බෙහෙත් වෙළඳ සැල් පිළිබඳ සමීක්ෂණයක් පවත්වා ගෙන යනු ලැබේ.

ගිණුම්

1961 සැප්තැම්බර්—1962 සැප්තැම්බර් වර්ෂ සඳහා වූ වාර්ෂික ගිනුම් සැසඳුම් පහත පළ වේ.

වර්ෂය	බඩුවල වටිනාකම	ගිහ බඩුවල වටිනාකම	වැඩි බඩුවල වටිනාකම
1960/61	1,10,22,438.38	1,94,810.08	479 217.97
1961/62	98,121,343.00	2,79,855.90	2,19,185.68

වර්ෂ 1959/60 හා 1960/61 වර්ෂ සඳහා වූ නිරවුල් නොවූ විමසීම් තවමත් ඇත. මේවා නොපමාව නිරවුල් කිරීමට ක්‍රියා කරගෙන යනු ලැබේ.

1961/62 වර්ෂයේ හදිවැරදි බැලීමේ දී දක්නා ලද ගිහ වීම් හා වැඩිවීම් පිළිබඳ පරීක්ෂා කරගෙන යනු ලැබේ. මෙම විෂමතාවයන් පිළිබඳ කටයුතු ඉතා ඉක්මනින් කිරීමට බලාපොරොත්තුවේ.

1961/62 වර්ෂය තුළ දී පරීක්ෂණ සෝදිසි 104ක් පැවැත් විය. විෂයයන් කීපයක් නිරවුල් කරන ලදී. 1959/60, 1960/61 හා 1961/62 හා සම්බන්ධ වූ කරුණු සමහරක් නිරවුල් කිරීමට ඉතිරිව ඇත. මේ සියලුම කාර්යයන් නොපමාව නිරවුල් කිරීම සඳහා ක්‍රියා කරගෙන යනු ලැබේ.

ආ—ඖෂධ සංග්‍රහ කමිටුව

ඖෂධ සංග්‍රහ කමිටුව දෙසතියකට වරක් රැස්වෙමින් වර්ෂය තුළ දී රැස්වීම් වාර විස්සක් පැවැත්වූ වාය. සෑම සාමාජිකයකුම ඉතාමත් උනන්දුවෙන් කටයුතු කළ අතර රැස්වීම්වලට පැමිණීම ඉතාමත් ම උසස් විය.

කමිටුව විසින් ගනු ලබන තීරණ තෙමසකට වරක් වෛද්‍ය නිලධාරීන් හා ඇපෝතිකරිවරු වෙත දන්වා යවන ලදී.

සිරිත් පරිදි කෙරෙන කටයුතුවලට අමතර වශයෙන් මෙරටට ගෙන්විය යුතු ඖෂධ වර්ග මොනවාද යනු ආනයන පාලක නිලධාරිවරයාට උපදෙස් දීමේ බැරෑරුම් කාර්ය යන් අරඹන ලදී. මේ කාර්ය යටතේ අයදුම් 8000ක් පමණ සංඛ්‍යාවක් සන්නිරීක්ෂ ණයට භාජන කෙරින.

ඇ—නව ආයතන සඳහා උපකරණ සැපයීම

1962/63 මුදල් වර්ෂයේ දී උපකරණ සැපයීම සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය රුපියල් 20,00,000කි. මෙම මුදල ඊට පළමු වර්ෂයේ දී වෙන් කරන ලද මුදලට වඩා රුපියල් 5,00,000කින් වැඩි විය. ඊළඟ වර්ෂයේ දී ගෙවීමට සිදුවන ණය පියවා දැමීම සඳහා රුපියල් 10,00,000ක් වෙන් කරන ලදී. මෙම මුදල් නව ආයතන 120ක් සඳහාත් එතෙක් පැවති ආයතනවලට එක්කළ කොටස් සඳහාත් අළුතින් අරඹන ලද විශේෂිත වෛද්‍ය අංශයන් සඳහාත් උපකරණ සැපයීම පිණිස යොදවන ලදී.

වෙන් කරන ලද මුළු මුදලින් වියදම් කළ හැකි වූයේ රුපියල් 1,032,241 කි. වෙන් කළ මුදලට වඩා අඩුවෙන් වියදම් වූයේ ඉල්ලා යවන ලද බොහෝ දේ සැපයීමට නා නා අයතන ප්‍රමාද වූ නිසා ය.

(ඇ) ආයතනවලට විශේෂ උපකරණ සැපයීම

දැනට ලබා ගෙන ඇති ඇක්ස්රේ වැනි විශේෂ උපකරණ සඳහා අවශ්‍ය අමතර කොටස් සපයා දී ඒ උපකරණවලින් ගත හැකි නියම ප්‍රයෝජනය ලබා ගනුවස් ගිය වර්ෂයේ දී මෙන්ම මෙම වර්ෂය සඳහා වෙන්කළ සම්පූර්ණ මුදල ද අයින් කර තැබීමට සිදුවිය. මෙම විෂය භාරව කටයුතු කරන නිලධාරීන්ගේත් විදුලි—වෛද්‍ය ඉංජිනේරු අංශය, භාරව කටයුතු කරන නිලධාරීන්ගේත් නොමද උත්සාහය හේතු කොට ගෙන වෙන්කර දුන් රුපියල් 3,68,000 ක මුදලින් රුපියල් 3,67,615 ක වියදම් කළ හැකිවිය.

ඇක්ස්රේ යන්ත්‍ර, ඩිපේරේ ප්‍රතිකාර උපකරණ, ශීතකර යන්ත්‍ර, අධි පීඩන හා යාන්ත්‍රික ජීවානුහරන උපකරණ, ගෘහ්‍ය ශීතකර, යකඩ පෙණහලු, දන්ත පුටු හා සෙසු උපකරණ, ශල්‍යාගාර මේස, වෙනත් වර්ගවලට අයත් විදුලි—වෛද්‍ය උප කරණ සවි කිරීම්, පවත්වාගෙන යාම්, ප්‍රතිසංස්කරණය කිරීම් හා සේවා කිරීම් විදුලි වෛද්‍ය ඉංජිනේරු අංශය මගින් කරගෙන යන ලදි. ක්‍රියා විරහිත වූ යන්ත්‍ර පිළිසකර කිරීම සඳහා කැඳවීම් 2,683ක් වූ අතර එයින් 1,850ක් ලැබුනේ පිට පළාත්වලිනි. විදුලි වෛද්‍ය ඉංජිනේරු අංශයේ සේවක මණ්ඩලය අසම්පූර්ණව පැවතුණ ද මේ හැම කාර්‍යයක් ම අප්‍රමාදව නිම කරන ලදී.

මෙම අංශය මගින් භාරගනු ලබන විශාල ප්‍රතිසංස්කරන කටයුතු රාශිය සඳහා දැනට ඇති ඉඩ ප්‍රමාණය නො සැහෙන බැවින් මහ රෝහලේ ගබඩාව සඳහා ප්‍රයෝජනයට ගෙන ඇති කොටස මෙම අංශය වෙත පවරා ගැනීමට ක්‍රියා කරන ලදි. වර්ෂය තුළ දී අධි බලයෙන් යුත් ඇක්ස්රේ යන්ත්‍ර දෙකක් ශාපනය, හා බදුල්ල යන රෝහල්වල, සවි කරන ලදී. ඩාර්ලි පාරේ, පිහිටි ළය චිකිත්සාගාරයේ කුඩා ඇම්. ඇම්. ආර්. යන්ත්‍රයක් සවි කරන ලදී. අධි පීඩක ජීවානුහාරතා යන්ත්‍ර මාතර, ගාල්ල, දකුණු කොළඹ, හලාවත හා කුරුණෑගල යන රෝහල්වල සවි කරන ලදී. කොළඹ ළමා රෝහලේ ජලප්‍රතිකාර බඳුනක් සවිකරන ලදී. ලෝක සෞඛ්‍ය ආයතනයේ ඉල්ලීමක් අනුව ඉන්දියාවේ කේරල රාජ්‍යයෙන් පැමිණි නිලධාරීන් දෙදෙනෙකුට ඇක්ස්රේ හා විදුලි වෛද්‍ය ඉංජිනේරු ශිල්පය ගැන 9 මසක පුහුණුවක් ලබා ගෙන ලදී.

මෙම අංශයේ ප්‍රයෝජනය සඳහා මෝටර් රථ අටක් සපයා දී ඇති බැවින් මෙහි සේවය කරන නිලධාරීන්ට හදිසි පිළිසකර කටයුතු සඳහා නොපමාව යාමට ඉඩ ලැබුණු බැවින් ප්‍රමාද ඇති වීම වළක්වා ගත හැකි විය. පැරණිවූත් අලාභ සහිත වූත් උපකරණ වෙනුවට නව විශේෂ උපකරණ මිලයට ගැනීම සඳහා රෝහල් ලොතරැයි අරමුදලෙන් මුදල් ලබා ගැනීමට උත්සාහ කරන ලදී. මේ සඳහා භාණ්ඩාගාරය මගින් ලබන මුදල් වර්ෂයේ දී මුදල් වෙන් කරනු ඇතැයි අපෙක්ෂා කෙරේ.

IV වැනි පරිච්ඡේදය—ජන සෞඛ්‍ය සේවා

අ — මාතෘ හා ළමා සෞඛ්‍ය

ගැටළුව

1. මාතෘ හා ළදරු මරණ ප්‍රමාණය අඩුවෙමින් පැවැතිණ. එබැවින්, වැඩිදුරටත් මෙම ප්‍රමාණය අඩු කිරීම, විසඳීමට අසීරුවූ ප්‍රශ්නයක්ව තිබුණි. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පත්කරන ලද මාතෘ මරණ විමර්ශණ කමිටුව වර්ෂය තුළ දී නිරන්තරයෙන් රැස්වීම් පැවැත්විය. විමර්ශණය සඳහා ආකෘති පත්‍රයක් ද පිළියෙල කොට ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත යවන ලදි. මෙම ආකෘති පත්‍රය කෙතරම් දුරට යෝග්‍යදැයි වර්ෂය තුළ දී සොයා බලන ලද්දෙන් මරණ 158ක සංඛ්‍යාවක් වාර්තා කෙරින මෙම මරණ සංඛ්‍යාව වාර්තා වූයේ ප්‍රාදේශීය රෝහල්, මූලික රෝහල් සහ මෙම ආකෘති පත්‍රයේ යෝග්‍යතාව සොයා බැලීම ආරම්භ කළ ප්‍රදේශ යනාදියෙනි.

ii. පාසල් නොයන වයස් සීමාවේ ළමුන් අතර මරණ වෙනත් වයස් සීමාවලට වඩා වැඩි හෙයින් පානදුර පළාතේ සමීක්ෂණයක් පවත්වන ලදි. තවද, ලංකා මහජන සෞඛ්‍ය සංගමය යටතේ ප්‍රාග් පාඨශාලා ළදරුවා, මැයෙන් සාකච්ඡාවක් පැවැත්විය. මෙම සාකච්ඡාවේ දී යථෝක්ත කාරණය සම්පූර්ණයෙන් ම සාකච්ඡා කළ අතර, පාසැල් නොයන වයසේ ළමුන් අතර, සිදුවන මරණ වැලැක්වීම සම්බන්ධව නිර්දේශ දක්වා සංවිධානය මගින් පත්කරන ලද උපකාරක කමිටුවෙන් වාර්තාවක් ද ඉදිරිපත් කෙරින.

2. වෛද්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ගේ ප්‍රධානත්වයෙන් මතෘ හා ළමා සෞඛ්‍ය පිළිබඳ උපදෙස් කමිටුවේ රැස්වීම් නිරන්තරව පැවැත්විනි. මෙම රටේ මාතෘ හා ළමා සෞඛ්‍ය පිළිබඳ කටයුතු ප්‍රතිසංවිධානය කිරීම සඳහා විශේෂිත උපදේශයකු අවශ්‍ය බැව් මෙම කමිටුවෙන් තරයේ ම කියා සිටින ලදී. අන් රටකින් විශේෂඥයකු ලබා ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. එම විශේෂඥයා දිවයිනට පැමිණි පසු ඔහුට සහාය වීම සඳහා මෙරටින් අයකු ලබා දෙනු ලැබේ.

වැඩ කටයුතු

3. (අ) ක්ෂේත්‍රය.—කලින් කෙරීගෙන ආ අයුරින්ම මෙම වර්ෂයේ දීත් මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන්ගේ වැඩ කටයුතු ඒ අයුරින් ම කෙරින. එතෙකුදු වුවත්, මහජනයා දරු ප්‍රසූතිය සඳහා රෝහල්වලට (විශේෂයෙන් ම විශේෂඥයින් සිටින) ඇතුල්වීමට වැඩි රිසියක් දැක්වූ හෙයින්, වින්නඹු සේවිකාවන් විසින් කරන ලද දරු ප්‍රසූති ගණන සීඝ්‍රයෙන් අඩුවිය. පුහුණුව ලත් වෙනත් නිලධරීන් විසින් 1,00,391ක් දරු ප්‍රසූති මෙහෙයවන ලද අතර, මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන් විසින් දරු ප්‍රසූති 53,745ක් මෙහෙයවන ලදී. වර්ෂය තුළදී "පවුල් සුභ සාධක චිකිත්සාගාර" ගණන වැඩි වූ අතර, පවුල් සංවිධාන කටයුතු වැඩි සැලකිල්ලක් ඇතිව කෙරින. මහජන සෞඛ්‍ය හෙදියන් විසින් ඉටුවූ වැඩ XXII වැනි සටහනේ දැක්වේ.

වර්ෂය තුළ දී මව්වරුන් ගේ කටයුතු සම්බන්ධව මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන් වගකීමක් ඉසුලූ අතර, දාරක සුභසාධක කටයුතු මහජන සෞඛ්‍ය හෙදියන් භාරව තිබුණි.

(ආ) ආයතනබද.—කළුතර සෞඛ්‍ය ප්‍රදේශයෙන් පටන්ගෙන දිවයිනේ සෑම තැනකම පාහේ ආයතන බද සහ ක්ෂේත්‍ර වැඩ කටයුතුවල ඒකාබද්ධතාවක් ඇති කරන ලදි. රෝහල්වල ප්‍රසව විශේෂඥයන් සහ ළමා රෝග විශේෂඥයන් විසින් පුරෝ-සූති ශාලනික හා දාරක අභිවෘද්ධි චිකිත්සාගාර කටයුතුවලින් අනතුරුව පාසැල් සෞඛ්‍ය කටයුතු වලත් නිරත වූහ. ප්‍රසූතියට පසු උවටැන් අවශ්‍ය වූ, මාතාවන් හා රෝහල්වලින් පිටකරන ලද ළදරුවන් ක්ෂේත්‍ර නිළධාරීන් විසින් සොයා බලා ගන්නා ලදී.

මව්වරුන්ගේ ඇඳන් ගණන— XXIII වැනි සටහනේ දැක්වේ.

ආයතනවල සිදු වූ දරු ප්‍රසූති සහ මව්වරුන්ගේ මරණ ගණන XXIV වැනි සටහනේ දැක්වේ.

(ඇ) අධ්‍යාපනය.—සෞඛ්‍ය අධ්‍යාපනය මාතෘ සහ ළමා සෞඛ්‍ය කටයුතු පරිපාටියේ ඉතා වැදගත් තැනක් ඉසිලීය. මව්වරුන් සහ ළදරුවන් වැඩිගෙන එන ඒ ඒ අවදිවල දී ගත යුතු කැමිබිම් විස්තර කරමින් විශේෂ පත්‍රිකා මහජනයාට ලබා දෙන ලදි.

මාතෘ හා ළදරු මරණ පරීක්ෂණ

4. මාතෘ හා ළදරු මරණ සොයා බැලීමේ විශේෂ කමිටුව විසින් පිළියෙල කරන ලද විශේෂ ආකෘති පත්‍රය, එහි යෝග්‍ය අයෝග්‍ය තාව සොයා බැලීම සඳහා වර්ෂය තුළ දී පාවිච්චි කරන ලදී. මෙම ආකෘති පත්‍රය මගින් ලැබුණු විමර්ෂණ ගණන අනුව, එය වෙනස් කොට දැනට මාතෘ මරණ සඳහා යොදනු ලබන ආකෘති පත්‍රය වෙනුවට යොදාගනු සඳහා එය ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත යවා ඇත.

ජංගම සේවා

5. දිවයිනේ, සෑම තැනම ළමුන් අතර පවත්නා වටපණු දූෂණයට ප්‍රතිකාර කිරීම පිණිස යොදවා ඇති ජංගම වැන් රිය දෙකම එම කටයුත්තෙහි මෙම වර්ෂ තුළ දීත් යොදා තිබුණි. මෙම වැන් රිය මගින් ප්‍රතිකාර කරන ලද ළමුන්ගේ මාසික සාමාන්‍ය සංඛ්‍යාව 6,265ක් විය.

පාසල් දන්ත වෛද්‍ය සේවය

6. (අ) **දත් හෙදි ඇබෑසි විදුහල.**—පාසල් දත් හෙදකම සම්බන්ධව පුහුණුවක් ලබාදීම සඳහා 17 දෙනකුගෙන් යුත් පාසල් දත් හෙද සිසුන් කණ්ඩායමක් ඇබෑසි විදුහලට බඳවා ගන්නා ලදී. නිව්සිලන්තයෙන් පැමිණි ශික්ෂක හෙද සොහොයුරියන් ගෙන් එක් අයෙක් තමාට මෙම රටෙහි සේවය කළ යුතු කාලසීමාව ඉක්මවා පෙරළා ගියාය. අනිකුත් අයගේ සේවා කාලය තවත් කාලයකට දික් කරන ලදී. මුදල් වර්ෂයේ අවසානයේ දී ඇබෑසි විදුහලේ වැඩ බලන ප්‍රධානාචාරිනිය විශ්‍රාම ගත්තාය.

පාසල් දත් හෙදියන් විසින් කරන ලද වැඩවල විස්තර XXV වැනි සටහනේ දැක්වේ.

(ආ) **පාසල් දන්ත වෛද්‍ය සේවා.**—පාසල් දන්ත වෛද්‍ය චිකිත්සාගාර ගොඩනැගිලි සඳහා අවශ්‍ය මුදල් හදල් සැපයීම මහජනයාගේ හෝ දෙමවුපියන්ගේ හෝ වෙනත් ආධාරකරුවන්ගෙන් හෝ ස්වේච්ඡා වැඩකටයුතු මාර්ගයෙන් ම කෙරෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇබෑසි විදුහලෙන් පිටවීගිය පාසල් දත් හෙදියනට අවශ්‍ය වූ චිකිත්සාගාර ප්‍රමාණය ලබාගැනීමට අපහසු විය. 1962 වර්ෂයේ දී සමත්වී ඇබෑසි විදුහලෙන් පිටවී ගිය 18 දෙනකුගෙන් යුත් පාසැල් දන්ත හෙදියන්ගේ නව කණ්ඩායමට පත්වීම් ලැබුණේ 1963 ජනවාරි මාසයේ දී ය.

ගම්පොල සහිරා විදුහල
මහනුවර ශාන්ත සිල්වෙස්ටර් විදුහල
වේයන්ගොඩ ශාන්ත මේරිස්
හේනේගම විද්‍යාලය
හොරණ තක්ෂලා
අම්බලන්ගොඩ දේවපතිරාජ

මෙකී ස්ථානවල පාසල් දන්ත වෛද්‍ය චිකිත්සාගාර විවෘත කරන ලදී. මහරගම ප්‍රදේශයෙන් චිකිත්සාගාරවලට පැමිණෙන ළමුන් සංඛ්‍යාව වැඩි නිසා මහරගම දන්ත ඇබෑසි විදුහලට වැඩිපුර පුටු සපයන ලදී.

පවුල් සංවිධානය

7. පවුල් සංවිධාන කටයුතු වර්ෂය තුළ දී දැඩි ලෙස කරගෙන යන ලදී. පවුල් සංවිධානය සම්බන්ධව සාකච්ඡාවක් පවත්වන ලද අතර, එයට විදේශීය අමුත්තෝ ද සහභාගි වූහ. **ජාත්‍යන්තර පවුල් සංවිධාන ඒකාබද්ධ සංවිධානයේ**

සභාපති තැන ද මෙම සාකච්ඡාවලට සහභාගි විය. වර්ෂය තුළ දී වෛද්‍ය නිලධාරීන් 36 දෙනෙකු පවුල් සංවිධාන කටයුතුවලට පුහුණු කරන ලදී. ලංකා ස්වීඩන් පවුල් සංවිධාන ක්‍රමය ක්‍රියාත්මක වෙමින් පැවත්වුන අතර පවුල් සංවිධාන වැඩවල වින්නඹු සේවිකාවන් 22 දෙදෙනෙකු පුහුණු කරන ලදී. සංවිධාන ක්‍රමය යටතේ වැඩ කටයුතු යාපන අර්ධද්වීපයේ වැල්වෙට්දුරේ ප්‍රදේශය දක්වා දීර්ඝ කරන ලදී. තවද, මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය දක්වා දීර්ඝ කරන ලදී.

විශේෂ පාඩම් මාලා සමාලෝචනය කිරීම හා පර්යේෂණ

8. "පින්කස්" පෙති පාවිච්චියේ මූලික ප්‍රතිඵල සම්බන්ධ විමර්ශන වෛද්‍යාචාරිනී සින්නතම්බි මහත්මිය විසින් කරගෙන යන ලදී.

ජාත්‍යන්තර ආධාර

9. **(අ) සාමාජික ළමා රෝග විශේෂඥතාවය.**—වර්ෂය තුළ දී දිවයින සෑම තැනකම ග්‍රාමීය සෞඛ්‍ය වැඩ පිළිවෙල ලෝක සෞඛ්‍ය සංවිධානයේ ළමා රෝග විශේෂඥ විසින් කරගෙන යන ලදී.

ආ —පාසල් සෞඛ්‍ය කටයුතු

සංවිධානය

1. කලින් සඳහන් කළ පරිද්දෙන්ම මෙම කටයුතු විශාල රෝහල්වල ළමා රෝග විශේෂඥයින්, පාසල් වෛද්‍ය නිලධාරීන්, පාසල් සෞඛ්‍ය ඇපෝතිකරිවරුන්, සහ බෙහෙත් ශාලා භාර ඇපොතිකරිවරුන් විසින් ඉටු කරන ලදී. මෙම වැදගත් රාජකාරිය ඉටුකිරීම සඳහා ඇති නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ.

2. කටයුතු—ගතවූ වර්ෂයේ දී මෙන්ම මෙම වර්ෂයේ දීත් කටයුතු ඒ ආකාරයෙන්ම කෙරින.

(i) **සෞඛ්‍යාරක්ෂාව.**—පාසල් සෞඛ්‍යාරක්ෂාව, පාසල් සෞඛ්‍යාරක්ෂක වැඩ පිළිවෙලේ වැදගත් අංගයක් විය. මේ සම්බන්ධව වැදගත් කටයුත්තක් ලෙස සැලකූ වැසිකිලි සෑදීමේ කටයුතුවලටත් පාසල් සෞඛ්‍ය පහසුකම් පවත්වා ගැනීමේ කටයුතු වලටත්, බොහෝ ගුරු දෙගුරු සංගම් සහභාගි වුනි.

(ii) **වෛද්‍ය පරීක්ෂණ සහ අඩුපාඩු හරිගැස්සීම.**—ගමන් වියදම් දැරීමේ වැය ශීර්ෂ අඩු කළ නිසා, වර්ෂය තුළ දී පරීක්ෂා කළ පාසැල් සංඛ්‍යාව ඉතාමත් ම අඩුවිය. වර්ෂය තුළ දී පාසල් 2,683ක සංඛ්‍යාවක් පරීක්ෂා කෙරින.

පාසැල් සහ පරීක්ෂාකරන ලද ළමුන් ගණන XXVI වැනි සටහනින් දිස්වේ.

විශේෂ අඩුපාඩු සහ හරිගස්සන ලද අඩුපාඩු ගණන XXVII වැනි සටහනින් දිස්වේ.

ඉ — පෝෂණය

හැටළුව

1. පාසල් නොයන ළමුන් අතර බහුලව පවත්නා මරණ ප්‍රමාණයන් ළමුන් අතර මන්දපෝෂණයට ගොදුරු වූ ප්‍රමාණයන් මුහුණු පෑමට හා විසඳීමට ඇති ප්‍රශ්නයකි. පසුගිය වර්ෂය තුළ දී පවත්වන ලද මහජන සෞඛ්‍ය සංවිධානය මගින් පැවැත්වූ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් වශයෙන් එහි උපකාරක කමිටුව විසින් කමිටුවේ නිර්දේශ ඇමතිතුමා ඉදිරියේ තබා ඇත.

පෝෂණයට අදාල වැඩ කටයුතු

2. (අ) **දවල් ආහාරය**—පසුගිය වර්ෂවල දී මෙන් ම එම කටයුතු ඒ ආකාරයෙන් ම පැවැත්විය. ඇතැම් ප්‍රදේශවල යොදේ රහිත කිරි ජනප්‍රිය නොවූයෙන් යොදේ රහිත කිරි පාවිච්චිය වැඩි කිරීමේ ක්‍රම සම්බන්ධව ඒකාබද්ධ පාඨශාලා සෞඛ්‍ය සංගමය, "කෙයාර්" කිරි නිලෝජිතයන් ගේ සහාය ඇතිව සාකච්ඡා පවත්වන ලදී.

"කෙයාර්" කිරි රස යෙදූ විස්කෝතු බෙදාහැරීම ගැන සලකා බැලුමුත්, පිට පළාත් වල පිටි කෑම වර්ග පිළියෙල කරන්නට මුහුණ පෑමට සිදුවන මුදල් කරදර ගැන සලකා බලා මෙම අදහස ක්‍රියාත්මක නොකරන ලදී.

(ආ) **පෝෂදායකත්වය පිළිබඳ අධ්‍යාපනය—ක්ෂේත්‍රයේ.**—ක්ෂේත්‍රයේ දී සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන සෞඛ්‍ය ශික්ෂකයන් සහ මහජන සෞඛ්‍ය වැඩවල නිරතව සිටින නිලධාරීන් විසින් පෝෂණය සම්බන්ධව විශේෂ සැළකිල්ලක් දක්වා ක්‍රියාත්මක කරන ලදී. නොයෙකුත් විමධ්‍යගත ආයතනවලදී සාකච්ඡා බොහොමයක් පවත්වන ලදී.

(ඇ) **නොමිලයේ කිරි බෙදා හැරීම.**—ජාතික කිරි බෙදාහැරීමේ ක්‍රමය, "කෙයාර්" කිරි බෙදාහැරීමේ ක්‍රමය යන ක්‍රම දෙක යටතේ දෙපාතීමේන්තුව මගින් කිරිබෙදා හරින ලදී.

ජාතික කිරි බෙදා හැරීමේ ක්‍රමය

1. මන්දපෝෂණය ගැබිණි මව්වරුන්ගේ ලේ හිඟවීමට ප්‍රධාන හේතුව විය. සාමාන්‍ය කිරි සහ යොදේ රහිත කිරි පිටි දෙවර්ගයම පාසල් නොයන ළමුන්, ගැබිණි මව්වරුන් සහ කිරි මව්වරුන් අතර, බෙදාහරින ලදී. සමුපකාර කිරිපට්ටි වලින් සහ කිරි මණ්ඩලයෙන් ලබාගත් කිරි සැලකිල්ලට භාජන වූ වර්ෂය තුළ දී මධ්‍යස්ථාන 1931කින් බෙදාහරින ලද අතර, ආහාර කොමසාරිස් ගෙන් මුදලට ලබා ගත් යොදේ රහිත කිරි රු. 403,080ක් මධ්‍යස්ථාන 1,130කින් බෙදා හරින ලදී. මෙම ක්‍රමය යටතේ වර්ෂයේ දී සාමාන්‍ය කිරි සහ යොදේ රහිත කිරි පසින්ට 8,497ක් උපකාර ලබාගත් අයට ලැබිණ.

කිරි මධ්‍යස්ථාන පරිපාලනය කරන ලද්දේ දිස්ත්‍රික් පරීක්ෂකවරුන් සහ සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසිනි. ළමුන් නොකඩවා කිරි මධ්‍යස්ථානවලට පැමිණෙන්නේ ද නැද්ද යන්න සොයා බැලීමත් ඔවුන් එහි පැමිණෙන ලෙස පොළඹවා ගැනීමත් මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන්ට පවරන ලදී.

වර්ෂය තුළ දී කිරි මධ්‍යස්ථාන 1,575ක් ස්වෙච්ඡා ආයතනවලට පවරන ලදී. මෙම ආයතන බොහොමයකම කිරි බෙදා හරින ලද්දේ වේතන ලබන උපස්ථායකයන් යොදවා නොව සහමුලින් ම ස්වෙච්ඡා ක්‍රමයක් උඩ ය.

කිරි බෙදා හැරීමේ විස්තර XXVIII වැනි සටහනින් පෙනේ.

කිරි මණ්ඩලයෙන් ලැබුණු වැඩිපුර කිරි පසින්ට 8,000 බෙදාහැරීම සඳහා ප්‍රදේශ 9ක යොදේ රහිත කිරි බෙදාදීමේ මධ්‍යස්ථාන 578ක් සාමාන්‍ය කිරි බෙදාදීමේ මධ්‍ය ස්ථාන බවට හරවන ලදී. කිරි මධ්‍යස්ථානවල කිරි බෙදා හැරීමේ කටයුතු කාර්‍යක්ෂම ලෙස, ඉටු කිරීම සම්බන්ධව ගත යුතු පියවර ද, පළාතේ ළමයින් වැඩි දෙනෙකුට බොහෝ දුර පයින් යෑමක් නොමැතිව තමන්ට අයිති කිරි ප්‍රමාණය ලබා ගත හැකි වන අයුරු ද දක්වා ඇමති මඩුල්ලේ සැලකිල්ල සඳහා සන්දේශයක් පිළියෙල කිරීම සඳහා ආහාර, සෞඛ්‍ය හා පළාත් ප ලන ආදී දෙපාතීමේන්තුවල නිලධාරීන් ගෙන් සමන්විත වූ කමිටුවක් පත් කරන ලදී.

මේ සම්බන්ධව, වාර්තාවක් ඇමති මඩුල්ලට ඉදිරිපත් කර ඇතත් ඒ ගැන තීරණ යක් මේ වනතුරු ලැබී නැත.

"කෙයාර්" කිරි ව්‍යාපාරය

ලංකාවේ "කෙයාර්" කිරි ව්‍යාපාරය මගින් ප්‍රදානය කරන ලද කිරි, පාසල් නොයවන වයසේ පසුවන ළමයින්; ගැබිනියන් හා කිරි මව්වරුන් ක්ෂය රෝගීන්, ලාදුරු රෝගීන් හා ඔවුන්ගේ ස්පර්ශකයින් අතර බෙදා හරින ලදී. පෙර මෙන්ම මෙය බෙදාහරින ලද්දේ මහජන සෞඛ්‍ය සේවාව යටතේ විවෘත කර ඇති මාතෘ චිකිත්සාගාර හා ළමා ශුභ සාධක චිකිත්සාගාර මගිනි. "කෙයාර්" සංවිධානය මගින් කිරි ටොන් 13,80,726ක් කිරි මධ්‍යස්ථාන 315කින් බෙදා හරින ලදී.

V වැනි පරිච්ඡේදය—වසංගත රෝග විද්‍යාව

හැටළු

1. 1962 වර්ෂයේ මුල් භාගයේ දී වසංගතයක ප්‍රමාණයට පැතිරී ගිය බාලක පක්ෂාඝාත රෝගය ඔක්තෝබර මාසයේ දී අඩුවෙමින් පැවතින. (සේබින් නිපදවූ) මුඛ මාර්ගයෙන් ප්‍රතිකාර කරන බාලක පක්ෂාඝාත ජීවමාන කුඩා විසබීජ එන්නත් (පෝලියෝ මයිලයිටිස් වයිරස් වැක්සින්) දෙවතාවක්ම කුඩා ළමුන් සියලු දෙනාටම පාහේ විශාල වශයෙන් දීම නිසා වර්ෂය තුළ දී ඇති වූ රෝගීන්ගේ ගණන අඩු විය.

ලෝක මහා සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව පාවන රෝග උපදේශක කණ්ඩායම හොරපේ සහ ඔබේසේකර පුරයේ අරඹා තිබූ වැඩ පවත්වාගෙන යන ලදී. මෙසේ කරන ලද්දේ ළමුන් අතර හා වැඩිහිටියන් අතර තිබූ පාවන රෝග ගැන ප්‍රතිකාර කිරීමත් පර්යේෂණ පැවැත්වීමත් සඳහා මහ රෝහලේ, රාගම, අංගොඩ උණ රෝහල, ළමා රෝහල යනාදියේ පැවැත්වූ විශේෂ වාර්තු සංවිධානයට අතිරේක වශයෙනි.

බාලක පක්ෂාඝාත රෝගය

රෝගීන් 293ක මුළු ගණනක් වාර්තා විය. වැඩිම රෝගීන් ගණන වාර්තා වූයේ මඩකළපුවේ සහ බදුල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශවලට අයත් ප්‍රදේශයන් ගෙනි. මෙම කොට්ඨාශ දෙකේ 1962දී ග්ලාන්‍යය අඩු විය. තවද, රෝග පැතිරීම පමාවිය. 1962දී ග්ලාන්‍යය 1,00,000කට 77.22ක් වූ වවුනියා සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශයේ මේ වර්ෂය තුළ දී නව රෝගීන් ගැන වාර්තා නො වී ය. රෝගයට භාජනවන සුළු ළමුන් සියයට 80කට අධික ගණනකට බාලක පක්ෂාඝාත රෝගය සඳහා එන්නත් කරන ලදී.

අඩුම රෝගීන් ගණන වාර්තා කළේ —

මාතර සෞ. සේ. අධි—1
කළුතර සෞ. සේ. අධි—2
පුත්තලමේ සෞ. සේ. අධි—2
අනුරාධපුර සෞ. සේ. අධි—3
කෑගල්ලේ සෞ. සේ. අධි—3

මුළු දිවයිනේම ග්ලාන්‍යය ප්‍රමාණය 1961-62 වර්ෂය තුළ දී 1,00,000කට 15.9ක් වූ අතර 1962-63 වර්ෂයේ දී 1,00,000කට 2.7ක් විය.

බාලක පක්ෂාඝාත රෝගීන් පරීක්ෂණය යටතේ සිටීම

රෝගියාගේ රෝග ලක්ෂණ හා ඔවුන්ගේ පරිසරයට අදාල වන කරුණු ගැන සලකා 1962 වර්ෂයේ දී රෝගය වැළඳුණු සෑම කෙනකුම සුපරීක්ෂාකාරීව විමර්ශනය යට භාජන කරන ලදී.

පුනරුත්ථාපන කටයුතු

1962 වර්ෂයේ දී රෝගය හටගත් අයගේ රෝගය සුවවීමෙන් පසු දුරට ඔවුන්ට අංශභාගය තිබේද යන්න සොයා ගැනීම් වස් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ සහ සෞඛ්‍ය කොට්ඨාශය භාර නිලධාරියාගේ සහයෝගය ඇතිව සමීක්ෂණයක් පවත්වන ලදී. සමීක්ෂණයේ දී අනාවරණය වූයේ මෙසේ ය.

අපහසුකම්වල තත්ත්වය	රෝගීන් ගණන	සියයට ගණන
1. කිසිවක් නොමැති	569 ...	42.1%
2. සුළු වශයෙන්	374 ...	27.6%
3. මධ්‍යස්ථ	256 ...	18.9%
4. අධික	153 ...	11.3%

මෙම රෝගීන්ට ප්‍රතිශක්ති කරණය ඉටු කිරීම පිණිස කොළඹ ළමා රෝහලේ සහ මිහනුවර, ගාල්ල, යාපනය හා රත්නපුර රජයේ රෝහල්වල පහසුකම් සලසා දෙන ලදී.

බහුල වශයෙන් ප්‍රතිශක්ති කරණය කිරීමේ වැඩ පිළිවෙල

රෝගීන් ස්වල්ප දෙනකුට මුඛය මාර්ගයෙන් ගන්නා බාලක පක්ෂඝාත ජීවමාන කුඩා විසබීජ එන්නත (ලයිව් පොලියොමයිලිටිස් වයිරස් වැක්සින්) දීමෙන් ප්‍රතිශක්ති කරන වැඩ පිළිවෙල සාර්ථක අන්දමින් පවත්වන ලදී.

1962 වර්ෂයේදී මුළු දිවයිනේම සියයට ගණන වූයේ

	මාස 3 සිට අවුරුදු 5	අවුරුදු 6-15
පළමුවැනි මාත්‍රාව	49... ...	59%
දෙවැනි මාත්‍රාව	31... ...	41%

ඇතැම් සෞඛ්‍ය ප්‍රදේශවල රෝගයට භාජන විය හැකි ජනගහනයෙන් 80%කට ප්‍රතිශක්තිකරණය ඉටු කරන ලදී.

1962 වර්ෂයේදී ප්‍රතිශක්ති කරණ වැඩ ඵලදායක නොවූයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් වෛද්‍යාචාර්ය ඇල්බට් එස්. සේබින් මහතා ගේ උපදෙස් පතන ලදී. 1962 ජනවාරි මාසයේ දී වෛද්‍යාව යෂී සේබින් මහතා දිවයිනට පැමිණ රෝගය හට ගැනීම සම්බන්ධව සම්පූර්ණ දැණුමක් ලබාගෙන 1963 වර්ෂයේ දී ඉටු කිරීම පිණිස පහත දැක්වෙන අයුරින් ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙලක් නිර්දේශ කරන ලදී.

1962 වර්ෂයේදී ළමුන්ගෙන් 95%කට ම බාලක පක්ෂාඝාත රෝගය වැළඳී තිබුණේ මාස 3 සිට අවුරුදු 8 දක්වා වයසැති අයට නිසා මේ වයස් සීමාවේ සෑම දෙනාටම ප්‍රතිශක්තිකරණ ඉටු කිරීම.

(1) 1962 වර්ෂය තුළදී එන්නත් නොලැබූ වයස මාස 3 සිට අවුරුදු 8 දක්වා සියලුම ළමුන්ට සති 6-8ක අතරතුරේ දී මාත්‍රා දෙකක් දීම.

(2) 1963 වර්ෂයේ එකක් හෝ දෙකක් හෝ මාත්‍රා ලැබූ ළමුන් සියලු දෙනාම එක මාත්‍රාවක් ලැබිය යුතු ය.

(3) ළඟදී උපදින සියළුම ළමුන්ට මාස 3කින් පසු පළමුවැනි මාත්‍රාව ද සති 6-8 කින් පසු දෙවැනි මාත්‍රාව ද වර්ෂයකින් පසු (කිරි වැරු විගසම) තුන්වැනි මාත්‍රාව ද දිය යුතු ය.

වෛද්‍යාචාර්ය සේබින් මහතාගේ නිර්දේශ දෙපාර්තමේන්තුව විසින් පිළිගන්නා ලද අතර 1963 මැයි සහ ජූලි මාසවල දිවයින මුළුල්ලේම ජාතික ප්‍රතිශක්ති කරන ව්‍යාපාරයත් ගෙන යාමට තීරණයක් ගන්නා ලදී. වෛද්‍යාචාර්ය සේබින් මහතා විසින් උපදෙස් දුන් පරිදි ප්‍රතිශක්තිකරණ ව්‍යාපාරය දින දහයක් තිස්සේ පැවැත්විය. මෙම ව්‍යාපාරයේ විශේෂ අංගයක් වූයේ සම්පූර්ණයෙන්ම ස්වේච්ඡා සේවක පිරිසකින් සමන්විත වූ සංවිධානාත්මක සෞඛ්‍ය අධ්‍යාපන ව්‍යාපාරයක් තිබීම යි.

දියාරු මැග්නීසියම් ක්ලොරයිඩ් ස්ටැබිලයිස් (ඝනවූ) ටයිවේලන්ට් (තුන් වර්ගයක) සේබින් එන්නත් බෙහෙත් එන්නත් කිරීමට පාවිච්චි කරන ලදී. මෙම බෙහෙත රුසියාවෙන් ලබා ගන්නා ලදී. විශේෂයෙන් ම සීතකරණ පහසුකම් නොමැති ප්‍රදේශවල මෙය පහසුවෙන් එන්නත් කළ හැකිය.

වසූරිය

රෝගය විශාල වශයෙන් පැතිරීයාමෙන් රට වැලකී තිබිණ. ජා-ඇල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයට අයත් කඳාන ප්‍රදේශයට මෑතකදී ඉන්දියාවෙන් පැමිණි අයකුට 1963 ජනවාරි මාසයේ දී, වරිසූය රෝග ලක්ෂණ ඇති පළු මතු වී තිබුණි. රෝගියා සහ ස්පර්ශකයන් අංගොඩ උණ රෝහලේ වෙන් කර තබන ලදී.

ටයිපොයිඩ් (උණ සන්නිපාතය)

රෝගය සාමාන්‍යයෙන් පැතිර පවත්නා ක්‍රමයට වඩා දැඩි වෙනසක් දක්වමින් රෝගය ඉස්මතු නොවීය.

රෝහල්වල දී ප්‍රතිකාර කරන ලද රෝගීන් හා සෞඛ්‍ය කාර්යාලවලට දැනුම් දුන් රෝගීන් අතර විශාල වෙනසක් දක්නට ලදී. 1962-1963 වර්ෂය තුළ දී දැන ගැනීමට ලැබුනේ 64%කි. රත්නපුර හා මාතර සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශවලින් වාර්තා වුන රෝගීන්ගේ සංඛ්‍යාව වැඩි වෙමින් පැවතින. රත්නපුර අටකලන්පැන්න සෞඛ්‍ය කාර්යාලයෙන් වැඩිම රෝගීන් සංඛ්‍යාවක් වාර්තා කෙරින. මෙම ප්‍රදේශය සම්බන්ධව පවත්වන ලද විශේෂ පරීක්ෂණයේ දී අනාවරනය වූ දැය මෙසේ දැක්විය හැක:

(1) මද වශයෙන් දිගටම පැවති උණ ගැන නියම අයුරින් පරීක්ෂාකර බලා නොමැත.

(2) වලවේ ගඟ නිම්නයේ මැණික් ගරන්නන් අතර ටයිපොයිඩ් උණෙන් පෙලුණු අය සිටි බැව් පෙනින.

මාතර සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශයේත් මෙවැනි පරීක්ෂණ පවත්වනු ලැබේ. ටයිපොඩිඩ් උණ වැළඳීමේ සිතීන් සමගම මද වශයෙන් නො කඩවා උණ ගැනීමේ සිතීන් ද මෙම ප්‍රදේශ දෙකෙහි සීඝ්‍ර වශයෙන් තිබුණි. මේවා ටයිපොයිඩ් උණ හෝ වේවා ලෙප්ටොස්පයිරෝසිස් වැනි වෙනත් රෝගයක් හෝ වේවා මේ ගැන පරීක්ෂණ පැවැත්විය යුතු යි. පසුගිය වර්ෂ පහ තුළ දී රජයේ රෝහල්වල දී ප්‍රතිකාර කළ ටයිපොයිඩ් උණ රෝගීන්ගේ ග්ලානත්‍ය—ප්‍රමාණය XXIX වැනි සටහනින් දැක්වේ.

බෝවෙන යකෘත්දහය

දිවයිනේ බෝවෙන යකෘත්දහය පැතිර පවත්නා ක්‍රමය XXX වැනි සටහනින් දැක්වේ. ලංකාවේ තෙත් හා සම දේශගුණයක් ඇති කලාපයන් ලෙස හැඳින් විය හැකි කුරුණෑගල, කෑගල්ල සහ මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාසවලට අයත් ප්‍රදේශවල වැඩි වශයෙන් ම මෙම රෝගය පැතිර පවත්නා බැව් අනාවරනය විය.

සංවිධානය

(2) පශ්චාත් උපාධි පාඩම් කටයුතු නිමාකොට දිවයිනට පෙරලා පැමිණි සහකාර වසංගත රෝග විද්‍යාඥ ආන්ත්‍රික රෝග සම්බන්ධ විමර්ෂණයක් පැවැත්වීමේ වගකීම බාරගත්තේ ය.

තව ද, හොරපේ සහ ඔබේසේකරපුරයේ ආරම්භ කර තිබූ පාචන රෝග මැඩීමේ ව්‍යාපාරයේ වැඩ කටයුතු සොයා බැලීමේ වගකීම ද බාරගත්තේ ය.

වැඩ කටයුතු

(3) **පාචන රෝග මැඩීමේ වැඩ කටයුතු.**—ලෝක සෞඛ්‍ය සංවිධානයේ පාචන රෝග උපදේශක කණ්ඩායමේ වාර්තාව 1963 අගෝස්තු මාසයේ දී නිකුත් කරන ලදී. කණ්ඩායම විසින් නිර්දේශ කර තිබූ අයුරින් වසංගත රෝග විද්‍යාත්මක ආයතනයේ උපදෙස් ඇතිව හොරපේ හා ඔබේසේකරපුරයේ ආරම්භ කර තිබූ ව්‍යාපාරයේ වැඩකට යුතු සොයා බලන ලදී. ළමා රෝග විශේෂඥයකු ගේ පරිපාලනය යටතේ පාචන රෝග සම්බන්ධව සොයා බැලීම සඳහා රාගම රජයේ රෝහලේ විශේෂ වාට්ටුවක් වෙන්කර තබන ලදී. එහි වැඩ කටයුතු සතුටුදායක අන්දමින් ඉටුවිය. තවද, අංගොඩ උණ රෝහලේ දී සහ කොළඹ ළමා රෝහලේ දී විශේෂ වැඩ කටහුතු මාලාවක් කරගෙන යනු ලැබිය. ලෝක සෞඛ්‍ය සංවිධාන, පාචන රෝග උපදේශක කණ්ඩායමේ නිගමනයන්හි සමහරක් නම් :—

(1) අවුරුදු දහය දක්වා ළමුන්ගේ ගුද මාර්ගයෙන් මාත්තු ගෙන ශාඛානු විද්‍යාත්මක පරීක්ෂා කිරීමේ දී අනාවරනය වූයේ නිශ්චිත වශයෙන් 4.1%ක ෂිගේලා, 0.8% සැමොනෙලා 0.6%ක පැතොජේනික් ඊ කෝලයි හොරපේ ගමේ ළමුන්ට තිබීමත් ඔබේසේකර පුරයේ ළමුන්ට 3.8%ක ආමාශයේ බැක්ටීරියා රෝගය තිබීමත් ය.

(2) පරිපෝෂිතාත්මක පරීක්ෂණයේ දී අනාවරණය වූයේ හෙල්මින්ත්ස් (පණුවන්) බෝවීමේ ප්‍රමාණය අධික බවයි. ජීවිතයේ දෙවැනි වර්ෂය තුළ දී පණු දුහණය ඇතිවන බැව් අනාවරණය විය.

හොරපේ	—	25%කට එක වර්ගයේ බෝවීමක්
		38%කට දෙවර්ගයේ බෝවීමක්
		16% කට තුන් වර්ගයේ බෝවීමක්
		19.4%කට බෝවීමක් තිබුණේ නැත.
ඔබේසේකර පුර	—	46%කට එක වර්ගයේ බෝවීමක්
		32%කට දෙවර්ගයේ බෝවීමක්
		5%කට තුන් වර්ගයේ බෝවීමක්
		17.7%කට බෝවීමක් නොතිබිණ.

ළමා රෝහලේ දී පැවැත්වූ ශාඛානු විද්‍යාත්මක් පර්යේෂණයේ දී අනාවරණය වූයේ

සිගෙල්ලා 4.5% නිශ්චිත

සැල්මොනෙල්ලා 28%

පැතජෙනික් ඊ කෝලි 20.7%

සැල්මොනෙල්ලා හා සිගෙල්ලා 3.8%

ෂිගෙල්ලා වර්ගය 78% ක්ම සල්පොනෙමයිඩ්ස්වලට ඔරොත්තු දෙන බවත්, 10% ක් ප්‍රතිජෛවකයට ඔරොත්තු දෙන බවත්, සැමොනේලා සල්පොනෙමයිඩ්ස්වලට සහ ප්‍රතිජෛවකයට ඔරොත්තු දෙන බවත් පෙනින. පැතොජෙනික් ඊ. කෝලයි 85%ක්ම සල්පොනෙමයිඩ්ස්වලට ඔරොත්තු දෙන අතරම ප්‍රතිජෛවකයට තරමක් ඉවසන බැව් පෙනින.

රෝහල්වල තබා තිබූ සංඛ්‍යා ලේඛන හා රිජිස්ට්‍රාර්ජනරාල් තැනගේ වාර්තාවලින් ලබාගත් කරුණු උඩ ගිලන් භාවය හා මරණ සම්බන්ධ සංඛ්‍යා ලේඛන පරීක්ෂණයක් ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් කරන ලදී. සමහර වැදගත් සොයා ගැනීම් මෙසේ ය.

(1) අවුරුදු 1 සිට අවුරුදු 5 දක්වා වයස් ප්‍රමාණවල මරණ වලින් 24%ක් සිදු වන්නේ ආන්ත්‍රික රෝගවලිනි.

(2) පාචන රෝගය වැඩිම වශයෙන් දක්නට ලැබුනේ වවුනියා, අනුරාධපුරය, පුත්තලම සහ කුරුණෑගල සෞඛ්‍ය සේවා කොට්ඨාසවලට අයත් ප්‍රදේශවල ය.

(3) පණු දූහණය වැඩි වශයෙන් දක්නට ලැබුණේ මාතලේ, කෑගල්ල සහ රත්නපුර ප්‍රදේශවල ය.

(4) අන්තක රෝගවලින් 3/4ක් ජඨරාන්ත්‍රදාහය විය. ගිලන් භාවය වැඩිම ප්‍රමාණය වූයේ වවුනියා කොට්ඨාසයෙහි ය.

(5) පාචන රෝගයේ හා හෙල්මින්තිස් (පණු) රෝගයේ එකතුව ගත් කළ වැඩිම ගිලන් භාවය දැක්වූයේ වවුනියා, කෑගල්ල, පුත්තලම, කුරුණෑගල මාතලේ සහ රත්නපුර කොට්ඨාසවල ය.

(6) සන්නිපාත උණ රෝගය වැඩිම ලෙස තිබුණේ රත්නපුර, කොළඹ, වවුනියා සහ බදුල්ල ප්‍රදේශවල යි. පයිරෙක්සියා රෝගය බහුල වශයෙන් තිබුණේ මාතර, රත්නපුර, අනුරාධපුරය සහ වවුනියා ප්‍රදේශවල යි.

(7) රෝහල්වලට ඇතුළුව ප්‍රතිකාර ලැබූ රෝගීන්ගෙන් 20%කට විසබීජ හෝ පණුවන් හෝ මගින් හටගත් ආන්ත්‍රික රෝග වැළඳී තිබුණි.

හොරපේ ගම

(1) පාසල් නොයන ළමුන්ට වැසිකිළි සැපයීම.

(2) වැඩි හිටියන්ට වැසිකිළි සැපයීම.

(3) මෙම ගමේ ඇති පාසල් දෙකට වතුර පොම්ප සවි කිරීම.

(4) සෞඛ්‍ය අධ්‍යාපනය

(5) දික් සමීක්ෂණය.

සඳහන් වන සෞඛ්‍ය පහසුකම් සැපයීම හා සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ වැඩවල සැලකිය යුතු දියුණුවක් දක්නට ලදී.

ප්‍රතිශක්ති කරණ කමිටුව

ඩිප්තිරියා (ගලපටලය), පිටගැස්ම, කක්කල් කැස්ස, හා වෙනත් රෝග සඳහා ළමුන්ට විශාල වශයෙන් ත්‍රෙළුන්නත ලබා දීමේ වැඩ පිළිවෙළක් සම්බන්ධව වාර්තා කරන ලෙස සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරන ලද කමිටුවේ වාර්තාව සැප්තැම්බර් මාසයේ දී ඉදිරිපත් කරන ලදී.

බස්නාහිර පළාතේ සෞඛ්‍ය කොට්ඨාසවලට අයත් ප්‍රදේශයේ දරක අභිවෘද්ධි චිකිත්සාගාරවල දී සිරිත් පරිදි ඩිප්තීරියා, පිටගැස්ම හා කක්කල් කැස්ස සඳහා ප්‍රතිශක්ති කරණ ත්‍රෙ එන්නත ළමුන්ට ලබා දීමත් අවශ්‍ය බැව් කමිටුව නිර්දේශ කර තිබුණි. රෝහල්වල විශේෂ චිකිත්සාගාර පවත්වන ළමා රෝග විද්‍යාඥ විසින් මෙම වැඩ කටයුතු ද ඉටු කළ යුතු ය.

පිට ගැස්ම ධූලකාහයෙන් පාසැල් ළමුන් ප්‍රතිශක්ති කරනය කිරීම ද නිර්දේශ කර ඇත.

වෛද්‍ය සේවයේ යෙදී සිටින අයගේත් මහජනයාගේත් දැන ගැනීම සඳහා ප්‍රතිශක්ති කරන උප ලේඛනයක්ද පිළියෙල කර ඇත.

කායික සේවකයින් අතර දියවැඩියාව පැතිරීම සම්බන්ධව පරීක්ෂා කර බැලීම

ශරීරය වෙහෙසව වැඩ කරන කම්කරුවන් අතර දියවැඩියාව පැතිර පවත්නා අයුරුත් රුධිර පීඩනය ගැනත් දැන ගැනීම සඳහා රත්මලානේ දුම්රිය කම්හලේ 1961 දී සමීක්ෂණයක් පැවැත්වීමට පටන් ගන්නා ලදී. මහා ලේකම් ගොඩනැගිල්ලේ සේවයෙහි නියුතු කායික සේවකයින් සම්බන්ධවත් එවැනිම පරීක්ෂණයක් මේ වර්ෂයේ ජූලි මාසයේ දී ආරම්භ කෙරින. පළමුවෙන් වෛද්‍ය දෙපාර්තමේන්තුවේ සේවකයින් පරීක්ෂා කරන ලදී. සිය කැමැත්ත පරිදි 131 දෙනකු පරීක්ෂා කරන ලදුව ඔවුන් අතුරෙන් 8 (6.1%) කුට ග්ලූකෝස්යුරියා තිබූ බැව් අනාවරණය විය. මෙම අය තවදුරටත් පරීක්ෂා කිරීම පිණිස දියවැඩියාව චිකිත්සාගාරයට යවන ලදී. සිය කැමැත්තෙන් ඉදිරිපත් වූ අයගේ සංඛ්‍යාව එතරම් සතුටුදායක නොවී ය.

වසූරිය වැළැක්වීමේ එන්නත් කිරීම

එන්නත් වැඩ පිළිබඳ විස්තර :—

මූලික—2,15,298

ද්විතියික—සියලුම වයස්වලට 64,215

උණසන්නිපාතය වැළැක්වීමේ ප්‍රතිශක්ති කරණය

ප්‍රතිශක්ති කරණ ගණනාව :—

පළමුවැනි මාත්‍රාව 1,87,229

දෙවැනි මාත්‍රාව 1,37,725

ආරක්ෂක මාත්‍රාව 1,28,759

රෝග සුව කිරීරෙම් කටයුතු—අංගොඩ උණ රෝහල

උණ රෝහලේ ඉදි කරන ලද රසායනාගාරයේ වැඩ ආරම්භ කෙරින. ශාකානු විද්‍යාව පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදේශක සැප්තැම්බර මාසයේ දී දිවයිනට පැමිණි අතර රෝහලේ අවශ්‍යතාවන් ශාකානු විද්‍යාත්මක සේවයකින් සපුරාලීම සඳහා වැඩ පිළිවෙළක් සංවිධානය කරගෙන යනු ලැබේ. පාචන රෝගනිවාරණ කට යුතුවලට මෙය මහෝපකාරී වනවා ඇත. වෛද්‍ය විද්‍යාලයේ (වෛද්‍ය අංශයේ) ඖෂධ විද්‍යා අංශයේ සහාය ඇතිව දැනට කරගෙන යන ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණයට ද මෙය උදව්වනවා ඇත.

අධ්‍යාපනය

4. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් කණ්ඩායම් දෙකක් පුහුණු කිරීමේ වැඩ පිළිවෙලටත් මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් ගේ එක කණ්ඩායමක් පුහුණු කිරීමටත් අධ්‍යාපන අංශය උපකාරි විය.

බෝවෙන සුළු රෝග ඇතිවීම

5. අතිසාරය සුළු වශයෙන් හටගත් බවට නොයෙක් පළාත්වලින් වාර්තා කෙරින.

(1) 1962 දෙසැම්බර අවසානයේ දී කොලොන්න කෝරලේ මොරගොඩ අතිසාරය හටගන්නා ලදි. රෝගීන්ගේ ප්‍රමාණය 45%ක් ලෙස දක්වමින් අවුරුදු හතරට අඩු වයස් සීමාවල ළමුන්ට රෝගය වැඩි වශයෙන් වැළඳී තිබුණු, අතර රෝගීන්ගේ ප්‍රමාණය 8%ක් ලෙස දක්වමින් අවුරුදු 10-29 දක්වා වයස් සීමාවල අයට රෝගය අඩුම වශයෙන් වැළඳුනි. රෝගය හටගැනීම පැවතුණේ මාසයක් තුළ දී පමණ ය. රෝග ස්පර්ශයෙන් රෝගය පැතුරුණු බවත් රෝගය පැතිරීමට හේතුවූයේ ආකීර්ණ ජනාවාසය හා පෞද්ගලික පහත් සෞඛ්‍ය තත්ත්වය බවත් කිව හැක. රෝග ලක්ෂණවලින් බැසිල අතිසාරය තිබූ බැව් පෙනී ගියත් ශාඛානු විද්‍යාත්මක පරීක්ෂණයට භාජන කළ 19 දෙනා තුළ රෝගය තිබූ බැව් අනාවරණය නොවී ය. ආයතනය මගින් විමර්ෂණයට ලක් කරන ලද එකම රෝගය මෙයයි.

(2) බදුල්ලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ කොට්ඨාශයට අයත් නමුනුකුල, කරවැනැල්ල වතුයායේ අතිසාරය හටගත් බැව් වාර්තා කෙරින. මුළු ගණන 137ක් වන සේ ජූනි, ජූලි හා අගෝස්තු මාසවල පිළිවෙලින් රෝගීන් 41,266 හා 29 දෙනෙකු සිටි බැව් දැන ගන්නට ලැබින.

වතුයායේ දුරින් දුර පිහිටියා වූ ද නා නා ජල වහන පෙදෙස්වලින් ජලය නල මාර්ගයෙන් ලැබෙන්නා වූ ද ලැයින්වල මෙම රෝගීන් ඇති වූ බැව් පෙනේ. මෙයින් පෙනී යන්නේ මෙම රෝගය ස්පර්ශයෙන් පැතුරුණු බවයි. 1962 වර්ෂය තුළ දී වතු යායේ මෙම රෝගය වැළඳුන රෝගීන් 142 දෙනෙකු සිටි බැව් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වාර්තා කළේ ය.

(3) අම්පාරේ, සෞඛ්‍ය කාර්යාල කායශිභාර, නිලධාරිගේ කොට්ඨාසයට අයත් බක්මිටියේ රෝගීන් 31 දෙනකු සිටි බැව් වාර්තා විය. ගමේ කිරි බෙදා හැරීමේ මධ්‍යස්ථාන කායශිභාර නිලධාරිගේ නිවසේ පළමුවැනි රෝගීන් තිදෙනා ඇති වූ බැව් කියවේ. එබැවින්, ගමේ අනික් තැන්වලට රෝගය බෝවිය ගිය බැව් පෙනේ.

විශේෂ අධ්‍යයන හා සමීක්ෂණ

6. පාචන රෝග අධ්‍යයනය, මේහ (දිය වැඩියාව) සමීක්ෂණය හා රුධිර පීඩන අධ්‍යයනයට අතිරේකව ඉටු කරන ලද වැඩ මෙසේ වේ:—

(1) ලංකාවේ බාලක පක්ෂාඝාත රෝග වසංගතය, 1962 වර්ෂයේ හට ගැනීම.

(2) 1962 බාලක පක්ෂාඝාත රෝග ප්‍රතිශක්ති කරණ වැඩ පිළිවෙල පරීක්ෂා කිරීම

(3) ලංකාවේ ඩිප්තීරියා වසංගතය.

(4) රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාසයේ හටගත් ටයිපොයිඩ් උණ රෝගය සම්බන්ධව අධ්‍යයන කටයුතු.

ජාත්‍යන්තර නිරෝධායනය

7. (අ) **සාමාන්‍ය.**—තලෙයිමන්නාරම නව නිරෝධායන රෝහල 1963 ජනවාරි මස 31 වැනි දින ආරම්භකරන ලද අතර මන්ඩපම් කඳවුරේ කටයුතු නතර කරන ලදි. ආරම්භයේ දී අගහිඟකම්වලට මුහුණ පෑමට සිදුවූ නමුත්, වර්ෂය තුළ දී තලෙයිමන්නාරමේ පාලන කටයුතු සතුටුදායක අන්දමින් වැඩි දියුණු විය.

එතෙකුදු වුවත්, මන්ඩපම් කඳවුර බාර ගැනීමට ඉන්දියා ආණ්ඩුව සතුටුදායක අයුරින් විධි විධාන නොසැලැස්වූයෙන් එය, එම ආණ්ඩුවට බාර දීමට නොහැකි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම කඳවුර ආරක්ෂා කිරීමත්, නඩත්තු කිරීමත් යන කරුණු දෙක පදනම් කරගෙන ලංකාණ්ඩුව මගින් රැකබලා ගනු ලැබේ.

වර්ෂය තුළ නීති විරෝධි ලෙස මෙරටට පැමිණි අය 3,058 දෙනෙක් අල්ලා ගන්නා ලදී. පසුගිය වර්ෂය හා සසඳා බලන කල මෙම වර්ෂයේ දී ගණන දෙගුණයක් වී ඇත.

පරීක්ෂණය යටතේ තැබූ නාවිකයන් හා මගියන් අතර නිරෝධායන පාලනයට යටත් විය යුතු රෝග සොයා නොගන්නා ලදී.

(ආ) **වැඩ කටයුතු.**—(1) කොළඹ වරාය-නැව් ගමනා ගමනය මුළු ගණන, 2,687ක නැව් ප්‍රමාණයකට(ප්‍රැටික්) නැව්තොට අවසරය දෙන ලදී. මේවා අතුරින් තෙල් හා තැප් මගින් ක්‍රියාකරවන නැව්, 1,906ක් ද රුවල් නැව් 781ක් ද වෙනත් පාරු ද වූහ. ගුවන් ප්‍රැටික් අවසරය 116කට දෙන ලදී.

පරීක්ෂණය යටතේ මගින් 24,774 දෙනෙක් තබන ලදී. මේ අය අතුරින් 289 දෙනකු නියමිත දිනයන්හි නොපැමිණියෙන් ඔවුන්ට විරුද්ධව නියම අන්දමින් කටයුතු කරන ලදී. නොපැමිණි තැනැත්තන්ට රු. 172/-ක මුදලක් අහිමි විය. මෙම මගින් අතර නිරෝධායන පාලනයට යටත් විය යුතු රෝගියකු සොයා නො ගන්නා ලදී.

වසූරිය සඳහා, 7,548 දෙනකුට ද, කොලරා සඳහා 10,102 දෙනකුට ද ටී. ඒ. බී සඳහා 95 දෙනකුට ද කහ උණ සඳහා 531 දෙනකුට ද බෙහෙත් එන්නත් කරන ලදී. මේ මාර්ගයෙන් රු. 40,000.25ක මුදලක් ආදායම වශයෙන් එකතු විය. මෙය පසුගිය වර්ෂයේ ලැබුණු ආදායමට වඩා රු. 10,000/-ක් විය.

කිලුටු රෙදි වලට විෂබීජ නාශක බෙහෙත් ඉසීම සඳහා අයකළ බදු මුදල වූ රු. 3,899/- ආදායමට එකතු කරන ලදී.

බත්තල්වල, තත්ත්වය ඉතාමත් අසතුටුදායකය. බත්තල් 21කින් සහ මීටර් 8කින් වතුර සැම්පල් ගෙන නගරයේ සූක්ෂම ජීව විද්‍යාඥ විසින් පරීක්ෂා කිරීමේ දී පෙනී ගියේ ඒවා සතුටුදායක බවයි.

පොහොර ගබඩාව දැනට තිබෙන ස්ථානයෙන් ඉවත් කරන ලෙස වරාය සංයුක්ත මණ්ඩලයෙන් ඉල්ලා සිටින ලදී. මෙය අත්‍යවශ්‍යය.

වරාය සංයුක්ත මණ්ඩලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ පරිපාලනය යටතේ දෙපාර්තමේන්තුවේ කම්කරුවන් දෙදෙනකුගේ සහාය ඇතිව මීයන් වද කිරීමේ කටයුතු පැවැත්විය.

නැව් ගුදම්වලදී නාවික බඩුවලට අයත් හාල් මළු 60,52,307 කට ද වෙනත් වෙළඳ බඩු අඩංගු මළු 14,174කට ද වර්ෂය තුළ දී දුම්ගසන ලදී. මේ හැර හාල් මලු 2,94,054 කට ද වෙනත් වෙළඳ බඩු අඩංගු මළු 6,41,099කට ද කපු මිටි 77කට ද දුම්ගැසීම සඳහා පාවිච්චි කරන ලද එච්සිඑන් ගෑස් මුළු ප්‍රමාණය රාත්තල් 11,629ක් විය. නාවික බඩු දුම් ගැසීමෙන් ලැබුණු මුළු ආදායම රු. 2,64,385/31ක් විය.

වරාය ප්‍රදේශයේ සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධව වගකීම නිලධාරීන් කිහිප දෙනෙකු සතුව තිබුණි. මෙම කාර්‍ය්‍ය එක බලධාරියකු වෙත පැවරීමේ අවශ්‍යතාව නැවත වතාවක් මෙහිලා සඳහන් කිරීම වටී. වරාය ප්‍රදේශයේ සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධව වරාය සෞඛ්‍ය නිලධාරීන් විසින් වාර පරීක්ෂණ පවත්වන ලදී.

වරාය කොමිසමේ මහජන සෞඛ්‍ය නිලධාරීන් විසින් මදුරුවන් මැඩලීමේ වැඩ කටයුතු කරන ලදී. කීට විද්‍යා සහකාර විසින් "ඊඩිස්" සමීක්ෂණයක් පවත්වන ලදි. වාර දහයකින් ස්ථාන 2,902ක් පරීක්ෂා කෙරින. මේවා අතුරින් ස්ථාන 329ක් (එනම් 11.3%) නිශ්චිත වශයෙන් මදුරුවන් ලගින ඒවා විය. නිශ්චිත වශයෙන් මදුරුවන් සිටින ස්ථානවලින් මදුරුවන් 1,585ක් එකතු කරගන්නා ලදි. මෙසේ එකතු කර ගන්නා ලද මදුරු පහත සඳහන් අයුරින් වර්ග කළ හැක:—

ගෝත්‍රය හා වර්ගය	එකතු කළ ප්‍රමාණය	සියයට ගණන
ඒ(එස්) ඇජිප්ට	518	32.7
ඒ(එස්) ඇල්බොපික්ටස්	39	1.4
සී පැටිගන්ස්	1,011	64.8
වෙනත් අය	17	1.1

වර්ෂය තුළ දී, මදුරුවන් බෝවෙන ස්ථානවලින් පිළවුන් 2,046ක් එකතු කර පරීක්ෂා කර බලන ලදී.

පහත සඳහන් වර්ගවලට ඔවුන් වෙන් කළ හැක:—

ගෝත්‍රය හා වර්ගය	එකතු කළ	සියයට ගණන
ඒ(එස්) ඇජිප්ට	636	40.9
ඒ (එස්) ඇල්බොපික්ටස්	320	15.6
සී පැටිගන්ස්	863	42.3
වෙනත් අය	25	1.2

නොයෙක් වර්ගයේ මදුරුවන් බෝවන තැන් මෙසේ දැක්විය හැක:—

ඒ(එස්) ඇජිප්ට, ටයර්, යන්ත්‍ර කොටසේ, බැරල්, සිමෙන්ති වලවල්
ඒ(එස්) ඇල්බොපික්ටස්, ටයර්, ටින්, බැරල්
සී පැටිගන්ස්—බෝට්ටු, කානු, සිමෙන්තිවලවල්, බිම්වල වල්, යන්ත්‍ර කොටස්, යකඩ, මහා බාල්ක

වර්ෂය තුළ දී වරායේ පාවෙමින් තිබූ නානා විධ පාරු පරීක්ෂා කර බලන ලදී. පරීක්ෂණ වාර දහයක දී පහත දැක්වෙන ප්‍රතිඵල ලැබිණ.

පාරු 228ක් පරීක්ෂා කෙරින

ඒ(එස්) ඇජිප්ට	305
ඒ(එස්) ඇල්බොපික්ටස්	7
සී පැටිගන්ස්	17
වෙනත් අය	1

පරීක්ෂා කරන ලද පාරු 228න් 25ක් මදුරුවන් ලගින නිශ්චිත ස්ථාන විය. ඒවායින් වැඩි ගිය මදුරුවන් 330 ක් එකතු කරන ලදී. ඉහත දක්වා ඇත්තේ ඒවායේ විග්‍රහ යයි.

පාවෙන පාරුවල බෝවෙන ස්ථාන 437ක් පරීක්ෂා කර බලන ලදී. මේවායින් 15ක් නිශ්චිත ස්ථාන විය. මේවායින් පිළවුන් 129ක් එකතු කරන ලදී. මේවායේ වර්ග මෙසේය:—

ඒ(එස්) ඇජිප්ට	46
ඒ(එස්) ඇල්බොපික්ටස්	21
සී පැටිගන්ස්	62

(ii) **වෙනත් වරායවල්.**—ගාල්ල, ත්‍රිකුණාමලය, තලෛමන්නාරම සහ කයිට්ස් වරායවලට ඇතුල්වීමට අවසර පත්‍ර (පැට්‍රික්) 653ක් දෙන ලදී. වෙනත් කුඩා වරායවලට ඇතුල් වීමට ද අවසර පත්‍ර දෙන ලදී.

(iii) **තලෙයිමන්නාරමේ නිරෝධායන රෝහල හා කඳවුර.**—මීට කලින් දකුණු ඉන්දියාවේ මන්ඩපම් කඳවුරේ දී කරන ලද නිරෝදායන වැඩ කටයුතු තලෙයිමන්නාරම නිරෝධායන රෝහලේ දී හා කඳවුරේ දී කරගෙන යනු ලැබේ. එහෙත්, නාවිකයින්ට විෂබීජ නාශක බෙහෙත් ඉසීම තවමත් මන්ඩපම් කඳවුරේ දීම කර ගෙන යනු ලැබේ. නාවිකයින් ඇතුළු මගින් 14,743 දෙනකුට වර්ෂය තුළ දී ලංකාවට ඒමට අවසර දුනි. මෙයට අතිරේක වශයෙන්, දිවයිනෙන් බැහැරව යන මගින්ට තලෙයිමන්නාරම සෞඛ්‍ය නිලධාරීන් විසින් ප්‍රතිශක්තිකරණය කරන ලදී. වසූරිය සඳහා 1,055 දෙනකු ද කොලරාව සඳහා 1,511 දෙනකු ද මෙම කඳවුරේ දී එන්නත් කරන ලදී. මේ අයුරින් වර්ෂය තුළ දී රු. 5,773.50ක ආදායමක් ලැබිණ.

(iv) **ගුවන් තොටුපොලේ සෞඛ්‍ය වැඩ කටයුතු.**—රත්මලාන—මගින්ට හා අමුත්තන්ට සපයන ලද සෞඛ්‍ය පහසුකම් සතුටුදායක විය. ජල සම්පාදනය ප්‍රමාණවත් විය. "ඊඩිස්" පරීක්ෂණ පවත්වන ලදී. සති දෙකින් දෙකට ගුවන් තොටුපොල ස්ථාන 20ක් ද, පර්යාන්තික ප්‍රදේශ 49ක් ද පරීක්ෂා කර බලන ලදී. මුළු පරීක්ෂණ වාර 20 හා ඒවාහි ප්‍රතිඵල වල විස්තර මෙසේ වේ:—

	ගුවන් තොටුපල	පර්යාන්තික ප්‍රදේශය
පරීක්ෂා කරන ලද ප්‍රදේශ ගණන	332 ...	822
ඒ(එස්) එජිප්ට නිශ්චිත වශයෙන් තිබූ ප්‍රමාණය ...	1 ...	1
සියයට ගණන	3 ...	1
ඒ(එස්) ඇල්බොපික්ටස්	— ...	1
සියයට ගණන	— ...	1
කියුලිසයින්ස් නිශ්චිත වශයෙන් සිටි ප්‍රමාණය ...	89 ...	347
සියයට ගණන	26.8 ...	42.8
ඇනොෆිලිස් නිශ්චිත වශයෙන් සිටි ප්‍රමාණය ...	— ...	5
සියයට ගණන	— ...	.6

පිලවු	ගුවන් තොටුපල	පර්යාන්තික ප්‍රදේශය
පරීක්ෂා කරන ලද ප්‍රදේශ ගණන	400 ...	980
ඒ(එස්) එජිප්ට නිශ්චිත වශයෙන් සිටි ගණන ...	— ...	4
සියයට ගණන	— ...	.5
ඒ(එස්) ඇල්බොපික්ටස් නිශ්චිත වශයෙන් සිටි ගණන ...	13 ...	67
සියයට ගණන	3.2 ...	7
කියුලිසයින්ස් නිශ්චිත වශයෙන් සිටි ගණන ...	35 ...	140
සියයට ගණන	8.7 ...	14.1
ඇනොෆිලිස්. නිශ්චිත වශයෙන් සිටි ගණන ...	— ...	4
සියයට ගණන	— ...	.5

ගුවන් නැව් 334කට ප්‍රැටික් අවසර පත්‍ර දෙන ලදී.

කටුනායක.—වර්ෂය තුළ දී ගුවන් නැව් 775කට ප්‍රැටික් අවසර පත්‍ර දෙන ලදී. සෞඛ්‍ය වැඩ කටයුතු සතුටුදායක අයුරින්, පවත්වා ගෙන යන ලදී. ඊඩිස් එජිප්ට පාලනය ඵලදායක ලෙස පවත්වන ලදී.

කන්කසන්තුරේ—වැඩි දියුණුව සතුටුදායක විය.

සත්ව රෝග සහ පිස්සු බලු රෝග මර්දනය

8. අවුරුද්දේ වැඩි කොටසක් දිවයිනෙන් බැහැරව සිටි මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය නිලධාරි තැන පශු වෛද්‍ය මහජන සෞඛ්‍ය පිළිබඳ පුහුණුවක් එක්සත් ජනපදයේ දී ලබා ගෙන ජූලි මස අන්තිමේ දී පෙරලා දිවයිනට පැමිණියේය. XXXI වන සටහනේ පරීක්ෂා කරන ලද සුනඛයන්ගේ සහ අනෙකුත් සතුන්ගේ මොල ගණන දැක්වේ.

මස් පරීක්ෂා කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් පුහුණු කිරීම.—මහජන සෞඛ්‍ය පරීක්ෂක ශිෂ්‍යයන්ට මස් පරීක්ෂා කිරීම හා සත්ව රෝග පිළිබඳ පුහුණුවක් ලබා දීමේ වැඩ කටයුතු කළුතර සෞඛ්‍ය ආයතනයේ දී ආරම්භ කරන ලදී.

VI. වැනි පරිච්ඡේදය

විශේෂ සේවා

අ. ක්ෂය රෝග මර්දනය

සනීපයෙන් සිටින පුද්ගලයින් රෝගයට ගොදුරු වීමේ ඉඩකඩ ඇති පවත්නාතාක් කල් ක්ෂය රෝගය මහජන සෞඛ්‍ය ගැටලුවක් ලෙස පවතිනවා ඇත. 1956 දී ජ.සෞ.සං. සමීක්ෂණ කණ්ඩායම සොයා ගත් පරිදි රෝගාතුර බැගිනුව සියයට 1ක් වී තිබීමත් අවුරුදු පතා රෝගීන් සොයා ගන්නා බැගිනුව ජනතාවෙන් 10,000කට 8ක් වී තිබීමත් යන දෙ කරුණ අනුව බලන කලෑ, මෙ රටෑ, ජනතාව කිනම් මොහොතෙකෑ හෝ රෝගය වැළඳීමේ බියෙන් මිදී සිටිතැයි කිසිසේත් කියා නො හැක. ක්ෂය රෝගය තව මෑ මහජන සෞඛ්‍ය ගැටලුවෙකි. එ සේ හෙයින්, එය මැඩ පවත්වා ගැනීමේ විධිවිධාන ශක්තිමත් කොටෑ දිවයින පුරා මෑ එම විධිවිධාන විහිදුවා හැරීම අවශ්‍ය වී ඇත.

රෝග මැඩලීමේ වැඩ පිළිවෙල ඇතැම් පැත්තෙකින් දුබල වී යෑ. නිදසුනක් ගෙනෑ බලමු. පිටියේ රෝගීන් සොයා ගැනීම සමූල කුඩා විකිරණ සේයා යන්ත්‍ර තුනකට සීමා වූ අතරෑ, ඒ හේතුවෙන් අලුත් රෝගීන් සොයා ගැන්මේ ප්‍රධාන මධ්‍යස්ථාන බවට පත් වූයේ ලය චිකිත්සාගාර යෑ. සේවක පිරිස මද වීම නිසා, ඇතැම් පෙදෙස්හි රෝගීන් බලා කියා ගැනුම ද අවහිර වී ගියේයෑ. සුවය ලත් ක්ෂය රෝගීන් පුනරුත් ථාපනය කිරීමට නිසි වැඩ පිළිවෙලක් සකස් වී නො තිබුණි. ස්වේච්ඡා සංවිධාන විසින් පෙරමුණ ගෙනෑ කටයුතු කළ හැකි තැනෙකි මේ. තවද, කියා යුත්තක් ඇත. ක්ෂය රෝගය පැතිර යාමට රුකුලක් වූ සමාජයීය-ආර්ථික තත්ත්වය ජනතාවේ ඇතැම් කොටස් තුළ නිදැල්ලේ බලපවත්වමින් තිබුණි. තත්ත්වය එලෙස පවත්නා තාක් කල් ක්ෂය රෝගය නම් ගැටලුව අප අතරෑ අනවරතයෙන් මෑ පවතිනු ඇත.

එ සේ ද වුවත්, රෝගයට පහර එල්ල වන විශේෂයෙන් හුවා දැක්වියෑ යුතු සිදු වීම් රැසෙක් ව්‍යාපාරය තුළ ඇති වී යෑ. ක්ෂය රෝගය මැඩ පැවැත්වීමෙහි ලා ප්‍රගති ශීලී සහ ප්‍රයෝජනවත් වූ කටයුතු විධිවිධාන ගණනාවක් මේ රටේ පළමු වරට පිහිටුවනු ලැබියෑ. ඉන් සමහරක් මෙසේ වෙයි :—

(අ) අලුත උපදින බිළිඳුන් බීසීජී වලින් එන්නත් කිරීමේ වැඩ පිළිවෙලක් 1963 මැයි මස කොළොඹෑ ද සොයිසා ගැහැණු රෝහලේ සහ කාසල් වීදි ගැහැණු රෝහලේ ඇරඹිණි. මෙය මෙතෙක් දුරට සඵල වූ බව පෙනෙන්නට ඇති අතරෑ, හැකි ඉක්මනින් මේ වැඩ පිළිවෙල සෙසු රෝහල් කරා ද විහිදුවාලීමට අදහස් කරනු ලැබේ.

(ආ) සෑම තුන් වසරක් පාසා ගුරුවර-ගුරුවරියන් එක්ස්රේ සෝදිසියට ලක් කිරීමේ වැඩ පිළිවෙලක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගැනුණෙන්, මුල පිරීමක් හැටියට, රජයේ අභ්‍යාස පාඨශාලාවල උගන්නා සියලු මැ සිසු-සිසුවියන්ගේ එක්ස්රේ සේයා ගැනීමට පියවර තබන ලදී.

(ඉ) ක්ෂය රෝග බීජ සහගැති පාසල් දරුවන් අයි. එන්. ඒ. එච්. සංයෝගයෙන් කළ ප්‍රතිකාරයේ ප්‍රතිඵල සෙවීම සඳහා පාදුක්ක සෞඛ්‍ය පේරුවේ රෝග හරණ රසායන අරමුණක් පටන් ගන්නා ලදී. මෙය සඵල බව පෙනී ගියොත්. බීසීජී එන්නත් කරණ වැඩ පිළිවෙල සමග ඇඳා ගෙනැ මෙය රට පුරා මැ විහිදුවීමට බලාපොරොත්තුවනු ලැබේ.

(ඊ) සිරිත්හුරු වැඩක් හැටියට, පොදු රෝහල්වලට ඇතුළත් වන සියළු මැ රෝගීන් එක්ස්රේ කිරීම ප්‍රයෝජනවත් වේ දැයි සෙවීම පිණිස—සමීක්ෂ යක් මෙහෙයවන ලදී. එම සමීක්ෂණයේ සැලකුරුව (වාර්තා) මේ වාර්තාව ලියවෙන විටැ සූදානම් වී නොතිබිණි.

රෝගාතුර තරම

1. මුදල් වර්ෂය තුළැ දී ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයේ අධිකාරිතැනට ගිය අවුරුද්දේ ලැබී තිබුණ සැලකුරු (දැනුම් දීම්) ගණන 9,786ක් වූ නමුත් මේ අවුරුද්දේ සැලකුරු ගණන 9,339කි. මෙයින් 6,357ක්, එනම්, සියයට 68ක් ලය චිකිත්සාගාර වලින් සහ ශාඛා චිකිත්සාගාරවලින් ලැබුණ ඒවා වී යැ. පෞද්ගලික වෛද්‍යවරයින් ගෙන් ලැබුණ සැලකුරු ගණන 86ක් පමණි. එම සැලකුරු 1,015ක් පමණ වූයේ, එවකටත් සැලකරන ලදුවැ ලේඛ්‍යාරූඪ වූ රෝගීන් සම්බන්ධයෙන් බව දැන ගන්නට ලැබුණි.

මේ කාලසීමාව තුළැ දී මධ්‍යම ක්ෂය රෝග ලේඛනයේ ලේඛ්‍යාරූඪ වූ රෝගීන් මුළු ගණන 8,528ක් වූ අතරැ, එයින් 7,285ක් එනම් සියයට 85.4ක් පුප්ඵුසීය ක්ෂය රෝග යෙන් පෙළුනෝ වූහ. වැඩි මැ රෝගීන් ගණනක් හසු වූයේ බටහිර පළාතෙන් යැ. (3,551) එක් එක් සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාසවලින් හසුවූ රෝගීන් ගණන මෙසේ වෙයි :—

කොළඹ	... 3,040	ගාල්ල	... 533	මඩකලපුව	... 435
කළුතර	... 811	මාතර	... 512	කුරුණෑගල	... 422
මහනුවර	... 650	යාපනේ	... 431	පුත්තලම	... 199
මාතලේ	... 163	වවුනියා	... 57	රත්නපුර	... 555
බදුල්ල	... 215	අනුරාධපුර	... 216	කෑගල්ල	... 289

රෝගීන් සෙවීමේ පහසුකම් ඇතැම් පෙදෙසෙකැ සැහෙන තරම් නොමැති හෙයින් බදුල්ල වැනි ඇතැම් කොට්ඨාසවලින් සොයා ගනු ලැබ රෝගීන් ගණන අඩු වූ තරමින් මැ එම පෙදෙස්වලැ ක්ෂය රෝගීන් අඩු යැයි නො පිළිගත යුතු යැ. කොළොඹ, සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාසය තුළින් හසුවූ රෝගීන් 3,040 දෙනාගෙන් 1,273 දෙනෙක් තරම කොළොඹැ නගර සභා සීමා පෙදෙසින් යැ. එම පෙදෙසින් ගිය අවුරුද්දේ සොයා ගනු ලැබූ රෝගීන් ගණන 1,382කි.

රෝගීන් 5,269 දෙනෙක්, එනම්, මෙහි ඇළලෙන කාලය තුළ දී ලේඛ්‍යාරූඪ වූ රෝගීන්ගෙන් සියයට 61.7 ක් පිරිමි වූහ. එයින් සියයට 81ක් පස්විසි විය ඉක්මවා සිටියහ. එය ගිය අවුරුද්දේ අනුපාතය මැයි. රෝගීන්ගෙන් වැඩි පිරිස පිරිමි සහ ගැහැණු දෙගොල්ලන්ම 25-44 වයස් සීමාවේ වූහ. 5-14 වයස් ගොල්ලෙන් 61/62 අවුරුද්දේ දී සොයා ගනු ලැබූ රෝගීන් ගණන 526 (සියයට 5.9) ක් වූවත් මේ අවුරුද්දේ දී සොයා ගත් ගණන 659 (සියයට 7.6) ක් බව B177 පිටුවේ 1 සටහනෙහි දැක්වේ.

මරණ (628), දෙබරාදු ලේඛනාරූඪ (534), රෝග විනිශ්චය වෙනස්වීම් (15), වසන පළාත් වෙනස් වීම් (89), ඉසව් දැන ගන්නට නැතිවීම (1) රටින් නික්ම යෑම (2) යන හේතු නිසා ලේඛනාරූඪ, 1,269ක් වර්ෂය තුළදී, අවලංගු කැරිණ, වර්ෂය අවසානයේදී ලේඛනයේ රැඳී තිබුණු වූ මුළු ගණන 48,242 කි. එයින් 8,649ක් 1958 දී ද, 7,660ක් 1959 දී ද, 9,751 ක් 1960 දී ද, 8,091 ක් 1961 දී ද, 8,851ක් 1961-62 දී ද 5,574ක් 1962-63 දී ද ලේඛ්‍යාරූඪ වූ ඒවාය.

මරණ ගණන

2. 1962 අවුරුද්ද වෙනුවෙන් දිසා ලේකම්ලාගෙන් ලත් වාර වාර්තා අනුව, එම අවුරුද්ද තුළ දී ක්ෂය රෝගයෙන් 1,082 දෙනෙක් මිය ගොස් සිටියහ. එහෙත් මෙම ගණන මෙතෙක් මහ ලේඛාධිකාරි (රෙජිස්ට්‍රාර් ජනරාල්) විසින් තහවුරු කොට නොමැත. වර්ෂය තුළ දී ක්ෂය රෝගින්ගේ මරණ 903ක් ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයේ අධිකාරි වෙත සැලවූ අතර, එයින් 628 දෙනෙක් මධ්‍යම ක්ෂය රෝගි ලේඛනයෙන් ලේඛ්‍යාරූඪ වී තිබූ බැව් පෙනී ගියේ ය.

සේවක පිරිස

3. 1963 සැප්තැම්බර් 30 වනදා ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයේ යෙදී සිටි මුළු සේවක පිරිස 1,733ක් වූහ. එයින් 56 දෙනෙක් වෛද්‍ය නිලධාරීහු ද, 329 දෙනෙක් (සිසුවියන් ඇතුළු) හෙදියෝ ද, 439 දෙනෙක් උපස්ථායක-උපස්ථායිකාවෝ ද වූහ. තවද, අවුරුද්ද අවසානයේදී මුදා හැරීමට යන ආගමික මව්වරුන් සහ සොයුරියන් 17 දෙනෙක් ද වූහ.

රෝහල්

4. ක්ෂය රෝගින්ට ප්‍රතිකාර දීම සඳහා 1962-63 වර්ෂය අවසානයේදී වෙන් කර තිබුණ ඇඳන් මුළු ගණන 3,660කි. එයින් 2,034ක් ලය රෝහලේ ද 1,371ක් විශේෂ ක්ෂය රෝග වාට්ටු ඇති පොදු රෝහල් වල ද වී ය. අංගොඩ මානසික රෝහලේ ක්ෂය රෝග සහගත මානසික රෝගින් වෙන් කර තැබීමට ඇඳන් 155ක් ද හැඳල ලාදුරු රෝහලේ ක්ෂය රෝග සහගත ලාදුරු රෝගින් වෙන් කර තැබීමට ඇඳන් 20ක් ද විය. ඉතුරු ඇඳන් 80 තිබුණේ රෝගය මෙල්ල කරන ලද රෝගින්ට අවුරුද්දක් දෙකක් ජීවනෝපාය කර්මාන්ත අභ්‍යාසයක් දෙන තලගොල්ල පුනරුත්ථාපන මධ්‍ය ස්ථානයේ ය.

අවුරුද්ද තුළ දී කංකසන්තුරේ විවේකාගාරයේ ඇඳන් 32කින් යුත් සැහැල්ලු ආතුරාලයක් ද ඇඳන් 10කින් යුත් ළමා ආතුරාලයක් ද තනවන ලද මුත් ඒවා ගෙවදිනු නො ලැබිය. ලය රෝහල් වලදී සහ පොදු රෝහල් බද ක්ෂය රෝග ආතුරාලහි දී ප්‍රතිකාර ලැබ මුළු රෝගින් ගණන ගිය අවුරුද්දේ 12,541 ක් වූ නමුත් මෙවර එය 12,926 ක් විය. එයින් 500ක් මිය ගියහ. 9,579 දෙනෙක් පිට වී ගියහ. 2,757 දෙනෙක් අවුරුද්ද අවසන් වන විටත් ප්‍රතිකාර ලබමින් සිටියහ. පිට වී ගිය රෝගින් 9,579 දෙනාගෙන් 7,053 දෙනෙකු තුළ රෝගය නැවත මතු වන බව පෙනෙන්නට වූ නමුත්, 1,598ක් තරම, එනම් සියයට 16.6කු පිට වී ගොස් ඇත්තේ වෛද්‍ය උපදෙස් නො තකාය. B176 පිටුවේ XXXII සටහන මෙය පෙන්වයි.

අංගොඩ මානසික රෝහලේ දී ප්‍රතිකාර ලත් රෝගින් මුළු ගණන 569 කි. එයින් 40 දෙනෙක් මිය ගියහ. සුව අතට හැරී තිබුණ 139 දෙනෙක් පිට කරනු ලැබූහ. අවුරුද්ද අවසානය වන විට 365 දෙනෙක් ප්‍රතිකාර ලබමින් සිටියහ. රෝගය මේ සා තදින් පැවැත්ම ගැන පිළියම් යෙදීමට මං සොයනු වස් ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයේ අධිකාරී තැන හා මානසික රෝහල් භාර අධිකාරි තැන හා අතරේ සාකච්ඡා කිහිපයක් විය. බෝවීම ලත් කිසිවෙකුත් පොදු මානසික ආතුරාලහි සිටීම වැළැක්වීමේ අටියෙන්, ක්ෂය රෝගී ගිලනුන්ට ඇඳන් තව විකක් වෙන් කිරීමට වෙලාවේ හැටියට ක්‍රියා කරන ලදී.

හැඳල ලාදුරු රෝහල ක්ෂය රෝග ආතුරාලයේ රෝගීන් 23 දෙනෙකුට ප්‍රතිකාර කළ අතර, එයින් දෙදෙනෙක් මිය ගියාය. දෙදෙනෙක් පිට වී ගියහ. අවුරුද්ද අවසානයේ දී රෝගීන් 19 දෙනෙක් ප්‍රතිකාර ලබමින් සිටියහ.

චිකිත්සාගාර

5. කල්පිටියේ ශාඛා චිකිත්සාගාරයක් අරඹන ලද නමුත්, හපුතලේ එකක් ද, දෙනියායේ එකක් ද යනුවෙන් දෙකක් වසා දමන ලදී. කොළොන්නැ ශාඛා චිකිත්සාගාරය ද අවුරුද්ද මුලැ දී වැඩ පටන් ගත්තෙන්, චිකිත්සාගාරය සහ ශාඛා චිකිත්සාගාර මුළු 59 ක් වීයැ. B 178 පිටුවේ 1 සටහනේ පෙනෙන පරිදි.

මෙකී මධ්‍යස්ථානයෙහිදී පරීක්ෂා කරන ලද "පළමු වැරැ පැමිණි" රෝගීන් ගණන ගිය අවුරුද්දේ 167,487 ක් වූ නමුත්, මේ අවුරුද්දේ 159,421 ක් වී යැ. පළමු වරට පැමිණීමෙන්" පරීක්ෂා කරන ලද රෝගීන් ගණන මැද, උතුරු, ඌව යන පළාත්හි නැති තිබුණ අතරැ, බටහිර, නැගෙනහිර, උතුරු-මැද පළාත්හි එම ගණන පහත බැස තිබුණි. පරීක්ෂා කරන ලද "පළමු වරැ පැමිණි" 1,59,421 දෙනාගෙන් 6,429 දෙනෙක් එනම් සියයට 4 ක් (පුප්ඵුසීය ක්ෂය රෝගයෙන් පෙළුන අය වූහ. ගිය අවුරුද්දේ නම් මේ ගණන 6,364 හෙවත් සියයට 3.8ක් වීයැ. B180 පිටුවේ XXXIII සටහන් බලන්නැ.

පළාත් බද ලය චිකිත්සාගාර දොළොසෙක්, තම පෙදෙස්හි ප්‍රධාන ක්ෂය රෝග මධ්‍යස්ථාන විලස වැඩ උනන්දුවකින් තම කටයුතු අවුරුද්ද මුලුල්ලේ කැරැ ගෙනැ ගියහ. ඒ ඒ පෙදෙස්හි රෝගය පැතිර යාම වැළැක්වීමේ මං සැලසීම මුළු මනින් මැ එකී චිකිත්සාගාරවලින් ඉටු වූවෙකි.

බදුල්ලැ ලය චිකිත්සාගාරය තැනවීම 1963 පෙබරවාරියේ දී හමාර වී යැ.

කරන ලද වැඩ

6. (අ) **රෝගීන් සෙවීම.**—අනෙක් රටවලැ මෙන් ලංකාවේ ද රෝගීන් සෙවීමේ ප්‍රධාන මධ්‍යස්ථාන වූයේ ලය චිකිත්සාගාර සහ ශාඛා ලය චිකිත්සාගාර යි. අලුත් රෝගීන් වැඩි පිරිසක් සොයා ගනු ලැබුවෝ, මේ මධ්‍යස්ථානහි පරීක්ෂා කරන ලද පුද්ගලයින් අතර, වූහ. වැඩි දෙනා තමන්ගේ මැ වුවමනා වෙන් පරීක්ෂා කරවා ගැනීමට එහි පැමිණි නමුත්, අනෙකුත් ආයතනවලින් සහ පෞද්ගලික වෛද්‍ය වරුන් විසින් එවනු ලැබූ අය ද සැහෙන ගණනක් වූහ. වැඩි මැ රෝගීන් ගණන හසු වූයේ වැලිසර ලය රෝහලේ දී යැ. (929) ඊළඟ තැන් අනුපිළිවෙලින් බාර්ලි පාරේ චිකිත්සාගාරයට (786) ගාල්ලට (598) ක්ෂය රෝ. ම. ආයතනයට (537) මහනුවරට (272) සහ යාපනයට (226) හිමි වූහ. බදුල්ලැ ලය චිකිත්සාගාරයේ දී හසු වූ රෝගීන් ගණන 116ක් පමණ යැ.

ගිය අවුරුද්දේ දී පරීක්ෂා කරන ලද ආශ්‍රිතයින් ගණන 21,440ක් වන නමුත් මේ අවුරුද්දේ එය 22,959ක් වූහ. එයින් 282 දෙනෙක්, එනම් සියයට 1.2ක් පුප්ඵුසීය ක්ෂය රෝගයෙන් පෙළුන වුන් ලෙස හඳුනා ගන්නා ලදහ. පරීක්ෂා කරන ලද ආශ්‍රිතයින් ගණන බටහිර පළාතේ සැලකියැ යුතු සේ වැඩි ඇති බව පෙනෙන්නට තිබෙන නමුත්, උතුරු නැගෙනහිර, ඌව යන පළාත්හි මේ ගණන සැහෙන තරම් අඩු වී ඇත.

සමූල කුඩා-විකිරණ සේයා යන්ත්‍ර තුනෙන් පුද්ගලයින් 145,540ක් විකිරණ සේයා ගන්වන ලද අතරැ, ඉන් ඉහළ මැ ගණන (69,044) පරීක්ෂා කරන ලද්දේ, විකිරණ විද්‍යාඥ යටතේ පවතින වැලිසර ලය චිකිත්සාගාරයේ පිහිටි යන්ත්‍රයෙනි.

විකිරණ සේයා ගනු ලැබූ රෝගීන්ගෙන් 1836ක් හෙවත් සියයට 1.3ක් පෙනහැලි පලුදුවක් ඇති බව කුඩා සේයාවෙන් දැක්වූ හෙයින්, ඒ අය වැඩිදුර සෝදිසිය සඳහා ලය චිකිත්සාගාරවලට භරවන ලදහ.

(ආ) **රෝගීන් බලා—කියා ගැනීම.**—ගිලන්සුරු ප්‍රතිකාර ලබමින් සිටි රෝගීහු පිටිමානයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් විසින් බලා කියා ගන්නා ලදහ. කොළොඹ මහ නගර සභා පෙදෙසේ නම්, මේ වැඩේ කරන ලද්දේ ඩාලි පාරේ ලය චිකිත්සාගාරය බද සෞඛ්‍ය වික්ෂකයන් විසිනි. මහජන සෞඛ්‍ය පරීක්ෂක තැන සැලකුරුවන් ලත් විගස, මැ මුල් විමර්ශනයක් මෙහෙයවා තමාට පෙනී ගිය දේ පිළිබඳ වාර්තාවක් එවී යැ. ඉන් පසු රෝගියා බලන්නට ගිය ඔහු, උපදෙස් පරිදි රෝගියා බෙහෙත් කන බව සැක හැරැ දැනැ බලා ගෙනැ ආශ්‍රිතයින් ද, පරීක්ෂා කොටැ කෙළ නිසි අයුරු බැහැර කරවන ලදි. පාලනය අතින් මෙන් ම ප්‍රායෝගික අසිරුකම් නිසා බොහෝ පෙදෙස්හි මේ කටයුතු සැලැස්මේ පරිදි සිදු නොවේ. 1962 දී ලේඛ්‍යාරූඪ වූ රෝගීන් 8,851 දෙනාගෙන්, මෙතෙක් විමැසිල්ලට භාජන වූවෝ 6,098 දෙනෙක් පමණි.

(ඉ) **ප්‍රතිකාර විධි.**—සංවේදී වූ අය රෝහල්හි නතර කරවනු ලැබූහ. ඇතැම් රෝගීහු රෝහල්හි නැවතී ප්‍රතිකාර ලැබීම පිටු දැක්කාහ. ඒ අතරැ තවත් කොටසක් වෛද්‍ය උපදෙස් නො තකා රෝහලින් පිට වී ආහ. රෝහලේ නැවතී ප්‍රතිකාර ගැනීම බල කිරීමට නීතියෙන් ඉඩක් නොමැති හෙයින්, මේ තත්ත්වය මැඩ පවත්වා ගැනීමට පිළියමෙක් නොවේ.

ඖෂධ සැපයීම තදබල ලෙස ඇන හිටීමෙක් නො වී යැ. එහෙත්, පසිරසයිනමයිඩ්, ඊරෙස්කටයිල් සහ සයික්ලොසරින් වැනි ක්ෂය රෝගයේ දෙවන වැලේ ඖෂධ වර්ග සැපයීම සීමා කළ යුතු වූයේ, අවශ්‍ය බෙහෙත් තොගය කල් වේලා ඇතුවැ නො ලැබුණ නිසා යැ.

(ඊ) **බීසීජී එන්නත් කරණය.**—තුන් අවුරුදු සැලැස්ම යටතේ බීසීජී එන්නත් කරණ වැඩ පිළිවෙල, තවත් දෙ පළාතෙකැ එනම් මැද සහ සබරගමුවැ දෙ පළාතෙහි, නිමාවට පත් වී යැ. උතුරු සහ දකුණු පළාත්හි මේ කටයුත්ත ගිය අවුරුද්දේ නිමවන ලදි. අනෙකුත් පළාත්හි මෙම වැඩය හැකි ඉක්මනින් නිම කැරැ ගැන්මේ අපියෙන් ඒ පළාත්හි නිල ඇණි තර කරවන ලදහ.

ක්ෂය රෝග ධාතු සඳහා පරීක්ෂා කරන ලද මුළු ගණන 5,05,288ක් වූ අතරැ, එයින් 3,96,653ක් කරන ලද්දේ පිටියේ ඇණි විසින් යැ. අනෙකුත් අය චිකිත්සා ගාරවල දී පරීක්ෂා කරන ලදි. ගිය අවුරුද්ද සඳහා මේ ගණන් පිළිවෙලින් 4,59,966ක් සහ 3,63,019ක් වී යැ.

පිටියේ ඇණි විසින් 2,25,383 දෙනෙකුට බීසීජී එන්නත දෙන ලදි. එයින් 56,471 දෙනෙක් 0-6 වයස් ගොල්ලේ වූ අතරැ, 1,34,369 දෙනෙක් 7-14 වයස් ගොල්ලේ වූහ.

ප්‍රධාන වශයෙන් රෝග විනිශ්චය කටයුතු සඳහා, ටියුබර්ක්‍යුලීන් පරීක්ෂණ කරන ලද නමුත්, පෙනහැල්ලේ පලුදු නොමැති වී නම් නොගැති අයට ද බීසීජී එන්නත දෙන ලදි. මේ අවුරුද්දේ දී එබඳු අය 9,202 දෙනෙක් එන්නත් ලැබූහ.

බීසීජී ව්‍යාපාරයේ මුල සිටැ මැ ටියුබර්ක්‍යුලීන් පරීක්ෂණයට ලක් කොට තිබුණ පුද්ගලයින් මුළු ගණන 63,22,853ක් වූ අතරැ, එයින් 27,03,551 දෙනෙක් බීසීජී එන්නත ලැබූහ.

දිවයිනේ සියළු මැ පාසල් සිසුන් ටියුබර්ක්‍යුලින් පරීක්ෂණයට භාජනය කොටැ ඔවුන්ට බීසීජී එන්නත දීම අරමුණු කැරැ ගත් බීසීජී තුන් අවුරුදු සැලැස්ම යටතේ, 1,648,273 දෙනෙක් පරීක්ෂා කොට ඇති අතරැ, 946,533 දෙනෙකුට බීසීජී එන්නත දී ඇත. එය 1959 ඔක්තෝබර් 1 වනදා හා 1963 සැප්තැම්බර් 30 වන දා හා අතරැ, සිදු වී යැ. B181 පිටුවේ XXXIV සටහනේ මෙය පෙනේ.

බීසීජී එන්නත් කරණයෙහි ලා මහජන සෞඛ්‍ය හෙදියන් පුරුදු-පුහුණු කරවීම කළුතර බීසීජී ඇණිය විසින් කළුතරැ, දී කරන ලදි. මෙම පුහුණුවෙන් පසු තමන් සිටින ඒ ඒ පෙදෙසෙහි බීසීජී එන්නත් කරණය ඔවුන්ට පැවරෙනු ඇත. පෙර පාසල් වයසේ ළමුන්ට බීසීජී එන්නත දීම් ද මීට අයත් වනු ඇත.

(උ) **අලුත උපන් බිළිඳුන්ට බීසීජී එන්නත.**—ළමුන් තවදුරටත් ක්ෂය රෝගයෙන් ආරක්ෂා කැරැ ගැන්මේ අපියෙන් තබන ලද වැදගත් පියවරෙකි. අලුත උපදින බිළිඳුන් එන්නත් කිරීමේ සැලැස්ම ද සොයිසා ගැහැණු රෝහලේ සහ කාසල් වීදි ගැහැණු රෝහලේ 1963 මැයි මාසයේ දී ඇරඹුණි. 1963 සැප්තැම්බරය හමාර වන විටැ බිළිඳුන් 6,978 ක් එන්නත් කරනු ලැබූහ. මෙම වැඩෙහි මහ හෙදියන් පුරුදු පුහුණු කරවීමටත්, සිරිත්හුරු වැඩක් හැටියට ඔවුන් ලවා සූතිකාගාර වලදී අලුත උපදින බිළිඳුන් එන්නත් කරවීමත් අප අදහස වේ.

(ඌ) **පුනරුත්ථාපනය.**—රෝගය මැඩ පවත්වා ඇති රෝගීහු තලගොල්ලැ පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ දී පුරුදු-පුහුණු කරවන ලදහ. 109 දෙනෙක් රෝගීහු පුහුණු වෙමින් සිටි අතරැ, එයින් එක් අයෙකු මිය ගියේ යැ. පුහුණුවෙන් පසු 46 දෙනෙක් ඊට වී ගියහ. පුහුණුව ලැබූ අයට රක්ෂා සොයා දීම නම් ගැටලුවක් වී යැ.

(ඒ) **සෞඛ්‍ය අධ්‍යාපනය.**—ලය රෝහලෙහි සහ ලය චිකිත්සාගාරයන්හි, එකී ආයතන බද මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් විසින් සිරිත්හුරු සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු මෙහෙයවන ලදී. කොළඹ, සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශයේ සෞඛ්‍ය අධ්‍යාපන අංශයේ සහයෝගය ඇතුව, කිරිඳිවැල සහ ගම්පොලැ සෞඛ්‍ය පෙදෙස්හි ජනතාවට කරුණු උගැන්වීමේ ප්‍රබල වැඩ සැලැස්මක් මෙහෙයවන ලදී.

බීසීජී ඇණි පාසල් කරා පැමිණි විටැ, පාසල් ළමුන්ට ක්ෂය රෝගය ගැන කරුණු කියා දෙන ලදී. සියළු මැ රජයේ අභ්‍යාස පාසල්හි දැකුම් කරැ (දෘශ්‍ය ආධාර) සේයා පිටි, සාකච්ඡා සහ දෙසුම් ආධාරයෙන් විශේෂ ක්ෂය රෝග අධ්‍යාපන මාලා මෙහෙයවන ලදී. මෙම වැඩ පිළිවෙල, පුහුණුව ලබන අය විකිරණ සේයා රූ මගින් සෝදිසි කිරීම සමග ඇදාගනු ලැබී යැ.

ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයේ නියුක්ත ලිපිකරුවන්, හෙදියන්, උපස්ථායක—උපස්ථායිකාවන් යනාදීන්ට ක්ෂය රෝගය මැඩ පැවැත්වීමේ විධි උගැන්වීමේ අපියෙන්, සේවා අභ්‍යාස පංක්ති ද මෙහෙයවනු ලැබී යැ.

(ඒ) **විකිරණ සේයා (එක්ස්රේ) සේවා.**—ව්‍යාපාරයේ විකිරණ සේයා මෙහෙය ගැන නම් කියැ සුතු තරම් දියුණුවක් නොවී යැ. සැබැවින් මැ විකිරණ සේයා අංශ බොහොමයකට මැ ප්‍රතිසංවිධානය අවශ්‍ය වූ අතරැ, ඇතැම් අංශ දැන් තම අරමුණු ඉක්මවා ගොස් ඇත. හැකි ඉක්මනින් මෙම අඩු-පාඩු සකස් කැරැ ගැන්මට ක්‍රියා කරනු ඇත.

(ඔ) **පරීක්ෂාගාර (රසායනාගාර) මෙහෙය.**—ව්‍යාපාරයේ නොයෙක් රෝහල් සහ චිකිත්සාගාර සතු පරීක්ෂණාගාර තෙළෙසෙක් වේ. කෙළින් මැ වැකුම් ගැනීමෙන් කරන පරීක්ෂණ ඇතුළු සිරිත්හුරු පරීක්ෂණ මේ පරීක්ෂණාගාරයෙහි දී මෙහෙයවනු ලැබූ නමුත්, වැලිසර පිහිටි දැවැන්ත බීජ-රක්නය අඛලන් වැ ගිය හෙයින් වැඩීමේ සහ සංවේදනා (සන්දන) පරීක්ෂණ වැනි සිරිත්හුරු පරීක්ෂණ අඩපන වී ගියේ යැ.

එහෙත්, වැලිසර රෝහලට වද්දා ගත් රෝගීන් පිළිබඳ වැ වැඩිමේ සහ සංවේදනා පරීක්ෂණ, කුඩා බිජු-රක්නය යෙදීමෙන් සීමිති පදනමක් මතැ කැරිණ. සියල්ල එකට ගත් කැලැ, කෙළින් මැ බෙට බැලීමෙන් පරීක්ෂණ 15,002 ක් ද, වැඩිමෙන් බෙට පරීක්ෂණ 205 ක් ද සංවේදනා පරීක්ෂණ 31ක් ද වැලිසරැදී කැරිණ.

පරීක්ෂණාගාර වැඩ සඳහා සිටිය සේවය පිරිස :—

එක් ව්‍යාධ වේදියෙකු ගෙන් ද

එක් සහකාර ව්‍යාධවේදියෙකු ගෙන් ද,

සුවිසි වෛද්‍ය පයෙක්ෂණාගාර කාර්මික විද්‍යාඥයෙකුගෙන් ද,

තුන් පරීක්ෂණාගාර උප සහායක යෙකුගෙන් ද

සමන්විත වූහ.

(ඕ) **හෙද-හෙදියන්.**—පොදු හෙදකම විෂයෙහි අභ්‍යාසය සඳහා 1962 දෙසැම්බර-යේ දී සිසු සිසුවියන් 45 දෙනෙක් ඇතුළත් කැරැ ගැනීමෙන්, වැලිසරැ පිහිටි ක්ෂය රෝග සේවා සහකාර හෙදියන් පුහුණු කරවීමේ සිප්සල පොදු හෙදකම් අභ්‍යාස සිප්සලක් බවට හැරවීම සඳහා ක්‍රියා කරන ලදි. මාණ්ඩලික හෙදියන් (මහ හෙදියන්) විලස නිපුණත්වය ලබා ගැනීමට හැකි වනු පිණිසැ, පොදු හෙදකම විෂයයෙහි කෙටි කල් පුහුණුවක් සඳහා 1963 අගෝස්තුවේ දී ක්ෂය රෝග සේවා සහකාර හෙදියන් 33 දෙනෙකුගෙන් යුත් තවත් කට්ටියක් බඳවා ගන්නා ලදහ.

මෙම සිප්සල ක්ෂය රෝග සේවා හෙදියන් 383 දෙනෙකු දැනට පුහුණු කරවා ඇති අතරැ, පසුගිය වතාවේ ඇතුළත් කරන ලද කට්ටිය 1963 අවසන් වන විටැ තම පුහුණුව හමාර කරනු ඇත.

ශික්ෂක (ඇදුරු) පිරිස දැනට විදුහල් පතිනියගෙන් සහ ශික්ෂිකාවන් සිව් දෙනෙකු ගෙන් යුක්ත වේ.

(ක) **සමාජයීය ආධාර.**—සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් මුදලින් ආධාර ලැබූ රෝගීන් මුළු ගණන 16,137 කි. ඊට වැය වූ මුදල රු. 78,50,752කි. ආධාර මුදල ගෙවීමේ උපරිම කාල සීමාව නියම කැරැ ගැන්මේ අටියෙන් මුදලින් ආධාර සැලසීමේ පිළිවෙල ප්‍රතිශෝධනය කිරීමට ක්‍රියා කරන ලදි.

(කා) **මිල-මුදල්.**—කලින් අවුරුද්දේ වියදම් වූ මුළු මුදල රු. 88,77,650ක් වූයේ නමුත්, මේ අවුරුද්දේ වියදම් වූ මුළු මුදල රු. 93,66,673ක් වී යැ. වියදම ඒ ඒ සේවා යටතේ බෙදී ගිය අයුරු මෙ සේ දැක් වේ :—

සම්බන්ධිත සේවා	...	...	රු.	2,25,818.00
වෛද්‍ය සේවා	...	...	රු.	87,42,122.00
මහජන සෞඛ්‍ය සේවා	...	...	රු.	2,88,554.00
පරීක්ෂණාගාර සේවා	...	...	රු.	1,10,179.00
			රු.	93,66,673.00

වියදමෙන් වැඩි මැ කොටසක් ගියේ වැටුප් සහ දීමනා ගෙවීමට යැ. එනම් රු. 51,72,060 ක් හෙවත් මුළු වියදමෙන් සියයට 55.2 කි. කලින් අවුරුද්දේ මේ අරබයා ගිය වියදම රු. 49,95,661 ක් වී යැ,

රු. 21,79,900ක් (හෙවත් සියයට 23.2ක්) ඖෂධ වෙනුවෙන් ද රු. 11,54,434ක් (හෙවත් සියයට 12.3ක්) අහරවට වෙනුවෙන් ද වියදම් වී යැ.

ආ—මැලේරියා මර්ධනය

මැලේරියා රෝගය පැතිර යාම අවහිර කරනු පිණිස පසු ගිය වර්ෂයේ දී යොදා ගන්නට යෙදුණ විධිවිධාන මේ වර්ෂයේ තුළ දී වැඩියෙන් තර කරන ලදි. රෝගය පැතිර යාමක් සිදු වී නො තිබුණි. මුළු රෝගීන් ගණන 31 සිට 16 දක්වා පහත බවුයේ යැ. එයින් දස දෙනෙක් පිට රටින් පැමිණි අය වූහ. එනම්, නව දෙනෙක් මාලදිවයින්වලින් පැමිණිය අතරැ එක් අයෙක් මෙරටැ ඔස්සේ අන් දෙසකට ගමන් ගත් මගියෙකි.

මැලේරියා රෝගය මාලදිවයින්වලින් මෙ රටට යළි සේන්දු වේ දෝ යි ඇති වූ බිය නිසා, මාලදිවයින්වලින් මෙ රට බලා එන සියළු මැ මගීන්ට ඔවුන් ගොඩබසින තොටු පළවල දී ලේ පරීක්ෂණයට භාජනය වන ලෙස බල කිරීමෙන් නිරෝධා යන විධිවිධාන තර කොටැ තිබුණි.

මෙ රටැ සිටි රෝගීන් සය දෙනාගෙන් සිව් දෙනෙක් දෙ වන වරට රෝගයට ගොදුරු වූ අය වූහ. එක් අයෙක් ලේ ගනු-දෙනුවකින් පසු වැ රෝගයට වසඟ වූ බව හොඳට මැ පෙනෙන්නට තිබුණ අතරැ, අනෙක් තැනැත්තාට රෝගය බෝවීමේ මූල නියත කොටැ දක්වාලිය නොහැකි වී යැ.

මෙ රටින් මැලේරියා මුලිනුපුටා දැමීමේ වැඩ සටහන දැන් පවතින තත්ත්වය මෙසේ වෙයි:—ජනගහණයෙන් සියයට 49ක් සිටින්නේ එතෙරින් හෝ මෙ රටේ මැ වෙනත් පෙදෙස්වලින් හෝ රෝගය ගෙනැ ඒම අල්ලා ගැනීම සඳහා විපිළිසරය පවත්නා නඩත්තු තලයට අයත් පෙදෙසෙහි යැ. ජනගහණයෙන් සියයට 20ක් සිටින්නේ, සෝදිසියෙන් සිටීමේ කටයුතු පටන් ගෙනැ ඇති කලින් වසංගත පෙදෙස්වලට අයත් වී තිබුණ ඒකාබද්ධ තලයට අයත් පෙදෙසෙහි යැ. ඉතුරු සියයට 31 සිටින්නේ කලින් රෝගය මුල් බැසගෙන තිබුණ වූ ද වන ලැහැබවල සිටැ සැතැපුම් බාගයක් ඇතුළත පිහිටි සියළු ජන වාසස්ථානවලට වැඩි ආරක්ෂාවට බෙහෙත් ඉසීම "1963 මැයි මාසයේ දී අරඹන ලදු වැ 1964 අප්‍රේල් අවසානයේ දී එය මූළුමනින් මැ අත්සිටුවා වැඩ සටහන ඒකාබද්ධ තලයට ළඟාවනවා ඇතැයි සිතිය හැක්කා වූ ද පෙදෙස්වලැ යැ.

බෙහෙත් ඉසීමේ කණ්ඩායම් 37න් 17ක් ඉවත් කර ගැනීමත් සමග ව්‍යාපාරයේ කාර්ය මණ්ඩලය අඩු වී ගියේ යැ. ඉසීම අත්හිටවූ පෙදෙස්වල වැඩ සටහන ඒකාබද්ධ අඩියට එළැඹුණි.

ඒකාබද්ධ තලයට තව තවත් පෙදෙස් ඇතුළත් වීමත් සමග, රෝගීන් සොයා බැලීම සඳහා සෝදිසියෙන් සිටීමේ කටයුතු විහිදුවා දැඩි කරන ලදි. එසේ වී නමුත්, අවදිව සිටීමේ තාවකාලික සහ අනියම් ඔවසියර්වරුන් වෙනත් රක්ෂා භාර ගැනීම සඳහා විශාල වශයෙන් අස් වී යාම හේතු කොටැ ගෙනැ වර්ෂය තුළ දී අනුදක්න සෝදිසියට ගන්නා ලද ලේ තැවරුම් ගණන සියයට 7.92කින් පහත බැස්සේ යැ.

මැලේරියා මුලිනුපුටා දැමීමේ වැඩ සටහන සම්බන්ධයෙන් කීට විද්‍යාත්මක විමර්ශන මෙහෙයැවීමෙහි ලා අපගේ කීට විද්‍යාඥයා ඇතුළු සේවක පිරිස සමග එකමුතු වී කටයුතු කරමින් සිටි ජගත් සෞඛ්‍ය සංවිධානයේ කීට විද්‍යාඥ තැන සහ ශිල්පියා තව දුරටත් මෙහි සේවය කිරීම වුවමනා නැතැයි ජ. සෞ. සංවිධානය කල්පනා කළෙන්, ඔවුහු ආපසු කැඳවා ගන්නා ලදහ. එකතු වී කර ගෙනැ ගිය විමර්ශන කටයුතු දැන් අපගේ කාර්‍ය මණ්ඩලය විසින් සාර්ථක ලෙස කර ගෙනැ යනු ලැබේ.

මෙ රටැ බීජ භාරකයා වන ඇනෝපිලිස් කියුලිසිපෙසිස් මදුරුවා දැනට භාවිතා වන ක්ලෝරීන් සම්මිශ්‍රිත ජලකර අංගාර කෘමි නාශක ද්‍රව්‍යවලට තවමත් ඉතා ඉහලින් මර්දනය වන බව පෙනෙන්නට තිබුණි.

විදේශීය ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සංවර්ධන දූත මණ්ඩලය විසින් ඩොලර්වලින් දෙන ලද ආධාර මුදල උන් හිටි ගමන් පෙබරවාරියේ අත්හිටුවන ලදින්, එයින් අපගේ වැඩ සටහනට බාධාවක් නොවනු පිණිස උපකරණ, කෘමිනාශක ද්‍රව්‍ය, පරීක්ෂණාගාරය භාණ්ඩ යනාදිය මිලට ගැනීම සඳහා ජාතික ධනයෙන් මුදල් යොදවන ලදි. මැලේරියා මුලිනුපුටා දැමීමේ වැඩ සටහන විහිදුවීම සඳහා එක්සත් ජනපද රජය පී. එල්. 480 රුපියල් අරමුදලින් දෙන ලද ආධාර මුදල්, අප වියදමෙන් සියයට 75ක් කැපී යාමට දිගටමැ ගලා ආයේ යැ. ඉතුරු සියයට 25 කැපීම් වස් ජ. සෞ. සංවිධානයේ සම්මාදම් මුදල් ලැබුණි.

වැඩ සටහනේ සංවිධාන සහ සාර්ථකත්වය ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලැබූ අතරැ, මුලිනුපුටා දැමීමේ අරමුණුවලට හවුල් වී සිටින්නාවූ විදේශීය මැලේරියා විද්‍යාඥයින් සහ සෙස්සන් 35 දෙනෙක්, ජ. සෞ. සංවිධානයෙන් සහ එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සංවර්ධන දූත මණ්ඩලයෙන් නැමුණු අර්ධ ශිෂ්‍යත්ව මතැ වැඩ සටහන උරගා බැලීමට මෙරටට පැමිණියහ. මේ වර්ෂයේ පෙබරවාරියේ දී ඉන්දියාවේ මැලේරියා සමූලනාශක වැඩ ක්‍රමයේ ප්‍රගතිය මැනීමෙහි යෙදුණ නිවහල් මිනුම් කණ්ඩායමකට අප මැලේරියා ව්‍යාපාරයේ අධිකාරි තුමා ද පත් කිරීමෙන් ජගත් සෞඛ්‍ය සංවිධානය සහ භාරත රජය ඔහුගේ කෞශල්‍යය පිළිගත් බව පළ වී යැ.

වෛද්‍ය ආයතනවල දී ලේ තැවරුම් ගැනීමෙහි ලා මුහුණ පෑමට සිදු වන අසීරු කම් සහ ගැටළු සාකච්ඡා කිරීමටත්, එබඳු අසීරුකම් මැඩ පවත්වා ගැනීමේ මං සෙවීමටත්, වෛද්‍ය ආයතනවල නිලධාරි පිරිසගේ සහයෝගය බලාපොරොත්තු වීමටත්, යන මේ අරමුණු සඳහා සෞඛ්‍ය සේවා අධිකාරි සම්මේලනයේ අවසාන සැසි වාරය මාර්තු මාසයේ දී කොළොඹැ මැලේරියා නාශක ව්‍යාපාරයේ මූලස්ථානයේ දී පැවැත්විණ.

මැලේරියා නාශක ව්‍යාපාරයේ වැඩ පොළ ප්‍රතිසංවිධානය කිරීම ගැනත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සියලු රථ වාහන පිරියම් කිරීමේ සහ නඩත්තු කිරීමේ මධ්‍යම වැඩ පොළක් බවට එය නඟා සිටුවීම ගැනත් සොයා බලා වාර්තා කරනු පිණිස, භාණ්ඩාගාරයේ ලේකම් තුමා විසින් පත් කරන්නට යෙදුණ කමිටුවක් දැන් සිය කටයුත්තේ නිරත වී සිටි. මැලේරියා නාශක ව්‍යාපාරයේ අධිකාරි තැන එහි මුලසුන දරයි. දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු තැන, පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයේ සහකාර පොලිස් අධිකාරි තැන, මහා භාණ්ඩාගාරයේ නිලධාරියෙක්, යන අය එහි සෙසු සාමාජිකයින් වන අතරැ මැලේරියා නාශක ව්‍යාපාරයේ වෛද්‍ය නිලධාරියෙක් එහි ලේකම් ධුරය උසුලයි.

නිලධාරි මණ්ඩලය

1. මුදල් වර්ෂය අවසානයේ දී ව්‍යාපාරයේ නියුක්ත වී සිටි නිලධාරි මණ්ඩලය 1 වන උප ග්‍රන්ථයේ දැක්වෙයි. බෙහෙත් ඉසීමේ වැඩ සටහන කපා හැරීම නිසාත්, වඩා හොඳ රක්ෂාවල් සොයා ගැනීමට පුළුවන් වූ තාවකාලික සහ අනියම් ඔවසියර් වරුන් ඉල්ලා අස්වීම සහ මාරු කිරීම නිසාත්, මුළු කායික-මණ්ඩලය 1013 සිටැ 868 දක්වා අඩු වී ගියේ යැ. මෙකී හේතු නිසා 1243ක් වූ මුළු සේවක සංඛ්‍යාව කිසි විටෙක රැක ගත නො හැකි වී යැ. නොයෙක් හේතු නිසා තාවකාලික සහ අනියම් ඔවසියර්වරුන් 88 දෙනෙක් ව්‍යාපාරයෙන් වෙන් වූ අතරැ, පැවැති ඇබෑර්තු පිරවීමට අලුතෙන් ඔවසියර්වරුන් 107 දෙනෙක් පත් කරනු ලැබූහ. බෙහෙත් ඉසීමේ වැඩ සටහන කපා හැරීම නිසාවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් 6 දෙනෙක් ද රියැදුරුන් 13 දෙනෙක් ද කම්කරුවන් 121 දෙනෙක් ද සේවයේ මුදා හරිනු ලැබූහ. කම්කරුවන් 121 දෙනාගෙන් 72 දෙනෙක් සෙසු

කොට්ඨාශවල ඇබෑර්තු වලට යොදනු ලැබූහ. ඉතුරු 49 දෙනා වැඩ නොමැතිකම් උඩ සේවා වියුක්ත වූහ. ඇමැති විධානයක් අනුව, ඇබෑර්තු පිරවීමේ දී සෞඛ්‍ය දෙපාර්තමේන්තුව එකී 49 දෙනාට මුල් තැන දෙයි.

ගොඩනැගිලි

2. ව්‍යාපාරයේ ගොඩනැගිලි මෙසේ වෙයි:—

(1) කොළඹ මූලස්ථානයේ ඇති කාර්යාලයීය ගොඩනැගිලි, පරීක්ෂණාගාරය සහ වැඩපොළ.

(2) අම්පාරේ ඇති නිලධාරීන්ගේ වාසස්ථාන 10ක් සහ කම්කරු වාසස්ථාන 5ක්.

(3) හිඟුරක්ගොඩ ඇති නිලධාරීන්ගේ වාසස්ථාන 4ක් සහ කම්කරු වාසස්ථාන 5ක්.

(4) ගංතලාවේ (කන්තලේ) තාවකාලික ගබඩාව.

(5) ඉසිමේ කණ්ඩායම් සහ රථ වාහන සඳහා පිට පළාත්වල ඇති රියැ මඩුසහිත ගබඩා 44ක්.

කාලගුණය

3. වෙරළාසන්න කඳු බෑවුම් පෙදෙස්වල උෂ්ණත්වය පැරන්හයිට් අංශක 65ටත් 95ටත් අතර වී යෑ. මේ නයින් බලන කලෑ, රෝගය මුල් බැසගෙන ඇත්තාවූත් වසංගත නියාවෙන් පවතින්නාවූත්, කලාපවල උෂ්ණත්වයේ සහ තෙතමනයේ තත්ත්වය රෝග බීජ පැතිර යාමට රුකුල් වීයෑ. මේ රටෙහි තත්ත්වය වර්ෂා පතනය වැනි දේශගුණ සාධකවලින් බොහෝ සෙයින්, අභාසය ලබයි. රෝගය මුල් බැසගත් කලාපයේ රෝග බීජ පැතිර යාම දියුණු තියුණු කිරීමට හිතකර තත්ත්වයක් ඔක්තෝබරයේ සිට ද මාර්තු දක්වා වූ ඊසාන දිග මෝසම් සුළඟෙන් ඇති විය. ජනවාරි, පෙබරවාරි සහ ජූනි මාසවල දී වසංගත කලාපයේ පැවැති වියලි ස්වභාවය, බීජ පැතිරීමට සෑහෙන තරම් භාරකයින් බෝවීමට හිතකර තත්ත්වයක් ගෙනැ දුන්නේ යෑ. රෝග බෝවීමේ සියළු සාධක එකතු වීමක් නොවූ හෙයින්, හුදෙක් කාලගුණයට පමණක් රෝග පැතිරිය නොහැකි විය.

මැලේරියා රෝගය පැවැති තරම (ශායනික ලෙස විනිශ්චිත රෝගීන්)

4. ශායනික රෝගීන් විහිදී සිටින අයුරු දිසා අනුවත් පළාත් අනුවත් B183 වන පිටුවේ XXXV වන සටහනේ දැක්වේ.

මැලේරියා යැයි ශායනිකවල දී සැකකරනු ලැබූ රෝගීන් 20 දෙනෙක්, රජයේ වෛද්‍ය ආයතනවලින් 14 දෙනෙක් ද වතු බෙහෙත්හල් වලින් 6 දෙනෙක් ද යනුවෙන්, දැන ගන්නට ලැබිණ. රෝගීන් 20 දෙනා මැ වසංගත රෝග විද්‍යානුසාරයෙන් සහ අනුදක්න මගින් ලේ වැකුම් බැලීමෙන් පරීක්ෂා කරන ලද නමුත්, ඉන් කිසිවෙක්වත් මැලේරියා රෝගීන් බවට නහවුරු නොවීයෑ.

මැලේරියාවෙන් වූ මරණ ගණන

5. මැලේරියාව නිසා සිදුවූ මරණයක් ගැන දැන ගන්නට ලැබුණු අතර, ඒ ගැන වැඩිදුරටත් තතු විමසා බැලීමේ දී එම රෝගියාට රෝගය බෝවී ඇත්තේ මාලදිව යිනේ දී බවත් මෙරටැ පැමිණීමෙන් පසු දරුණු අතට හැරුණු බවත්

ප්‍රතිකාරයක් කිරීමට මත්තෙන් ඔහු මිය ගිය බවත්, අනාවරණය වී යැ. රෝග විනිශ්චය තහවුරු කරනු පිණිස පශ්චාත් මරණ ලේ පරීක්ෂණයක් කරන ලදි.

කරන ලද වැඩ

6. (අ) **ගෙන්-ගෙට බෙහෙත් ඉසීම.**—වර්ෂය ආරම්භයේ දී ක්‍රියා කරමින් සිටි බෙහෙත් ඉසීමේ ඒකක 37,20 දක්වා අඩු කරන ලදි. ඉසීමේ වැඩ සටහන රෝගාශ්‍රිත කලාපයේ කැලැවල සිට සැතැපුම් ½ක් ඇතුළත පිහිටි ගෙවල්වලට පමණක් සීමා කරන ලදි. බීජ පැතිරීම කඩ වී ගියේ නමුත්, යම් කිසි නිවාසාශ්‍රිත මාර්ගයක් ඇරී තිබුණොත් කැලැ පෙදෙසේ උපද්‍රව රහිතව බෝවෙන බීජ භාරක යින්ගෙන් යළිත් රෝග බෝවීම පටන් ගත හැකි හෙයින් බෙහෙත් ඉසීම නැවැත් වීම පියවර දෙකෙකින් කිරීමට වැඩි ආරක්ෂාව සඳහා තීරණය කර ගන්නා ලදි. 1964 අප්‍රේල් අවසානයේ දී බෙහෙත් ඉසීම මුළු මනින් මැ නවතා දමන තෙක් ආරක්ෂා බෙහෙත් ඉසීම තව අවුරුද්දක් දක්වා දිගට මැ පවතිනු ඇත. කෘමි නාශක බෙහෙත් ඉසීම අඩු කිරීමට පෙර සිටි සේවක පිරිසට මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් 14 දෙනෙක් ද රියැදුරු ඔවසියර්වරුන් 23 දෙනෙක් ද පරිපාලක ඔවසියර්වරුන් 50 දෙනෙක් ද රියැදුරන් 14 දෙනෙක් ද ඉසින්නන් 241 දෙනෙක් ද අයත් වූහ. ආරක්ෂක ඉසීම ඇරඹීමෙන් පසු එම සේවක පිරිස මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් 4 දෙනෙක් ද රියැදුරු ඔවසියර්වරුන් 16 දෙනෙක් ද පරිපාලක ඔවසියර්වරුන් 22 දෙනෙක් ද රියැදුරන් 4 දෙනෙක් ද ඉසින්නන් 128 දෙනෙක් ද දක්වා අඩු කරන ලදි. මැලේරියා රෝගය ඉතා බලසම්පන්න අන්දමින් බල පැවැත්වූ පෙදෙස්වල මාස තුනක් හතරක් ගත වූ ද අනෙකුත් මුල් බැසගත් පෙදෙස්වල සය මාසයක් ගත වූ ද, ඉසීමේ චක්‍රය මාස තුනටත් හතරටත් අතර කාලයක් ගතවන සේ එකාකාර කර ගන්නා ලදි. බෙහෙත් ඉසීමේ චක්‍රයට සාමාන්‍යයෙන් මාස තුන-හතරක් ගත වූ අතර, වාසස්ථාන 3,74,288කට ඩී. ඩී. ටී. 7,59,710 වාරයක් ඉසින ලදී. ගිය අවුරුද්දේ නම් ඩී. ඩී. ටී. ඉසි වාර ගණන 10,84,647ක් වන අතර වාසස්ථාන ගණන, 4,29,978කි. වසා තිබුණ ගෙවල් 1,35,011ක අත පෙවිය හැකි කොටස්වලට බෙහෙත් ඉසින ලදි. බෙහෙත් ඉසීමට ඉඩ නුදුන් ගණන ගෙවල් ගණනින් සියයට 2.4කි. මුරණ්ඩුකම නිසා බෙහෙත් ඉසීමට ඉඩ නුදුන් අයට විරුද්ධව නීති මගින් නඩු පැවරෙන බවට දැන්වීම් නිකුත් කිරීම හේතුවෙන් පසු ගමන් වලදී බෙහෙත් ඉසීමට එසින් සෙතක් සැලසුනි. භාවිතා කරන ලද කෘමි නාශක වඩිය නම් පාරිභාෂික ඩී.ඩී.ටී. වර්ග අඩියකට මිලි ග්‍රෑම් 50කි. ගෙවල්වල සහ පිට කැටිවල ඇතුළු බිත්ති, අත දිග තරමේ උස වහල, සහ අගු කොන් යන තැන්වලට බෙහෙත් ඉසින ලදි. වර්ෂය තුළ දී දියෙන් තෙමිය හැකි ඩී. ඩී. ටී. සියයට 75ක් ඇති කුඩු රාත්තල් 5,42,622ක් වියදම් කරන ලදින්. එක් ගෙයකට එක් වතාවක දී ඉසින ලද ප්‍රමාණය රාත්තල් 0.72ක් වෙයි.

ආරක්ෂක බෙහෙත් ඉසීමේ කණ්ඩායම් පිහිටුවා ඇති තැන් 2 වන සිතුවමේ දැක්වෙන අතරැ, ඉසීමේ වැඩ ක්‍රමය ගැන පෙළට ලියන ලද ප්‍රකාශය XXXIX වන සටහනේ දැක්වෙයි.

බෙහෙත් ඉසීමේ වැඩ කටයුතු අරබයා ගිය වියදම පෙදෙස් අනුව XL වන සටහනේ ඉදිරිපත් වෙයි.

වාහනවලට ගිය ප්‍රාග්ධන වියදම ඇතුළු වැ ඉසීමේ කටයුතු සඳහා ගිය මුළු වියදම රු. 14,12,690කි. එක් ගෙයකට යොදවන ලද ඩී.ඩී.ටී. ප්‍රමාණය සඳහා ගිය වියදම රු. 1.86කි.

(ආ) **සෝදිසියෙන් සිටීම.**—සෝදිසියෙන් සිටීමේ වැඩ කටයුතු සෝදිසි මණ්ඩල සෝදිසි උප මණ්ඩල පරිපාලකයින්, (ක්ෂේත්‍ර) සෝදිසි උප මණ්ඩල (ආයතනගත)

සෝදිසි උප මණ්ඩල යන නැන් විසින් මෙහෙයවන ලදි. මෙකී මණ්ඩල විහිදී තිබෙන අකාරය වන සිතුවමේ පෙනේ, සෝදිසි මණ්ඩල 33ක්, සෝදිසි උප මණ්ඩල පරිපාලකයින් 25ක්, (ආයතනගත) සෝදිසි උප මණ්ඩල 129ක් සහ (ක්ෂේත්‍ර) සෝදිසි උප මණ්ඩල 186ක් වර්ෂය තුළ දී කායශ්‍රී ඉටු කළහ. ගමන් බිමන් සඳහා සෝදිසි මණ්ඩලවලට ජීප් රථ ද සෝදිසි උප මණ්ඩල පරිපාලකයින්ට මෝටර් සයිකල් ද (ක්ෂේත්‍ර) සෝදිසි උප මණ්ඩලවලට පා පැදි සයිකල් ද නිකුත් කරන ලදි. මෝටර් සයිකල් සහ පා පැදි සයිකල් ජ.සෞ. සංවිධානයෙන් සැපයුණි.

මැලේරියා නාශක ව්‍යාපාරයිය නොයෙක් මණ්ඩල ගණනද, ගන්නා ලද ලේ වැකි ගණනත්, මැ.නා. ව්‍යාපාරයිය මණ්ඩල වෛද්‍ය ආයතන සෞඛ්‍ය නිලධාරීන් නිරෝධායන සේවාවන් යනාදීන් විසින් සොයා ගන්නා ලද නියත රෝගීන් ගණනත් B184 වන පිටුවේ XXXVI වන සටහනේ දැක්වේ.

(i) **නිරායාසයෙන් රෝගීන් සොයා ගැන්ම.**—මැලේරියා නාශක ව්‍යාපාරයේ මණ්ඩල වලින් ලේ වැකුම් 4,77,529ක් ද වෛද්‍ය ආයතන 176ක්, සෞඛ්‍ය නිලධාරීන්, නිරෝධායන සේවා යන අය විසින් 66,495ක් ද ගන්නා ලදින්, නිරායාස ක්‍රමයට රෝගීන් අල්ලා ගැනීමට බලන ලද ලේ වැකුම් මුළු ගණන 5,44,024ක් වෙයි. සොයා ගන්නා ලද නියත රෝගීන් මෙසේ පුද්ගලික පරීක්ෂණාගාරයකින් 2දෙනෙක් ඇතුළු වෛද්‍ය ආයතනවලින් 4යි. මැලේරියා නාශක ව්‍යාපාරයිය මණ්ඩලවලින් 2යි. නිරෝධායන සේවා මගින් 1යි, එය මැලේරියා රෝගීන් මුළු ගණනින් සියයට 43.75කි.

(ii) **ආයාසයෙන් රෝගීන් සොයා ගැන්ම.**—ආයාසයෙන් රෝගීන් සොයා ගැන්මේ ක්‍රමයට ක්ෂේත්‍රයේ සෝදිසි උප මණ්ඩල 186ක් විසින් ලේ වැකුම් 3,09,149ක් ගන්නා ලදින්, ඉන් එකක් මැලේරියා පරාපොෂිතයින්ගෙන් ගහණ බව නියත වශයෙන් දැන ගන්නට ලැබුණි. මේ අනුව සොයා ගන්නට ලැබුණ නියත රෝගීන් ගණන මුළු ගණනින් සියයට 6.25කි.

මෙයින් ප්‍රශ්නයකට ඉඩ සැලසේ. මහජනයාට පහසුවෙන් ළඟා විය හැක්කා වූ ද සාමාන්‍යයෙන් ජනතාව නිසි සේ ප්‍රයෝජනයට ගනු ලබන්නා වූ ද වෛද්‍ය ආයතන රැසක් විහි දී ගොස් ඇති ලංකාව වැනි රටෙකැ සියළු මැ රෝගීන් අල්ලා ගැනීම ගැන අවධාරණය ඇති සමූලනාශක වැඩ සටහනක ඕනැ—එපාකම් ඉටු කිරීම සඳහා මැ විශාල කාර්ය මණ්ඩලයක් යොදවා ඒ සා ඉමහත් වියදමක් දැරීම වුවමනා දැයි යන ප්‍රශ්නය යි මතු වන්නේ.

එක් පරිපාලකයෙකුට (ක්ෂේත්‍රයේ) සෝදිසි උප මණ්ඩල 6ක් වන සේ ඇතුවැ සෝදිසි උප මණ්ඩල පරිපාලකයින් 25ක් දෙනෙක් ආයාස සෝදිසි නියෝජිතයින් පරිපාලනය කරමින් ඔවුන්ට මග පෙන්වූහ. තවද ඕවර්සියර්වරුන් සේවයට නො පැමිණි හැම විටෙකැමැ මෙම නිලධාරීහු සෝදිසි උප මණ්ඩලවල රාජකාරි ද ඉටු කළහ.

(ඊ) **නියත රෝගීන් මාසයෙන් මාසයට බෙදී යන අයුරු.**— නියත රෝගීන් මාසයෙන් මාසයට බෙදී යන අයුරු XXXIII වන සටහනේ දැක්වෙයි. අවුරුද්දේ මුලින් මැ දැන ගන්නට ලැබුණ රෝගීන් 1963 ජනවාරි සහ පෙබරවාරි මාසවල ගොදුරුවූ අයයි. ඔවුහු මෙ රටේ දී මැ රෝගයට ලක් වූ අය වූහ. අප්‍රේල් මාසයේ දී රෝගී වූවන් සිව් දෙනා අතුරෙන් එක් අයෙක් මෙ රටින් ද ඉතුරු තිදෙනා මාලදිවයිනෙන් ද රෝගය ලැබුවෝ වූහ. මැයි මාසයේ දී තවත් තිදෙනෙක් වූහ. ඔවුහු මාලදිවයිනෙන් රෝගය ගෙනාවෝය. ජූනි මාසයේ දී මෙ රටින් මැ රෝගී වූවන් දෙදෙනෙක් ද මාලදිවයිනෙන් ගෙන ආ එක් අයෙක් ද වූහ. ජූලි මාසයේ දී මෙ රටින් මැ රෝගී වූ එක් අයෙකි. අගෝස්තුවේ දී මාලදිවයිනෙන් රෝගය ගෙන ආ දෙදෙනෙක් ද සැප්තැම්බරයේ දී දෙදිනක් කොළඹැ නැවතී සිටි රටින් රට යන මගියෙක් ද වූහ.

(උ) **ප්‍රතිකාරය සහ තදනුගත ක්‍රියා.**—ශායනික සහ තහවුරු වූ සියළු මැලේරියා රෝගින්ට දිනපතා ගෙවල්වලට මැ ගොස් ක්ෂණික සුවය සඳහා ඇමෝඩියක්වින් සහ ප්‍රයිමැක්වින් බෙහෙතෙන් සංයෝග ප්‍රතිකාරය දෙන ලදී. මෙම රෝගින්ගේ ප්‍රතිකාර මාලාව හමාර වූ පසු සෝදිසි මණ්ඩලයේ නිලධාරියා නිතිපතා ඔවුන්ගේ රුධිර විභාග ගැනීමෙන් දැවුරුද්දක් ඔවුන් ගැන සෙවිල්ලෙන් පසු වී යැ. තදනුගත ලේ වැකුම් ගන්නා ලද්දේ, ප්‍රතිකාර විධි අවසානයේ මාසයක් ඇවැමෙන් පටන් ගෙනැ මාසයක් මාසයක් පාසායැ. එය නවතන ලද්දේ පිටැ පිටැ තුන් වතාවක් ගත් ලේ වැකුම්හි මැලේරියා පරාපෝෂිතයින් තොර බැව් පළවූ පසු යැ. ඉන් පසු වැ, තුන් මාසයකට වරක් ද ඉනුත් පසු සය මසකට වරක් ද බැගින් දැවුරුදු කාල සීමාව නිම වන තෙක් ලේ වැකුම් ගන්නා ලදී.

වැඩි හිටියන්ට දෙන ලද සම්මත ප්‍රතිකාරය නම් පළමු දවසේ ඇමෝඩියක්වින් පදනම් මිලි ග්‍රේන්ස් 600 බැගින් ද ඊට පසු සෑම දෙදිනක්ම මිලි ග්‍රේන්ස් 400 බැගින් ද යනුවෙන් වී යැ. මීට පසු, ප්ලැස්මෝඩියම් වයිවැක්ස් සහ ප්ලැස්මෝඩියම් මැලේරියයි ආසාදනය කෙරෙහි තුදුස් දිනකට ප්ලැස්මෝඩියම් පැල්සිපාරම් ආසාදනය කෙරෙහි පස් දිනකට ද ප්‍රයි මැක්වින් මාධ්‍යයේ මිලි ග්‍රේන්ස් 15ක් දෙන ලදී. ළමුන්ට දෙන ලද්දේ වයසට හරි යන වඩියකි.

(ඌ) **කීට විද්‍යාව.**—කීට විද්‍යාඥ තැනගේ විධානය සහ මග පෙන්වීම ඔස්සේ කුරුණෑගල කීට විද්‍යා පරීක්ෂණාගාරය සිය මෙහෙය ඉටු කිරීමේ දිගට මැ ඇලී සිටියේ ය. අප කීට විද්‍යාඥ තැන සමග එකතු වී සහයෝගයෙන් වැඩ කර ගෙන ආ ජ. සෞ. සං. කීට විද්‍යාඥ තැන පෙබරවාරියේ දී සිය කටයුතු අත් හළේ යැ. ඊට හේතුව ඔහු තව දුරටත් මෙහි රැඳී සිටීම නුවමනායැයි ජ. සෞ. සංවිධානය කල්පනා කිරීම යි. ජ. සෞ. සං. කාර්මික තැන ද ආපසු කැඳවුම් ලැබී ගියේ ය. වර්ෂය තුළ කීට විද්‍යා වැඩ කටයුතු මෙසේ බෙදිය හැකි යැ :—

(ක) (i) ඉසින ලද සහ (ii) මුල් බැස ගෙනැ තිබුණ කලාපයේ ඉසීම කඩ කළ පෙදෙස්වලින් (iii) ඉසීම අවුරුදු කිහිපයක් තිස්සේ ඇනහිට තිබුණ වසංගත කලාපයේත්, වැඩුණු හාරකයින් සහ පිළවුන් පැවැත්ම සොයා ගැනීමේ එදිනෙදා විමර්ශන.

(කා) ඇනෝපිලිස් කිව්ලිසිපසීස් (හාරක) වර්ගයේ ගහණය සෘතුවෙන් සෘතුවට ඉහළ පහළ යන අන්දම විමසීම අරබයා වසංගත සහ රෝගය මුල් බැස ගත් කලාපවල එකක් ද රෝගය අතීශයින් මුල් බැස්ගත් කලාපයේ දෙකක් ද වන සේ නිරීක්ෂණ ගම් සතරක විශේෂ විමර්ශන.

(කි) ඉසින ලද සහ ඉසීම ඇන හිටි පෙදෙස්වලින් අල්ලා ගත් හාරක වර්ගයත්, භාවිතා කරන කෘමිනාශක ද්‍රව්‍යවලින් විඳවන තරම මැන ගැනීම.

(කු) හාරක වර්ගයන් බෝ කිරීම සඳහා උපකාරක නිරීක්ෂණ ස්ථාන 195ක් සෝදිසි කිරීම.

මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් භාරයේ වූ සෝදිසි මණ්ඩල 33ක් විසින් ද ඔවසියර්වරුන් භාරයේ වූ සෝදිසි මණ්ඩල 4ක් විසින් ද එදි-නෙදා කටයුතුවලට අදාල විමර්ශන මෙහෙයවන ලදී. වර්ෂය තුළ දී රෝගාබද්ධ කලාපයේ ගෙවල් 7,462ක් පරීක්ෂා කරන ලදින්, ඇනෝපිලින්ස් මදුරුවන්ට ආරක්ෂා සහිත ස්ථාන වූ බවට සොයා ගන්නා ලද ගෙවල් ගණනත් ප්‍රතිශතකය අතින් අල්ලන ක්‍රමයෙන් 4.7ක් ද ඉසමේ ක්‍රමයෙන් 71.4ක් ද වී යැ. මේ ගෙවලින් ඇනො. කිව්ලිසපසීස් අතින් අල්ලා ගැනීමෙන් ලත් ගණන 64ක් ද ඉසීමේ ක්‍රමයට ලත් ගණන 255ක් ද වී යැ. රෝගාබද්ධ කලාපයේ නිලධාරීන් විසින් පරීක්ෂා කරන ලද ඉතා වැදගත් බෝවෙන ස්ථාන 21,602කින් සොයා ගන්නා ලද ඇනො. කිව්ලිසිපෙසීස් පිළවුන් ගණන 1,469කි.

වසංගත කලාපයේ ගෙවල් 5,632ක් පරීක්ෂා කරන ලද අතරැ, ඇනෝපිලින්ස් මදුරුවන් වැසී සිටි ගෙවල් සියයට ගණන අතින් ඇල්ලීමේ ක්‍රමයෙන් 6.9ක් බව හෙළි වීයැ. ඇනෝපිලිස් කිව්ලිසිපෙසිස් වැඩුණු මදුරුවන් අතින් ඇල්ලීමේ ක්‍රමයෙන් ලත් ගණන 16ක් ද ඉසිමේ ක්‍රමයෙන් ලත් ගණන 35ක් ද වී ය.

වසංගත කලාපයේ අති වැදගත් බෝවෙන ස්ථාන 49,086කින් සොයා ගත් ඇනෝපිලිස් කිව්ලිසිපේසිස් පිළවුන් ගණන 58කි.

වසංගත කලාපයේ ආඩිමුල්ලේත්, මධ්‍ය—රෝහාබද්ධ කලාපයේ නිලන්තව්වුවේත් රෝහාබද්ධ කලාපයේ උඩුගොඩගම සහ අත්තරගල්ලැවේත්, ඇනෝපිලිස් ක්‍යුලිසි පෙසිස් මදුරුවන්ගේ ගහණ සෘතු අනුව අඩු—වැඩි වන අයුරු දැනගැනීමට අවුරුද්ද මුලුල්ලේම විශේෂ විමර්ශන මෙහෙවුණි. විවිධ නිරීක්ෂණ ග්‍රාමවල ජනයා වෙසෙන ගෙවල සහ ඉන් බැහැර ස්ථානවල වැඩුනු මදුරුවන් අල්ලා ගැනීම, අතින් ගැනීමේ ක්‍රමයටත් ඉසිමෙන් ගැනීමේ ක්‍රමයටත් ජනෙල් උගුල් දැමීමෙන් සහ ගව ඇම තැබීමෙන් කරන ලදි. ආඩිමුල්ලේවත් උඩුගොඩ ගමේවත්, අතින් ඇල්ලීමෙන් ලබා ගන්නා වූ හෝ ඉසිමේ ක්‍රමයෙන් ලබා ගන්නාවූ හෝ ජනෙල් උගුල්වලට හසු වී සිට අල්ලා ගන්නා වූ හෝ එක ද ඇනොක්‍යුලිසිස් පෙසිස් වැඩුණු මදුරුවන් නො වී යැ. නිලන්තව්වුවේ දී අතින් ඇල්ලීමේ ක්‍රමයට ඇනොක්‍යුලිසිපේසිස් ගැහැණු මදුරුවන් 7 ක් ද ඉසිමේ ක්‍රමයට පිරිමි මදුරුවන් 1 ක් ද අල්ලා ගත් අතරැ, අත්තරගල්ලැවේ දී අතින් ගැනීමේ ක්‍රමයට ගැහැණු 5 ක් ද ඉසිමේ ක්‍රමයට පිරිමි 2 ක් ද හසු වී යැ.

ජනෙල් උගුල් නිසා ගම් දෙකෙන් ඇනො. ක්‍යුලිසිපේසිස් මදුරුවන් ලැබුණි. නිලන්තව්වුවේ දී එක් ගැහැණු සතෙක් සොයාගත් අතරැ, ඌ පැය 24 ක් ඇතුළත දී මිය ගියේ යැ. ඉසින ලද ගමක් වන අත්තරගල්ලැවේ දී සොයා ගනු ලැබූ ගැහැණු 7 ක් සහ පිරිමි 11 ක් වන ඇනෝපිලිස් ක්‍යුලිසිපෙසිස් මදුරුවන් අතුරෙන්, 8 දෙනෙක් පැය 24 ඉක්මවා ජීවත් වූහ. මෙයින් පෙනෙන්නේ හාරක වර්ගයත් කෙරෙහි ඩීඩීටී විනාශකාරී බවයි. මේ සොයා ගැන්ම අනුව, වැඩිදුරටත් විමර්ශන අවශ්‍ය වන හෙයින් එය ද ඉටු කරනු ඇත.

රෝහාබද්ධ කලාපයේ ඉසින ලද ගම්වලැ ගංගා පතුල් වල ඇනොපිලිස් ක්‍යුලිසිපේසිස් පිළවුන් නිතර නිතර දැකගන්ට ලැබීම, අසළ පිහිටි වන ලැහැබ්වලැ ඇනො. ක්‍යුලිසිපේසිස් මදුරුවන් තදින් ගහන වී සිටින නිසා යැයි සිතිය හැක.

සතුන්ගේ ඇම් එකතුවෙන් ඇනොපිලිස් ක්‍යුලිසිපේසිස් නො ලැබුණ නමුත්, අත්තර ගල්ලැවේ දී අනෙකුත් ඇනොපිලින්ස් වර්ග අල්ලා ගන්නා ලදි. පිට මඩු ආවරණ යනාදිය පරීක්ෂා කිරීමෙන් අත්තරගල්ලැවේ දී තනි හාරක වශී ලබාගත හැකි වී යැ.

උඩුගොඩගම, අක්කරයන්කුලම සහ මන්නාරම යන තුන් පොළකින් අල්ලාගන්නා ලද පිළවුන්ගෙන් ඇති කරන ලද ඇනො. ක්‍යුලිසිපේසිස් මදුරුවන් විෂයයෙහි ඩී.ඩී.ටී. බලපාන සැටි පරීක්ෂා කර බලන ලදි. උඩුගොඩගමැ සහ අක්කරයන්කුලම් යන දෙපොළේ හාරක වර්ග තවමත් ඩී.ඩී.ටී. වලට වැනසෙන සුළු බව ප්‍රතිඵල වලින් පෙනී ගියේ යැ. මන්නාරමෙන් ලබා ගත් එවුන් විෂයයෙහි පරීක්ෂණ වලින්, සියයට 2 ඩීඩීටී වලින් 4 දෙනෙකු දිවි බේරාගත් බවත් සියයට 2 සහ සියයට 4 ඩීඩීටී වලින් සියයට සියයක් මැ වනසනයට පත්වූහ. මෙය සමහර විටැ, ප්‍රතිප්‍රහාරක බලය වැඩිකම නිසා, හෝ ස්පර්ශ සංඥාවත් කෘමි නාශක බල කැවූ කඩදාසියේ නිරාවරණ ගුල් මග හැරී යාම නිසා හෝ, මන්නාරමේ දී එකතු කරගත් පිළවුන්ගෙන් බෝ කරන ලද මදුරුවන්ගේ වීර්යවන්ත ඔරොත්තු දීමේ ප්‍රතිඵලයක් වියැ හැක. මේ හේතුවෙන්, මන්නාරම පෙදෙස් ඇනො. ක්‍යුලිසිපේසිස් වර්ග විෂයයෙහි තවදුරටත් පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍යතාවය පැන නැගුණි.

පිටියේ මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් විසින්, වසංගත ප්‍රදේශයේ උපකාරක නිරීක්ෂණ ස්ථාන 195 ක හාරක වර්ගයේ පිළවුන් සඳහා පරීක්ෂණ පවත්වන ලදි. මේ උපකාරක නිරීක්ෂණ පොළවල් සියල්ල මැ පිහිටා ඇත්තේ ඉසීම ඇන හිටියා වූ

පෙදෙස්වල යැ පරීක්ෂණ 2655 ක දී අනෙකුත් ඇනෝපිලින් වර්ගවල එවුන් 3051 ක් සොයා ගත්තේ වී නමුත්, ඇනොපිලිස් ක්‍යුලිසිපේසිස් වර්ගයේ පිළවුන් එකෙක්වත් එකී පොළවලින් වර්ෂය තුළ දී ලැබී නො තිබුණි.

(එ) **සෞඛ්‍ය අධ්‍යාපනය.**—මැලේරියා හා සම්බන්ධ සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු ක්‍රියා ශීලී ලෙස කරගෙනැ යන ලද. මැලේරියා මුලිනුපුටා දැමීමේ ප්‍රයත්නය උදෙසා මහජන යාගේ සහයෝගය ලබා ගනු පිණිස මුද්‍රිත දැන්වීම් සහ පුවරුත්, ව්‍යාපාරයේ නිලධාරීන් විසින් සෞඛ්‍ය සති උළෙලේ දී බෙදා හරින ලදි. මුලිනුපුටා දැමීමේ වැඩ ක්‍රමයේ නොයෙක් වැඩ කටයුතු දැක්වෙන ඡායා රූපවල පිටපත් සහ ප්‍රචාරය සඳහා මුද්‍රාපිත ලිපි ජගත් සෞඛ්‍ය සංවිධානයට ඉදිරිපත් කරන ලදි. මැලේරියා සමූලනාශන යේ ප්‍රගතිය දැක්වෙන පොත්—පිංචක් පිළියෙල කරන ලදුවැ, මාර්තු මාසයේ දී මැලේරියා නාශක ව්‍යාපාර මූලස්ථානයේ දී පවත්වන ලද සෞ. සේ. අධිකාරීන්ගේ සම්මේලනයට ඉදිරිපත් කරන ලදි. මැලේරියා වඳ කිරීමේ අවසාන අඩියේ දී මහ ජනයාගෙන් ඉටු විය යුතු කොටස සම්බන්ධයෙන් පත්‍රයක් පිළියෙල කොට බෙදා දෙන ලදි. මැලේරියා පිළිබඳ සිනිමා සහ දෙසුම් පිළියෙල කොට පාසල්වලට දෙන ලදි. සෞඛ්‍ය ශික්ෂක ගැන ද, මහරගමැ දන්තායතනයේ දී දන්ත පුහුණුව ලබන්නන්ට දෙසුම් වැලක් දුනි. සෞඛ්‍යයට අදාළ මේ විෂය ගැන චිත්‍ර පිට දර්ශන ව්‍යාපාරයේ සේවක පිරිසට පෙන්වන ලදි.

කොළඹ මූලස්ථානයේ පොත් ගුලක් සහ කවුගෙයක් පිහිටුවාගෙනැ යනු ලැබේ.

(ඒ) **ප්‍රවාහණය සහ වැඩ පොළ.**—ජීප් රථ 101කින් ද මෝටර් සයිකල් 60කින් ද පා පැදි සයිකල් 250කින් ද යුත් ව්‍යාපාරයේ රථ සමූහය පිළියම් කිරීම සහ නඩත්තු කිරීම කරන ලදි. යාන්ත්‍රිකයින් යැවීමෙන් කම්පිටියේ දී රිය පිළියම් කරවන ලදි. ව්‍යාපාරයෙන් බාහිර වූ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රථ වාහන 42ක් ද වර්ෂය තුළ දී පිළියම් කරන ලදි.

ඉසිමේ වැඩ ක්‍රමය කපා හැරීම සමග වාහන 6ක් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෙසු කොට්ඨාසවලට මාරු කරන ලදි. වාහන 8ක් සේවයෙන් ඉවත් කරන ලද නමුත් අලුත් වාහන මිළ දී ගැනීමක් නො වී යැ. මෙම වැඩ පොළ අවසානයේ දී දෙපාර්ත මේන්තුවේ මධ්‍යම වැඩ පොළ සහ රිය මඩුව බවට හැරවීමේ වැඩ ක්‍රමය ක්‍රියාවේ යෙදවීම සඳහා අමතර යන්ත්‍රෝපකරණ මිළ දී ගන්නා ලදි.

(7) **විදේශීය ආධාර.**—ඩොලර් ආධාරය අත්හිටුවීමට පෙරැ, එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සංවර්ධන දූත මණ්ඩලය ඩී.ඩී.ටී. රාත්තල් 1,50,000ක් මිළ දී ගැනීම සඳහා එක්සත් ජනපද ඩොලර්වලින් රු. 1,61,368 ක ආධාර මුදලක් සම්මාදම් වී යැ. සෝදිසියෙන් සිටීමේ ව්‍යාප්ත වැඩ සටහනේ වියදමෙන් සියයට 75ක් පියවීම සඳහා පිළුන් 480 රුපියල් අරමුදලෙන් ද රු. 2,07,953 ක ආධාර මුදලක් සම්මාදම් වී යැ. එම වැඩ සටහනේ ඉතුරු සියයට 25 වියදම පියවීම සඳහා ජගත් සෞඛ්‍ය සංවිධානය රු. 69,086 කින් සම්මාදම් වූවා යැ.

විදේශීය බල මණ්ඩල විසින් දෙන ලද ආධාර මුදල් පිළිබඳ ආවේදනයක් XLII වන සටහනේ දැක්වේ.

වියදම සහ එක් පුද්ගලයෙකු සඳහා ගිය වියදම

(8) වර්ෂය තුළ දී ව්‍යාපාරයට සිදුවූ මුළු වියදම වන රු. 34,20,532 ක මුදල බෙදී ගිය හැටි XLII වන සටහනේ දැක්වෙයි.

මැලේරියාවෙන් ආරක්ෂා කර ගන්නා ලද ජනගහණයෙන් එක් පුද්ගලයෙකු සඳහා ගිය වියදම ශත 63 කි. ගිය අවුරුද්දේ නම් මෙය ශත 58ක් පමණි.

සැඳහුම්

(9) එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සංවිධාන දූත මණ්ඩලය සහ ජගත් සෞඛ්‍ය සංවිධානය මෙම වැඩ ක්‍රමය සපල කර ගැනීම සඳහා මුදලින් සහ කාර්මික උපදේශ යෙන් ඉතා අනර්ඝ ලෙස ආධාර කළ බව ස්තුති පූර්වක පිළිගනු ලැබේ. වැඩ ක්‍රමය කෙරෙහි එම ආයතන දෙක නිරතුරුවැ උනන්දුවක් දක්වා ඇත. ශාසනික වශයෙන් හමු වූ මැලේරියා රෝගීන් ගැන එවෙලේ මැ දැනුම් දෙමින් ද, උපලේඛන ගත වතුවල මැලේරියා බෝවීම ගැන ව්‍යාපාරයට පුවත් සැලකරමින් ද, අපට සහයෝගය දුන් වතුකරයේ සෞඛ්‍ය ක්‍රමයේ වෛද්‍ය නිලධාරි තැනගේ සේවය ප්‍රශංසා මුඛයෙන් සඳහන් කරමි.

ඇ—බරවා රෝග මර්ධනය

ගැටළුව

1. "ඩබ්ලිව්. බැන්ක්‍රොප්ටි" නිසා රෝගය බෝවීම නිරිත දිග මුහුදු බඩ ප්‍රදේශයේ ගැටළුවක්ව තිබිණ. දිවයින පුරාම පැවැත්වූ පරපෝෂිත විද්‍යාත්මක සමීක්ෂණයේ දී අනාවරණය වූයේ ආසාදනය දිවයිනේ වෙනත් පළාත්වලට පැතිරී නැති බවයි. පසුගිය අවුරුදු පහ තුළ දී මේ රෝගයේ තත්ත්වය XLIII වැනි සටහනින් පෙනේ. ඒ ඒ බරවා රෝග මර්දන මධ්‍යස්ථාන යටතේ සමීක්ෂණයට භාජන වූවත්, පසුගිය සිව්වසර තුළ දී "මයික්‍රෝfපයිලේරියා" රෝගය බොහෝ සෙයින් අඩුවැඩි වීමක් නොමැතිව පැවතුන බැව් XLIV වෙනි සටහනෙන් පෙනේ. මෙයින් පෙනී යන්නේ දැනට සොදා ඇති ක්‍රමය වැඩිදියුණු කිරීමෙන් රෝගය සාර්ථක ලෙස මර්දනය කිරීමට හැකිවන බවයි. රෝගය පැතිරීම පරිමාණයක් වශයෙන් ගත් කල 1.3% (මොරටුව) සිට 8.0% (ගාල්ල) දක්වා වෙනසක් ඇති බැව් පෙනිණ. වත්තල (5.8%) සහ අලුත්ගම 5.3%) අධික පරිමානයක් දක්වූ වෙනත් ප්‍රදේශ වේ.

සංවිධානය

2. බරවා රෝග මර්දනය වැඩි දියුණු කිරීමේ ක්‍රියා පටිපාටිය 63.5.1 වැනි දිනය සිට ක්‍රියාත්මක කෙරින. (ගාල්ලේ නගර සභා ප්‍රදේශය, ජා-ඇළ උප නගර සභා ප්‍රදේශය, කොළඹ වරාය, අළුත්ගම සහ දර්ගා සුළු නගර සභා ප්‍රදේශ පහටත් දැනට පවත්නා රෝග මර්දන ක්‍රියා පිළිවෙල දීර්ඝ කිරීමත් සමගම පිළවී මර්දනය කිරීමේ ක්‍රියා පිළිවෙල දීර්ඝ කිරීමත් සමගම පිළවී මර්දනය කිරීමේ ක්‍රියා පිළිවෙල දැනට පවත්නා සියලුම මර්දන මධ්‍යස්ථානවල සතර පැත්තෙන් සැතපුම් භාගයක ප්‍රදේශයකට දීර්ඝ කරන ලදි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් (පරපෝෂිත මර්දනය සඳහා 31, පිළවුන් මර්දනය සඳහා 20 සහ රසායනාගාර කටයුතු සඳහා 16 යනාදි වශයෙන්) බරවා රෝග මර්දන සහායකයින් 67 දෙනකුන් ද (පිළවී මර්දනය සඳහා) කම්කරුවන් 70 දෙනකු ද බඳවා ගැනීමෙන් කාර්‍ය්‍ය මණ්ඩලය වැඩි කරන ලදි.

කටයුතු

3. සිරිත් පරිදි කෙරෙන වැඩ කටයුතු රෝගය පැතිර පවත්නා නාගරික ප්‍රදේශවලට (කොළඹ නගර සභා ප්‍රදේශය හැර) සීමා විය.

(අ) සිරිත් පරිදි කෙරෙන වැඩ

(i) පරපෝෂිත විද්‍යාත්මක විමර්ශන සහ පාලනය

(ii) කීට විද්‍යාත්මක විමර්ශන හා පාලනය සහ

(ආ) විශේෂ වැඩ කටයුතු යනාදි වශයෙන් ක්‍රියාවට භාජන වූ වැඩ කටයුතු වර්ග කළ හැක.

(අ) **සිරින් පරිදි කෙරෙන වැඩ**—(1) පරපෝෂිත විද්‍යාත්මක විමර්ශන හා පාලනය. —ක්ෂේත්‍ර නිලධාරි සංඛ්‍යාව වැඩි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එකතු කළ ලේ තහඩු ගණන දෙගුණයක් තරම විය. පරීක්ෂා කරන ලද ලේ සැම්පල් 2,19,539 ක් වූ මුළු ගණනින් 7995ක "මයික්‍රොපයිලේරියා" සොයා ගන්නා ලදී. (මෙම "මයික්‍රොපයිලේරියා" ප්‍රමාණය සියයට 3.6ක් විය.

"මයික්‍රොපයිලේරියා" තිබූ බාලම වයස් කාරයා වූයේ මාස 8කුත් දින 4කුත් වයස් වූ පිරිමි බිළිඳෙකි.

රෝගය වැළඳී තිබූ රෝගීන්ට සහ ඔවුන් ඇසුරු කරන අයට නිවෙස්වල දී ඩයතිල් කාබමසින්" නමැති බෙහෙත්වලින් ප්‍රතිකාර කරන ලදී. පරීක්ෂා කරන ලද ප්‍රශ්වාත් ප්‍රතිකාර ලේ තහඩු 12,773න් පෙනී ගියේ 2,374ක නිශ්චිත රෝග ලක්ෂණ තිබූ බවයි. (18.6%) නිශ්චිත වශයෙන් රෝගය වැළඳී සිටි අයගේ සංඛ්‍යාව (ඌනවටුන) 5.9% සිට (බේරුවල හා ගාල්ල) 27.7% දක්වා වෙනස්විය. පැලියගොඩ (26.7%) මාතර 24.1%) (වත්තල 23.1%) අම්බලන්ගොඩ (22.0%) ජාඇල (21.2) කෝට්වේ (20.9) යනාදිය වැඩි සංඛ්‍යාවක් තිබූ අනිකුත් මධ්‍යස්ථාන වේ. මේ අයුරින් සුව ලැබූවන්ගේ සංඛ්‍යාවේ වෙනස්කම් ඇතිවීමට හේතුව වනුයේ නිශ්චිත වශයෙන් රෝගය වැළඳී ඇති ඇතැම් රෝගීන් විශෙෂයෙන් ම බෙහෙත් පාවිච්චියේ දී වෙනත් සුළු ආබාධ ඇතිවීම නිසා නොකඩවා සම්පූර්ණ බෙහෙත් ප්‍රමාණය පාවිච්චි නො කිරීමයි. ඉතා කෙටි කාලයක් තුළ දී ප්‍රතිකාර කළ හැකි වූ ද පාවිච්චි කිරීමේ දී වෙනත් ප්‍රතිඵල ගෙන නොදෙන්නා වූ ද බෙහෙතක් අවශ්‍යතාව කියා නිම කළ නොහැක.

(2) **කිට විද්‍යාත්මක විමර්ශන හා පාලනය.**—රෝගය පැතිර පවත්නා ප්‍රදේශයේ කිට විද්‍යාත්මක පර්යේෂනාගාර තිහෙහි සී (සී) පැටිගන්ස් 15,677 ක මුළු ගණනක් එකතුකර ගන්නා ලදී. සී. (සී) පැටිගන් ලෙස හඳුනාගන්නාවූ ද කපා බලන ලද්දාවූ ද සී. (සී) පැටිගන්ස්, 8,761 ක රෝගය බෝවීම ඇති බැව් සොයා ගන්නා ලදී. රෝගය බෝවන ප්‍රමාණය 2.0%) තුන්වන අවධියේ රෝගය බෝවීම සොයා ගන්නා ලද්දේ 1.1% රෝගය බෝවීමේ ප්‍රමාණය 0.2% (කෝට්වේ) සිට 4.2%) (වැලිගම) දක්වා වෙනස් විය. පිළිවුන් මර්දනය කිරීමේ වැඩ කටයුතුවලට අතිරේක වශයෙනි. දෙහිවල ගල්කිස්ස නාගරික සභාවට අයත් ප්‍රදේශයේ සහ මාතර උපනගර සභාවට අයත් පොල්හේන කොට්ඨාශයේ සීමිත ප්‍රමාණයකින් වැඩි ගිය මදුරුවන් නාශක බෙහෙත කින් විනාශ කරගෙන යති. අනිකුත් සැම ස්ථානවලට පාහේ මදුරුවන් බෝකිරීමේ තැන් 1,06,770 කට සතිපතා ක්‍රමයට මැලතියන් නමැති තෙල් වගීය ඉසීම කරන ලදි. බෝවන ස්ථාන 1,431 ක් පස් ඝන අඩි 24,669 කින් සම්පූර්ණයෙන් ම පුරවා ස්ථිර වශයෙන් විනාශ කරන ලදී. වැසිකිළි ඉදි කිරීමට රජයේ ආධාර දීමේ ක්‍රමය යටතේ දියවළ සහිත වැසිකිළි 1,192ක් "ලමුද්‍රිත" බවට හරවන ලදි.

(ආ) **විශෙෂ වැඩ කටයුතු.**—රෝගය දිවයිනේ අනිකුත් ප්‍රදේශවලටත් බෝවීගෙන යන්නේ දැයි සොයා බැලීමේ අදහසින් රසායනාගාර පහසුකම් ඇති රෝහල්වලට ඇතුල්වන රෝගීන් සැම දෙනාම පරපෝෂිත විද්‍යාත්මක පර්යේෂණයකට භාජන කරන ලදි. පරීක්ෂා කර බලන ලද ලේ තහඩු 1,35,688ක 21 දෙනකුට "ඩබ්ලිව්. බැන් ක්‍රොප්ටි" විෂබීජ තිබූ බැව් සොයා ගන්නා ලදි. මේ අය සියලු දෙනාම පාහේ රෝගය පැතිර පවත්නා ප්‍රදේශයේ වාසය කළ අය බවට තහවුරු කිරීමට හැකියාවක් තිබේ.

විශේෂ කිට විද්‍යාත්මක සමීක්ෂණ බාරගන්නා ලද අතර බරවා රෝග මර්දන ව්‍යාපාරයට අයත් මධ්‍යස්ථාන සැමයකම පාහේ ඒවා නිම කරන ලදි. රෝගය බෝ කිරීමේ ස්ථාන දක්වා සිතියම් සූදානම් කරන ලදි.

සී (සී) පැටිගන්ස් නමැති මදුරුවාට කොතෙක් දුරට පියඹා යා හැකි දැයි සොයා ගැනීම සඳහා "රේඩියෝ-අයිසොටෝප්ස්" පාවිච්චි කිරීමෙන් සොයා බලන ලදි.

රෝග නිවාරණ කටයුතු

4. රෝගය පැතිර පවත්නා ප්‍රදේශවල පවත්වාගෙන යන විශේෂිත චිකිත්සාගාරවල රෝගීන් 9,525 දෙනකුට ප්‍රතිකාර කරන ලද අතර වර්ෂය තුළ දී නව රෝගීන් 1,282 දෙනකු සොයා ගන්නා ලදි. දෙහිවල හා රත්මලාන චිකිත්සාගාරවල දී ප්‍රතිකාර කරන ලද රෝගීන් 1,282 විග්‍රහ කර ඇති අයුරු XLV වැනි සටහනේ දැක්වේ.

අධ්‍යාපනය

5. සෑම බරවා රෝග මර්දන ව්‍යාපාර මධ්‍යස්ථානවලම සතියක් තිස්සේ පවත්නා සෞඛ්‍ය අධ්‍යාපනික කටයුතු බොහෝ සෙයින් කරගෙන යන ලදි. ගාල්ල, අලුත්ගම සහ ජාඇල ආදි නව ප්‍රදේශ ගැන විශෙෂ සැලකිල්ලක් දක්වන ලදි. මෙම කටයුතු මාලාව උදේ වරුවේ පාසල්වලත් දහවල් වරුවේ ප්‍රජාමණ්ඩලවලත් කතා සහ සාකච්ඡා වලින් ද අනතුරුව සවස්වරුවේ චිත්‍රපට සහ සාකච්ඡාවලින් ද සමන්විත විය. පාසල්වල දී කථා 96 කුත්, ප්‍රසිද්ධ කථා 147කුත්, චිත්‍රපට 114 කුත් පවත්වන ලදි. මෙයට ගුවන් විදුලි කථා ද ඇතුළත් වේ. සතුටුදායක අන්දමට (වැලිගම සහ අම්බලන්ගොඩ) ප්‍රදර්ශන දෙකක් පවත්වන ලදි.

තැනින් තැන විසිකර දමා ඇති කෝම්බ ආදිය නැති කිරීමේ ශ්‍රමදාන වැඩ පිළිවෙළක් සතුටුදායක ලෙස වැලිගමදී පවත්වන ලදි.

ව්‍යාපාරයේ කාර්‍ය්‍ය මණ්ඩලය වෛද්‍ය සේවයේ යෙදී සිටින අය සහ අනිකුත් අය සඳහා බරවා රෝගය සහ රෝග පාලනය පිළිබඳ දේශනා අභ්‍යාස පවත්වන ලදි.

බරවා රෝග මර්දන ව්‍යාපාරයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්ගේ ප්‍රයෝජන සඳහා පොටෝ කාඩ්, ඡායාරූප සහ දියවල සහිත බාල්දි වැසිකිළි "ජලමුද්‍රිත" වර්ගයට හැරවීම පිළිබඳ පත්‍රිකා ප්‍රකාශිත දේවල්වලට අයත් විය.

රසායනාගාර වැඩ

6. ක්ෂේත්‍රයේ දී එකතු කරගන්නා ලද ලේ සැම්පල් බරවා රෝග මර්දන ව්‍යාපාරයට අයත් මධ්‍යම රසායනාගාරවල දී පරීක්ෂාකර බලන ලදි. (පසුව ගන්නා ලද සැම්පල් 12,773 ඇතුළත් වූ) ලේ සැම්පල් 2,32,312 ක් දෙහිවල පරපෝෂිත විද්‍යාත්මක රසායනාගාරයේ දී පරීක්ෂාකර බලන ලදි. මෙම ලේ තහඩුවලින් සමහරක් පරීක්ෂාකර බලා වාර්තා කරන ලෙස වෛද්‍ය පර්යේෂණ ආයතනයට යවන ලදි. වෛද්‍ය පර්යේෂණ ආයතනයෙන් පරීක්ෂා කර බලන ලද මුළු ලේ තහඩු 905 ක පරස්පර විරෝධි අදහස් දැක්වූයේ තහඩු 11ක් සම්බන්ධව පමණ ය.

කීට විද්‍යාත්මක වැඩවලට අයත් වූයේ මදුරුවන් 20,986ක් හඳුනා ගැනීමයි. සී (සී) fපැටිගන්ස් 15,677ක් සහ වෙනත් වර්ගයට අයත්, නම් වශයෙන් එම් (එම්) යුනිfෙපාම්ස්, ඒ ඔබ්ටර්බන්ස්, සී. විරසිවේනියෝරසිතස්, සී. ගෙලිඩස්, ඒ (එස්) ඒජිප්ටි, හා ඒ (එස්) එල්බොපික්ටස්, 5,309 ක් මේ සංඛ්‍යාවට අයත් වේ. සී (සී) පැටිගන්ස් 8,761 ක් ඇතුළත් මදුරුවන් 9,292 ක සංඛ්‍යාවක් මේ කාලය තුළ දී කපා බලන ලදි. මදුරු පිලවුන් 43,620 ක් එකතු කර හඳුනා ගන්නා ලදි. මොවුන් අතර වැඩියෙන් දක්නට ලැබුණේ සී (සී) පැටිගන්ස්, ඒ ඔබ්රුබන්ස්, සී. විරසිවේනි යෝරසිතස්, සී. ගෙලිඩස්, ඒ (එස්) ඒජිප්ටි සහ ඒ (එස්) එල්බොපික්ටස් යන වර්ගයි.

ලබා ඇති දියුණුව

7. ප්‍රමාණවත් නොවන ඉඩකඩ, සේවක මණ්ඩලය ආදි බාධක ඇති සුළු පහසුකම් මධ්‍යයේ දී රෝගය මැඩ පැවැත්වීම සම්බන්ධව ලබා ඇති දියුණුව අති මහත් ය. එතෙකුදුවුවත්, අතිරේක සේවක පිරිසක් පත්කොට පුහුණුව ලබා දීමෙන් සේවක

පිරිස ප්‍රමාණවත් නොවීමේ ප්‍රශ්නය බොහෝ දුරට විසඳන ලදී. රෝගය වෙනත් පළාත්වලට පැතිරීගෙන නොයන බවට සාක්ෂි ලැබීම සන්තෝෂයට කරුණකි.

සි (සී) fපැටිගන්ස් මදුරුවා පියාඹන ප්‍රමාණය සොයා ගැනීම සඳහා පැවැත්වූ විමර්ෂණ සැලකිය යුතු දෙයකි. මේ සඳහා රේඩියෝ අයිසොටෝප්ස් " පාවිච්චි කරන ලදී. සලකුණු ලැබූ මදුරුවන් යාර 35 සිට සැතපුම් 3/4 දක්වා දුර ප්‍රමාණයකට යන බැව් සොයා ගන්නා ලදී.

ප්‍රසිද්ධ කිරීම සඳහා පොත් දෙකක් ඉදිරිපත් කොට ඇත.

8. එක් අයකු සඳහා වැයවූ වියදම

එක් අයකු සඳහා දැරූ වියදම දල වශයෙන් ශත 90කි.

ඇ.—ලාදුරු රෝග මර්දනය

ස්පර්ෂකයින් සමග සිටින අළුත් රෝගීන් සොයා ගැනීමත් ප්‍රතිකාර මගින් ලබා ඇති දියුණුව හා එතෙක් සොයාගෙන සිටි සියලුම ලාදුරු රෝගීන් වර්ෂය තුළදී පරීක්ෂා කරන ලදී.

ලාදුරු ගිලන් භාවය

දැනට ලියාපදිංචි වී සිටින ලාදුරු රෝගීන් ගේ සංඛ්‍යාව 4,117 කි. ගිය වර්ෂයේ දී මේ සංඛ්‍යාව 3,966 දෙනෙක් වූහ. මරණ හා වෙනත් හේතූන් නිසා රෝගීන් 115 දෙනෙකු ලේඛනයෙන් අස්කරනු ලැබූ අතර වර්ෂය තුළ දී නව රෝගීන් 264 දෙනෙක් ලියා පදිංචි කරන ලදී. ගතවූ වර්ෂයේ දී ලියා පදිංචි කරන ලද නව රෝගීන්ගේ සංඛ්‍යාව 309 දෙනෙකි. විස්තර සඳහා XLVI චක්‍රය හා XLVII බලන්න.

රෝගය වැඩිම වශයෙන් පවත්නේ අවුරුදු 30-39 අතර වයස් සීමාවේ පසුවන්නන් අතරය. ඊළඟට රෝගය පවත්නේ අවුරුදු 40-49ත් අතර වයස් සීමාවේ පසුවන්නන් අතරය. අවුරුදු 50-49 ත් අතර සිටින්නේ තෙවෙනි ස්ථානයට පැමිණෙති. ස්ත්‍රී පුරුෂයන් අතර රෝගය පවතින්නේ 1 : 3 යන අනුපාතයෙනි. බෝවන තත්ත්වයේ සිටින රෝගීන්ගේ අනුපාතය 4 : 1 කි. බෝ නොවන අන්දමේ රෝගීන්ගේ අනුපාතය 2 : 1 කි. පිරිමින් අතර රෝගය වැඩි වශයෙන් පවත්නේ මේ රෝගයට පිරිමින් පහසුවෙන් ගොදුරු වන හෙයිනි. බෝවන තත්ත්වයේ සිටින ලාදුරු රෝගීන් ගේ අනුපාතය වැඩිවී ඇත්තේ දීර්ඝ කාලයක් ගතවීම නිසාය. වැඩිම සංඛ්‍යාවක් රෝගීන් සිටින්නේ බටහිර පළාතේ ය. කොළඹ නාගරිකයට අයත් රෝගීන් 575 දෙනා ඇතුළුව බස්නාහිර පළාතේ සිටින මුළු රෝගීන්ගේ සංඛ්‍යාව 2,171 කි. විස්තර XLIII චක්‍රයේ හා XLIX සටහනේ දැක්වේ.

ස්පර්ෂකයන්

ලාදුරු රෝගීන් ඇසුරු කළ ගෘහවාසි ස්පර්ෂකයන් සෑම කෙනෙකුම වාගේ ඒ ඒ පළාත්වල සෞඛ්‍ය සේවකයන්ගේ ද ආධාර ඇතිව වර්ෂය තුළ දී පැවැත්වූ සෞඛ්‍ය සමීක්ෂණයේ දී පරීක්ෂා කරන ලදී. වයස අවුරුදු 15 ට වැඩිවූ ස්පර්ෂකයන් 9,633 දෙනෙක් හා වයස අවුරුදු 15 ට අඩුවූ ස්පර්ෂකයන් 1,534 දෙනෙක් අවුරුද්ද තුළ දී සිටියහ. රෝගය පහසුවෙන් ගොදුරුවීමට ඉඩ ඇති අවුරුදු 15 ට අඩු වයස් සීමාවේ සිටින ස්පර්ශකයන් කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කරන ලදී. ඇදිහැස කිරි හා ඩී. ඩී. ඇස්. ඖෂධය ප්‍රතිෂේධක වශයෙන් දීම් හැරුණු විට රෝග වැළැක්වීමේ ශක්තිය රැකගැනීම සඳහා මෝරතෙල්ද ගන්නා ලෙස ඔවුන්ට උපදෙස් දෙන ලදී. ස්පර්ෂකයන් තුළ සැක සහිත ලප මතුවේ නම් ඒ බැව් සෞඛ්‍ය නිලධාරීන්ට දැන්වීමේ වගකීම ගෙහිමියා හෝ වෙනත් වගකිව යුතු අයෙක් වෙත පවරන ලදී.

අලුත් රෝගීන්

වැඩිම රෝගීන් සංඛ්‍යාවක් දක්නා ලද්දේ අවුරුදු 30-39 ත් අතර වයස් සීමාව තුළය. බටහිර පළාතේ අළුත් රෝගීන් 129 දෙනෙකු වූ අතර ඔවුන්ගෙන් 35 දෙනෙකු කොළඹ නාගරික සීමාවට අයත් විය. දකුණු පළාතේ අළුත් රෝගීන් 43 දෙනෙක් සිටියහ. විස්තර L චක්‍රයෙහි දැක්වේ.

මරණ

වර්ෂය තුළ දී රෝගීන් 78 දෙනෙක් මිය ගියහ. විස්තර LI වැනි චක්‍රයෙහි දැක්වේ.

රසායනාගාරය

සිරිත් පරිදි කෙරෙන පරීක්ෂණවලට අමතර වශයෙන් ලාදුරු බැසිල සොයා බැලීම සඳහා නාසා හා චර්ම ස්‍රාවයන් 3,724 ක් පවත්වන ලදි.

කායික වෛද්‍ය කර්ම

රෝගියාට ප්‍රතිකාර කිරීමේ දී කායික වෛද්‍ය කර්මයට ප්‍රධාන තැනක් දෙන ලදි. සම්බාහනය, ඉටි ප්‍රතිකාරය, ඉන්ෆ්‍රාරෙඩ් රශ්මි විකිරණය, ප්ලාස්ටර් ඔෆ් පැරිස් කාස්ට් යෙදීම මේ සඳහා යෙදා ගත් ක්‍රමයන් අතර විය.

වෘත්තීය ප්‍රතිකාර

දීර්ඝ කාලයක් ප්‍රතිකාර ලැබිය යුතු රෝගීන් කිසියම් කාර්යක නිරත කරවීම අවශ්‍ය වේ. වෘත්තීය ප්‍රතිකාර අංශය මගින් සපත්තු හා අංග විකල රෝගීන් සඳහා අවශ්‍ය සෙසු සරල උපකරණ නිෂ්පාදනය කෙරේ. විවිමේ මධ්‍යස්ථානය මගින් වෙළුම් පටි හා රෙදි වියන ලද අතර වේවැල්වැඩ හා වඩු වැඩද කෙරින. මාන්තිව් රෝහලේ රෝගීන්ගේ සමුපකාරය මගින් රෝහලට කිරි සපයනු ලබන අතර, කුඹුරු වැඩ ද කරනු ලැබේ.

ප්‍රතිකාරය

ලාබ නිසාත් පහසුවෙන් දියහැකි නිසාත් ප්‍රධාන වශයෙන් ප්‍රතිකාරය සඳහා යොදා ගනු ලබන්නේ ඩී. ඩී. ඇස්. (ඩයමිනෝ ඩයිෆෙනිල් සල්ෆෝන්) නමැති ඖෂධ යයි. එපමණක් ද නොව මෙම ඖෂධමය රෝග නාශක බැසිලය තවමත් අසංවේදී වී නැත. එහෙත් ඇතැම් රෝගීන්ට මේ ඖෂධ දීමේ දී අතුරු ආබාධ ඇතිවන බැවින් ඔවුන්ට ඒ සමගම ඩී. ටී. පී. ඖෂධය ද දෙනු ලැබේ.

ඩී. ඩී. ඇස්. ඖෂධය තනිකර ගත නොහැකි අයටත් ඒ දෙවර්ගයම ගත යුතු අයටත් ඩී. පී. ටී. නමැති ඖෂධය දෙනු ලැබේ.

ක්‍රීම් වශයෙන් නිෂ්පාදිත එටිසල් නමැති ඖෂධය මාස තුන හතරක් භාවිතා කරන විට රෝග කාරක බැසිලය ඊට ඔරොත්තු දීමට පටන් ගනී. මෙම ඖෂධ වර්ග ප්‍රවේසම් සහිතව සංයෝගකර පාවිච්චි කිරීමෙන් රෝගය සුවකළ හැකිය. මුල් අවස්ථාවේ දී ප්‍රතිකාර කිරීමෙන් එය වඩාත් පහසුවෙන් කළ හැකි ය.

ඉ.—සමාජ රෝග මර්දනය

ගැටලුව

1. (i) **රෝගය පැවති තරම.**—සමාජ රෝග පිළිබඳ ගැටලුව එ සේ ම පැවතිණ. එ සේ ද වුවත්, 1960න් පසු කොළඹ දී ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණි බෝවෙන සුළු උපදංශ සහ සුද බිංදුම රෝගීන් ගණනෙහි වැඩිම නැවතුණ බව පමණක් නොව,

එය පහළ බැස්ස බවක් ද පෙනෙන්නට තිබේ. 1962දී බෝවෙන උපදංශ රෝගීන් 502ක් සහ සුද බිංදුම රෝගීන් 2,185ක් වූයේ වී නමුත්, මේ වර්ෂයේ දී බෝවෙන උපදංශ රෝගීන් 367ක් සහ සුද බිංදුම රෝගීන් 1,969ක් වී ය. වැඩි ම සංඛ්‍යාව අවුරුදු 20-29 වයස් සීමාවේ අය අතුරෙන් ප්‍රතිකාර ලැබූ සංඛ්‍යා වේ. සමානුපාතයෙහි නම් වැඩිමක් තිබී ඇත්තේ මැයැ. එහි සියයට ගණන 1962 දී 8ක් වැ තිබී 1963 දී 15.8 දක්වා වැඩි ඇත. එසේ ද වුවත්, අප චිකිත්සාගාරවලින් කලාතුරෙකින් ප්‍රතිකාර ලබන පාසැල් යන ළමුන් පිළිබඳ තත්ත්වය නම් මෙයින් පිළිබිඹු නොවේ මැ යි.

බෝවෙන උපදංශ රෝගීන් සියළු දෙනා ගෙන් මැ සියයට 74ක් ප්‍රතිකාර සඳහා පැමිණියේ, ස්පර්ශය ලැබූවන් විමසීම සඳහාත්, මහජනයාට කරුණු කියා දීම සඳහාත්, දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ලද වැඩ පිළිවෙල නිසා බැව් පෙනෙන්නට තිබුනි. බෝවීම පහත බැසීමට සමහර විට අවහිරකම් නොමැති වැ ගණිකා වෘත්තිය ගෙනැ යාම වඩා වඩා අපහසු කළ පොලිස් දෙපාර්තමේන්තුවේ දූෂණ පරීක්ෂණාංශයේ කටයුතු ව්‍යාප්ත කිරීම ද එක් හේතුවක් යැයි සිතිය හැක.

බෝවෙන උපදංශ නිසා කටුගස්තොට දී ප්‍රතිකාර ලත් සංඛ්‍යාව පසු ගිය අවුරුද්දට වඩා බෙහෙවින් වැඩි වී තිබීම හැරුණ විට පිට පළාත්වල පූර්ණ කාලීන සමාජ රෝග චිකිත්සාගාරවලින් ප්‍රතිකාර ලැබූ බෝවෙන උපදංශ සහ සුද බිංදුම රෝගීන් සංඛ්‍යාවෙහි නම් ඒ තරම් වෙනසක් දක්නට නො මැත.

(2) **සමාජයීය පිහිටීම.**—කොළඹ චිකිත්සාගාරයෙන් ප්‍රතිකාර ලැබීමට පැමිණි ඉහළ මැ සංඛ්‍යාව මේ වරත් කම්කරුවන් අතුරෙනි. ගිය අවුරුද්දේ බෝවෙන උපදංශ රෝගීන් සියයට 42ක් ඔවුනතුරෙහි සිටිය ද මේ වර ඔවුනතුරෙහි සිටියේ සියයට 39කි.

ඔවුනතුරේ සිටි සුද බිංදුම රෝගීන් සංඛ්‍යාව ගිය අවුරුදුවලැ මෙන් මැ මේ අවුරුද්දේ දී ද සියයට 34ක් වී යැ. බෝවෙන උපදංශ රෝගය අතරෙනුත් සුද බිංදුම රෝගය අතිනුත් ඊ ළඟ තැන ගත්තේ වෙළෙන්දෝයැ. බෝවීමේ මූලාශ්‍ර ගිය අවුරුදුවල මෙන් මැ ගණිකාවන් සහ අහම්බෙන් හාදකම් ඇති කර ගත් අය අතරේ විද්‍යාමාන වී යැ.

සංවිධානය

2. ව්‍යාපාරය සංවිධානයෙහි කිසි වෙනසෙක් සිදු වී නැත. කොළඹ පිහිටි මධ්‍යම චිකිත්සාගාරයට අමතර වැ, මහනුවර (කටුගස්තොට) යාපනේ, ගාල්ල, රත්නපුර, කුරුණෑගල, බදුල්ල, අනුරාධපුරය, මීගමුව සහ හොරණ යන ස්ථානවල ද පූර්ණ-කාලීන චිකිත්සාගාර නවයෙක් වී යැ. රෝගය පිළිබඳ වැ ත්‍රිකුණාමලය දිසාවේ නැගී ආ ගැටලු සම්බන්ධයෙන් නො අඩු වැ ක්‍රියා කරනු පිණිස 1963 පෙබරවාරියේ සිට ත්‍රිකුණාමලය, අර්ධ-කාලීන චිකිත්සාගාරයට පූර්ණ-කාලීන මහජන සෞඛ්‍ය පරීක්ෂකයෙක් පවරන ලදි. දැනට තීරණය කොටැ හමාර (මඩකළපුව සහ අම්පාරේ) නව චිකිත්සාගාරවලට අමතර වැ කෑගල්ලේ සහ මාතරැ පූර්ණ කාලීන චිකිත්සාගාර දෙකක් පිහිටුවීමටත් මඩකලපුවේ සහ අනුරාධපුරයේ මස්තු විද්‍යා පරීක්ෂණ විමධ්‍යගත කිරීමටත් තීරණය කොට ඇත.

සම්බන්ධීකරණය

3. (අ) **පළාත් පාලන මණ්ඩල.**—කොළඹ සහ මහනුවර මහනගර සභා නිලධාරි පිරිස, තමතමන්ගේ චිකිත්සාගාරවල ලේඛ්‍යාරූඪ වූ සියළු ම රෝගීන් විෂයයෙහි සාමාන්‍ය පූර්ව-ප්‍රසව ලේ පරීක්ෂණ මෙහෙයවීම දිගට ම කර ගෙන ගියහ. ප්‍රතික්‍රියා දැක්වූ අය ගැන විමසා බැලීමෙන් පසු කොළඹ සහ කටුගස්තොට චිකිත්සාගාරවලදී ඔවුන්ට ප්‍රතිකාර දෙන ලදි.

(ආ) ස්වේච්ඡා සංවිධාන

ඒ ඒ ප්‍රදේශවල ස්වේච්ඡා සංවිධානවල සහයෝගය ඇතුව, සමාජ රෝග මර්දනය විෂයයෙහි අධ්‍යාපන වැඩ සටහන් සහ කණ්ඩායම් අතර සාකච්ඡා මෙහෙයවන ලදි.

4. වැඩ කටයුතු

රෝගීන් සොයා ගැන්ම, රෝග විනිශ්චය ප්‍රතිකාරය සහ තදනුගත වැඩ සියළු පූර්ණ-කාලීන චිකිත්සාගාරවල කරගෙන යන ලදි. චිකිත්සාගාරවල දී ප්‍රතිකාර ලැබූ සියළු රෙගින්ගේ විග්‍රහයක් LII සටහනේ දක්වේ.

(i) **වැළැක්වීමේ කටයුතු.**—සිරිත් පරිදි කැරෙන කටයුත්තක් හැටියට, බෝවෙන උපදංශයෙන් පෙළුන සියළු රෝගීන් විෂයයෙහි වසංගත රෝග විද්‍යා පරීක්ෂණ කරන ලද අතර, තමන් ස්පර්ශය ලැබූ අය සොයා ගැනීමට රෝගීන් කිහිප දෙනෙකුගේ සහාය ලැබුණි. සිර ගෙවල්, රිමාන්ඩ් ගෙවල්, බාලාපරාධ අභ්‍යාස පාසැල් යන ස්ථානවලට ඇතුළත් කර ගන්නා ලද සියළු දෙනාම, පසු ගිය අවුරුද්දේ මෙන්ම සිරිත් ප්‍රකාර ලේ පරීක්ෂණවලට භාජනය කරනු ලැබූ අතර, කොළඹ ගැහැණු රෝහල්වලත් මහනගර සභාවේ පූර්ව ප්‍රසව චිකිත්සාගාරවලත් ගැබිනි මව්වරුන් විෂයයෙහි ද සිරිත් ප්‍රකාර ලේ පරීක්ෂණ දිගටම කර ගෙන යන ලදි.

සිරිත් පරිදි ගැබිනි මව්වරුන්ගේ ලේ පරීක්ෂා කිරීම පූර්ණ කාලීන චිකිත්සාගාර ඇති සියළුම පළාත් බද රෝහල්වල කරන ලද අතර, මේ සම්බන්ධයෙන් මේ මේ විධියට ක්‍රියා කළ යුතු යැයි නිශ්චිත විධාන ද නිකුත් කරන ලදි. සියළු ආයතනවල සහ පූර්ව-ප්‍රසව චිකිත්සාගාරවල සිරිත් ප්‍රකාර ලේ පරීක්ෂණ පටන්ගනු පිණිස "වැකුවේනර්" නම් වායු සුන් බඳුන් උපකරණ කිහිපයක් ඒ ආයතනවලට නිකුත් කරන ලදි. ගැබිනි මව්වරුන්ගේ ලේ වල ප්‍රතික්‍රියා සහිත වූ සියයට ගණන කොළඹ නම් මේ අවුරුද්දේ 1.34ක් ද ගිය අවුරුද්දේ 1.69ක් ද, පිට පළාත්වල එම සියයට ගණන පිළිවෙලින් 0.85ක් සහ 1.06ක් ද වී ය. ජාතික සේවා ව්‍යායාමයේ ඉල්ලීම උඩ කුරුණෑගල දිසාවේ වදුරුස්ස නම් ගම ලේ පරීක්ෂා කිරීමෙක යෙදුණු නමුත්, "ප්‍රතික්‍රියා" දැක්වූ කිසිවෙකුත් නො වී ය. සමාජ අධ්‍යයන ආයතනයේ ඉල්ලීම පරිදි කුරුවිට පෙදෙසේ මුලල්ලපිටිය නම්ගම ලේ පරීක්ෂාවක් ගෙන ගිය නමුත්, එහි ද "ප්‍රතික්‍රියා" සහිත කිසිවෙකුත් නොවීය. කොළඹ වරාය කොමිසමේ නිලධාරි පිරිසයේ සහයෝගය ඇති ව ලේ පරීක්ෂාවක් කරන ලදි. 1172 දෙනෙක් ලේ පරීක්ෂාවට භාජනය වූහ. එයින් සියයට 3.4ක් ප්‍රතික්‍රියා සහිත වූහ. විමසා බලා ප්‍රතිකාර කරනු පිණිස මේ අය ගැන වරාය සමාජ රෝග චිකිත්සාගාරයට දැනුම් දෙන ලදි. මාකොළ, කඩවත පිහිටි සහතික ලත් ගැහැණු සහ පිරිමි පාසල් ප්‍රධානයන්ගේ ඉල්ලීම උඩ, සෞඛ්‍ය අධ්‍යාපන මාලාවක් සහ ලේ පරීක්ෂාවක් යෙදවූ අතර, ප්‍රතික්‍රියා සහිත වූවන් දෙදෙනෙක් එතැන වූහ. ඔවුහු කොළඹ චිකිත්සාගාරයට පැමිණ ඇත්තාහ.

ලංකා විශ්ව විද්‍යාලයට ඇතුළත් කර ගන්නා ලද සියළු ම දෙනා උපදංශ උදෙසා සමාජ රෝග පර්යේෂණ රසායනාගාර පරීක්ෂණයට භාජනය කරන ලද නමුත්, ඔවුනතුරෙන් ප්‍රතික්‍රියා සහිත වූවන් කිසිවෙකුත් නො දක්නා ලදී.

(ii) **සුවපත් කිරීමේ කටයුතු.**—උපදංශ සහ සුද බිංදුම රෝගීන් සියළු දෙනාටම කොළඹ චිකිත්සාගාරයේ දී ප්‍රතිකාරය සඳහා වැඩි දෙනාගේ සිත් දිනාගත් ඖෂධය වූයේ පී. ඒ. එම්. (ඇලුමිනියම් මෙනොසිට්රේට් සියයට 2ක් සමග ප්‍රොකෙන් පෙනිසිලින්) සංයෝගයයි. රෝගීන් සතියකට වරක් පමණක් පැමිණ ප්‍රතිකාර ලබා ගන්නා පිට පළාත්වල චිකිත්සාගාර කිහිපයෙක දී බෙන්සතීන් පෙන්සිලින් භාවිතා කරන ලදි. පෙනිසිලින් වලින් ප්‍රතිකාර දීමට පෙර සියළු රෝගීහු පෙනිසිලින් සංවේදනාවය සඳහා පරීක්ෂණයට භාජනය කරනු ලැබූහ.

පෙනිසිලින් කෙරෙහි "ට්‍රෙපොනිමා පැලිඩම්වල" සංවේදීතාවය දිගටම පැවතුණි. එහෙත් ගොනොකුකුසය දැක්වූ සංවේදතාවය හීනවූ බවත් පෙනෙන්නට වී ය. වාසනාවකට මෙන් ගොනොකුකුසයට හානිකර වූ වෙනත් ප්‍රතිජීවී ද්‍රව්‍ය රාශියක් තිබෙන හෙයින්, සුද බිංදුම රෝගියාට ප්‍රතිකාර දීම ගැටලුවක් නො වී ය. අසංරක්ෂිත ප්‍රහාරයට ලක් වූ අවස්ථා කිසිත් වර්ෂය තුළ දී හට නො ගත්තේ ය.

5. අධ්‍යාපන කටයුතු

පිට පළාත් බද ආයතනවල අර්ධ-කාලික චිකිත්සාගාර මෙහෙයවීම පිණිස වෛද්‍ය සහ වෛද්‍යාවශෙෂ නිලධාරි පිරිස් පුරුදු-පුහුණු කරවීම දිගටම කරගෙන යන ලදි.

සේවයේත් අභ්‍යාසයේත් යන දෙකෙහිම යෙදී සිට විවිධ සෞඛ්‍ය සේවක පිරිස්වලට දෙසුම් සහ දෙසුම් සහිත පෙන්වීම් සලසන ලදි. ව්‍යාපාරයේ නියුක්ත පූර්ණ කාලික මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් සියළු දෙනා උදෙසා කොළඹ මධ්‍යම චිකිත්සාගාරයේ දී 1962 නොවැම්බර මාසයේ දී සතියක සංස්කරණ පාඨ මාර්ගයක් සහ සාකච්ඡා මුළුවක් පවත්වන ලදි.

"සෑම මහජන සෞඛ්‍ය පරීක්ෂකයෙකු ම දත යුතු දේ" සහ "සමාජ රෝගය ගැන ඔබ දත යුතු දේ" යන මැයෙන් උපදේශ පත්‍ර සකස් කරන ලදුව දැන් එය පතුරුවා හරින තැනට පැවරී තිබේ. වෛද්‍ය නිලධාරීන්ට මග පෙන්වනු පිණිස සමාජ රෝග විෂයයෙහි වූ උවදෙස් පත 1963 ජූලි මාසයේ දී ශුද්ධ කරන ලදුව බෙදා හරිනු ලැබිය. "ක්ෂෙත්‍ර නිලධාරීන්ගේ ප්‍රයෝජනය පිණිස ලංකාවේ පරංගි පිළිබඳ තොරතුරු" නම් තවත් උවදෙස් පතක් ද මුද්‍රණය පිණිස යවන ලදි.

කොළඹ චිකිත්සාගාරයේ නියුක්ත එක් වෛද්‍ය නිලධාරියෙක්, 1963 මැයි සිට සැප්තැම්බර දක්වා කාල සීමාව තුළ දී එක්සත් රාජාධානියෙ චිකිත්සාගාර බැලීමට තමා ලත් අවස්ථාවෙන් ප්‍රයෝජන ලැබිය. එසේ බැලීමට ගියේ, ලංඩන් රෝහලේ වයිට් වේපල් චිකිත්සාගාරයේ සමාජ රෝග විෂයෙහි සංස්කරණ පාඨ මාර්ගයක් හදාරමින් සිටිය දී ය.

6. රසායනාගාර වැඩ

උපදංශ උදෙසා සමාජ රෝග පයෙස්ෂණ රසායනාගාර පරීක්ෂණය කොළඹ චිකිත්සාගාරය බද රසායනාගාරයේත් මහනුවර (කටුගස්තොට ස. රෝ. චිකිත්සාගාර බද රසායනාගාරයේත් යාපනය, රත්නපුරය, කුරුණෑගල, බදුල්ල සහ ගාල්ල යන පළාත් බද රසායනාගාරවලත් සතුටුදායක ලෙස පවත්වා ගනු ලැබී ය.

උපදංශ උදෙසා ස.රෝ.ප.ර. පරීක්ෂණ මඩකළපුව සහ අනුරාධපුර පළාත් බද රෝහල්වලත් පටන් ගැනීම පිණිස වැඩ කටයුතු සලසා තීන්දු කර ගෙන ඇති අතර, මෙම රසායනාගාර දෙකට උපකරණ ද පිටත් කොට යවා හමාර ය.

කොළඹ රෝහල් කැටිය උදෙසාත්, ස.රෝ.ප.ර. පරීක්ෂණ පිහිටුවා ඇති රසායනාගාර නොලත් සියළු පිට පළාත් ආයතන උදෙසාත්, මධ්‍යම චිකිත්සාගාර රසායනාගාරය ස.රෝ.ප.ර. පරීක්ෂණ මෙහෙයවයි. කලින් මහ රෝහලේ රසායනාගාරයේ කරන ලද ස.රෝ.ප.ර. පරීක්ෂණ, මැයි 10 වනදා සිට මධ්‍යම චිකිත්සාගාරය බද රසායනාගාරය සිය අතට ගත්තා ය.

කොළඹ ලේ බැංකුවේ ඇති සියළු ම ලේ නිදහසුන් විෂයයෙහි, 1963 ඔක්තෝබර් 1 වන දා සිට ස.රෝ.ප.ර. පරීක්ෂණ පැවැත්වීමට ගිවිස ගෙන ඇත. එසේ කිරීමෙන්, මධ්‍යම චිකිත්සාගාර රසායනාගාරය සිරිත් ප්‍රකාර පරීක්ෂණවලින් ලේ බැංකුවත්

මහ රෝහලේ රසායනාගාරයත් ඉන් මුදනවා ඇත. මේ කාර්ය සඳහා වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥයින් දෙදෙනෙක් අමතර ව පත්කර ඇත. කොළඹ වෘත්තියේ යෙදී සිටින සාමාන්‍ය වෛද්‍යවරුන් ගිය අවුරුද්දට වඩා වැඩි ගණනක් මේ අවුරුද්දේ දී මධ්‍යම චිකිත්සාගාර රසායනාගාරයේ පහසුකම්වලින් පල ලැබූහ. කරන ලද රසායනාගාර වැඩ LIV වන සටහනේ දැක්වේ.

7. විශේෂ අධ්‍යයන, පර්යේෂණ සහ සමීක්ෂණ

යම් යම් රසායන ද්‍රව්‍යවලට ගොනොකුකුස වැකුම් දැනට දක්වන සංවේදතාවය මැනීම සඳහා, සිරිත් පරිදි කෙරෙන කාර්යයක් විලස, ප්‍රතිජීවී සංයෝග කෙරෙහි ගොනොකුකුසයන්ගේ සංවේදතාවය නිගමනය කිරීමේ සංවේදනා පරීක්ෂණ කරන ලදි.

මෙම රසායනාගාරයේ කායික්ෂමභාවය කෙතෙක් දැයි සොයා ගැනීමේ අපියෙන්, ඇත්ලන්තාවේ සහ ජෝජියාවේ බෝවෙන රෝග මධ්‍යස්ථානය විසින් මෙහෙයවන ලද මස්තු විද්‍යාත්මක අගය මිනීමේ අධ්‍යයනයෙහි ලා මෙම රසායනාගාරය හවුල් වූවා ය. මෙම රසායනාගාරයේ සම්මත කාර්යක්ෂමභාවය සියයට 98 ක් බව තීන්දු විය.

8. ජාත්‍යන්තර සහාය

තායිලන්තය උදෙසා ජගත් සෞඛ්‍ය සංවිධානයේ සහාය ලත් ට්‍රැපොනිමැටොසිස් මර්දන අරමුණේ ජ්‍යෙෂ්ඨ ශිල්ප වේදඥ ආනන් සුවනවේජ් මහතා කොළඹ මධ්‍යම චිකිත්සාගාර රසායනාගාරයේ දී මාසයෙක අභ්‍යාසයක් ලැබී ය.

වෛද්‍ය පර්යේෂණාගාරය විසින් පමණක් කරනු ලබන (රේටර් ප්‍රෝටීන් පරිපූරක නිර්ණය) ආර්.පී.සී. පරීක්ෂණයට වඩා විශේෂිත වූ ට්‍රිපොනිමල් පරීක්ෂණයක් වන (ප්ලුරොසන්ට් ට්‍රිපානිමල් පිළිබඳ) එෆ්ජ්. ටී. ඒ. පරීක්ෂණය පිහිටුවාලීම සඳහා උතුරු දම් (පාර ජම්බූල) අනුදක්නයක් ලබා දීමට එක්සත් ජාතීන්ගේ අන්තර් ජාතික ළමා හදිසි අරමුදල සියළු විධි-විධාන නිම කොට ඇත. මෙම පරීක්ෂණය පිහිටුවාලීමෙන් පසුව ආර්.පී.සී.එෆ්ජ්. පරීක්ෂණය නැවත කිරීමට පුළුවන් වනු ඇත.

සාමාන්‍ය මාර්ගය ඔස්සේ ලබා ගතනොහැකි වූ ද ස.රෝ.ප.ර. පරීක්ෂණයට අත්‍යාවශ්‍ය වූ ද රසායනාගාර උපකරණ සමහරක් සපයා දීමට ජගත් සෞඛ්‍ය සංවිධානය කැමති වී ඇත.

ඊ—මානසික සෞඛ්‍යය

හැඳින්වීම

ගිය අවුරුද්ද තුළ මනො වෛද්‍යවරුන් දෙ දෙනෙකු විශ්‍රාම ගැනීමත් විශේෂ උගැනුම සඳහා එක් අයෙකු පිට රට යාමත් නිසා මේ වසර උදාවූයේ මනෝ වෛද්‍ය වරුන්ගේ අඩුවක් ඇති වැ ය. වෛද්‍යාචාර්ය ශ්‍රිල්මේයර් මහතා දිගු නිවාඩුවක් මතු දිවයිනෙන් බැහැර සිටීමෙන් තවත් පාඩුවෙකි. මෙහි ප්‍රතිඵලයක් හැටියට, විශේෂඥ පිරිස මඳවීම නිසා මනො වෛද්‍ය සේවය සැහෙන තරම් පීඩා ලැබී යැ.

විශේෂඥභාවය ලබනු පිණිසැ කලින් දිවයිනෙන් පිටැ යවනු ලැබූ මනෝ වෛද්‍යයින් තිදෙනෙක් අළුතෙන් සුදුසුකම් ලබා පැමිණීමෙන්, අවුරුද්ද අග හරියේ දී පමණ තත්ත්වය දියුණු වී යැ.

1962 දෙසැම්බරයේ දී, "මානසික ආබාධ ගැන වසංගත විද්‍යා සමීක්ෂණ ශිල්ප න්‍යාය" විෂයයෙහි මැනිලාවේ පැවැති ජගත් සෞඛ්‍ය සංවිධානයේ දේශාන්තර සම් මේලනයට සහභාගි වීම සඳහා ගිය නියෝජිතයින් දෙදෙනාගෙන් එක් කෙනෙකු

හැටියට මානසික රෝහල් වැඩ බලන වෛද්‍යාධිකාරී වෛද්‍යාචාර්ය ඩබ්. බී. පියුඩරයෝ තේරුණහ. දෙ සතියකට කිට්ටු කාලයක් මෙම සම්මේලනය පැවතුණි. මානසික ආබාධ හැදෑරීමෙහි ලා මේ පැත්තෙන් ඉමහත් දැනුමක් සහ අත් දැකීමක් යට කී සම්මේලනයට සහභාගි වීමෙන් ලැබුණි.

එක්සත් ජනපදයේ වෛද්‍ය පාලනය උගැනුම පිණිස ශිෂ්‍යත්වයක් අවුරුද්ද මුලදී, අංගොඩ මානසික රෝහලේ ලේකම් එච්. එම්. සංඝදාස මහතාට පිරිනැමී, ඔහු ජනවාරියේ දී දිවයිනෙන් නික්ම ගොස් සැප්තැම්බරයේ දී පෙරළා පැමිණියේ යැ.

පසු ගිය අවුරුද්දේ අරඹන ලද පශ්චාත්-පාදක මනො වෛද්‍ය හෙදකම් පාඨ මාර්ගය මාර්තු වේ දී අවසන් වී, එයින් නිකුත් හෙද-හෙදියෝ අංගොඩැ සහ ඉල්ලේරියාවැ මානසික රෝහල් වලැ නියුතු කරවනු ලැබූහ. මෙම අභ්‍යාසයෙන් ඔවුන්ගේ වැඩ හුරුකම් බොහෝ සෙයින් දියුණු වූ අතරැ, කට්ටි වැඩ වැනි මනො වෛද්‍ය හෙද කමේ නවතම අංශ ඇරඹීමේ හැකියාව ඔවුන්ට ලැබුණි. මේ අතරැ, තුරැ, මාණ්ඩලික හෙද-හෙදියන් 8 දෙනෙකු උදෙසා තවත් පාඨ මාර්ගයක් මේ වසරැ අප්‍රේල් මසැ ඇරඹුණේ ය. පශ්චාත්-පාදක මනො වෛද්‍ය හෙද-හෙදියන් සංවිධානය කොටැ අභ්‍යාසය දීම සඳහා, ජ. සෞ. සං. මනො වෛද්‍ය හෙදකම් උපදේශක ස්වෝන් මහතා අවුරුද්ද මුලැ දී හෙදකම් පාසලට පත් කරනු ලැබී යැ. විදේශීය විශෙෂඥයින් කිහිප පොළක් මානසික රෝහල බැලීමට ආහ. අප්‍රේල් 4 වන දා පැමිණි සෝවියට් වෛද්‍ය විශේෂඥයින තිදෙනාගේ ගමන ගැන විශේෂ සඳහනක් දියැ යුතු යැ. මාදක ගැන ජ. සෞ. සං. උපදේශක වෛද්‍යාචාර්‍ය ජේ. ලිප්ට් මහතා ද මානසික රෝහලට පැමිණි අතරැ, ජ. සෞ. සං. දේශාන්තර හෙදකම් උපදේශිකා හෝල්සිංගර් මහත්මිය ද නැවත පැමිණ, මාණ්ඩලික හෙද-හෙදියන්ට සහ මනො වෛද්‍ය හෙදකම් විෂයයෙහි කලින් පුහුණුවක් නො ලත් උපස්ථායක-උපස්ථායිකා වන්ට සේවායුක්ත අභ්‍යාස පිළිවෙලක් අරඹන ලෙස අප අයැදියා යැ. පශ්චාත්-පාදක අභ්‍යාසය ලත් හෙද හෙදියන් විසින් උගැන්වීම කට යුතු යැ. මෙම අභ්‍යාසය දැන් කැරැ ගෙනැ යනු ලැබේ.

ගෙවන පෙළ ගාස්තු ප්‍රතිශෝධනය සමග 1 වන සහ 2 වන පෙළ ගෙවන රෝගීන් ගේ ගාස්තු අවුරුද්ද තුළැ දී වැඩි කරන ලද නමුත්, එය කලින් තිබූ රු. 3 ක ගාස්තු ප්‍රමාණයට මැ, නැවත හරවන ලදී.

කරන ලද වැඩ

ප්‍රතිකාර දීම.—1954 දී භාවිතයට ගන්නා ලද මනො නිවර්තන ඖෂධ වර්ග වැඩ වැඩියෙන් පාවිච්චි කරන ලදී. පෙනොතියසින් වර්ගයට අයත් ක්ලොප්‍රොමේසින් (ලාගක්ටිල්) බෙහෙත, මානසික රෝහල්වලැ මෙන් මැ මනො වෛද්‍ය චිකිත්සාගාර වලැ ද ඉබෙහෙවින් පාවිච්චියට ගන්නා ලද ඖෂධය වී යැ. එය පෙති විලසැ මුව මගින් ගැනීම ද පේශීගත නික්ෂේපණ විලසැ ශරීරයට විදීම ද යන දෙයාකාරයෙන් මැ පාවිච්චියට ගන්නා ලදී. අපේ අත්දැකීම්වල දී අනිටු පල නම් නො දක්නා ලද මුත්, ඉඳ-හිටැ දැනගන්නට ලැබුණ එක මැ සංකූලය නම් කාමලාව යයි, එය ද, බෙහෙත් නැවැත් වූ විගස මග හැරී යෙයි. ක්ලොප්‍රෝමේසින් තරමට බෙහෙවින් නුවූවත්, යම් යම් අය සඳහා රෙසපින් ද නියම කරන ලදී.

අවුරුද්ද තුළ දී ට්‍රයිප්ලුපරසින් (ස්ටෙලසින්) සීමා සහිත තොගයක් රෝහලට ලැබුණ අතරැ, එම මා ඇති ඖෂධයෙන් ප්‍රයෝජනය ලැබීමේ වරය නො ගෙවන රෝගීන්ට ද ලැබුණි. විපාට ප්‍රේණියෙන් පෙළෙන අයට ප්‍රතිකාර කිරීමෙහි ලා මෙම ඖෂධය බෙහෙවින් වටනේ යැ.

මෑත අවුරුදු වලැදි පහළ වූ ප්‍රති-අවපීඩක ඖෂධ වර්ග නිසා, අවපීඩක සයිකොසියා වට ප්‍රතිකාර කිරීමේ නවීන ක්‍රම සැහෙන තරම් වෙනසක් දිටී. මීට කලින් තිබූ එක මැ ප්‍රතිකාර විධිය නම් විදු කම්පන විධිය පමණ යි. විදුකම්පන විධිය යෙදීම ගැන රෝගීන්

වැඩි දෙනෙකු බිය පත් වීමේ විශේෂ හේතුව නිසා, ප්‍රති-අවපීඩක ඖෂධයේ පාවිච්චි යත් සමග මැ, වි. ක. වි. යෙදුම මග හරවා ගත හැකි වී යැ. ඉදින් යෙදුයේ නම් ඒ හැකි තාක් දුරට අඩුවෙන් වුවමනා මැ අවස්ථා වලැ දී යැ. මානසික රෝහලේ ගෙවන ආතුරාලයන්හි සහ කොළොඹැ මහ රෝහලේ මනො වෛද්‍ය චිකිත්සාගාරයන්හි ප්‍රති-අවපීඩක ඖෂධ පාවිච්චි කරන ලද නමුත්, එම ඖෂධ රෝහල් නිසණ්ඩුවේ අන්තර් ගත නො වන හෙයින් එය නො ගෙවන රෝගීන්ට නියම නො කරන ලදි. එ සේ ද වුවත්, මෑතක දී ඉම්ප්‍රැමින් (ටොප්‍රනිල්) නිසණ්ඩුවේ ඇතුළත් කරන ලදින්, එය ගෙන්වා ගැනුමට අභියාචන ඉදිරිපත් කරන ලදි. වි. ක. වි. පිළි-සැදැහි ඇති විශේෂ ප්‍රස්ථාවලැ දී රජයේ බෙහෙත් ගබඩාව ඖෂධය සැපයී යැ.

ලාගක්විල් පෙති 11,75,000ක් සහ ස්ටෙලසින් පෙති 13,000 ක් අවුරුද්ද තුළැ දී නියම කරන ලදි.

විදුලි කම්පන ප්‍රතිකාර ක්‍රමය

අවපීඩක සයිකෝසියාවට සහ විපාට ප්‍රේණි සයිකොසියාවේ ඇතැම් වර්ගවලට ප්‍රතිකාර දීමේ ඉතාමත් ජනප්‍රිය ක්‍රමය හැටියට වි. ක. වි. ක්‍රමය තව මැ රැඳී සිටී.

ඉන්සුලින් කම්පන ප්‍රතිකාර ක්‍රමය

මේ ක්‍රමය දැන් බසිමින් තිබේ. මනො වෛද්‍යවරුන් වැඩි දෙනා ලිහිල් කරන ලද ඉන්සුලින් ප්‍රතිකාර විධියක් භාවිතා කරත්.

වෘත්තීය ප්‍රතිකාර ක්‍රමය

වෘත්තීය ප්‍රතිකාර අංශයේ නව ගොඩනැගිල්ල 1962 දෙසැම්බරයේ දී ලකිසුරු තුමන් අතින් විවෘත වී යැ. මානසික රෝගවලට දෙනු ලබන නවීනතම ප්‍රතිකාර ක්‍රම කෙරෙහි වැඩි වැඩියෙන් අවධාරනය යොමු කරනු ලැබේ. එ සේ ද වුවත්, ද්‍රව්‍ය නො මැති කම නිසා ද ද්‍රව්‍ය සැපයීමේ ප්‍රමාදය නිසා ද ඇතැම් විටැ මේ වැඩට අකුල් වැටීම අවාසනාවක් මැ යි. වෘත්තීය ප්‍රතිකාර ක්‍රමයෙහි පසු ගිය අවුරුදුවලැ ඇරඹුන වැඩ කැරැගෙනැ යන ලදි. මුල්ලේරියාවැ රෝහලට වෘත්තීය චිකිත්සකයෙකු පත් කිරීමෙන්, මෙහි පූර්ණ-කාලීන වෘත්තීය චිකිත්සා අංශයක් පිහිටුවන ලදි.

මනො වෛද්‍ය සමාජ සේවය

සම්පූර්ණ සුදුසුකම් ලත් මනො වෛද්‍ය සමාජ-සේවකයින් තිදෙනෙක් ද පුහුණු වන්නෙක් ද අවුරුද්ද මුල දී සිටියහ. ජ්‍යෙෂ්ඨතම මනො වෛද්‍ය සමාජ සේවකයා මැයි මසැ ඉල්ලා අස් වී යැ. තව එකෙක් මේ වසරැ අවසනැ විශ්‍රාම ලබන ඇත. ඉතිරි වූ තැනැත්තා ද ඇපකරයේ සඳහන් කාල නියමය අවසන් වන විටැ විශ්‍රාම ලබන බවට දැනුම් දුනි. දැනට තිදෙනෙක් එක්සත් රාජ්‍යයේ පුහුණුව ලබමින් සිටිත්. එම නිසා, එතෙරැ සිටිනවුන් සුදුසුකම් ලබා අවුත් වැඩ භාර ගන්නා තෙක් වත් මේ කටයුතු මෑත අනාගතයේ දී පාළු වී යැ හැකි බැව් පෙනෙනු ඇත. දැනට සිටින මනො වෛද්‍ය සමාජ සේවකයෝ සේවය කරන්නෝ මතු සඳහන් ආයතනවලැ යැ :—

(1) කොළොඹැ මහ රෝහලැ වැඩි හිටි මනො වෛද්‍ය චිකිත්සාගාරය

(2) කොළොඹැ රෝහලැ ළමා අනුශාසනා චිකිත්සාගාරය

(3) කොළොඹැ මහ රෝහලැ අපස්මාර චිකිත්සාගාරය

(4) අංගොඩැ මානසික රෝහල

(5) නාගොඩැ රෝහලැ වැඩි හිටිම නො වෛද්‍ය චිකිත්සාගාරය

(6) නාගොඩැ රෝහලැ ළමා අනුශාසනා චිකිත්සාගාරය.

අංගොඩැ මානසික රෝහලැ එක් මනො වෛද්‍ය සමාජ සේවකයෙක් වෙයි. ඔහු සතියකට වරක් බැගින් නාගොඩ මනො වෛද්‍ය චිකිත්සාගාරයට සහ ළමා අනුශාසනා චිකිත්සාගාරයට ගොස් ද සේවය කරයි.

කලින් කොළොඹැ මහ රෝහලැ මනො වෛද්‍ය චිකිත්සාගාරයට ද කොළොඹැ ළමා රෝහලැ ළමා අනුශාසනා චිකිත්සාගාරයට ද මනො වෛද්‍ය සමාජ සේවකයින් දෙදෙනෙක් සහභාගි වූහ. දැනට මේ කටයුත්ත සඳහා ඇත්තේ එක් අයෙක් පමණි. අංගොඩැ මනො වෛද්‍ය සමාජ සේවක කොළොඹැ මහ රෝහලැ මනො වෛද්‍ය චිකිත්සාගාරවලට සහාය වෙයි.

පුහුණුව ලබන තැනැත්තේ, සුදුසුකම් ලත් මනො වෛද්‍ය සමාජ සේවකයාගේ ආදර්ශ-උපදෙස් යටතේ අංගොඩැ මානසික රෝහලැ සහ කොළොඹ, මහ රෝහලැ චිකිත්සාගාරවලැ වැඩ කරයි.

රෝහලින් නිකුත් වූ ද තම රක්ෂා අහිමි වී ඇත්තාවූ ද මානසික රෝගින්ට වැඩ කිරීමට තැන් සලසා දෙන මනො වෛද්‍ය සමාජ සේවකයෝ, වැඩි වැඩියෙන් පුනරුත්ථාපන කටයුතු මෙහෙයවත්. ඇතැමුන්ට සුදුසු ගෙවලැ ගෙදර-දොරැ මෙහෙකම් සැපයේ.

මනො විද්‍යා සේවය

මුළු මනො වෛද්‍ය සේවයට මැ ඇත්තේ එක මැ මනෝ විද්‍යාඥ වරියෙකි. ඇගේ ප්‍රධාන වැඩ පොළ වනුයේ අංගොඩයි. එහි ඇ සතියකට පස් උදැසනක් වැඩ කරයි. හවස් වරුවේ දී ඇය, කොළොඹැ මහ රෝහලැ මනො වෛද්‍ය චිකිත්සාගාර වලැත්, ළමා රෝහලේ ළමා අනුශාසනා චිකිත්සාගාරයේත් වැඩ කරයි. නැණ-නුවණ, තැනැතියාව, කර්මාන්තය අතින් මග පෙන්වීම සහ සමත්කම් අරබයා රෝගින් පිරික්සනු ලැබේ.

හෙද-හෙදි ඇබැසි පාසල, පශ්චාත්පාදක හෙදකම් පාසල, කායික ප්‍රතිකාර පාසල, සමාජ සේවා ආයතනය යන තන්හි ඇ දෙසුම් ද දෙයි මනො විද්‍යාව ගැනැ.

නැණ-නුවණ මැනීම අරබයා ඇ වෙත රෝගින් යොමු වන නිසා ඇ අවුරුද්ද තුළැ දී මුල්ලේරියාවැ රෝහලට ද සතියකට වරක් ගියා යැ.

සතුන් ගාල

රෝහල් කමිටුවේ නිර්දේශයට කන්දෙමින් අවුරුද්ද තුළැ ඌරු ගාල වසා දමන ලදි. කිරි පට්ටිය නම්, තනි මුළුවෙකැ රෝගින් ඉමහත් ගණනක් යොදා ගනී. ගාල දියුණු කිරීම අරබයා ගොවිකම් අධ්‍යක්ෂ විසින් පත් කැරුණු කමිටුවේ නිර්දෙශ ක්‍රියාවේ යෙදවෙන නමුත්, සතුන්ට වැඩි දියුණු ගෙවල් සැලසීම අරබයා ඔවුන්ගේ නිර්දේශ වැඩට යෙදවීමට මුදල් ගිහකම හරස් වෙයි.

මේ අසිරුකම් මෙ සේ වුවත්, පට්ටියෙන් කිරි පයින්ට 87,340 ක් ලැබී එයින් රුපියල් 45,853.54 ක් උපදියි. අවුරුද්ද තුළැ දී දෙනුන් 57ක් ඇතුළු වැ සතුන් 95ක් එහි වී යැ.

සතුන් 13ක්, වැඩි දුරටත් තබා ගැනීමට තරම් සුදුසු නැති බව පෙනුනෙන්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබී යැ. එයින් එකතු වූ මුළු මුදල රු. 2,755 කි.

බාහිර රෝගි මනො වෛද්‍ය සහ ළමා චිකිත්සාගාර

කොළඹැ මහ රෝහලැ, මා රෝහලැ, නාගොඩැ රෝහලැ සහ ඕර ගෙදර රෝහලැ මෙකී චිකිත්සාගාර පැවතේ.

අංගොඩැ මානසික රෝහලේ සහ මුල්ලේරියැවැ රෝහලේ මනො වෛද්‍යවරු හවස් වරුවේ දී මේ චිකිත්සාගාර මෙහෙයවත්. මනො වෛද්‍ය චිකිත්සාගාර සතරක්, අපස්මාර චිකිත්සාගාර එකක් සහ නහඹු චිකිත්සාගාර එකක් කොළොඹැ මහ රෝහලේ බිහි දොර රෝගී අංශයේ පවත්වනු ලැබේ. ළමා අනුශාසනා චිකිත්සාගාර ළමා රෝහලේ මෙහෙයවනු ලබන අතරැ, ළමා අනුශාසනා චිකිත්සාගාරයක් සහ මනො වෛද්‍ය චිකිත්සාගාරයක් කලුතරැ නාංගොඩැ රෝහලේ මෙහෙයවෙයි. අපරාධ වැඩ ගැන ක්‍රියා කරන මනො වෛද්‍ය තැන විසින්, සිර ගෙදර රෝහලේදී චිකිත්සාගාර පවත්වනු ලැබේ.

මහ රෝහල්වලැ මනො වෛද්‍ය අංශ

මහනුවරැ, ගාල්ලැ සහ යාපනේ මහ රෝහල් වලැ මනො වෛද්‍ය අංශ පිහිටුවීමට තීරණය කරන ලද මුත්, මනො වෛද්‍යවරුන් නොමැති නිසා මෙය කළ නොහැකි වී යැ. මහනුවර මේ සඳහා යෝග්‍ය ගොඩනැගිල්ලක් ඇති නමුත් ගාල්ලේ නම් ඊට සුදුසු ගොඩනැගිල්ලක් දැන් මැ ලබා ගත නො හැක. එතෙරැ පුහුණුවෙන් පසු සුදුසු කම් ලත් මනො වෛද්‍යවරුන් වැඩි වැඩියෙන් ගමරට බලා ආ විටැ, මහනුවර රෝහලේ එ බඳු අංශයක් පිහිටුවීමටත් පසු වැ එය ගාල්ලැ යාපනේ රෝහල් කරා විහිදුවීමටත් පිළිවන් වනු ඇත.

මුල්ලේරියාවැ රෝහල

මුල්ලේරියාවැ රෝහල, තනවා ඇත්තේ මහ රෝහලක් මෙන් "එළිමහන් රෝහලක්" හැටියට හෙයින්, රෝගීහු වැඩි වැඩියෙන් ඊට ඇතුළත් වීමට මාන බලති. එය ජනප්‍රිය වී ගෙනැ එයි. මනාව පිහිටා ඇති එම රෝහලේ දැකුම්කලු අවට පරිසරය විදේශිය ආගන්තුකයෝ වැනුහ. කලින් තිබුණ රබර් ගස්වලින් එහි දැකුම් කලු බව වැඩි වන නිසා ඒවාට එසේ මැ තිබෙන්නට ඉඩ හරින ලදි. දැකුම්කලු භූමි දර්ශන ගෙළයන් වැඩ ගැන දැනමුතුකම් දීමට පේරා-දෙනියැ උද්භිද විද්‍යා උයනේ උද්‍යාන කර්මාන්ත නිලධාරි තැන දෙවරක් මෙහි පැමිණැ දුන් නිර්දේශ, දැන් ක්‍රියාවේ යොදවා ගෙන යනු ලැබේ. එම වැඩ සැකැස්මේ කොටසක් හැටියට දැන් දැවැන්ත සෙවෙණි ගස් වවා ගෙනැ යනු ලැබේ.

රෝහලේ 1 වන මුළුවෙහි 151 දෙනෙක් සිටිත්. කලින් කියූ පරිදි මේ මුළුව ඇත්තේ කෙටි කලකට ආ, එනම් අමාරු රෝගීන්ට ප්‍රතිකාර දීම සඳහා යැ. තුන් මාසයකින් තරම සුවයක් නො ලදහොත් 2 වන මුළුවට හෝ අංගොඩට හෝ මාරු කරනු ලබති. ඔවුහු අංගොඩැ සිටින මනො වෛද්‍යවරුන් වැඩි දෙනෙකුට මේ මුළුවෙන් ද ඇඳන් වෙන් වී ඇත. පශ්චාත්-පාදක මනො වෛද්‍ය හෙදකම විෂයයෙහි පුහුණුව ලත් හෙද-හෙදියන් කිහිප දෙනෙක් මේ මුළුවේ නිල වී සිටිත්. මෙහි ප්‍රතිකාර විධි කිහිපයක් වෙයි. නවීනතම විද්‍යුත්-නිඩිර්පර රේඛන සටහන් යන්ත්‍රයක් ද මෙහි සවි කොට ඇත.

2 වන මුළුවට රෝගීන් 311 ක් පමණ අයත් වෙති. එය ඇත්තේ මැදි තරමේ කාලයකට ආ රෝගීන් උදෙසා යැ. අංගොඩැ පවතින බලවත් තදබදය නිසා නිදන්ගත රෝගීහු ද මෙහි ලැගුම් ගෙනැ සිටිත්. තවත් වාර්වූ භාර නිලධාරියෙක් මුල්ලේරියාවට පත්වීම් ලැබී යැ.

පැලවත්තැ රෝහල

මෙහි රෝගීන් 287 ක් පමණ සිටිත්. නව ආතුරාල දෙක තවමත් ඉදිවෙමින් තිබේ. කලින් වාර්තාවේ කියූ පරිදි, පැලවත්තැ රෝහල පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් බවට හැරවීමට ගත් තීරණය නිසා, අළුත් ගොඩනැගිලි ඉදි කිරීමේ කටයුතු සියල්ල අත්හිටුවා ඇත. පුනරුත්ථාපන මධ්‍යස්ථානය ඉතා ඉක්මනින් ඇරඹීමට යි අප අදහස.

භික්ෂු ආතුරාලය (වාවිටුව)

සුව ලබන්නවුන්ගේ ආතුරාලය පිළිසකර කිරීමෙන් භික්ෂූන් සඳහා කුඩා ආතුරාලයක් අවුරුද්ද තුළ එළිය දිටි.

වෛද්‍ය මණ්ඩල

හැම බදාදා උදයෙකැ මැ අංගොඩ දී විශේෂ මනො වෛද්‍ය මණ්ඩලයක් පැවැත් වෙන අතරැ, අහහරුවාදා සහ බදාදා දිනවල කොළොඹැ, මහ රෝහලේ පැවැත්වෙන වෛද්‍ය මණ්ඩලයේ මනො වෛද්‍ය දෙදෙනෙක් ද කටයුතු කරත්.

පොලිස් ඇණිය

දෙපාර්තමේන්තුවේ ඉල්ලීමකට කන්දුන් පොලීසිය මෙහි පොලිස් ඇණියක් යොදා ඇත.

(උ) නීති—වෛද්‍ය කටයුතු

අධිකරණ වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලය නීති-වෛද්‍ය ගොඩනැගිල්ලකට ගෙනැ ගිය දවස පටන්, ඉඩ-කඩ මඳ වීම ඉතා තදින් දැනෙන්නට විය.

පසුගිය කාලයේ දී මෙන්, වඩා වැදගත් වූ සහ අසීරු වූ නඩු-හබ වරුදී ප්‍රාදේශීය අධිකරණ, පොලීසිය සහ නීති පති දෙපාර්තමේන්තුව අධිකරණ වෛද්‍ය නිලධාරියා ගෙන් උදවු ඉල්ලා සිටියහ. පිටැ ප්‍රදේශවලැ වෛද්‍ය නිලධාරිහු ද පළාත් බද අධිකරණ, වෛද්‍ය නිලධාරී හු ද අසීරු ප්‍රස්ථාවලැ දී අධිකරණ වෛද්‍ය නිලධාරියා ගෙන් උපදෙස් සෙවූහ.

නීති-වෛද්‍ය අංශයේ අත හැසුණු ඇතැම් වැදගත් මිනී මැරුම් නඩු අතර පුත්තලමැ මංගල එළියැ මිනී මැරුම ද වී යැ.

සේවක පිරිස

1. වෘත්තිය සහ අනෙකුත් සේවක පිරිස බෙදී යන්නේ මෙ සේ යැ :—

(අ) වෘත්තීය සේවක පිරිස

(1) අධිකරණ වෛද්‍ය නිලධාරී	1
(2) නියෝජ්‍ය අධිකරණ වෛද්‍ය නිලධාරී ...	1
(3) සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරී ...	2

(ආ) ශිල්පිය සහ ලිපිකාර සේවක පිරිස

(1) වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥයින් ...	1
(2) සා.ලි.ප. ලිපිකරුවන්	1
(3) යතුරු ලේඛකයන්	1

(ඉ) සුළු සේවක පිරිස

(1) කාර්යාල කායික සහායක	2
(2) උපස්ථායක	1
(3) උපස්ථායිකා	1
(4) පරීක්ෂණාගාර සේවක	1
(5) කම්කරුවන්	6

කරන ලද වැඩ

2. අධිකරණ වෛද්‍ය නිලධාරියා සහ ඔහුගේ සහකරුවෝ අවුරුද්ද තුළැ දී පරීක්ෂණ 1,200 කට වැඩි ගණනක් ම යෙදුණහ. එයින් 643 ක් මැ පශ්චාත්-මරණ පරීක්ෂණ වී යැ.

අ. පශ්චාත්—මරණ පරීක්ෂණ

පශ්චාත්-මරණ පරීක්ෂණ පිළිබඳ විස්තර මතු දැක්වේ.

(අ) මිනී මැරුම් මුළු ගණන		75
(i) කැපුම් සහ පිහියා ඇනුම්	37	
(ii) මොට ආවුධවලින්	19	
(iii) වෙඩි පහරින් සහ පිපිරීම්වලින් තුවාල	7	
(iv) සැඩ හුස්ම හිර කිරීම්	1	
(v) පිළිස්සුම්	1	
(vi) වෙනත්	10	
(ආ) මරණයෙන් කෙළවර වූ අනතුරු මුළු ගණන		202
(i) මහ මගැ සහ දුම්රිය මගැ	114	
(ii) රක්ෂාවේ දී සියවන අහඹු	1	
(iii) දියේ ගිලීමෙන්	26	
(iv) විස වායුවෙන්	6	
(v) විදිලිය සැර වැදීමෙන්	3	
(vi) පිළිස්සීම්, වැටීම්, යනාදිය නිසා ගෙදර-දොරේ අනතුරු ඇතුළු අනෙකුත් හේතු	52	
(ඉ) දිවිනසා ගැනීම්		42
(i) වස විස	21	
(ii) සැඩ හුස්ම හිරවීම්-එල්ලීමෙන්	7	
දියේ ගිලීමෙන්	1	
(iii) දුම්රියට යට වීමෙන්	7	
(iv) වෙඩි පහරින්	—	
(v) මුවහත් ආයුධ (ගෙල කපා ගැනීම)	2	
(vi) උසැ සිටැ පැනීමෙන්	3	
(vii) වෙනත්	1	
(ඊ) විවිධ		324
(i) ස්වාභාවික හේතුවලින්	282	
(ii) සාපරාධී ගප්සා	1	
(iii) ස්වභාවික ගප්සා	4	
(iv) බිළිඳුන් මැරීම	1	
(v) පණ-තොර උපත්	1	
(vi) කටයුතු වැරදි යාමෙන්	6	
(vii) අවිනිශ්චිත	29	

අසීරු පශ්චාත්-මරණ පරීක්ෂණ මෙහෙයවීම සඳහා පිටැ පළාත්වලැ මහෙස්ත්‍රාත් වරුන්ගේ පණිවුඩ 22ක් අධිකරණ වෛද්‍ය නිලධාරියාට යැවීයැ. එයින් පස් වතාවෙකැ, මිනී වළෙන් ගොඩ ගෙනැ පරීක්ෂා කළ යුතු වී යැ.

(ආ) තුවාල

	බරපතල	ලිහිල්	එකතුව
(i) තියුණු ආයුධවලින් සිදු වූ	260	584	844
(ii) මොට ආයුධවලින් සිදු වූ	873	7,113	7,986
(iii) වෙඩි පහර තුවාළ	16	10	26
(iv) බෝම්බ, පිපිරීම් හා පිළිස්සීම් නිසා	20	12	32
(v) මගැ-තොටේ අනතුරුවලින් ලත් තුවාල	378	1,358	1,736
(vi) රක්ෂාවේ අනතුරුවලින් සිදුවූ තුවාල	32	63	95
එකතුව	1,579	9,140	10,719

(ඉ) වෙනත් විභාග

(i) ඊනියා තනිස් නඩු	... ...	35
(ii) ඊනියා ගප්සා	... ...	5
(iii) ඊනියා බීමත් කම	... ...	1,284
(iv) වස-විස යෙදුම	... ...	248
(v) අස්වාභාවික වැරදි ක්‍රියා	... ...	28
(vi) බල්ලන් සපා කෑම	... ...	65
(vii) ඊනියා පහර දීම	... ...	1,026
(viii) වයස තීරණය ආදිය	... ...	84
(ix) ඇසිඩ (අම්ල) යනාදියෙන් සිදුවූ තුවාළ	...	15

නීති වෛද්‍ය පරීක්ෂණාගාර සෝදිසි

මෙම පරීක්ෂණාගාරයේ ට ඉදිරිපත් වූ ද්‍රව්‍ය පරීක්ෂා කිරීම් විස්තර මෙ සේ වෙයි :—

(අ) ග්ලාන ඖතික වේදය	... ...	247
(ආ) මූත්‍රා-ගෙ-මැඩි පරීක්ෂණය	... ...	8
(ඉ) ලේ වර්ග කිරීම	... ...	5
(ඊ) සංරක්ෂණය	... ...	35
(උ) ඇට-කටු සහ මිනිස් ද්‍රව්‍ය	... ...	22
(ඌ) තැවරුම්, වැකුම්, යනාදිය	... ...	15
(ඍ) යෝනියා දී තැවරුම්	... ...	58
(ඎ) කෙස්-ලොම් යනාදිය	... ...	15
(ඩ) ඇට මිදුළු ...	... ...	2
		407

නිදර්ශන වැඩි හරියක් ලැබුණේ පිටැ පළාත් වලිනි. නිදර්ශන 44ක් නීති වෛද්‍ය කෞතුකාගාරය උදෙසා රාමු කරවන ලද නමුත්, නිසි සේ නිමවුණ ගොඩනැගිල්ලක් නැති නිසා මෙම කෞතුකාගාරයේ විහිදුම සීමා සහිත වී යෑ.

නීති-වෛද්‍ය කෞතුකාගාරය උදෙසා නිදර්ශන සකසා රාමු-නැංවීම කරන ලද්දේ වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥ තැන විසින් යෑ. නීති-වෛද්‍ය නඩුවලට අදාළ සියලු ඡායාරූප වැඩ බාරගන්නේත් ඔහු මැයි. එබඳු ඡායාරූප 26 ක් අවුරුද්ද තුළ ගන්නා ලදි.

සංස්කරණ පාඨ මාර්ග

අධිකරණ වෛද්‍ය කර්මය විෂයයෙහි මතු සඳහන් සංස්කරණ පාඨ මාර්ග දෙන ලදි :—

62.11.17—ආධුනික පොලිස් පරීක්ෂකයින් උදෙසා උසස් කිරීමේ පාඨ මාර්ගය
62.12. 8—වැඩ බලන පොලිස් උප පරීක්ෂකයින්ට දෙසුම්
62.12.18—සීමා වාසික නිලධාරීන්ට අධිකරණ රාජකාරි ගැන දෙසුම්
63.1. 12— එම
63. 3. 8—වැඩ බලන පොලිස් සැරයනුන්ට දෙසුම්
63. 3.14—ආධුනික උප පරීක්ෂකයින්ට සහ ආධුනික ප්‍රාදේශීය ආදයම් නිලධාරීන්ට දෙසුම්
63. 3.29—ප්‍රාදේශීය ආදයම් නිලධාරීන්ට දෙසුම්
63. 4.15—සීමාවාසික වෛද්‍ය නිලධාරීන්ට තත්වාවබෝධ පාඨ මාර්ගය
63. 4.20—සීමාවාසික වෛද්‍ය නිලධාරීන්ට අධිකරණ කටයුතු ගැන දෙසුම්
63. 5.11—පරීක්ෂක ලෙස උසස් වීමට යන උප පරීක්ෂකයින්ට දෙසුම්
63. 7.20—වැඩ බලන පොලිස් සැරයනුන්ට දෙසුම්
63. 8.27—නව මහේස්ත්‍රාත්වරුන් පුහුණු කරවීම
63. 9.21—සීමාවාසික වෛද්‍ය නිලධාරීන්ට අධිකරණ කටයුතු ගැන දෙසුම්
63. 9.24—ආධුනික උප පරීක්ෂකයින්ට සහ ආධුනික සහකාර පොලිස් අධිකාරීන්ට දෙසුම්

පිටැ ප්‍රදේශවලැ අධිකරණ වෛද්‍ය වැඩ

(අ) පශ්චාත්—මරණ පරීක්ෂණ		2,109
(ක) මිනී මැරුම් මුළු ගණන		2,109
(1) කැපීම් සහ පිහියා ඇනුම්	767	
(2) මොට ආයුධ	1,065	
(3) වෙඩි පහර තුවාල සහ පිපිරීම්	90	
(4) සැඩ හුස්ම හිරවීම-එල්ලී	16	
දියේ ගිලී	13	
(5) පිළිස්සීමෙන්	20	
(6) වස-විස යෙදුමෙන්	51	
(7) අවිනිශ්චිත තීන්දු	37	
(8) වෙනත්	50	
(කා) මිරු කැඳවූ අනතුරු මුළු ගණන		683
(1) මග-තොටේ අනතුරු	370	
(2) දුම්රියට යට වී	50	
(3) රක්ෂාවේ ආපදාවලින් අනතුරු	54	
(4) අවිනිශ්චිත තීන්දු	8	
(5) පිළිස්සීම් යනාදියෙන් ගෙදර දොරේ අනෙකුත් අනතුරු	201	
(කි) දිවි නසා ගැනීම්		864
(1) වස-විස ගැනීමෙන්	406	
(2) සැඩ හුස්ම හිරවීමෙන්—එල්ලීමෙන් ...	208	
දියේ ගිලීමෙන්	139	
(3) දුම්රියට පැනීමෙන්	25	
(4) වෙඩි පහරින්	26	
(5) තියුණු ආයුධ	16	
(6) අවිනිශ්චිත	18	
(7) වෙනත්	26	
(කී) වෙනත් නඩු		1,273
(1) බිළිඳුන් මැරීම	22	
(2) ගප්සා	12	
(3) අවිනිශ්චිත	126	
(4) ස්වාභාවික හේතු	1,113	
මුළු එකතුව ...		4,909

අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් සහ රජයේ රෝහල් භාර නිලධාරීන් විසින් සැපයුණ වාර වාර්තාවලින් :—

(අ) තුවාල

	බරපතල	ලිහිල්	එකතුව
(1) තියුණු ආයුධවලින් සිදු වූ	1,546...	7,681 ...	9,227
(2) මොට ආයුධවලින් සිදුවූ	3,957...	38,130...	42,087
(3) වෙඩි පහර වලින් සිදුවූ	235...	295...	530
(4) බෝම්බ සහ පිපිරීම්වලින් සිදුවූ ...	145...	218...	363
(5) පිළිස්සීමෙන්	148...	1,072...	1,220
(6) මගැ-තොටේ අනතුරුවලින් සිදුවූ ...	1,003...	3,841...	4,844
(7) දුම්රිය අනතුරුවලින් සිදුවූ	31...	67...	98
(8) රක්ෂාවේ ආපදාවලින් සිදුවූ	316...	1,098...	1,414
(9) වෙනත්	173...	2,540...	2,713
එකතුව ...	7,554	54,942	62,496

(ඉ) වෙනත් විභාග

(1) ඊනියා තනිස් නඩු	...	221
(2) ගප්සා නඩු ...	...	249
(3) ඊනියා බිමත්කමේ	...	2,460
(4) වස-විස කැවීමෙන්	...	970
(5) සිහි මඳ ගතියෙන්	...	736
(6) වෙනත් ...	...	435
එකතුව	...	5,074

(ඊ) කැවිය

(1) පශ්චාත් මරණ පරීක්ෂණ ගණන	...	4,159
(2) තුවාළ සිදු වූ ගණන ...	...	50,845
(3) වෙනත් පරීක්ෂණ ගණන ...	...	5,074
එකතුව	...	60,078

ගොඩනැගිලි

3. කාර්යාලය පිහිටා ඇත්තේ නීති වෛද්‍ය මිනි කිළි අංශයේ හෙයිනුත්, නීති-වෛද්‍ය පරීක්ෂණාගාරය සහ කෞතුකාගාරය එක කිළියෙකැ හෙයිනුත් දරුණු ලෙස ඉඩ-කඩ මද වීමෙක් වෙයි. ඉඩ-කඩ නොමැති කම නිසා පරීක්ෂණාගාරයේ සහ කෞතුකාගාරයේ වැඩ කටයුතු බොහෝ සෙයින් අවහිර වෙයි.

(උ) පිළිකා-රෝගය

මහරගම පිළිකා රෝග ආයතනයට ඇතුල්වී ප්‍රතිකාර ලැබූ රෝගීන් සහ එහිදී ප්‍රතිකාර ලැබූ අනිකුත් රෝගීන් සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩිවූ බැව් පෙනී ගියේ ය. පසුගිය වර්ෂවල දී මෙන් ම එහා මෙහා ගෙනයා හැකි රෝගීන්ට පිළිකා සංගමයේ නේවාසිකාගාරයේ ඉඩ සලසා දීමෙන් ඇඳන් 254ක් ඇති ආයතනයේ ආකීර්ණතාව මහහැරිණ. මධ්‍යගත ආයතනයක් වශයෙන් මෙම ආයතනයේ දී "රශ්මි චිකිත්සාව" දිගටම කරගෙන යන්නේ නම් මෑත අනාගතයේ දී මෙහි ඇඳන් සංඛ්‍යාව යටත් පිරිසෙයින් 500 දක්වා වැඩි කිරීම අවශ්‍ය වේ.

රෝගය සුව කළ නොහැකි රෝගීන් රැක බලා ගැනීම උග්‍ර ප්‍රශ්නයක් වී තිබේ. එයට හේතුව, රෝගයෙන් ලැබෙන පීඩාව සමනය කිරීම සඳහාත් රෝග ලක්ෂණවලට ප්‍රතිකාර කිරීම සඳහාත් යවන මෙම රෝගීන් යම්යම් කරුණු නිසා ප්‍රාදේශීය රෝහල්වලට ඇතුළු කරවීමට අපහසුවීමය. ලංකා පිළිකාරෝග සංගමය මගින් විවෘත කරන ලද බණ්ඩාරනායක නිවාසයේ මෙවැනි රෝගය සුව කළ නොහැකි රෝගීන් 50කට ඉඩකඩ සලසා ඇත.

දිවයිනේ සිටින සියළුම පිළිකා රෝගීන්ට රශ්මි මාර්ගයෙන් රශ්මි චිකිත්සාගාරයේ දී ප්‍රතිකාර කිරීම දිගටම කරගෙන යනු ලැබේ. කොළඹ මහ රෝහලේ ඉඩකඩ, සලසා ඇත්තේ විශේෂයෙන් ම රෝහලට ඇතුල් වීම අනවශ්‍ය, පිළිකා රෝගය නොවැළඳුනු රෝගීන්ට ප්‍රතිකාර කිරීමටත් මාත්සරික රෝගීන්ට රෝගයෙන් ලැබෙන පීඩාව සමනය කිරීම සඳහා ප්‍රතිකාර කිරීමටත් පමණක් ය.

පසුගිය වර්ෂයේ මෙන් ම රෝගීන්ගේ සංඛ්‍යාව වැඩිවෙමින් පැවතින.

චිකිත්සාගාරය

මහරගම හා වෙනත් චිකිත්සාගාරවල දී පරීක්ෂා කිරීමෙන් පසු මෙම ආයතනයට රෝගීන් ඇතුළු කරනු ලැබේ. ඉරිදා හැර අනිකුත් සෑම දිනකම පෙරවරු කාලයේ රශ්මි චිකිත්සාව කරන අතර සතියකට දෙවතාවක් ශෛල්‍ය කර්ම හා ස්ත්‍රී චිකිත්සාව කරනු ලැබේ.

මෙම ආයතනයේ දී පවත්වන චිකිත්සාගාර පරීක්ෂණවලට අතිරේක වශයෙන් කොළඹ මහ රෝහලේ දී, සතියකට තුන්වතාවක් ද, යාපනයේ සහ මහනුවර රජයේ රෝහල්වල දී සෙනසුරාදාවක් හැර ඊළඟ සෙනසුරාදා දිනයේ ද රෝගීන් සෝදිසි කරනු ලැබේ.

1963.1.15 වැනි දින ගාල්ලේ රෝහලේ චිකිත්සාගාරයක් විවෘත කරන ලදි.

කුරුණෑගල, මඩකලපුව හා බදුල්ල වැනි මධ්‍යස්ථානවලින් මහරගම ආයතනයට රෝගීන් බොහෝ සංඛ්‍යාවක් එවීමෙන් පෙනී යන්නේ තව තවත් ප්‍රාදේශීය රෝහල් ඇති කිරීමේ අවශ්‍යතාව වේ.

කරන ලද වැඩ

ආයතනයේ සෑම අංශයකම කරන ලද වැඩ භාරය වැඩිවී ඇත. "රශ්මි චිකිත්සා" අංශයෙන් රෝගීන් 880කට "ඩීප් රේ" චිකිත්සාව ලැබුණු අතර 511 කට "කොබෝල්ට්" චිකිත්සාව ලැබිණ.

VII වැනි පරිච්ඡේදය

වෛද්‍ය පර්යේෂණායතනය

අවුරුද්ද තුළ දී මෙම ආයතනයේ වැඩ කටයුතු ඉතාමත් සතුටුදායක වූ බව ලියා තබන්නට ලැබීම සතුටට හේතුවකි. සෞඛ්‍ය සේවාවේ අනෙකුත් අංශ උදෙසා එදිනෙදා වැඩට අයත් රෝග විනිශ්චය පරීක්ෂණාගාර සෝදිසි බොහෝ රාශියක් කැරී දීමට, මෙම ආයතනය මුල සිටැ මැ බැඳී සිටින හෙයින්, පර්යේෂණ පිටියේ ලබා ඇති ප්‍රගතිය විශේෂයෙන් සැලීමට වටනේ යැ. රෝහල් සහ අනෙකුත් පරීක්ෂණාගාර දියුණු වීමක් සමග මෙම ආයතනයට පැවරෙන සිරිත් හුරු වැඩ කෙමෙන් කෙමෙන් අඩු වී ගොස්, එහි ප්‍රධාන කාරිය හැටියට පර්යේෂණ පැවැත්වීම මැ යොදා ගත හැකි වෙනු ඇතැයි අප නිරතුරු වැ බලාපොරොත්තු වූවෙකි. එසේ ද වුවත්, ඇතැම් අංශවලැ සිරිත්හුරු වැඩ රාශිය අඩු වී ඇතත්, අලුත් පරීක්ෂණ පටන් ගත්තාවූ හෝ එක්තරා පරීක්ෂණ කොටසක් අනෙකුත් පරීක්ෂණාගාරවලැ ඒ තරම් දියුණු වී නැත්තා වූ හෝ වෙනත් අංශවල සිරිත්හුරු වැඩ වැඩි වී ඇත.

සේවක පිරිස

ජීව රසායන අංශය භාරවැ සිටි වෛද්‍යාචාර්ය ජී. එස්. විජේසිංහයෝ, ගානාවේ ආහාර සහ ගොවිකම් සංවිධානයේ පදවියක්, ඉසිලීමට 1962 දෙසැම්බරයේ දී සේවයෙන් විශ්‍රාම ගත්හ. බුද්ධිමත් වියතෙකු වූ ඔහු කිහිප මසක් ඇවැමෙන් මොටෝරිය අනතුරෙකින් මරු වැළඳගත් බව මා මෙහිලා සඳහනුයේ බලවත් සොවෙනි.

අවුරුද්ද තුළ දී සේවක පිරිසට අලුත් කෙනෙක් එක් වී යැ. ඒ, විෂාණු (වයිරස්) අංශයට පත් කරනු ලැබූ වෛද්‍ය නිලධාරිනී වෛද්‍යාචාර්‍යා අයි. ජී. ටී. ප්‍රනාන්දු මෙනෙවිය යි.

විශ්‍රාම ගැනීමේ වයසට පා තැබූ ටී. ඒ. බුල් මහතා සේවයෙන් වෙන් වී යාම නිසා අවුරුද්ද තුළදී ලේකම් තැනගේ සේවය ආයතනයට නොලැබී ගියේ යැ. පසු ගිය පසලොස් අවුරුද්දක් මුලුල්ලේ ආයතනයේ ලේකම් පදවිය දැරූ ඔහු දක්ෂ නිලධාරියෙකු බව මොනවට පැහැදිලි වියැ. ඔහුගේ හිස් වූ තැනට එස්. වේලමුරුගු මහතා පත්වී ආයේ යැ.

වැඩ පොළෑ කාර්මික හැටියට ඒ. ඩී. එච්. ගුණරත්න මහතාත්, රසායනාගාර උප සහායකයෙකු වූ ඒ. එල්. බී. පිගේරා මහතා කාර්මික සහකාරයෙකු හැටියටත්, වැඩ පොළට පත් කරනු ලැබීමෙන්, එහි සේවක පිරිස ඉන් පරිපූර්ණ වී යෑ.

පශ්චාත් උපාධි අභ්‍යාසය සහ අධි ශිෂ්‍යත්ව

මෑතක දී නිලධාරීන්ගේ විශ්‍රාම ගැනීමේ හේතුවෙන් නිපුණත්වය ඇති මාණ්ඩලික නිලධාරීන් වඩ වඩා වුවමනා බව දැනෙන්නට වූයෙන්, පශ්චාත්—උපාධි උගැනුම ලැබීම සඳහා නිලධාරීන් ඔව් දෙනෙකු එතෙරු යැවියැ හැකි වීම ඉතාමත් සතුටුදායක සිද්ධියෙකි.

සාක විද්‍යාව විෂයෙහි පශ්චාත්—උපාධි වැඩ සඳහා වෛද්‍යාචාර්ය එන්. අයි. ප්‍රනාන්දු මහත්මිය 1963 ජූනි මාසයේ දී තුදුස් මස් ඉගැනුම් නිවාඩුවක් පිටැ එක්සත් රාජධානිය බලා පිටත් වූවා යෑ

හෙසජ්ජක විද්‍යාව විෂයයෙහි පශ්චාත්—උපාධි උගැනුම ලබනු වස් එක්සත් රාජ ධානියේ දී පල දෙන පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්වයක් මතැ වෛද්‍යාචාර්‍යී කේ. ජයසේන මහතා 1963 අගෝස්තුවේ දී රටින් නික්මැ ගියේ යෑ. එ මසැ මැ පරාපොෂිත විද්‍යාව (පරපුටු විද්‍යාව) විෂයයෙහි උගැනුම ලැබීමට එ බඳු මැ ශිෂ්‍යත්වයක් මතැ වෛද්‍යාචාර්‍යී එම්. එම්. ඉස්මයිල් මහතා කැනඩාව බලා පිටත් වීයැ.

සාක විද්‍යාව විෂයයෙහි පශ්චාත්—උපාධි අභ්‍යාසය ලබනු සඳහා වෛද්‍යාචාර්‍යී පී. ඩී. පී. ගුණතිලක මහතා 1963 සැප්තැම්බරයේ දී එක්සත් රාජධානිය බලා පිටත් වී යෑ.

මෙකී පශ්චාත්—උපාධි උගැනුම්වලට අමතර වැ, වෛද්‍යාචාර්‍යී කේ. නිත්‍යානන්ද මහතා 1963 අගෝස්තුවේ දී තෙ මසෙකැ විශේෂ අභ්‍යාසයකට සහභාගි වී යෑ. ඒ වසංගත ස්වභාවය ගැන විශේෂ අවධාරණය ඇතුවැ ලේප්ටොස්පයිරෝසියාව විෂයයෙහි, කොළඹ ක්‍රමය යටතේ මලයාවේ කුවාලා ලුම්පූර් වෛ. ප. ආයතනයේ පවත්වන ලද අභ්‍යාසය පාඨ මාර්ගයෙකි.

ජාත්‍යන්තර සම්මේලන සහ සමුනේරු

ජාත්‍යන්තර සම්මේලනවලට හවුල් වීමට නිලධාරීන් දෙදෙනෙක් අවුරුද්ද තුළැ දී ඉඩ ලැබූහ. සම්මේලන දෙක මැ පෝෂණය මැයෙන් වීමත්, ඉන්දියාවේ හයිදරබාදයේ පැවැත්වීමත් අහඹුවක් මැයි.

අග්නි දිග ආසියාව උදෙසා ආහාර සහ ගොවිකම් සංවිධානය—ජ. සෞ. සං. එ. ජා. ජා. ල. හ. අරමුදල යන තුන් හවුලෙන් මෙහෙයැවුණ පෝෂණ සමුනේරුවට 1962 ඔක්තෝබරයේ දී වෛද්‍යාචාර්‍යී ඩී. බී. ගුණසේකර හවුල් වී යෑ. ජගත් සෞඛ්‍ය සංවිධානයේ අනුබලය ඇතුවැ "ප්‍රෝටීන් දුරාපෝෂණය" විෂයයෙහි පවත්වන ලද සමුනේරුවට 1963 ජනවාරියේ දීත්, සමස්ත භාරතීය ළමා රෝග විද්‍යාඥ සම්මේලන යට ඉන් ඉක්බිතිවලත් වෛද්‍යාචාර්‍යී කේ. මහාදේව මහතා හවුල් වී යෑ.

ඉඩකඩ—සැලසීම

සැහෙන තරමට ඉඩ-කඩ සැලසීමේ ගැටලුව අවුරුද්දෙන් අවුරුද්ද වඩ-වඩා බැරෑරුම් වී ඇත. තරමකට තම පර්යේෂණ කටයුතු නිසා ද, තරමකට විශේෂයෙන් වසංගත විද්‍යානුකූල තතු හදාරු සඳහා සෙසු සෞඛ්‍ය සේවාවලින් විශේෂ පරීක්ෂණාගාර වැඩ කරවා ගැනීමට එවූ ඉල්ලීම් නිසා ද, බොහෝ අංශ තම කම් පිටි පුළුල් කැරැ ගෙනැ ඇත. මේ හැර, පාලක සහ සේවා මණ්ඩල සුබ සාධක හේතු නිසා, වැඩි වැඩියෙන් ඉඩ-කඩ ලබා ගැනීමට ද වුවමනාවෙක් පැනැ නැඟ ඇත. එපමණක් නෙ වැ, මෙම ආයතනය උදෙසාත්, මෙම ආයතනයෙන් බඩු ලබාගත් පිට පළාත් පරීක්ෂණාගාර උදෙසාත්, ගබඩා කිළි මඳ වීම තදින් මැ දැනී ගොස් ඇත.

ආතනය පිටු පසෑ පිහිටි ඉඩම, අලෙවි කිරීමේ, දෙපාර්තමේන්තුව ආපසු දී තිබුණ නම් මේ ගැටලුව විසඳාගත හැකි වී තිබුණි. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් මුළු තැන්ගේ පිහිටි මෙම ඉඩම, අවුරුදු 20කට පමණ ඉහතැ දී අප භාරයේ තිබී එම දෙපාර්තමේන්තුවට පිරුළට දෙන ලද්දෙකි. මුළු ඉඩම හෝ එහි පිහිටා ඇති විශාල ගබඩා ගොඩනැගිල්ලේ පාවිච්චිය හෝ ලබා ගැන්මට අවුරුද්ද තුළ දී කොතෙක් තැත් කළ ද, අපගේ ඒ තැතෙන් පලක් නොවී යෑ. ලබන අවුරුද්දේ දී මේ ගැන යමක් කැරැ ගැනීමට පිළිවන් වෙතැයි සැනසෙමිහ අපි.

දැනට තිබෙන ගොඩනැගිල්ලේ වැඩි දියුණුව දෙස බලමු. විෂාණු (වයිරස්) පරීක්ෂණාගාරයට 1963 ජූනියේ දී විශේෂ වා-සැකැස්මක් සවි කරන ලදී. මේ සමග විෂානු හඳුනා ගැනීම අරබයා පටල වැඩුම ඇරඹුනි. සියළු ආකාරයේ වැඩ පරීක්ෂණාගාරයට බාර ගැනීමට නම්, සෙන්දු කිළි පහසුකම් ද වුවමනා යෑ. මේ ලබන අවුරුද්ද තුළ දී සලසා ගත හැකි වේ යැයි අපි බලාපොරොත්තු වෙමු.

නිසග නිපැදුම් රසායන විද්‍යාව උදෙසා වූ දෙවන පරීක්ෂණාගාරයේ දිය නළ අවසන් යෙදුටත්, පොෂණ පරීක්ෂණාගාරයේ අම්රදමුනේ දුම් බටය, යෙදුමක් ලබන අවුරුද්දේ දී නිම වෙනු ඇතැයි ද බලාපොරොත්තු වෙමි.

වැඩ කටයුතු

නොයෙක් කායශාංශවලැ කැරුණු වැඩ කැටි කැරැ දැක්වීමෙකි මේ:—

සාක විද්‍යාව (සාමාන්‍ය)

පසු ගිය කාලයේ මෙන් මැ, මේ කායශාංශයේ වැඩ වැඩි වශයෙන්, රෝහල්වලින් ලත් නොයෙකුත් නිදහසුන් ගැන වූ සාක විද්‍යා සෝදිසිවලින් යුක්ත වී යෑ. සාක විද්‍යා සෝදිසි සතුටුදායක ලෙස කර ගෙනැ යමට නිදසුන් නිසි සෙ එකතු කොටැ පිටත් කැරැ එවීම අවශ්‍ය හෙයින්, මෙය අඩු ගණනේ කොළොඹැ රෝහල් කැටියෙන් වත් ඉටු කරවා ගැනීමට වග බලා ගනු පිණිස, පිළිවෙතක් ඇරඹුයෙන්, එය සතුටුදායක ලෙස පල දුන් බව පෙනෙන්නට වී යෑ.

මෙම කායශාංශය සිරිත්හුරු වැඩවලින් බර වී තිබීම හේතු කොටැ ගෙනැ, සංවිධානය වූ පර්යේෂණ කළ හැකි වූයේ යන්තමින් යෑ. එසේ ද වුවත්, පර්යේෂණ කටයුතු සුළු වෙන් ඇරඹුණි.

පිටගැස්ම පිටු දැක්මේ දී සහ නොහොත් ඊට ප්‍රතිකාර දීමේ දී වෙනිවැල් ගැටයේ ඖෂධිය අගය මිනීමේ තතු විමසුම් ඇරඹුණි.

අවුරුද්දට කරන ලද සිරිත් හුරු සෝදිසි ගණන ගිය අවුරුද්දේ ගණනට වඩා බෙහෙවින් වැඩි යෑ. එ බැවි ගිය අවුරුද්දේ 13831කුත් මේ අවුරුද්දේ 18,094කුත් තිබීමෙන් පෙනේ.

මෙයින් තුනෙන් පංගුවක්—6,664ක්—වූයේ, ඩිප්තීරියා නම් ගලපටල රෝගය සහ අනෙකුත් බෝවීම් උදෙසා උගුරෙන් සහ වෙනත් තැන්වලින් ලත් මුස්නු වැකුම් සෝදිසි යෑ. ගලපටලයට සහගැති වූ ගණන 367කි. පසු ගිය අවුරුද්දේ ගණනින් මේ ගණන එ තරම් වෙනස් නො වේ.

අනෙකුත් සෝදිසිවලට අයත් වූයේ, මූත්‍ර නිදර්ශන 1,773ක් හි ද ලේ නිදර්ශන 1,102ක් හි ද සැරව සහ ශ්වාස නාලීය දියර නිදර්ශන 1,196ක් හිද කෙළ නිදර්ශන 1,281 ක් හි ද මස්තිෂ්ක කණ්ටකීය දිය නිදර්ශන 119ක් හි ද බෝවෙන ජීවීන් වැඩුම සහ හඳුනා ගැනුමයි.

ක්ෂය රෝග ආසාදනයට දෙස් සෙවීමේ අරමුණෙන් කරන ලද සෝදිසි ගණන 2,711ක් වූ අතරැ, එයින් 86ක් සහගැති බව ප්‍රත්‍යක්ෂ වී යෑ. මෙය ගිය අවුරුද්දේ ගණනට බොහෝසෙයින් සමාන වී යෑ.

ගොනොකුකුස ආසාදනය අරබයා 43ක් ද පිටගැස්ම අරබයා 19ක් ද ස්ටැපිලොකුකුසිය ආන්ත්‍ර අරිතත් දාහය අරබයා 41ක් ද යනුවෙන් සෝදිසි රැසෙක් ද වී යැ.

ලාදුරු අරබයා මෙහෙය වූ සෝදිසි අනුව ගිය අවුරුද්දට වඩා කැපී පෙනෙන වැඩි මෙක් දක්නට ලැබුණි. එනම් ගිය අවුරුද්දේ 80ක් වූ අතරැ මේ අවුරුද්දේ එය 1,392ක් වීම මිට හේතුව, මාලදිවයිනේ තන්පත් ජ. සෞ. ස. පුරෝහිත එච්. නියමාර් වෛද්‍යවරයා වෙනුවෙන් ගන්නා ලද ගණන—1,382—ඉතා විශාල වීම යි. ඒ අනුව මෙරටැ රෝගීන් විෂයයෙහි ගන්නා ලද ගණන 80 සිටැ 10ට බැස තිබේ.

සූක්ෂ්ම ජීවී සංවේදනා සෝදිසි උදෙසා ආ ඉල්ලීම් 2,230 සිටැ 2,822 දක්වා නැගී මෙක් පෙන්වී යැ. අලුත් ප්‍රතිජීවී ද්‍රව්‍ය එළැඹෙන විටැ මතු දවසැ, මේ සෝදිසි කිරීමේ වුවමනාව වැඩි වෙනවා නො අනුමාන යි.

රෝහල් ශල්‍යාගාරවලැ ඇති තද පිඩනයෙන් යුත් විෂ බීජ වන්ධ්‍යතා යන්ත්‍රවල ශක්ති ප්‍රමාණය උරගා බැලීමට 27 වතාවකැ දී දෙපාර්තමේන්තුව පරීක්ෂණ ද මෙහෙය වී යැ.

සාක විද්‍යාව (අහර සහ දිය, ලෙප්තොස්පයිරොසියාව, දිලීර වේදය)

(අ) **අහර සහ දිය.**—දිවයිනේ නොයෙක් පෙදෙස්වලින් ලත් දිය මුහුන්තැලි (නිදර්ශන) සහ නා නා වගැ අහර මුහුන්තැලි විෂයයෙහි මෙම අංශය සැක විද්‍යා පරීක්ෂණ කළේ යැ.

මේ අංශයේ වැදගත් කටයුත්තක් වූයේ, එලහකට ත් කරන ලද සාක විද්‍යා සෝදිසි ආරම්භ වී ඇති ප්‍රස්ථාවලදී උපදෙස් දීමේ පරීක්ෂණාගාරයක් ලෙස මෙය බොහෝ විට නිතර මැ පාවේ සි දුටු අතරැ, එ බඳු වැඩට වැඩි කාලයක් මිඩංගු වුණි. ඒ නයින් බලන කලැ, අවුරුද්දට මුහුන්තැලි 560ක් සෝදිසි කරන ලද අතරැ, 67ක් අසතුටු දායක බැව් පෙනුනි. සිරිත්හුරු පරීක්ෂණ සඳහා පොල් මණ්ඩලයට දැන් තමන්ගේ මැ පරීක්ෂණාගාරය තිබෙන හෙයින්, මේ වැරැ පරීක්ෂා කරන ලද මුහුන්තැලි ගණන ගිය අවුරුද්දේ ගණනින් අඩකටත් අඩු යැ.

කිරි, විත් කැම, පිටි යනාදි අනෙකුත් අතර මුහුන්තැලි 32ක් ද අවුරුද්ද තුළැදී පරීක්ෂා කරන ලදු වැ එයින් 12ක් සතුටුදායක බැව් පළ වී යැ.

අහර විස ගැන්වීමේ ජීවීන් බැලීමට පරීක්ෂා කරන ලද මුහුන්තැලි ගණන 22කි.

රජයේ සහ පෞද්ගලික ආයතනවලින් අවුරුද්ද තුළැ දී ලත් දිය මුහුන්තැලි ගණන 176කි. එයින් 98ක් අයහපත් බැව් පෙනුණි. රජයේ ආයතනවලැ හෝ වෙවා පෞද්ගලික ආයතනවලැ හෝ වේවා අයහපත් මුහුන්තැලි සමානුපාතය එක සේ මැ වූ බැව් සඳහන් කරනු වටී. පරීක්ෂා කරන ලද මුළු ගණන පසු ගිය අවුරුද්දේ ගණනට වඩා අඩු වී යැ.

(ආ) **ලෙප්ටොස් පයිරොසියාව (හෙවත් අනුදගරලු රෝග).**—ලෙප්ටොස්පයිරෝසියා (එනම් අණුදගරලුන්ගෙන්) රෝ යැයි සැක කරන ලද රෝගීන් උදෙසා ලේ සහ මුත්‍රා පැලුම් වැඩිමේ සහ මස්තු විද්‍යා ක්‍රමයේ පරීක්ෂණවලින් මෙහි වැඩ ප්‍රධාන වශයෙන් සමන්විත වී යැ. පරීක්ෂණය සඳහා පැලුම් 139ක් ලැබුණ අතරැ, එයින් 8ක් ගැති බැව් පසක් වී යැ.

මිට අමතර වැ පොල් වියලන කම්කරුවන්ගෙන් ලත් ලේ පැලුම් 158ක් මතැ ශලථය, පරීක්ෂණ ද කරන ලදී.

"ලිස්ටීරියා මොනොසයිටොජීන් හේතුවෙන් මරණිය වෘකදාහය හට ගැන්මක්" යන මැයෙන් ලිපියක් එල්. බී. ටී. ජයසුන්දර, පී. ඩී. පී. ගුණතිලක, එන්. අයි. ප්‍රනාන්දු යන අය විසින් ලංකා වෛද්‍ය සංග්‍රහයේ (1962) 7,221 හි පළ කරවන ලදි.

(ඉ)—**දිලීර වේදය.**—මේ කාර්යාංශයෙන් කරන ලද වැඩ වැඩි හරියක් මැ කොළොඹැ මහ රෝහලේ චර්ම රෝග චිකිත්සාගාරයේ පිටුවහල ඇති වැසිදු වී යැ. මෙතැනින් පැලුම් 570ක් ද වෙන තැන්වලින් 61ක් ද පරීක්ෂා කරන ලදි. මුළු ගණන ගිය අවුරුද්දේ ගණනට අඩු යැ. ඒ ගිය අවුරුද්දේ 823ක් වූ හෙයිනි.

ඉතාමත් සුලබ වූ දිලීරය නම් ටී. කෝපෝරිස් බව පෙනුනි. අනෙකුත් නිතර නිතර දක්නට ලැබුණු වර්ග නම් ටී. බාබෙයි, ටී. කෘරිස් සහ ටී. පිඩිස් යැ. දුලබ මැ දෙය ටී. කැපසිටිස් යැ.

"ඇසේ කර්වුලේරියා ජෙනිකියුලාටා ආසාදනය" මැයෙන් හවුල් ලිපියක්, පී. ඔබ සුබ්‍රමානියම් සහ කේ. නිත්‍යානන්දන් යන අය විසින්, ඇස් රෝග වේදය පිළිබඳ ලිපි එකතුවේ පළ කරවීම සඳහා ඉදිරිපත් කරනු ලැබ තිබේ.

සාක විද්‍යාව—(සැල්මොනැල්ලා-ෂිගෙල්ලා අංශය)

මෙම කාර්යාංශයේ සියළු මැ වැඩ පාහේ, අසූචි සහ ලේ පැලුම් විෂයයෙහි සිරිත් හුරු රෝග විනිශ්චක පරීක්ෂණවලින් සමන්විත වී යැ.

අවුරුද්ද තුළැ දී අසූචි පැලුම් 10,489ක් පරීක්ෂා කරනු ලැබී යැ. මෙය, ගිය අවුරුද්දේ ගණන 2000කට කිට්ටුවෙන් ඉක්මවයි. එයින් පැලුම් 627ක්, සුවය ලබන්නා වූ හෝ නික්මැ ගියා වූ හෝ සන්නිපාත රෝගීන්ගෙන් ලත් ඒවා යැ. 63 වතාවෙකැ දී සැල්මොනෙල්ලා ටයිපියා තනි කරන ලදී.

අනෙකුත් පැලුම් 9,862, සැල්මොනෙල්ලා සහ පිගෙල්ලා ලකුණු තිබේ දැයි බැලීමට පරීක්ෂා කරන ලදි. මස්තු 27 වගේකට අයත් සැල්මොනැල්ලාවන් පැලුම් 808කින් ද මස්තු 15 වගේකට අයත් ෂ්ගෙල්ලාවන් පැලුම් 438කින් ද තනි කරන ලදි. එකී නෙකට වෙනස් සවගේකට අයත අන්ත්‍ර-ව්‍යාධජනක පූරිත 8 තැනෙකැ හටගන්නේ යැ.

එකී පරීක්ෂණ කැරුගෙනැ යන අතරැ, තුරේ දී, ලංකාවේ පළමුවරට සැල්මොනැල්ලා, අලුත් සිව් වගෙයක් තනි කර ගන්නා ලද බැව් සඳහන් කිරීමට තරම් වටී. ඔවුන් තම්පර්ලැක සැල්මොනැල්ලා, ඇබඩින් සැල්, නව බ්‍රන්ස්වික් සැල්, සහ පොමානා සැල්මොනැල්ලා යැ. පසු ගිය අවුරුද්දේ අලුත් සවගෙක් තනි කැරිණ.

වයිඩල් ප්‍රතික්‍රියා සඳහා එවන ලද පැලුම්වලින් ගත් ගල් කැටි වඩවන ලදි. ලේ කැටි 14,378ක් වියැ. එය ගිය අවුරුද්දට වඩා 2,500කින් පමණ අඩු යැ. ලේ කැටි 500කින් ටයිපි සැල්මොනෙල්ලා ද, 36කින් පැරටයිපි සැල්මොනෙල්ලාද, 4කින් වෙනත් වර්ගද තනි කැරැ ගන්නා ලදි. මෙකී එළිදරව් ගණන පරීක්ෂණයට භාජන වූ මුළු ගණනට දරන අනුපාතය ගිය අවුරුද්දේ මෙන් මැයි.

වනන ලද වැඩෙහි වැදගත් තැනක් ගත්තේ භක්ෂ වගරුවයි. ටයිපි සැල්මොනැල්ලාවෙන් වැකුම් 582ක් භක්ෂ වගරුයෙන් 210ක් ඒ භක්ෂ වගයටත් 214ක් ඊඅයි භක්ෂ වගයටත් 3ක් බී1 භක්ෂ වගයටත් අයත් බව දැනගන්නට ලැබුණි. පිරිහීම නිසා ඉතුරුව වගරු නොහැකි වියැ.

අංගොඩැ මානසික රෝහලේ සන්නිපාතය කඩා වැදීමෙකැ දී, බීජ වාහකයෙකු මසායා ගැනීමෙන් මහ ජන සෞඛ්‍ය සේවාවෙහි භක්ෂ වගරුවේ අගය ද පෙන්වා දෙනු ලැබී යැ.

සිරිත්හුරු වැඩ කොතරම් බහුල වී තිබුණ ද, නිවහල් පර්යේෂණ වැඩ පිකක් ද මුදුන්පත් කැරැ ගන්නා ලදි. අනෙකුත් රට සතුන්ගේ වර්චස් වලැ සහ කටු පෝර වලැ සැල්මොනැල්ලා ආසාදනයක් සැල වී ඇති හෙයින්, මස් පිණිස විකුණන ලද සතුන්ගේ කටුවල ස්වභාවය මැනීමට තතු විමැසුම් බාර ගන්නා ලදි. වෙළෙඳ පොළ වලින් ලත් කුකුල් ඇට-කටු පැලුම් දහයක් පරීක්ෂා කරන ලදුවැ 8 වෂරකැ සැල්

මොනැල්ලක් තනි කරන ලදි. නිව්පෝට් සැල්, සිව් වරෙකැ ද පැරටසිපි බී සැල් මොනැල්ලා, වේක්‍රොස් සැල්, ස්ටැන්ලි සැල්, සහ ගැලිනේරියම් සැල්මොනෙල්ලා එක් එක් වතාව බැගින් ද දක්නට ලැබුණි. මස් පිණිස මරනු ලැබූ ගවයින්ගේ කටු ඒ බඳු මැ පරීක්ෂණවලට භාජනය කිරීමෙන්, බැසිලී සැල් දෙවරක් ද ස්ටැන්ලි සැල්, එන්තරසිටයිඩිස් සැල් සහ නිව් බ්‍රන්සිවික් සැල්, එක් එක් වර බැගින් ද දනැ ගන්නට ලැබුණි. එළිදරවු වූදේ සැලකියැ යුතු නමුත්, ඒ ගැන බිය නො වියැ යුතු යැ. එම ආහාර වර්ග බුදීමට පෙරැ, හොඳට උයා ගැනීම සැම විටෙකැ මැ කැරෙන නිසා යැ ඒ.

'වියලි පොලෙහි සැල්මොනැල්ලා' මැයෙන් ලිපියක්, ටී. වේලායුදපිල්ලෙ, කේ. නිත්‍යා නන්දන්, කේ. මීදෙනිය යන අය විසින් සැකැසී, ජර්මනියේ 1963 ස්වසථතා සඟරා වෙකැ පළ වී යැ.

සාක විද්‍යාව (මස්තු වේදය)

සිටි' හුරු රෝග විනිශ්චක මස්තු වේදීය වැඩ සැහෙන තරමක් අවුරුද්ද තුළැ දී මෙම අංශයෙන් කැරිණි. සියල්ල එකතු වැ පරීක්ෂණ 29,109 ක් කරන ලදි. මෙය ගිය අවුරුද්දේ ගණනට වඩා බෙහෙවින් වැඩි යැ. ඊට හේතුව, අවුරුද්දේ වැඩි හරියක දී කොළොඹ, මහ රෝහලේ ලේ බැංකුව උදෙසා ස. රෝ. ප. ර. පරීක්ෂණ භාර ගැනීමට අංශයට සිදු වීම යි. ස. රෝ. ප. ර. පරීක්ෂණ 9,990 ක් වූ අතරැ, එයින් සියයට 3.3 ක් සහගැති වී යැ.

ඉතුරු පරීක්ෂණවලින් 14,097 ක් වෙන් වූයේ, ආන්ත්‍රික ආසාදන උදෙසා සම්මත සහබඬ පරීකෂණයටයි. මෙම ගණන ගිය අවුරුද්දේ ගණනට වඩා 500 කින් පමණ අඩු වෙයි. සියයට 12ක් පමණ සන්නිපාතය ට සහගැති වී යැ.

පසුගිය වාර්තාවේ සඳහන් කළාක් මෙන්, කායීය භාර වැ සිටි වෛද්‍යාචාර්ය ආර්. එල්. වික්‍රමසිංහ මහතා නිවාඩු පිටැ එතෙරැ ගොස් සිටි හෙයින් කායීාංශයේ පර්යේෂණ කටයුතු ඇත හිටියේ යැ.

සාක විද්‍යාව (එන්නත් සාර)

මෙම අංශයේ ප්‍රධාන කායීය වූයේ, රටට අවශ්‍ය ටී. ඒ. බී. සහ කොලරා නාශක එන්නත් ද්‍රව්‍ය සියල්ල නිපදවීම යි.

අවුරුද්දට බෙදා හරින ලද ටී. ඒ. බී. එන්නත් මුළු තොගය ලීටර් 304 ක් වූ අතරැ, කොලරා නාශක එන්නත් තොගය ලීටර් 22ක් වී යැ. මෙය ගිය අවුරුද්දේ ප්‍රමාණයට බෙහෙවින් සම වේ.

තවද, ස්වයංජනිත එන්නත් වඩි 22 ක් ද මේ අංශයෙන් නිපදවීමෙන් එම ගණන ගිය අවුරුද්දේ ගණනට බෙහෙවින් වැඩි වී ය. ගිය අවුරුද්දේ ගණන 4කි.

ඖෂධ කර්මාන්ත අංශයෙන් ලත් නිෂ්පාදන මුහුනිති 68ක වන්ධ්‍යතා පරීක්ෂණ මෙහෙයැවිණි.

ජීව-රස විද්‍යාව

ලේ, මස්තිෂ්ක කණ්ඨක ද්‍රව සහ මුත්‍රා මුහුනිති 16,272ක් ගැන මේ අංශය වර්ෂය තුළ දී වාර්තා කෙළේ යැ. මේ අනුව බලන කලැ ගිය අවුරුද්දේ ලැබුණු මුහුනිත් ගණනට වඩා 3,000ක් වැඩි වී ඇත. නිතර නිතර වැඩියෙන් මැ ඉල්ලීම් ආයේ ලේ ප්‍රෝටීන් අගැයීම සඳහා යැ.

අවුරුද්ද උදෙසා මේ අංශයේ ලිය-කියමන් මෙ සේ වී යැ :—

(අ) "ගැබිනි මව්වරුන්ගේ ලේ අඩු කම ගැන තවදුරටත් කරුණු උගැනීම"— බී. වී. ද මැල් සහ ජී. සී. එන්. ජයසූරිය විසින් ලංකා විද්‍යා වර්ධන සංගමයේ (1962) 1.6 කලාපයේ.

(ආ) "පෙර-පාසල් වයසේ ළමුන්ගේ රක්තරංජක මට්ටම්, මස්තු-ප්‍රෝටීන් ආර සහ පරාපෝෂිත ගහණය "ගැන විමර්ශන"—ජී. සී. එන්. ජයසූරිය, එල්. ජී. ජයවර්ධන, කේ. මහාදේව සහ ඩබ්ලිව්. ඒ. බී. දසිල්වා විසින් ලං. වි. සං. සංගමයේ (1962) 1, 10 කලාපයේ.

කීට විද්‍යාව

කායතීක්ෂ්ම බරවා මර්දනය මුළු ලෝකයට මැ ගැටලුවක් වී පවතින හෙයින්, මෙම අංශයේ පර්යේෂණ වැඩ බොහොමයක් යෙදවුනේ එම රෝගයේ බීජ භාරකයින් පිළිබඳ වැ යි.

(අ) බරවා රෝග පැතිර යාම සම්බන්ධයෙන් කියුලෙක්ස් පැටිගන් වයස් නිර්මාණය

දිගු කල් ගත වන අරමුණ දිගට මැ ගෙනැ යෑමෙන් වටිනා තොරතුරු ලබා ගත හැකි වී යැ. මුලින් ලේ උරා ගැන්මේ දී ඩී. පැටිගන්ස් වර්ගය විසින් ඇදගනු ලැබූ **වුචරේරියා බැන්ක්‍රොප්ටයි** නම් සූක්ෂ්ම බරවා ජීවියා තුන්වන වාරයේ බිජු මෝරන විටැ ආසාදක වී, තුන් වන වාරයේ බීජවල ඩිම්බ අවධියෙන් පසු වැ එන ඩිම් වන ලේ ඉරීමේ දී රෝග පැතිරීම පටන් ගන්නා බවට දැනට අප දරන මතය තහවුරු කිරීමට පැහැදිලි දෙස් ඩී. පැටිගන්ස් විකණ්ඩනයෙන් හෙළි වී යැ. දෙවන ආහාරයේ දී ආසාදනය ලැබූ මදුරුවෝ ඩිම්වන ඩිම්බ තත්ත්වයට පසු වැ එන පස්වන අතර වේලේ දී ආසාදනය විහිදුවති. පසු අවස්ථාවල ලේ උරන විට සූක්ෂ්ම බරවා ජීවීන් ඇදැ ගන්නා මදුරුවන් රෝගය විහිදුවීමට තරම් සෑහෙන කාලයක් සොබා දහම පරිදි ජීවත් නො වන බව පෙනේනට තිබේ.

ගෙවල් තුළැ ලැගුම් ගෙන සිටි ඩී. පැටිගන්ස් වර්ගයාගේ වයස් සංයෝජනය මාස් පතා විග්‍රහ කිරීමකින් පෙනී ගියේ, පෙබරවාරි, මාර්තු, අප්‍රේල් යන මාසවලැ අල්ලා ගනු ලැබූ මුහුනිති අනෙකුත් කාලවලැ අල්ලනු ලැබූවන්ට වඩා වයසින් වැඩි බව යි.

(ආ) සීමායුක්ත නොවූ පෙදෙස්වලැ—ඩී. පැටිගන්ස් වයස් නිර්මාණය

යට දැක්වූ පරිදි එබඳු මැ විමර්ශන සුළුවෙන් පවත්වන ලදි. ඒ ගොඩකරයේ නගර බඳ පෙදෙස්වලැ මේ රෝගය හට නොගැනීම රෝග භාරක මදුරුවන්ගේ ආයු කාලය අඩු නිසාවත් දෝ යි නිගමනය කිරීමට යැ. මෙය බදුල්ලේ කරන ලදි.

(ඉ) ඩී.—පැටිගන්ස්ගේ සැපීමේ පිළිවෙල

සැපීමේ චරකය උගන්නා ලදි. සැපීමේ තියුණු මැ අවස්ථාව රැ 12වත් පෙවරැ 3වත් අතරැ වූ බව ප්‍රාරම්භක නිගමනවලින් පෙනුණි. සැපීමේ කාලය වයස් නිර්මාණය හා ඇති සම්බන්ධය උගැනීම ද පටන් ගන්නා ලදි.

(ඊ) බරවා භාරකයින් විකිරණ ශීලී ගැන්වීම

බරවා භාරක මදුරුවන් විකිරණ ශීලී ගැන්වීම, මෙම දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතුව ලංකා විශ්ව විද්‍යාලයයේ පරාපෝෂිත අංශය විසින් සපල ලෙස ඉටු කරන ලදි.

අත්හදා බැලීමට ගන්නා ලද සතුන්ගේ "ලහ තබන ලද" ආසාදන බරවා ජීවීන් මුළු අවධියේ සැරිසරන පිළිවෙල උගැනීමට මුල පුරන ලදි.

මෙකී උගැනුම් කරන ලද්දේ, ජාත්‍යන්තර පරමාණු බල ආයතනයෙන් ලංකා විශ්ව විද්‍යාලයයේ පරාපෝෂිත විද්‍යා අංශයට පිරිනමන ලද ප්‍රදානයක ආධාරයෙනි.

(උ) ඇනොපිලිස් හයිර්කේනස් නිකායේ ගනි පිළිවෙල

මෙකී තතු හැදෑරුම් දිගට මැ කැරැ ගෙනැ යන ලදි. ඇනොපිලිස් හයිරකේනස් නිකායට අයත් වර්ග තුනක්වත් ලංකාවේ පැවැති බව මැතක හෙළි දරව් වූ දෙයින් පෙනුණි. ඔවුන් නම් **නයිජේරිමස් ඇනෝපිලිස්, පෙඩිවේනියටස් ඇනො** සහ **ඉන්දි යෙන්සිස් ඇනො** යැ.

මේ මදුරුවන්ගේ බරවා බෝවෙන පිළිවෙල ගන්නා ලදි. **සෙවේරියා ඩිගිමාටා ඩිලො ගිලේරියා රිපෙන්ස්, වුචරේරියා බැන්ක්‍රොප්ටයි,** වාරානුගත බ්‍රගියා මාලයි සහ **බ්‍රගියා බක්ලෙයයි** යන වර්ගවලට **නයිජෙරිමස් ඇනො.** නැමෙනසුළු බව අත්හදා බැලීම්වලැ දී දක්නට ලැබුණි.

(ඌ) මදුරුවන් තුළ ප්ලැස්මෝඩියම් ආසාදනය

මැන්සෝනියා (කොකෙලටයිඩියා) ක්‍රැසිපිස් මදුරු වර්ගයක් නො හැඳිනිය හැකි ප්ලැස්මෝඩියමකින් ආසාදනය වී සිටි බැව් දැන ගන්නට ලැබුණි. මෙම ප්ලැස් මොඩියමේ මුල සොයා ගෙනැ එය හඳුනා ගැනීමට විමර්ශන පටන් ගන්නා ලදි.

(ඒ) බරවා වාහකයින් හැටියට ගත හැකි ඇඳ-මකුණු

පරීක්ෂණාගාරයේ හදා වඩා ගන්නා ලද **සයිමෙක්ස් හෙම්ප්ටෙරස්** ඇඳ මකුණු වැඩුන එවුන් මෙන් මැ ලාබාලයින් ද සූක්ෂම බරවා සහගැත්තවුන් හට ලක් කරන ලදු වැ කෘමියන් දිනපතා විකණ්ඩ කරන ලදි. **වඩරේරියා බැන්ක්‍රොප්ටයි** ඇඳ මකුණන් තුළ නො වැඩෙන බව මෙතෙක් කරන ලද පරීක්ෂණවලින් පෙනී ඇත.

(ඒ) ස්කාර බයසිස්

මෙය ඇති ළමුන් විමර්ශනය කිරීම දිගට මැ කැරැ ගෙනැ යන ලදි. අතුරු වාර්තා එක් පළ කැරිණ.

අවුරුද්දේ දී පළ කරවන ලද සහ සකස් කරන ලද ලිපි මෙසේ වෙයි :—

(1) ලංකාවෙන් අල්ලා ගන්නා ලද වල්මත් ක්‍යුලෙක්ස් පිපියෙන්ස් පැටිගන්ස් වර්ගයේ කැප අවශේෂ" ඩබ්ලිව්. ඒ. සමරවික්‍රම—ජ. සෞ. සං. (1962) සඟරාවේ 27,636.

(2) "ලංකාවේ ඔන්තෝපේගස් යුනිපැසිකේටස් ස්කැලි (ස්කරබාදි කොප්‍රිතයි) සහ ස්කරබයසිස් පිළිබඳ තතු හදාරුවක්"—කේ. ගුණවර්ධන—වෛද්‍ය පර්යේෂණ ඉන්දීය සඟරාව (1963) 51,654.

(3) ලංකාවේ බරවා පැතිරීමට සාපෙක්ෂක ලෙස **ක්‍යුලෙක්ස් පිපියෙන්ස් පැටිගන්ස්** විඩ්මන් නම් ගෙවලැ, ගැවසෙන වගීයාගේ වයස් නිර්මානය" ඩබ්ලිව්. ඒ සමරවික්‍රම—ලංකා වෛද්‍ය සමාගම සහ ලංකා විද්‍යා වර්ධන සංගමය විසින් හවුලේ කරන ලද සමුතේරුවකැ දී.

(4) "නො හැඳකිනි ප්ලැස්මෝඩියමකින් මැන්සෝනියා (කොකිලෙටිඩියා) ක්‍රැසසිපස් වර්ගයේ සවාභාවික ආසාදන" ඩබ්ලිව්. ජේ. නයිල්ස්—(1963) ඝර්ම කලාපීය වෛද්‍ය සඟරාව (නවම මුද්‍රණයේ).

ඊඩස් ඊජිප්තාසි පිළිබඳ තොවු පළවලදී දෙපාර්තමේන්තුවේ සිරිත්හුරු වැඩ දිගට මැ කැරැ ගෙන යන ලදි. විශ්‍රාම රෝහලකත් පිරියත් මළුවකත් මැසි කරදරය ගැන වූ අවස්ථා දෙකක් විමර්ශනය කරන ලදුවැ ඔවුන් මර්ධනය කිරීමට නිසි පිළිවෙත් නිදර්ශනය කරන ලදි.

අධ්‍යාපන අංශයෙන් බලන කලැ, වෛද්‍ය නිලධාරීන්ටත් මහජන සෞඛ්‍ය දුහුනන්ටත් සීමා වාසික වෛද්‍ය පයෙක්ෂණාගාර කාර්මික විද්‍යාඥයින්ටත් කීට විද්‍යාව අලලා, දෙසුම් දෙසන ලදි.

පෝෂණය

නොයෙකුත් කටයුතුවල දී වියදම් වන බිළුම්-ආරය සහ ශ්‍රම ශක්තිය මැනීමට සෙවලා සේවකයින් ලබා ගැන්මේ ගැටලුව උග්‍ර වූ හෙයින්, මෙකී පයෙක්ෂණ අරමුණේ ඉතාමත් සුළු ප්‍රගතියක් පමණ, ලද හැකි වූයේ. එතෙකුදු වුවත්, මෙතෙක් හෙදිදරවු වූ දෙයින් කොටසක්, එනම් පිරිමින් ගැන ලිපියක් පිළියෙල වෙමින් පැවතුණි.

මේ රටේ සුළු ගලගණ්ඩය පැවතීම ගැන 1947-1949 අවුරුදුවලැ දෙපාර්තමේන්තුව විසින් තතු විමසන ලදි. ගලගණ්ඩය මේ රටේ තෙත් කලාපයේ වඩා සුලබ වී කැපී පෙනුණ බව එ විටැ දක්නට වී යැ. අද පවතින තත්ත්වය විමසීමටත් ගැටලුව තව දුරට හැදෑරීමටත් අලුතෙන් සමීක්ෂණ අරඹන ලදි. සමීක්ෂණයට ගන්නා ලද ගම් මෙසේ ය:—කටුගස්තොටින් ඔබ ගොහොඩ, පානදුරෙන් ඔබ වැතර, පාලෙන්වත්ත, පොතුපිටිය සහ දියගම, පාදුක්කෙන් ඔබ බෝපේ සහ උඩු මුල්ල, ගාල්ලෙන් ඔබ උළුවිටිකෙ සහ වටරැක, සහ බදුල්ලෙන් ඔබ මීගහකිවු සහ තල්දෙන, හෙළිදරවු වූ දේ පිළිබඳ ලියවිල්ලක් පිළියෙල කැරැ ගෙනැ යනු ලැබී යැ.

පසුගිය අහරුද්දේ දී කරන ලද පෙර-පාසල් වයසේ දරුවන් සමීක්ෂණයේ විහිදුවක් හැටියට, විශේෂ සමීක්ෂණයක් පනාපිටියේ දී කරන ලදු වැ එක් එක් ළමයා ගනු ලබන ආහාර ප්‍රමාණය මැන ගන්නා ලදි. එක් එක් ළමයා ආහාර ගන්නා ප්‍රමාණය මැනීම පවුල් පදනමකින් එය මැනීමට වඩා ඉතා අසීරු හෙයින්, මෙම සමීක්ෂණය කරන ලද්දේ ප්‍රදේශයේ සෞඛ්‍ය සමාජයේ උදවු-උපකාර ඇතුව යි.

ගොමගොඩ නම් ගමැ ගලගණ්ඩය හටගැනීමට එහි ජනයා ගන්නා ආහාර සවභාවය යම් ලෙසකින් සම්බන්ධ වී ඇත්දෝ හෝ යි සොයා බැලීමේ අපියෙන් එම ගමැ පවුල් පදනමක් අනුව ගලගණ්ඩ සමීක්ෂණය සම්බන්ධයෙන් ආහාර සමීක්ෂණයක් මෙහෙයවන ලදි.

අලුත්ගමින් ඔබ බණ්ඩාරගමැ, මාතෘ ආරක්ෂාව සහ ළමා සෞඛ්‍ය පිළිබඳ මධ්‍යම උපදේශක සභාව උදෙසා, කරන ලද වැඩට සම්බන්ධ වෙමින්, ගැබිනි අවස්ථාවේ ලේ අඩු වීම ගැන තතු හදාරුවක් ද දිගට මැ කරන ලදි. ගැබිනි අවස්ථාවේ දී සහ කිරි දෙන කාලයේ දී මව්වරුන් ඔවුන්ගේ ආහාරය සහ මුව යකඩ සාපෙක්ෂණයෙන් ලේ තතු හදාරන ලදි.

මහාචාර්ය සී. සී. ද සිල්වානන්ගේ සහයෝගය ඇතුවැ කරන ලද අලුත් කටයුත්තක් නම්, ළමා රෝහලේ ශොෂිය ළමුන්ට අත්හදා බලන ලද ආහාරයේ ප්‍රතිඵල ඉගැනුම යි. කුඩ මස්සන් සහ මුං, මැ යනාදි ඇට වර්ග බුදීම ගැන අවධාරණය යොමු කරවන ලද අතරැ, ශරීරයේ බසෞව් සහ ලේ ධාතුවල වෙනස් වීම් සලකුණු කැරැ ගන්නා ලදි. අත්හදා බැලීම් දිගටමැ කර ගෙන යමින් තිබුණි.

කිරෙන් ඇරුණ මීයන්ගේ වැඩුම, අක්මාවේ සෞඛ්‍ය ය සහ ලේ ධාතු ගුණය කෙරෙහි. නොයෙක් ප්‍රෝටීන් සහ ප්‍රෝටීන් කැලරි අඩංගු ආහාරවලින් ලැබෙන ආහාසය මැනීම සඳහා නිර්මාණය කරන ලද අත්හදා බැලීම ද, අවුරුද්ද තුළැ දී

අරඹන ලද නවත් කැරුමකි. එම අත්හදා බැලීමේ අරමුණ වූයේ, බිළිඳුන්ට කවම් යෝකෝර් වැළඳීමේ තත්ත්වය මියන් වෙත ඇති කිරීම යි. මෙම කටයුත්ත දිගට මැ කැරැ ගෙනැ යමින් තිබුණි.

යොදය හළ කිරි වැඩි වැඩියෙන් පාවිච්චි කිරීමෙහි ලා අවධාරණය ඇතුව, පාසල් දහවල් ආහාර වේල යළි පිළියෙල කිරීම සඳහා ඒකාබද්ධ පාසල් සෞඛ්‍ය කමිටුවටත්, "මවුන්ගේ බොජුන්" "පෙර-පාසැල් ළමුන්ට ආහාර දීම" සහ "බෝතලෙන් කිරි දීම" යන මැයෙන් සෞඛ්‍ය අධ්‍යාපන ලිපිපත් පිළියෙල කිරීමෙහි ලා සෞඛ්‍ය සේවා ලිපිපත් කමිටුවටත් දෙපාර්තමේන්තුවෙන් බොහෝ ආධාර ලැබුණි.

ගොරකදෙනිය, බොරගල සහ පරණගම යන තුන් ගැමි පෙදෙසෙහි, දස වියට අඩු ළමුන්ගේ පෝෂණීය තත්ත්වය සහ ඔවුන් ගනු ලබන ආහාර ප්‍රමාණය මිනීමෙහි ලා ප්‍රජා ග්‍රාම සංවර්ධන ක්‍රම කමිටුවට ද ආධාර දෙන ලදි. පරීක්ෂා කරන ලද ළමුන් මුළු ගණන 654කි.

ළමුන්ගේ පෝෂණීය තත්ත්වය මැනීමෙන් දෙපාර්තමේන්තුව ජ. සෞ. සං. පාචන රෝග උපදේශක කණ්ඩායම සමග එකමුතු වී ක්‍රියා කළායැ. හොරපේ සහ කෝට්ටේ දෙ ගමැ ගැනැ ඔවුන්ගේ වාර්තාවේ ඒ බව පළ වෙයි. ආන්ත්‍රික ආසාදන හටගැන්ම පෝෂණ තත්ත්වයේ බලපෑම මැනීම යි මෙහි අරමුණ වූයේ. ඇසේ රෝග සහ කෙරටා මලඩි රෝගය ගැන ජ. සෞ. සං. පුරෝහිත වෛද්‍යාචාර්ය එච්. ඒ. පී. ඩී. බෝමන් මහතා මන්ද පෝෂණයෙන් උද්ගත ඇස් ආබාධ හැදෑරීමට රෝහල්, පාසල්, ගම්බද පෙදෙස් බැලීමට ආ ගමනේ දී ඔහුටත් ඒ ලෙස ආධාර දෙන ලදි.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මතු සඳහන් ලිපි කියවන ලදි:—

(i) ලංකා විද්‍යා වර්ධන සමාගමේ වාර්ෂික සභා වාරයේ—

(අ) "ජනතාවේ සෞඛ්‍ය මැනීමේ සුහුරු ක්‍රම"—කේ. මහාදේවන් විසින්,

(ආ) "ගැබිනි මවුන්ගේ ලේ අඩුකම ගැන වැඩිදුර තතු හැදෑරුම්", බී. වී. ද මැල් මහත්මිය.

(ii) ලංකා මහජන සෞඛ්‍ය සමාගමේ සමුනේරුව දී—

"පෙර-පාසල් වයසේ දරුවාගේ පෝෂණය"—කේ. මහාදේවන් විසින්.

(iii) දෙවන ළමා චිකිත්සා සම්මේලනයේ දී—

"උරෙන් කිරි"—බී. වී. ද මැල් මහත්මිය ගෙන්.

පාසල් වෛද්‍ය නිලධාරීන්ගෙන් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගෙන් ලත් වාර වර්තා අනුව අවුරුදු පතා පාසැල් ළමුන්ගේ පෝෂණ තත්ත්වය මැනීමේ කටයුතු දිගට මැ කරන ලද අතරැ, හැම වාරයෙකැ දී මැ මහජන සෞඛ්‍ය නිකායට වාර්තා කරන ලදි.

සෞඛ්‍ය සේවාවලට, අනෙකුත් රජයේ දෙපාර්තමේන්තුවලට සහ උපදෙස් පැතූ ලියුම්කාර භවතුන්ට, ඔවුන්ගේ නොයෙකුත් පොෂණ ගැටලු සම්බන්ධයෙන් පසු ගිය කාලයේ මෙන් දෙපාර්තමේන්තුව බොහෝ ආධාර සැලසී යැ.

පසු ගිය කාලයේ කළාක් මෙන් පෝෂණීය අධ්‍යාපනය අතිනුත් දෙපාර්තමේන්තුව බොහෝ දේ කළා යැ.

මතු සඳහන් ගුවන් විදුලි දෙසුම් ද දිණි :—

(1) "ලංකා ආහාර ක්‍රමය ගැන මැතක දී කළ තතු හදාරු කිහිපයක්"—කේ. මහාදේවන්.

(2) "බිළිඳුන්ගේ, ළමුන්ගේ සහ වැඩිහිටියන්ගේ වැඩිම" බී. වී. ද මැල් මහත්මිය.

මෙයින් පළමු වැ කි ලිපිය පුවත් පත් ලිපියක් හැටියට සැකසිණ. කලින් සඳහන් ලිපියත් එසේ සකස් කරනු ලැබ මහජන සෞඛ්‍ය සමාගමේ දී කියැවිණ.

වෛද්‍ය සහ පැස—වෛද්‍ය නිලධාරීන්ට හා සමාජ සේවයේ නිරත අවශේෂ සංවිධානවලට හා දෙසුම් මාලා බොහෝ දෙන ලද අතර, ඒ සඳහා පැය 97 1/2ක් වියදම් කරන ලදි.

පරාපෝෂිත (පරපුටු) වේදය

නිවර්තන කලාපිය ඉසිනොපිලියා විෂයයෙහි තතු හදාරුව නිමවන ලදි. මෙම තතු හදාරීමේ දී, සෑම රෝගියෙකු මැ පිළිබඳ ව ශාරීරික, රක්තවේදීය, මස්තු වේදීය සහ විකිරණ වේදීය පරීක්ෂණ කරන ලද අතරැ, ඩයකිල්කාබවේසින් සයිට්රේට් විවිධ වඩි කෙරෙහි ඔවුන් පිළිහුරු වූ අයුරු සටහන් කැරැ ගන්නා ලදී. හෙළිදරව් වූ දේ පිළිබඳ ලිපියක් සකස් වෙමින් තිබුණි.

ආන්ත්‍රික පරාපෝෂිතයින් ගැවසීම පැතිරෙමින් නිතර නිතර අසනීපවලට එය හේතුවක් වූ නිසා, නුවර වැසියන් අතරැ මෙය බල පැවැත්වූ තරම මැනැ ගැනීමේ අටියෙන් සමීක්ෂණයක් මෙහෙයවන ලදු වැ එයින් හෙළිදරව් වූ දේ පළකරවීමට සූදනම් කැරැ ගෙනැ යනු ලැබේ.

මෙම ගැටලුවට අනුබද්ධ වැ නෙමතෝද පරාපෝෂිතයින් කෙරෙහි පරීක්ෂණාගාර සතුන් දක්වන ප්‍රතිශක්ති වේදී පිළිසනු උගන්නා ලද අතරැ, හඳුනා ගැනීම සඳහා ප්ලූරොසන්ට් අනුදක්න ශිල්ප න්‍යායක් මත අත්හදා බැලීම් ද අරඹන ලදි.

විවිධ බරවා පරාපෝෂිත වර්ගයන් පරීක්ෂණාගාර සතුන් වෙත හටගැන්වීමේ ගැටලුව මතැ අත්හදා බැලීම් සහ ඒවායේ ප්‍රතිඵල අනුව කරුණු හැදෑරීම් දිගට මැ පැවතිණ. සතුන්ගේ පරාපෝෂිතයින් සොයා ගැනීම සඳහා විකිරණශීලී සමස්ථානයික, පාවිච්චි කැරැමත් ඇතුළත් කිරීමට මෙම හැදෑරැම් විහිදුවන ලදි.

ප්‍රචණ්ඩ සහ අප්‍රචණ්ඩ ටොක්සොප්ලාස්මා වලින් විවිධ වයසේ කුකුල් පැටවුන් ආසාදනය කරවීමේ අත්හදා බැලීම් අනුව තතු හැදෑරැම් නිමවන ලදි. දඩාවතේ යන බල්ලන් සහ බළලුන් අතරැ ටොක්සොප්ලාස්මාව පවතින තරම ගැන වැඩ ද එසේ මැ නිම වී යැ. මේ ගැන ලිපි දැන් පිළියෙල වෙමින් පවතී.

අරඹන ලද අලුත් හැදෑරැමක් නම්, ප්ලැස්මෝඩියම් බර්ගෙයිවලින් ආසාදිත මීයන්ගේ පරාපෝෂිත ඌනතාවය මතැ යකෘත්ධූලක ඖෂධවලින් සිදුවන අක්මා හානියේ බලපෑම පැනීමේ හැදෑරැමයි.

අවුරුද්ද තුළැ දී සිරිත් හුරු රෝග විනිශ්චක පරීක්ෂණ සැහෙන තරමක් කරන ලදි. මෙයින් වැඩි හරියක් වූයේ ඇමීබා, ඩිම්බ නොහොත් කෝෂ සාක්ෂි සෙවීම උදෙසා අසූචි මුහුන්තැලි පරීක්ෂා කිරීම යි. මේ අවුරුද්දේ කරන ලද ගණන 3,515ක් වීමෙන් එය 500කින් ගිය අවුරුද්දේ ගණන ඉක්මවයි. වැඩියෙන් මැ සුලබ වූයේ සියයට 33ක් වූ විෂ්-පණු විශේෂ ය යි. ඊළඟ තැන් හිමි වූයේ සියයට 22ක් වූ වට පණුවන්ටත් සියයට 15ක් වූ කොකු පණුවන්ටත් යැ.

ඇමීබා වැඩිම පිණිස ලත් මුහුන්තැලි ගණන ගිය අවුරුද්දේ ගණනට බෙහෙවින් සමාන වී 194ක් වී යැ. උච්ශ්වසනීය දියර (ii) ක් සහ කෙළ (2) ක් මත ද ඇමීබා වැඩුම කරන ලදි.

මීට අමතර වැ ට්‍රිකොමොනාස් සඳහා යෝනි මුස්න මුහුන්තැලි 6ක් ද පරීක්ෂා කරන ලදි.

සිරිත්නුහුරු පරීක්ෂණ වූයේ පණුවෙකු හඳුනා ගැනීමත් නයෙකු හඳුනා ගැනීමත් යැ.

මැලේරියා හඳුනා ගැනීම පිණිස ලේ තහඩු 123ක් පරීක්ෂා කරන ලදින්, සියල්ල මැ නොගැති බව පළ වී යැ. සියුම් බරවා හඳුනා ගැනීම පිණිස ලේ තහඩු 98ක් වූ අතර, එයින් 2ක් සහගැති වී යැ. ගිය අවුරුද්දේ ගණන සමග සසඳා බලන කැලැ මැලේරියා සඳහා ගත් තහඩු ගණන දෙගුණයකටත් වඩා වැඩි වී තිබුණ අතරැ, බරවා සඳහා ගත් ගණන නම් පෙර පරිදි මැයි.

මියන් මගින් ටොක්සොප්ලාස්මාව උදෙසා මස්තිෂ්ක කණ්ඨක දියර මුහුන්තැලි 2ක් පරීක්ෂා කරන ලදින් දෙක මැ නොගැති වී යැ. මීට අමතර වැ ලේ මුහුන්තැලි 14ක් සාබින්-ප්ලේමන් ඛයි ක්‍රමයෙන් පරීක්ෂා කරන ලදින් එකක් සහගැති වී යැ.

බරවා මර්ධන ව්‍යාපාරය උදෙසා හරස් පරීක්ෂණයක් හැටියට කරන ලද පරීක්ෂණ ගණන 1,238ක් වීමෙන් එය ගිය අවුරුද්දට වඩා දස ගුණයෙකින් තරම වැඩි යැ. සහගැති බව පළ වූ ගණන 316කි.

ඇන්කිලොස්තොමියසිස් ව්‍යාපාරය උදෙසා පරීක්ෂා කරන ලද අසූචි මුහුන්තැලි ගණන 94කි. මෙය ගිය අවුරුද්දට වඩා අඩු යැ. ගිය අවුරුද්දේ ගණන ඊට එපිට අවුරුද්දේ ගණනට අඩු යැ.

ධමනිය ජඨරදාහයේ මූලාරම්භයට කුඩ සෛලය සම්බන්ධ වී ඇතැයි සිතෙන ප්‍රමාණය ගැන තතු හදාරුව ද බාර ගන්නා ලද පර්යේෂණ ගැටලු අතරැ දිගට මැ පැවතුණි. අත්හදා බලනු පිණිස ධමනිය ජඨරදාහය කැවූ මියන් තුළැ කුඩ සෛලී මතැ ගුණහුරු ඵලය හදාරන ලදි.

ලාංකික වැඩි හිටියන්ගේ සාමාන්‍ය රක්තරංජක අගය දැන ගැනීම සඳහා විමර්ශන දිගට මැ පැවතුණ නමුත්, මීට ස්වේච්ඡා සේවකයින් නොමැති වූයෙන් මෙම කටයුත්ත ඇත හිටියේ යැ.

පිටගැස්මට නිවාරකයක් සහ/නොහොත් හරියන පිළියමක් හැටියට වෙනිවැල් ගැට පිළිබඳ වැ සාක විද්‍යා අංශයෙන් කරන ලද වැඩට මෙම අංශය ද එකතු වී උදව් වී යැ. මීට සම්බන්ධ වෙමින්, මියන්ගේ මධ්‍යම ස්නායු පංතිය මතැ ටෙටනස් විසෙහි බලපැවැත්ම ගැන ද තතු හදාරන ලදි.

ගර්භණීභාවය උදෙසා සෘජු ගර්භණීය බට පරීක්ෂණය දැනට වැඩියෙන් භාවිතා වන ගෙ-මැසි පරීක්ෂණය හා සැසඳෙන ශුරු කෙතරම් දුරට විශ්වාස කළ හැකි දැයි බැලීමට තතු හදාරුවක් කරන ලදු වැ එයින් හෙළි දරව් වූ කරුණු අඩංගු ලිපියක් සැකැසෙමින් තිබුණි.

පෝෂණ අංශයෙන් කරන ලද ආහාර කැවීමේ අත්හදා බැලීම් සඳහා ගන්නාලද අක්මා මතැ ඖතික වේදිය පරීක්ෂණ ද අංශයෙන් කැරිණ.

මෙම කාර්යාංශයේ සිරිත්හුරු පරීක්ෂණාගාර වැඩ ගිය අවුරුද්දට වඩා බෙහෙවින් වැඩි යැ. ලේ පරීක්ෂණ ගණන 218 සිටැ 410 දක්වා නැඟී නමුත්, එම වැඩිවීමට බොහෝ සෙයින් හේතු වූයේ ලේ වර්ග ගිකරණය සහ අසාමාන්‍ය රක්ත රංජක වැඩ මස්තු වේදි අංශයෙන් මේ අංශයට පවරා ගැනීම යි.

මේ හැර, ඖතික-ව්‍යාධිවේදී වැඩ බොහෝ වැඩි වූ අතරැ, නිලධාරීන් අධ්‍යයන නිවාඩු පිටැ බැහැර වී සිටියා වූ පිළිකායතනය වැනි අනෙකුත් පරීක්ෂණාගාර උදෙසා ද අමතර වැඩ කිරීමට සිදු වීයැ. එ පමණක් නො වැ ආයතනයේ අනෙකුත් අංශවලින් ඖතික-ව්‍යාධිවේද වාර්තා ඉල්ලා එවූ වාර ද වැඩි වී යැ.

මිගමු රෝහලේ සහ රාගමැ රෝහලේ පරීක්ෂණාගාර වලැ වැඩ බලා කියා ගැනීම සහ එහි වැඩ ප්‍රති-සංවිධානය කිරීම සඳහා කායික්‍රීශයේ ව්‍යාධිවේදී තැනට අවුරුද්ද තුළැ දී එකී පරීක්ෂණාගාර කරා යාමට සිදු වී යැ.

ඖෂධ ශාස්ත්‍රය

ආයුර්වේද ඖෂධ වර්ග පිළිබඳ පර්යේෂණ දිගට මැ පැවතුණ නමුත්, ඖෂධ වේදී ක්‍රියා බැලීම සඳහා සංයෝග වර්ග කිරයට හුවා ගැනීමේ පහසුකම් නොමැති නිසා මෙහි ප්‍රගතිය සීමා සහිත වී යැ. මීට හේතුව, අංශයේ ඖෂධවේදී තැන සේවයෙන් විශ්‍රාම ගෙනැ සිටීමත් අනෙකුත් නිලධාරියා පශ්චාත්-උපාධි අධ්‍යයන නිවාඩු පිටැ බැහැර සිටීමත් යැ. ස්වාභාවික නිෂ්පාදන රසායන විද්‍යා පිටියේ අනෙකුත් වැඩ බාර ගන්නා ලදුවැ වෙළෙඳ වටිනා කමක් ඇති ලංකාවේ තද ලී වර්ග ඒවායේ ස්ඵටික ධාතු සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලදි.

මිල්ල නම් තද ලීයෙන් කහවත් ස්ඵටික සංයෝගයක් වෙන් කරනු ලැබි යැ. මෙම සංයෝගයේ නිර්මාණය විග්‍ර කර බැලීමේ දී, කාමින් දුරු කිරීමේ සමත් ගුණයෙන් යුක්ත යැයි කියන ජලකර ධාතුවක් වන විටෙක්සින් බව පෙනී ගියේ ය. දොර-ජනෙල් උළුවහු වලට වඩුවන් මිල්ල ලීය යෙදීමේ ඉපැරණි චාරිත්‍රානුගත සම්ප්‍රදායට හේතුව මෙය වීයැ හැක.

කීන නම් තවත් තද ලීයෙකින් කහවත් රංගයක් ලැබුණි. එය උණුවන අවස්ථාව සෙන්ටිග්‍රේඩ් 241-242 වෙයි. එහි නිර්මාණය ගැන විමසුම් පැවතෙමින් තිබුනි.

ඩිප්තේරෝ කාපසියා (Diptero Carpaceae) පවුලෙන් පළමුවරට උදුරා ගන්නා ලද පිනොලික් සංයෝගය එහි නිර්මාණය සඳහා තවදුරටත් විමර්ශනයට භාජනය කැරිණ. ඕ-මෙතිල් පැහැවුම අම්ලදායක පරිහානියට ගැනීමෙන් වඩා සරල අංගාර ධාතු සංයෝගයක් වෙන් කරන ලදින්, එහි නිර්මාණය විමර්ශනය කැරැ ගෙනැ යනු ලැබේ.

රණවරාගේ බහු-පිනොලය මතැ වර්ණ රේඛනීය නම් අලුත් ශිල්ප න්‍යාය යෙදීමට අදහස් කරනු ලැබ, මේ සඳහා අවශ්‍ය මූල උපකරණ ඉල්ලා යවන ලදින්, එය එනතෙක් දැන් පොරොත්තුවේ පසු වේ.

මෙහි වැඩෙහි සැලකියැ යුතු දෙයක් වූයේ, ගසෙකැ තිබි ලැබුණ පරාපෝෂිත කෘමියෙකුගේ නිකුත් තැලි ජාතික කෞතුකාගාරයේ ටී. ගුණවර්ධන මහත්මිය විසින් අපට එවන ලදුවැ, විමර්ශනය ගැනීමයි. නුමහුන් තත්ත්වයක වූ සැකයිරයිඩ් වර්ගයක් වෙන් කැරැ ගනු ලැබ එහි නිර්මාණය පරීක්ෂා කරනු ලැබේ.

සිරිත් හුරු වැඩ ප්‍රමාණය නම් ගිය අවුරුද්දේ ප්‍රමාණයට බෙහෙවින් සම වේ. නියැලූ කෙටොස විරෝසිඩ්—17 සහ කෙටොජනක ස්ටිරොයිඩ් —17 සඳහා මාත්තු විභාග 108 ක් ද ජලබහන්දු ඇසටික් ඇසිඩ් සඳහා මාත්තු 12 ක් ද වී යැ.

පරීක්ෂණාගාරවල, ප්‍රයෝජනය සඳහා විවිධ සංයෝග ලීටර්ස් 3,660ක් මෙම ඖෂධ වේදී අංශයෙන් පිළියෙලැ කැරිණ. විදීමෙන්, ශාරීරගත කිරීම සඳහා පයිරගස් හෝ පෙරාපූ දිය ලීටර් 187 ක් ද සාමාන්‍ය සේලයින් ලීටර් 17 ක් ද සැපයුණි. සැමතින් තිබු වැඩ කොටස ගිය අවුරුද්දට සමාන වී යැ.

විෂාණු වේදය

(අ) **පිස්සු බලු රෝගය.**—පිස්සු බලු රෝගයේ දෙස් සොයනු පිණිස සතුන්ගෙන්, වැඩි හරියක් බල්ලන්ගෙන්, හිස් මොල 987 ක් පරීක්ෂණය සඳහා ලැබුණි. ගිය අවුරුද්දේ නම් එය 929 කි. මේ වර යන්තම් වැඩි ඇත. ලැබුණ හිස් මොළවලින් දහයෙන් පංගුවක් තරම පරීක්ෂණයට නුසුදුසු තත්ත්වයේ වී යැ. ඒ වැඩි කොටසක් දුර බැහැරින් ආ ඒවා යැ. පරීක්ෂා කළ ඒවාසින් සියයට 72 ක් සහගැති බව පෙනුණි.

ලැබුණු හිස්-මොළවලින් සියයට 22 ක් මැ කොළොඹ මහ නගර සභාවෙනුත්, සියයට 53 ක් බටහිර පළාතේ අනෙකුත් තැන්වලින්, සියයට 10 ක් මධ්‍යම පළාතෙනුත් බව විශේෂයෙන් සඳහන් කළ යුතු වේ.

පසුගිය දැවුරුද්දේ දතු අනුව බලන කලැ පිස්සු බලු රෝගය හට ගැනීම ඍතු අනුව වෙනස් වී යැයි නොපෙනෙන නමුත්, ඒ ගැන ස්ථිර නිගමනයකට බැසීමට පෙරැ, තවත් තතු හැදැරිය යුතු වේ.

රටට අවශ්‍ය පිස්සු බලු රෝග ප්‍රතිජනක එන්නත් මුළු තොගය මැ පසු ගිය කාලයේ මේ අංශයෙන් මැ නිෂ්පාදනය කැරිණ. එසේ ද වුවත්, නිරෝධායන සමයේ දී එන්නත් ගන්නා සතුන් අතරැ, රිණිය විෂාණු ආසාදනයක් කඩා වැදීමෙන් එන්නත් සාර නිෂ්පාදනය පෙබරවාරියේ දී අඩාල වී යැ. ඒ මදිවාට යාපනේ සතුන් අතරැ පිස්සු බලු රෝගය උන්හිටි ගමන් පැතිර යන්ට වූ හෙයින්, ගුනුර්හි පැස්චර් ආයතනයෙන් එන්නත් සාර පරිපූරක තොගයක් මිළ දී ගැනීමට සිදු වී යැ.

එන්නත් සාර ලීටර් 1,125ක් අවුරුද්ද තුළැ නිකුත් කැරිණ. ගිය අවුරුද්දේ නම් ලීටර් 1,416ක් විය. පහළ බැසීමට හේතුව, බල්ලන් සපා කෑම බැරැරුම් ලෙස සලකා ඊට යෙදිය නියම ප්‍රතිජනක වඩිය දෙනු පිණිස සෑම මධ්‍යස්ථානයකට මැ නිකුත් කරන ලද "පිස්සු බලු රෝගයට ප්‍රතිජනක පිළියම්" නමැති පත්‍රිකාව නිසා විය හැක.

ජනවාරියේ දී ජගත් සෞඛ්‍ය සංවිධානයේ තත්ත්වයට ගනු පිණිස එන්නත් සාරය තත්ත්වගත කොටැ පරීක්ෂා කරන ලදී. මේ නිසා, කවදටත් කරැගෙනැ ගිය වන්ධ්‍යතාව සහ ආරක්ෂාව සඳහා වූ පරීක්ෂණවලට අමතර වැ අලුත් පරීක්ෂණ ද එක් වී යැ.

(ආ) **වැරියෝලා ගොවසූරිකා.**—(1) මැරියෝලා සඳහා අවුරුද්දේ පරීක්ෂා කරන ලද මුහුන්තැලි ගණන 25 කි. එයින් කිසිත් සහගැති නො වී යැ.

පුල්තාන් සහ ඩිම්බෙල් ශිල්ප න්‍යාය අනුයමින් වැරියොල ගොවසූරිකා සඳහා කරන ලද ඌන පූරක තවුරු පරීක්ෂණය සිරිත් හුරු රෝග විනිශ්චක පරීක්ෂණවලට අයත් වී යැ. ගිය අවුරුද්දේ වසංගතයේ දී වසූරි රෝගින්ගෙන් ලබා ගෙනැ සිසිල් කරණයේ තැන්පත් කොට තිබුණ මස්තු මුහුන්තැලි 20ක ටයිටර් එන්නත් ලත් පුද්ගලයින්ගෙන් ආවට ගියාට ගන්නා ලද මුහුන්තැලි 25ක් 'සමග සැසඳීමට පරීක්ෂණය අත්හදා බලන ලදී. මුලින් කියු කොටසේ සියයට 70ක් අඩු ගණනේ 1/32 ක ටයිටරයක් දැරැ අතරැ, අනෙක් කොටසේ සියයට 76 1/4ක් ටයිටර දැරියැ. කිසි තැනෙකැ 1/16 නොඉක්ම වී යැ. එසේ හෙයින් ළඟ දී වසූරිය හටගත් බවට ටයිටර් 1/32 තරයේ මැ පෙන්නුම් කරන බව සලකන ලදී. වසංගතයක මූලාශ්‍රය සෙවීමේ දී මෙය ඉතා ප්‍රයෝජනවත් වියැ හැක.

(2) අවුරුද්ද සඳහා රටට අවශ්‍ය වූ සියළු මැ වසා ප්‍රමාණය මේ අංශයෙන් සැකසුණි. වඩි 6,11,616ක් නිකුත් කරන ලදී. මෙය ගිය අවුරුද්දේ ප්‍රමාණයට වඩා බෙහෙවින් අඩු වූයේ ගිය අවුරුද්දේ වසූරි රෝග හට ගැන්මක් කඩා වැදුණු නිසා යැ.

මෙම අංශයෙන් මෙහෙයවුණ එන්නත් කිරීමේ මධ්‍යස්ථානයේ දී මුල් වරට 1,070ක් ද දෙවන වරට 1,162 ක් ද එන්නත් කරන ලදී. වසංගතය තිබූ ගිය අවුරුද්දේ මුළු ගණන 41,543 කි.

එන්නත් සාර අත්හදා බැලීමේ පිටියේ දී සියයට 99—100ක් සපලදැයි බව පෙනී ගියේ ය.

(ඉ) **අනෙකුත් විෂාණු වැඩ.**—අවුරුද්ද තුළ දී රෝග විනිශ්චක කටයුතු වැඩි වැඩියෙන් විශේෂයෙන් ආබර් විෂාණු සම්බන්ධයෙන් කරන ලදී. නිධිකර්පර දාහය නම් විෂාණු රෝගයකින් හෝ ඩෙන්ගා වැනි ඇලි මැලි ගතියෙකින් හෝ පෙළෙන්නේ යැයි

සැක කරනු ලැබූ ළමුන්ගෙන් මස්තු ගෙනැ පරීක්ෂා කරන ලදී. සුගල මස්තු මුහුන් තැලි 21ක් ද තනි මස්තු මුහුනතැලි 71 ක්ද වූහ. ජපන් නිධිකර්පරදගය සහ ඩෙන්ගා ප්‍රතිජීවීන් සඳහා සියල්ල පරීක්ෂා කරන ලදී. ජපන් නිධිකර්පරදාහය සහ ඩෙන්ගා යන දෙකට මැ සහගැති වූ ගණන 11කි. ජපන් ලෙඩට පමණක් සහ ඩෙන්ගාවලට පමණක් සහගැති වූයේ 4ක් බැගිනි. මේ වැඩෙහි කායික මානය ලබන වසරැ විශිදු වීමට බලාපොරොත්තු වනු ලැබේ.

අලුත් විෂාණු පරීක්ෂණාගාරය ඊට අවශ්‍ය උපකරණ යන්ත්‍ර සූත්‍ර සියල්ලෙන් තව මත් පිරිපුන් නොවන හෙයින් පෝලියෝ විෂාණු වැඩ කිසිත් ඇරඹිය හැකි නොවී යැ. අප උදෙසා ලේ සහ අසූචි මුහුන්නැලි කිහිපයක් සිංගප්පූරුව විශ්ව විද්‍යාලයයේ සාක වේද අංශයේ ආන්ත්‍ර විෂාණු පරීක්ෂණාගාරයෙන් පරීක්ෂා කිරීමෙන් අපට කරුණාව දැක්වී යැ.

අවුරුද්ද අවසානයේ දී ඉන්ප්ලුවන්සා විෂාණු උදෙසා පරීක්ෂණ පටන් ගැනීමට පරීක්ෂණාගාරය සූදානම් වැ සිටි නමුත්, ශායනිකඥයින්ගෙන් කිසි පිළිසනක් නො වී යැ. එසේ ද වුවත් වාර්වුවල හැකි ආයගෙන් උගුරු දොවනයන් ලද නමුත්, උල්ඛ මාර්ගයේ බිජුවලැ විෂාණු කිසිත් වෙන් කිරීමෙක් නො වී යැ.

අභ්‍යාසය

(අ) **වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥ සිප්සල.**—සිප්සල් වර්ෂය මේ වාර්තාවේ වර්ෂය හා එක විට වැටේ. වර්ෂය සඳහා සිප්සලේ වැඩ සතුටුදායක වී යැ.

වර්ෂය ආරම්භයේ දී නවකයින් 26 දෙනෙක් අභ්‍යාසය සඳහා ඇතුළත් කර ගන්නා ලදු වැ එයින් 25 දෙනෙක් වර්ෂය අවසානයේ එන අවසාන විභාගයෙන් සමර්ථ වී 9 දෙනෙක් විෂය එකක් හෝ වැඩි ගණනකින් හෝ විශිෂ්ඨ සාමර්ථ ලැබූහ. පාසලේ සුළු ජීව කාලය තුළ ලත් හොඳ මැ ප්‍රතිඵල ඔවුන්ගේ යැ.

පසුගිය අවුරුද්දේ බඳවා ගන්නා ලද ශිෂ්‍යයෝ තම සීමාවාසික කාල සීමාව අවසන් කළෙන් සාමාන්‍ය සේවයට නිල කරවනු ලැබූහ. ශිෂ්‍යයින් 20 ක් සිටි අතරැ, තවත් සිව් දෙනෙක් තුන් මාසයෙකින් අවසන් කිරීමට නියමිත යි.

වැඩිදුර ඉගෙනීම පිණිස එක්සත් රාජධානිය බලා පිටත් වීමට ජ. සෞ. සං. අධි ශිෂ්‍යත්වයක්, එකී ආචාරියෙකු වූ එම්. ඩී. රාබන් මහතාට අවුරද්ද තුළැ දී පිරිනැමුණි.

(ආ) **සංස්කරණ පාඨ මාර්ග.**—ජීව රසායන විද්‍යාව ගැන සංස්කරණ පාඨ මාර්ග පිට පළාත්වල පරීක්ෂණාගාරවලින් ආ වෛද්‍ය පයෙවීක්ෂණාගාර කාර්මික විද්‍යාඥයින් දෙදෙනෙකුට දෙන ලදී. බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් ආ පරීක්ෂණාගාර උප සහායකගෙකුටත් හෙදුවෙකුටත් ශායනික ව්‍යාධිවේදය ගැන සංස්කරණ පාඨ මාර්ග දෙන ලදී.

සූක්ෂ්ම ඡායා රූප ශිල්පය

ආයතනයේ සියළු අංශවලට අවශ්‍ය වූ ඡායාරූප වැඩ සියල්ල මේ අංශයෙන් ඉටු වුනි. ඡායා සූක්ෂ්ම දර්ශන, නෙරළු, තහඩු, සූක්ෂ්ම පටල, මහා ඡායාරූප යනාදිය පිළියෙළ කිරීම මීට අයත් වී යැ.

වර්ෂය සඳහා පිළියෙළ වූ ද්‍රව්‍ය ගණන මෙසේ යැ. ඡායා සූක්ෂ්ම දර්ශන 760, මහා ඡායාරූප 180, නෙරළු තහඩු 320, ශායනික රෝගීන් ගැන ඡායාරූප 30, සූක්ෂ්ම පටල 25, ඡායානුසාර පිටපත් 630, එක්ස්රේ, ඇදිම් සහ සටහන්වල නිරූක්ති රූප 120 යි. සිරිත්හුරු වැඩට අමතර වැ සවයං විකිරන ශිල්පය සහ ප්ලුරොසන්ට් සූක්ෂ්ම ඡායාරූප ශිල්පය ගැන දියුණු ශිල්ප න්‍යාය මත තතු හදාරන ලදී.

වැඩ පොළ සහ නඩත්තු අංශ

පසුගිය කාලයේ මෙන් වැඩ පොළ සහ නඩත්තු අංශ එකිනෙකට නිවහල් ලෙස කටයුතු කළහ. එහෙත් බොහෝ වැඩ දෙකට මැ පොදු වූයෙන් අවස්ථාවේ හැටියට එක් අංශයක් විසින් ඉටු කරන ලදි.

යාන්ත්‍රික උපකරණ පිරියම් කිරීම් 748ක් ද විදුලි සහ අනෙකුත් උපකරණ පිරියම් කිරීම් 179ක් ද වැඩ පොළෙන් ඉටු වුනි. වඩු වැඩ ද බොහොමයක් ඉටු වීය. ඉදි කිරීම් සහ පිරියම් වැඩ ද 1,502ක් වූ අතරැ උපකරණ අහුරා යැවීමේ සම්මත ආකාරයේ පෙට්ටි 3,300ක් ද තැනුණි.

වෛද්‍ය පර්යේෂණායතනයේ උපකරණ යන්ත්‍රසූත්‍ර වලට සිරිත් හුරු සාත්තුව දීමේ පිළිවෙළක් ද ක්‍රියාවේ යොදවන ලදී.

උපකරණ පිරියම් කිරීම් 57ක් ද අනුදක්න 65කට පිරියම් සහ සාත්තුව දීමේ වැඩද නඩත්තු අංශයෙන් සිදුවී යැ.

සතුන් ගාල

ඇති ඉඩ කඩ ප්‍රමාණයේ සතුන් ගාල් කිරීම ආර-මාරු කර ගැනීමෙන් සතුන්ගාලට සැහෙන ඉඩ කඩ නොමැති වීමේ ගැටලුව තරමක් දුරට විසඳා ගත හැකි වී යැ.

අවුරුද්දේ දී ලත් ප්‍රධානතම දියුණුව නම් මීයන් බෝ කිරීම ක්‍රමවත් පදනමක් මත සේන්දු කරවීම යි. පරීක්ෂණ සඳහා මීයන් වුවමනා වූ අවස්ථා වැඩි වූයේ නමුත් ඒ හැම ඉල්ලීමක් මැ ඉටු කරන ලදී.

රට මීයන් සහ හාවුන් අතින් ස්වයං පොෂිත වීමට අරමුණක් පටන් ගන්නා ලදී.

VIII වැනි පරිච්ඡේදය

පාරිසරික සනීපාරක්ෂාව

අ—සනීපාරක්ෂාව

ගැටලුව

1. වැළැක්විය හැකි ලෙඩ-රෝග හටගැනීම සම්බන්ධයෙන් පාරිසරික සනීපාරක්ෂාව දිගට මැ වැදගත් තැනක් දැරී යැ. බාහිර රෝගීන්ගේ රෝහල්වලින් ප්‍රතිකාර ලබාගත් රෝගීන් වැඩි දෙනා, වට පණු, කොකු පණු, අතීසාර, බෝවෙන යකෘන්දාහය, බාලක පක්ෂාඝාතය වැනි වළක්වා ගත හැකි රෝගවලින් පෙළුන අය බව පෙනී ගියේ යැ. වැළැක්විය හැකි රෝග හට ගැන්මේ එක් හේතුවක් වූයේ පස කෙළෙසීම යි.

පෙර-පාසල් වයසේ අයට වැසිකිළි තැනවීම කෙරෙහි විශේෂ අවධානය යොමු වියයුතු අතරැ, රජයේ ආධාර නො මැති වැ මෙය කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමි.

සංවිධානය

2. මෙය මැඩ පවත්වා පෙර-පාසල් වයසේ ළමුන් අයහපත් පරිසරයෙන් බේරා ගැනීම අරබයා, අවුරුදු 1-4 ක්වූ වයස් සීමාවේ ළමුන්ගේ සෞඛ්‍යය තත්ත්වය බැලීමේ සමීක්ෂණයක් මෙහෙයවන ලදී. පළමු පියවර හැටියට මෙය සෑම ම. සෞ. ප. පේරුවෙකැමැ 1 වන ඒකකයට සීමා කරන ලදුවැ, නෙකටෝ, ඇස්කේරිස්, එන්ටොම්බා පූරිතය, සැල්මොනෙල්ලා-පිගෙල්ලා යන රෝග හටගැන්ම කෙරෙහි

සෝදිසි කර බලන ලදී. පෙර-පාසල් දරුවන්ගේ වැසිකිළි තැනවීම මේ පෙදෙස්වල විපුල කරවන ලදී. සෑම ගෙ-හිමියෙකුට මැ ඇත තියන පෝරුවක් සහ පෝච්චියක් නොමිලේ දෙන ලදී. ජනාවාස ගෙවල්වලට යාව වැසිකිළි තනවන ලදී. පෙර-පාසල් වයසේ ළමුන් අතරැ ඉතා ජනප්‍රිය වූ මෙම වැසිකිළිවලින් බහුලව මනා වැ ප්‍රයෝජනය ලැබූහ. ඇතැම් පෙදෙස්වලැ, පෙර-පාසල් වැසිකිළි කඳවුරු ක්‍රමයට තනවන ලද අතරැ එය ඉතා සාර්ථක බව තහවුරු වී යැ.

මහජන සෞඛ්‍ය පරීක්ෂක තැන මෙහි සැඳැහෙන අවුරුද්ද තුළ දී 1 වන ඒකකයේ වැඩ නිමාවට පත් කොටැ 2 වන ඒකකයේ වැඩෙහි නිරත වී යැ.

1962/63 අවුරුද්ද තුළ දී මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් 38 දෙනෙක් පත් කරනු ලැබූහ.

ආධාර ක්‍රමය යටතේ වැසිකිළි තැනවීම අරබයා රු. 4,00,000 ක් වියදම් කරන ලදී. මෙයින් රු. 75,000 ක් වෙන් කරන ලද්දේ පෙර-පාසල් වයසේ අයට වැසිකිළි තැනවීම උදෙසා යැ.

වැඩ කටයුතු

(අ) **දිය සැපයීම.**—මාතරැ, තලල්ල නම් ගමටත්, කොළොඹැ, හොරපේ නම් ගමටත්, ගාල්ලේ, අවිත්තාව නම් ගමටත්, පුත්තලමේ, පුකුලම නම් ගමටත්, කුරුණෑගල, පාරිසරික සනීපාරක්ෂක යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු විහිදුවන ලද අතරැ, එම ගම්වලට ප්‍රවේසම් සහිත දිය සහ සනීපාරක්ෂා වැසිකිළි සපයා දෙන ලදී.

කොළොඹැ මහ නගර සභාවට සැපයෙන දිය "fපලුවරිනාභාසය" දීමට ජගත් සෞඛ්‍ය සංවිධානයේ සහාය පතන ලදුවැ, ප්‍රාරම්භක තතු විමසුම සඳහා විශේෂ නිලධාරියෙක් පත් කරන ලදී.

(ආ) **මිනිස් මල-මුත්‍ර බැහැර කිරීම.**—බරවා රෝගය ගැටලුවක් වී තිබුණ පෙදෙස්වල බරවා මර්ධන ප්‍රයත්නයක් හැටියට බාල්දි වැසිකිළි දිය-ගිර වැසිකිළි බවට හැරවීම දිගට මැ කරගෙනැ යන මේ සඳහා එක් වැසිකිළියකට රු. 60 බැගින් වූ ආධාර මුදලක් දෙපාර්තමේන්තුවෙන් ගෙවන ලදී.

ගම්බද පෙදෙස්වලැ නම් එකකට රු. 25 බැගින් වූ ආධාර මුදලකින් වැසිකිළි තැනවීම කර ගෙනැ යන ලදී. වැසිකිළි තැනවීමේ ආධාර ක්‍රමය යටතේ මේ සඳහා රු. 4,00,000ක මුළු මුදලක් දෙපාර්තමේන්තුවෙන් වැය කරන ලදී.

(ඉ) **හදිසි අනතුරු.**—අන්තර්-දෙපාතර්මේන්තු කමිටුව වෂිය තුළැ දී දිගට මැ සිය කාර්යයේ නියැලී සිටියා යැ. මෝටර් බයිසිකල් අනතුරු වැළැක්වීමේ අටියෙන්, මෝටර බයිසිකල්වල ගමනේ යෙදෙන අය යකඩ හිස් වැසුම් පැළඳ සිටිය යුතු යැයි බල කෙරෙන සේ ව්‍යවස්ථා යෙදීමට මෙම කමිටුව මෝටර් වාහන කොමසාරිස්තැනට බලය දුන්නා යැ. පෙද-දෙරේ හදිසි අනතුරු වාර්තාව ඒ ඒ ප්‍රභෙද යටතේ වර්ග කරන ලදු වැ වසංගත රෝග විද්‍යා ලිපි සංග්‍රහ කොටස් හැටියට නිකුත් කරනු ලැබී යැ.

(ඊ) **නිවාස සැපයීම.**—දැනට පවත්නා ගෙවල් ගිහය නිසාවෙන්, ගෙවල් වැසීමේ නියෝග නිර්දේශය කරන විටැ දෙපාර්තමේන්තුව වැඩි වැඩියෙන් පරීක්ෂාකාරී වී යැ.

වතුවලැ කම්කරු ගෙවල් පේළි වඩා සනීපාරක්ෂා ලෙසත් ජනාවාසයට වඩා යෝග්‍ය ලෙසත්, වතු පාලකයින් ලවා පවත්වා ගැනීමට දෙපාර්තමේන්තු සෑම ප්‍රයත්නයක් මැ දැරුවා යැ.

ආ—ආහාර සහ ඖෂධ වර්ග පාලනය

මනුෂ්‍ය පරිභෝගය සඳහා තිබෙන ආහාර සහ ඖෂධ වර්ග පාරිභෝගිකයින්ට උවමනා ස්වභාවයෙනුත්, ධාතු බලයෙනුත්, ගුණයෙනුත් හොඳනා බවට වග බලා ගැනීම පිණිස ආහාර සහ ඖෂධ වර්ග පනත සහ තදනුගත ව්‍යවස්ථා බල ගන්වන ලදී.

(අ) **ආහාර වර්ග පාලනය.**—පළාත් පාලන ආයතනවල වගකීමක් වූ ආහාර සම්බන්ධයෙන් එකී පනත සහ එහි රීති ක්‍රියාවේ යෙදවීම, එම බලධාරීන් විසින් කරන ලදි. ප්‍රධාන පනතෙන් සහ තදනුගත රීතිවලින් තමන් වෙත පැවරී ඇති බලතල මහ නගර සභා 8ක් විසින් ද, නගර සභා 18ක් විසින් ද, සුළු නගර සභා 3ක් විසින් ද පාවිච්චි කරනු ලැබී යැ. ආහාර නිදර්ශන විග්‍රහ කිරීම සඳහා මහජන රස පරීක්ෂකයින් සහ බලය ලත් නිලධාරීන් පත් කිරීම අරබයා තවත් පළාත් පාලන ආයතන 5ක් ක්‍රියා කර ගෙනැ යති. පවිත්‍රතා මට්ටම පනවනු ලැබ ඇත්තා වූ නොයෙකුත් ආහාර වර්ගවලින් නිදර්ශන ගෙන ඇති අතරැ, වරදකරුවන්ට විරුද්ධ වැ නීති මාර්ගයේ කටයුතු කිරීමට මුල පුරා ඇත.

බාල කිරීමට පොදුවේ ගන්නා ලද ද්‍රව්‍ය ගිය අවුරුද්දේ ඒවා මැ වෙයි.

ඖෂධ වර්ග පාලනය

(ආ) ඖෂධ පාලනයෙහි ලා ප්‍රවීණ බලධාරියා වනුයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැන යැ. ඖෂධ වර්ග වෙළෙන්දන්ට බලපත්‍ර නිකුත් කිරීම දිගට මැ වලංගු වී පැවතුන අතරැ, අදාළ වර්ෂය තුළ දී බලපත්‍ර 1,564ක් නිකුත් කරන ලදි.

ඖෂධ වර්ග බාල කිරීම සම්බන්ධයෙන් තනු හදුරුවක් බලයලත් නිලධාරීන් 5 දෙනෙක් විසින් වර්ග 15ක් මතැ කරන ලද අතරැ, ඒවා කෙතෙක් දුරට බාල කර ඇත්දැයි යන වග රජයේ රස පරීක්ෂක විසින් පරීක්ෂා කරැගෙන යනු ලැබේ.

(ඉ) **ආහාර සහ ඖෂධ වර්ග පාලනය ගැන උපදෙස් කමිටුව.**—අන්තර්-දෙපාර්තමේන්තු කමිටුව සහ ඖෂධ කමිටුව වෙනුවට, ඒවායේ තැන ලබා ගත් ආහාර සහ ඖෂධ වර්ග උපදෙස් කමිටුව නමින් වූ අලුත් කමිටුවක්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ නායකත්වය යටතේ සිය කාර්‍යයේ යෙදුණා ය.

සාමාන්‍යයෙන් "ගෙවැසි ලැයිස්තු" නමින් හැඳින්වෙන ලැයිස්තුවලින් අයිතිකරුවන්ගේ නම් ඉවත් කොටැ බ්‍රිතාන්‍ය ඖෂධ සංග්‍රහයේ සහ බ්‍රිතාන්‍ය ඖෂධ සූචියේ දැක්වෙන පරිදි ඖෂධ වර්ගවල නිල නාම පමණක් ඇතුළත් කිරීම අරබයා, යෝජිත නීති සම්පාදනයේ දී ආහාර සහ ඖෂධ වර්ග (6 වන) නීති මාලාවේ 1 වන උපලේඛනය අධිකතර ලෙස වෙනස් කිරීම සැලකිල්ලට භාජන වී පවතී.

(ඊ) **නීති සම්පාදනය.**—සෞඛ්‍ය සහ නිවාස ඇමැතිතුමන් විසින් අනුදන්නා ලද නිශ්චිත ආහාර වර්ග ලෙස "එන්ෆැමිල්", "සිම්ලැක්" සහ "ඇල්මිරන්" ඇතුළත් කරනු සඳහා ආහාර සහ ඖෂධ වර්ග 8 වන රීති මාලාවේ 2 වන උපලේඛනයේ 1 වන කොටස සංශෝධනය කරන ලදි.

ඉ—මහජන සෞඛ්‍ය (ඉංජිනේරු ශිල්ප අංශය)

රටේ මහජන සෞඛ්‍ය ගැටලු විසඳීමෙහි ලා මහජන සෞඛ්‍ය ඉංජිනේරු ශිල්පයේ වැදගත්කම ක්‍රම ක්‍රමයෙන් අප රට තුළැ අවබෝධ වී ගෙනැ යයි. ජනතාවට දිය සැපයීම පිළිබඳ වැ, ජගත් සෞඛ්‍ය සංවිධානය ඉතා ඉහළින් මුල් තැන දී කටයුතු කර ඇති අතරැ, බෝවෙන සුළු රෝග මැඩ පවත්වා ගැනීමෙහි ලා පරිසරය හසුරුවා ගැනීම ද ඉහළින් අගේ කරයි.

2. 1962-63 වර්ෂයේ දී මහජන සෞඛ්‍ය ඉංජිනේරු ශිල්ප අංශයට වැඩෙමින් පවත්වනා වැඩ ගොඩවල් පැවරුණ බව පෙනේ. අනෙක් අතට බලන කලැ අංශයේ

සේවක පිරිස් බලය නො සැලී මැ පිරිහෙමින් තිබුණ බවත් පෙනේ. මහජන සෞඛ්‍ය ඉංජිනේරු ශිල්ප අංශය වූ කලී මහජන සෞඛ්‍ය වැඩට අවශ්‍ය අති වැදගත් අංගයක් බවත්,

(අ) මධ්‍යම ක්‍රම සම්පාදනයට ආභාසය දිය හැකි පරිදිත්

(ආ) නියම ආකාරයේ නිලධාරීන් සේවා තනු කෙරෙහි ඇදී එන පරිදිත්,

මෙම ශිල්පාංශයට දෙපාර්තමේන්තුවේ නියම තැන දියැ යුතු බවත්, පෙන්වා දුන් ප්‍රවීණයින් කිහිප දෙනෙක් යට කී කාරණය ද ඉස් මතු කැරැ දක්වා ඇත්තාහ.

3. විෂෙඥයින් වීම නිසා මහජන සෞඛ්‍ය ඉංජිනේරුවන්ට පාඩු කිරීම නියම ක්‍රමයට පටහැනි වනවා පමණක් නොවැ සිනහවට කරුණක් ද වෙයි. මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ නියුක්ත ඉංජිනේරුවන්ට, අනෙකුත් රජයේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවල අයට ලැබෙන උසස් වීමේ මාර්ගවලට සම කළ හැකි මාර්ගවත් නො දියැ යුත්තේ මන්දැයි තේරුම් ගැනීම උගහට ය. මේ අංශයෙහි ලා ඉංජිනේරුවන් ලත් අභ්‍යාසය නිසි සේ අගය කරන්නාවූ විදේශීය ව්‍යාපාරික ආයතන එක් පැත්තකින් සිටැ අභ්‍යාසය ලත් ඉංජිනේරුවන් බිලී බා ගනිද්දී, පසු ගිය සය අවුරුද්ද මුළුල්ලේ පැවැති ඇබෑර්තු පිරවියැ නො හැකි වීම පුදුමයකට කරුණක් නො වේ.

4. පරීක්ෂකවරුන් ගැන ද කියැ හැක්කේ එය මැයි. මගේ පරීක්ෂක-සංඛ්‍යාව 24ක් නමුත් දැනට එහි ඇබෑර්තු මැ 12කි. රජයේ අනුග්‍රහය ඇති සංයුක්ත මණ්ඩලවල සහ පෞද්ගලික අංශයේ වැඩි පඩි ලැබෙන රක්ෂා සොයා නිලධාරීහු මෙම අංශයෙන් නික්මැ ගොස් ඉවිත්.

5. ඉන්දියාවෙන් සහ පාකිස්ථානයෙන් ඉංජිනේරුවන් බඳවා ගැනීමට තැනෙක් වී යැ. ඉන්දියාවේ සහ පාකිස්ථානයේ ඇබෑර්තු පතළ කරවන ලදුවැ අයැදුම් පත් කිහිපයක් ලැබුණ නමුත්, පත්වීම් ගැන මෙතෙක් අවසාන තීරණයක් ගෙනැ නැත. පස් අවුරුදු ගිවිසුම් ක්‍රමයක් මතැ ඉන්දියාවෙන් සහ පාකිස්ථානයෙන් අඩු ගණනේ ඉංජිනේරුවන් දෙ-තුන් දෙනෙකු වත් බඳවා ගන්නට ලැබෙතැ යි බලාපොරොත්තු වනු ලැබේ.

6. ඉංජිනේරුවන් සම්බන්ධයෙන් දැනට ඇති තත්ත්වය දියුණු කර ගැනීමේ අපියෙන්, මහජන සෞඛ්‍ය ඉංජිනේරු අතවැස්සන් බඳවා ගැනීමේ පටිපාටියක් භාණ්ඩාගාරය විසින් අනුදන්නා ලදි. ඉංජිනේරු අතවැස්සෙකු හැටියට නියම ආකාරයේ අපේක්ෂකයෙකු තේරුණොත්, අවුරුදු සතරෙකින් නැත්නම් පහකින් කණිෂ්ඨ ඉංජිනේරුවෙකු ලෙස ඔහු නිපුණත්වය ලැබියැ යුතු බව බලාපොරොත්තු වනු ලැබේ. මෙකී තනතුරු දෙ වරක් පළ කරවන ලද නමුත්, තේරුණේ එක මැ එක අපේක්ෂකයෙකි.

7. වැළක්විය හැකි ලෙඩ-රෝග මැඩ පැවැත්වීමෙහි ලා පරිසරය හසුරුවා ගැනීම ප්‍රධාන තැනක් ගන්නා බව නො සැලී පවතී. කායික්ශිල්පීකම් පිටියේ දී වැඩි කැමැත්තක් දක්වුණු විධි-ක්‍රම නම් මහජන සෞඛ්‍ය ඉංජිනේරු විධි-ක්‍රම යි. මහජන සෞඛ්‍ය ඉංජිනේරු ශිල්පාංශය වැඩිය යුතුවා මෙන් ම, එහි වැඩිමට, බොහෝ සෙයින් එහි විහිදුවීම් අවහිර කරන්නාවූ සංවිධානයේ දුබලකම් මකා ගැනීමට යම් නොවරදින ප්‍රයත්නයක් දැරිය යුතු යැ.

දෙශාන්තර කායික භාරය

8. විමධ්‍යගත කිරීමත්, සමග මැ 1954 දී පිටුවන ලද කායික දේශ 5 ඒ ආකාරයෙන් මැ පවතී. එම දේශ කාර්යාල කොළොඹ, කුරුණෑගල, මහනුවර, ගාල්ල, යාපනය යන නගරවලැ පිහිටි, එක් එක් දේශය දේශීය මහජන සෞඛ්‍ය ඉංජිනේරුවෙකු යටතේ පවතී. දේශීය කාර්යාල පිහිටුවනු ලැබුවාට පසු අවසානයේ දී,

සෑම සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශයකට මැ දේශිය කාර්යාලයක් තිබිය යුතු යැයි අදහස් කරන ලද නමුත්, අවශ්‍ය පිරිස් බලය හිඟ පාඩු වීම නිසා මේ අතින් කිසි ප්‍රගතියක් ලැබී නැත. සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශ තුන හතරක වැඩ බලා ගැනීමට එක මැ එක දේශිය මහජන සෞඛ්‍ය ඉංජිනේරුවෙකු යෙදීමේ දැනට තිබෙන වැඩ පිළිවෙල නම් කිසිසේත් සතුටුදායක නොවේ. සෑම දේශිය ඉංජිනේරුවෙකුට මැ දැන් පැවරී ඇති රාජකාරි ප්‍රදේශ ප්‍රමාණයට වඩා විශාල යැ, දැරීමට බැරි තරම් යැ.

9. රජයේ ඉඩම් බෙදුම් අනුරාධපුරයෙන් සහ මඩකලපුවෙන් ලබා ගෙනැ ඇත. මේ දෙකොට්ඨාශයේ දේශ කාර්යාල 1964-65 දී පිහිටුවීමෙන් මුල පිරීමට අදහස් කරනු ලැබේ. කලින් කලැ උද්ගත වී තිබෙන තදබල අවහිරයක් නම් දේශගත ඉංජිනේරු වන්ට විශාල කොට්ඨාශවලැ වැඩ බලා ගැනීමට සිදුවීම සහ ඇතැම් ආයතන ඉතාමත් ප්‍රත්‍යන්ත (පිටිසර බද) පෙදෙස් වලැ පිහිටා තිබීම යි. දේශිය මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලයයෙකැ මොන මැ අන්දමක වත් ගමන්-බිමන් පහසුකම් නැත. දේශිය මහජන සෞඛ්‍ය ඉංජිනේරුවෙකුට ලැබෙන උප කාර්මික සේවක පිරිස ඉතාමත් සීමා සහිත බැවින්, සමීක්ෂණ සහ විමර්ශණ උදෙසා නිලධාරීන් විහිදී යාම ඉතා ගිරිහැර සහිත වී ඇත. ගමන් බිමන් පහසුව ඉතා ඉක්මණින් සැලසිය යුතු දෙයකි.

10. වෛද්‍ය ආයතන උදෙසා දිය සැපයීමේ යෙදුම්, පල් දෝරු සහ මතු පිටැ කාණු සම්බන්ධයෙන් සමීක්ෂණ සහ විමර්ශන මෙහෙයවීම දේශ ඉංජිනේරුවන් සතු වග කීමෙකි. කුඩා ආයතන සම්බන්ධයෙන් නම් වැඩ සැලැස්ම සම්පූර්ණයෙන් මැ ඔහුගේ කාර්යාලයේ දී පිළියෙල වී, හරි-වැරැදි බැලී සම්මත වෙනු පිණිස මධ්‍යම සිතුවම් කාර්යාලයට යැවෙයි. විශාල වැඩ සැලසුම් සම්බන්ධයෙන් නම් වුවමනා ක්ෂේත්‍ර වස්තු සලකුණු වී මධ්‍යම සිතුවම් කාර්යාලයට යැමෙන් එහි දී සැලැස්ම නිමාවට සිතුවම් වෙයි.

11. මහජන සෞඛ්‍ය ඉංජිනේරු ගැටලු සම්බන්ධයෙන් සෞඛ්‍ය සේවා අධිකාරින්ට අවවාද-අනුශාසනා කිරීම ද දේශ ඉංජිනේරුවන් සතු වගකීමෙකි. රජයේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ පළාත් පාලන මණ්ඩල උදෙසා ද මහජන සෞඛ්‍ය ඉංජිනේරු කායී විෂයෙහි ඔව්හු පුරෝහිතකම් කරති.

මහ කාර්යාලයය

මැලේරියා නාශක ව්‍යාපාරයේ අධිකාරි කාර්යාලයය අලුත් කාර්යාලයීය ගොඩනැගිල්ලකට ගෙනයාමත් මාගේ ගොඩනැගිලි කොටසක් ලංකා ගුවන් විදුලියට ඉඩ හැරීමත් නිසා ඉංජිනේරු ශිල්පාංශයේ මහ කාර්යාලයයේ වෙනස්කම් කිහිපයක් ඇති වී යැ. මේ වෙනස්වීම් නිසා තරමක් දුරට අපහසුකම් ඇති වුණි. ඊට හේතුව පරණ ගොඩනැගිල්ලේ තිබුණු සනීපාරක්ෂක සහ අනෙකුත් පහසුකම් කිහිපයක් දැන් නො ලැබී යාමයි. එම පහසුකම් සුහුසුළු වැ ලබා දීම අත්‍යාවශ්‍ය වෙයි.

මධ්‍යම සිතුවම් කාර්යාලය සහ පරීක්ෂණාගාරය

13. මේ අංශය මතු සඳහන් සේවක පිරිසෙන් යුක්තයි :—

ඉංජිනේරුවන්	...	...	...	2
පරීක්ෂකයින්	...	...	...	2
සැලැසුම්කරුවන්	...	...	...	13
පිඹුරු මුද්‍රණකරු	...	...	...	1
කාර්යාල සේවක	...	...	...	1

කළ යුතු වැ තිබෙන අනු මිනුම් ගැණීමේ සහ තක්සේරු සැසඳීමේ වැඩ සම්භාරය අනුව බලන කලැ, සිතුම් කාර්යාලයයේ නියුක්ත උප කාර්මික නිලධාරි පිරිස ප්‍රමාණවත් නො වන බව පෙනී යයි. රජයේ දෙපාර්තමේන්තුවලට, පළාත් පාලන

ආයතනවලට සහ මහජනයාට ආකාර පිඹුරු පත් නිකුත් කිරීම ද මධ්‍යම සිතුවම් කාර්යාලයයෙන් ඉටු වියැ යුත්තෙකි. නිමවන ලද පිඹුරු පත්, නිකුත් වූ ආකාර පිඹුරු පත් සහ පිළියෙල වූ වැය තක්සේරු 1 වන පරිශිෂ්ඨයෙන් දැක්වෙයි.

14. පයෙවීක්ෂණ සහ සිතුවම් අංශය යටතේ සිය මෙහෙය ඉටු කරන මෙම ශිල්පාංශයේ පරීක්ෂණාගාරය නොයෙක් වෛද්‍ය ආයතනවල දිය සැපයීමේ සහ කැත-කුණු බැහැර කිරීමේ ගුණ පාලනය කැරැ ගෙනැ යයි. නොයෙක් ආයතන කරා කලින් කලැ ගමන් කරන වෛද්‍ය පයෙවීක්ෂණාගාර කාර්මික විද්‍යාඥ තෙමේ, අවශ්‍ය පරිදි ක්ලෝරීන් මාත්‍රුව බලා නිසි තත්ත්වය පමුණුවා, මෙම ආයතන වලැ නිපදවෙන දියෙහි තත්ත්වය බිමට සුදුසු ලෙස තබා ගැනීමට වග බලා ගනී.

15. දෙනු ලබන සාත්තුවේ ශක්තිය උරගා බලනු අටියෙන් පල්දෝරු සහ කැළි-කසළ දෝරු විෂයයෙහි කලින් කලැ පරීක්ෂණ ද මෙහෙයැ වෙයි.

16. අපවිත්‍ර දේ පොළොවට උරා ගන්නට සැලසීමේ ක්‍රම නිසා ප්‍රදේශයේ ලිං දිය කෙළෙසීමක් වූයේ දෝයි සොයා බැලීම සඳහා දෙ ප්‍රසථාවකැ දී ප්ලුරොසින් ඛයි පරීක්ෂණය කරන ලදි. හොරපේ ගමේ අතිසාර රෝග බල පැවත්ම ගැන විමර්ශන පැවැත්වූ ජගත් සෞඛ්‍ය සංවිධානයේ අතිසාර රෝග සමීක්ෂණ කණ්ඩායම උදෙසා ද හොරපේ පෙදෙසෙන් තෝරා ගත් ලිං කිහිපයක් මත මේ පරීක්ෂණ මෙහෙයැවිණි.

17. ඉහළ මට්ටමේ වැඩ වඩා විශ්‍රාම ප්‍රමාණයක් පරීක්ෂණාගාරයේ දී කළ හැකි වනු පිණිස පරීක්ෂණාගාරය භාර වැ සිටීමට ජීව රසඥයෙකු පත් කරන ලෙස කාලයක් තිස්සේ කර ඇති ඉල්ලීමක් වෙයි. පරීක්ෂණාගාරය සතුටුදායක අන්දමින් සිය මෙහෙය ඉටු කිරීමට නම්, පරීක්ෂණාගාර උප සහායකයෙක් ද (ඕඩර්ලි) මෙහෙකරුවෙක් ද ඊට වුවමනා වෙයි. මේ අඩුව පිරිමසා ගැනීමට දැනට කරනු ලබන්නේ සේවකයින් ආර-මාරු කිරීමේ-පිළිවෙලකි.

බටහිර දේශය

18. මෙය විශාලතම දේශය යි. කොළඹ, කැගල්ල, රත්නපුර සහ කලුතර සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්‍ය භාරය පවත්නා කොට්ඨාස මීට ඇතුළත් වෙයි. බටහිර දේශයට අයත් සේවක පිරිස මෙසේ යැ :—

දේශාන්තර මහජන සෞඛ්‍ය ඉංජිනේරු	1
නේවාසික ඉංජිනේරු-අර්ධ කාලීන	1
ලිපිකරුවන්	3
පරීක්ෂකයින්	1
උප පරීක්ෂකයින්	4
සැලසුම්කරුවන්	2
යන්ත්‍ර ක්‍රියාකරුවන්	5
සමීක්ෂණ ඕවර්සියර්	44
සමීක්ෂණ කම්කරුවන්	9
කාර්‍යාල කම්කරුවන්	1
සමීක්ෂණ ඕවර්සියර්	11
පොම්ප ක්‍රියාකරුවන්	20
අර්ධ-නිපුණ II වන ශ්‍රේණියේ කම්කරුවන්	8
යාන්ත්‍රිකයින්	1
මුරකරුවන්	4
නො නිපුණ කම්කරුවන්	1
කසළ ශෝධකයින්	10
පෙදරේරුවන්	3
නිපුණ II වන ශ්‍රේණියේ කම්කරුවන්	1

19. මෙහි ඇළලෙන වර්ෂය තුළ දී කර ගෙනැ යමින් සිටි වැඩ මෙසේ යැ :—

(අ) ගොඩිගමුවැ පිරිසක් මළුවේ (පයර්‍යාන්ත ඒකකයේ) දනවන මඩුව.

(ආ) කරවනැල්ලැ රෝහලේ දිය සැපයීමේ යෙදුම.

(ඉ) මොරවුවැ රෝහලේ දිය සැපයුම් යෙදුම.

(ඊ) කොළොන්නාවැ නගර සභාවේ කසළ හරින යෙදුම.

(උ) ස්වදේශිය වෛද්‍ය විද්‍යාලයයේ සහ එම රෝහලේ කසළ හරින යෙදුම.

(ඌ) කැගල්ලැ නගර සභාවේ මතු පිටැ කාණු යෙදුම.

20. පසුගිය මුදල් වර්ෂයේ දී අරඹන ලද මතු සඳහන් වැඩ නිම කරන ලදි.

(අ) රාගමැ පොදු ජන රෝහලේ බෙදාහැරීමේ යෙදුම.

(ආ) කිතුල්ගලැ රෝහලේ දිය සැපයීම.

(ඉ) තලහේනැ මාතෘ නිවාසයේ දිය සැපයුම—බෙදා හැරීමේ සැටිය සහ පොම්ප නැවත යෙදීම.

(ඊ) මහරගමැ දත් හෙදි ඇබැසි පාසලේ පල් දිය පොළොවට ඉරවීමේ සැටිය.

(උ) රාගමැ රෝහලේ ශල්‍යාපාරයට සහ එක්ස්රේ කොටසට පල් දෝරැ යෙදුම.

(ඌ) රත්නපුරැ දි. වෛ. නි. සහ දි. වෛ. ස. යන දෙ පොළයේ නිල වාසස්ථාන වලට පල්දෝරැ යෙදුම.

(එ) හොරගොල්ලේ බණ්ඩාරනායක අනුස්මරණ දිනය තාවකාලික වැසිකිළි.

(ඒ) පානදුර නගර සභාවේ මතු පිටැ කාණු යෙදුම.

(ඔ) වත්තල-පැලියගොඩ නගර සභාවේ මතු පිටැ කාණු.

(ඕ) නාවල-අසාධ්‍ය රෝගින්ගේ නිවාසයට මතු පිටැ කාණු.

21. බටහිර දේශයෙන් මතු සඳහන් වැය තක්සේරැ ලැබී ඇත :—

(අ) කිරිත්ගොඩැ රෝහලේ දිය සැපයීම-දියුණු කිරීම

(ආ) අලුත්ගමැ රෝහලේ දිය සැපයීම-ප්‍රතිශෝධිත වැය තක්සේරැව

(ඉ) මීගහතැන්නැ රෝහලේ දිය සැපයීම-ප්‍රතිශෝධිත වැය තක්සේරැව

(ඊ) පොතුපිටියැ රෝහලේ දිය සැපයීම

(උ) මීගමුවැ රෝහලේ දිය සැපයීම

(ඌ) කහවත්තැ රෝහලේ දිය සැපයීම

(එ) මාදම්පේ රෝහලේ දිය සැපයීම

(ඒ) මිරිගමැ රෝහලේ බෙදා හැරීමේ සැටිය නැවත යෙදුම.

(ඔ) ඇහැලියගොඩැ රෝහලේ දිය සැපයීම

(ඕ) කඳානැ ලය රෝහලේ දිය සැපයීමේ 11 වන පියවර

(ක) කලවානැ රෝහලේ දිය සැපයීම

(කා) රාගමැ ලය රෝහලේ "සෙප්ටික් ටැංකිය" දියුණු කිරීම

(කි) කලුතරැ රෝහලේ පොම්ප මාරැ කිරීම.

(කී) අංගොඩැ මානසික-රෝහලේ පල්දෝරැ යෙදුම.

(කු) වැලිසරැ ලය රෝහලේ මාණ්ඩලික හෙදියන්ගේ නිවාසය—පොළොවට දිය ඉරවීමේ සැටිය.

(කූ) රක්වානැ රෝහල-පල් දෝරැ යෙදුම.

(කෙ) කල්තොටැ රෝහලේ-මතු පිටැ කාණු යෙදුම.

(කේ) දිවුලපිටියැ රෝහලේ මතු පිටැ කාණු යෙදුම

(කො) රත්නපුරැ නගර සභාවේ මතු පිටැ කාණු

(කෝ) හොරණ රෝහලේ මතු පිටැ කාණු.

22. මතු සඳහන් විමර්ශන භාර ගන්නා ලදුවැ, නිම කරන ලදි :—

(අ) කඳානැ ලය රෝහලේ දැනට පවතින බෙදා හැරීමේ සැවිය සලකුනු කරා ගැන්ම

(ආ) අංගොඩැ උණ රෝහලේ පල් දෝරු යෙදුම.

(ඉ) අංගොඩැ මානසික රෝහලේ නිලධාරින්ගේ නිවාසවලට සහ ආතුරාල (වාර්වු) වලට පල් දෝරු යෙදුම.

(ඊ) කහවත්ත රෝහලේ පල් දෝරු යෙදුම.

පාරිසරික සනීපාරක්ෂාව

23. ජගත් සෞඛ්‍ය සංවිධානයේ අතිසාර රෝග සමීක්ෂණ කණ්ඩායම විසින් කලින් කරන ලද වැඩ අනුව, සලකා නියමු යෝජනා ක්‍රමයක් හැටියට හොරපේ නම් ගම ගන්නා ලදි. මතු සඳහන් වැඩ හමාර කරන ලදි :—

(අ) වැඩිහිටියන්ගේ වැසිකිළි 72.

(ආ) හොරපේ පාසල් දෙකක් සඳහා අත්පොම්ප දෙකක් සහ ලිං ආවරණ සවිකිරීම

(ඉ) පෙර-පාසල් වයසේ ළමුන් සඳහා ඇන තියන පුවරු සහ පෝච්චි 650ක් වාත්තු කර බෙදා හැරීම.

වයඹ දිග දේශය

24. කුරුණෑගල, පුත්තලම සහ මඩකළපුව සෞඛ්‍ය සේවා අධිකාරින්ගේ කාර්‍ය භාර ප්‍රදේශය මේ සීමාවට අයත් වෙයි.

මේ දේශයට අයත් සේවක පිරිස මෙ සේ වෙයි :—

දේශ මහජන සෞඛ්‍ය ඉංජිනේර	1
වැඩ උප පරීක්ෂක	3
සෞඛ්‍ය ශික්ෂක	1
සැලසුම් කරු	1
ලිපිකරුවන් (1ක් තාවකාලික මාස් පඩි ලබන්නකි)	3
සමීක්ෂණ ඔවර්සියර් වරුන්	2
සමීක්ෂණ කම්කරුවන්	10
වැඩ පොළ ඔවර්සියර්වරුන් (1ක් තාවකාලික මාස් පඩි)	1
පෙදරේරුවන් (1ක් තාවකාලික මාස් පඩි)	1
වඩුවන් (1ක් තාවකාලික මාස් පඩි)	2
යාන්ත්‍රික ශිල්පීන්	2
වැඩපොළ කම්කරුවන් (2ක් තාවකාලික මාස්පඩි , 1ක් අනියම් දවස් පඩි) ...	3
වාහන රියැදුරන් (1ක් තාවකාලික මාස් පඩි)	3
මුරකරුවන් (2ක් අනියම් දවස් පඩි)	2
කාර්යාල කම්කරුවන් (1ක් තාවකාලික මාස් පඩි)	1
පරිපාලක ඔවර්සියර්වරුන් (තාවකාලික මාස් පඩි)	8

25. කාර්යාලයය දැනට පිහිටා ඇත්තේ කුරුණෑගල සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයයේ එක් පියස්සෙකැ යැ. ඇති ඉඩ-කඩ ප්‍රමාණය මදි තරම් යැ. එහෙත්, සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයට ඉඩ-කඩ මදි හෙයින් මේ පියස්සත් තමාට මුදා දෙන ලෙස අධිකාරි තැන තදින් ඉල්ලා සිටී.

26. දේශ මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලය උදෙසා කුරුණෑගලැ නවැ ගොඩනැගිල්ලක් තැනවීමට ගිවිස්නාවක් අස්සන් කොටැ ඇත. ගොඩනැගිල්ල තැනවීමට අදහස් කරන්නේ එක්සත් ජනපද ක්‍රියාකාරි දූත මණ්ඩලයෙන් සැප යෙන අරමුදලින් දෙපාර්තමේන්තුව සතු රජයේ ඉඩමෙකැ යැ. අවුරුද්දකින් පමණ ගොඩනැගිල්ලේ වැඩ කටයුතු හමාර වෙතැ යි බලාපොරොත්තු වනු ලැබේ.

27. මහජන සෞඛ්‍ය සේවක පිරිස උදෙසා අභ්‍යාස මධ්‍යස්ථානයක් හැටියට කුරුණෑගල දරන වැදගත්කම සහ පාරිසරික සනීපාරක්ෂාව විෂයයෙහි ලංකා—ජ. සෞ. සං.—එ.ජා.ජා.ළ.හ.අ ඒකාබද්ධ යෝජනා ක්‍රමයේ පිහිටීම යන දෙ කරුණ නිසා මෙම දේශයේ අභ්‍යාස වැඩ සැහෙන තරමක් කැරැගෙනැ යනු ලැබේ. දේශ මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන ද, කුරුණෑගල දිසාවේ සියළු මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්ගේ සංඝායනාවකට සහභාගි වියැ. පුහුණුවීමේ යෙදී සිටින මහජන සෞඛ්‍ය අතවැස්සන්ට පරිසරය මැඩ පවත්වා ගැනීමේ වැඩ විෂයයෙහි ප්‍රමේයය, ප්‍රායෝගික යන දෙ අතින් මැ අභ්‍යාසය සලසන ලදී. සේවයේ හිඳිමින් ලබන අභ්‍යාස සැලැසුමක් ද සෞඛ්‍ය සේවක-සේවිකාවන් උදෙසා මෙහෙයවන ලදී.

28. මතු සඳහන් වැඩ භාර ගන්නා ලදුවැ සහ/නොහොත් නිමවන ලදි :—

(අ) කුරුණෑගලැ මහ රෝහලේ දිය සැපයීමේ යෙදුම.

(ආ) කෝන්ගහවෙලැ පිරිසත් රෝහලේ දිය සැපයීමේ යෙදුම.

(ඉ) දඹුල්ලැ රෝහලේ දිය සැපයීමේ යෙදුම.

(ඊ) කිඹුල්වන්ඔය ඇපෝතිකරි නිවාසය දියුණු කිරීම.

(උ) කුරුණෑගල දේශ මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනට කාර්යාලයීය ගොඩනැගිල්ලක්.

29. මතු සඳහන් යෝජනා ක්‍රම විමසා බලන ලදුවැ වැය තක්සේරු පිළියෙල කරන ලදි :—

(අ) ගලේවෙලැ පිරියත් රෝහලේ දිය සැපයීමේ යෙදුම.

(ආ) නාරම්මලැ පිරියත් රෝහලේ දිය සැපයීමේ යෙදුම.

(ඉ) ආනාමඩුවැ දිසා රෝහලේ දිය සැපයීමේ යෙදුම.

(ඊ) සඳලංකාවැ මාතෘ නිවාසයේ දිය සැපයීමේ යෙදුම.

(උ) මාවතගමැ දි. වෛ. නි. නිවාසයට දිය සැපයීමේ යෙදුම.

(ඌ) දුනකදෙනියැ මාතෘ නිවාසයට දිය සැපයීමේ යෙදුම.

(එ) පුත්තලමැ ලය රෝහලේ දිය සැපයීමේ යෙදුම.

(ඒ) කටන්කුඩි පිරියත් රෝහලේ දිය සැපයීමේ යෙදුම.

(ඔ) මූනමල්දෙනියැ මාතෘ නිවාසය සහ මැදි බෙහෙත් හලට දිය සැපයීමේ යෙදුම.

(ඕ) කටුපොතැ පිරියත් රෝහලට පොම්පය සවි කිරීම.

(ක) ඔවිලිකන්දැ මාතෘ නිවාසය සහ මැදි බෙහෙත්හලට පොම්පය සවි කිරීම.

(කා) රිදීගමැ දිසා රෝහලට දිය සැපයීමේ යෙදුම.

(කි) මාතලේ පාදක රෝහලට දිය සැපයීමේ යෙදුම.

(කී) දංකොටුවැ පිරියත් රෝහලට මතු පිටැ කාණු යෙදුම.

(කු) පොල්ගහවෙලැ පිරියත් රෝහලට මතු පිටැ කාණු යෙදුම.

(කූ) ආනමඩුවැ දිසා රෝහලට මතු පිටැ කාණු යෙදුම.

(කෙ) දූනකදෙනියැ මාතෘ නිවාසය සහ මැදි බෙහෙත්හලට මතු පිටැ කාණු යෙදුම.

පාරිසරික සනීපාරක්ෂාව

30. ලංකා—ජ. සෞ. සං. 35 යටතේ වූ පැදසුන් යෝජනා ක්‍රමය තිරගත්දහය, නැගෙනහිර කෝරළයේ සිය වැඩ අවසන් කළා යැ. මතු සඳහන් වැඩ කටයුතු මුදුන්පත් වූ බව සටහන් වී යැ :—

(අ) යෝජනා ක්‍රමයෙන් ආධාර ඇතුව නිම කරන ලද ගෙ වැසිකිළි ...	... 1,271
(ආ) යෝජනා ක්‍රමයෙන් ආධාර ඇතුව නිම කරන ලද අත් පොම්ප සහිත ලිං	... 87
(ඉ) කුරුණෑගල ප්‍ර. සෞ.වෛ. නි. සඳහා සැපයුණු ඇනතියන පුවරු ...	... 717
(ඊ) කුලියාපිටියැ සෞ. වෛ. නි. සඳහා සැපයුණු ඇනතියන පුවරු ...	... 496
(උ) පොල්ගහවෙලැ සෞ. කා. අධිපති සඳහා සැපයුණු ඇනතියන පුවරු	... 448
(ඌ) වාරියපොලැ සෞ. කා. අධිපති සඳහා සැපයුණු ඇනතියන පුවරු ...	... 149
(එ) මහවැ සෞ. කො. අධිපති සඳහා සැපයුණු ඇනතියන පුවරු ...	... 100
(ඒ) ගොකරල්ල සෞ. කා. අධිපති සඳහා සැපයුණු ඇනතියන පුවරු ...	... 236

ඇනතියන පුවරු අවවු සැපයුණ ගණන

(අ) රත්නපුර සෞ. සේ. අධිකාරිට	කටවල 4
(ආ) මාතලේ සෞ. සේ. අධිකාරිට	... 1
(ඉ) වවුනියා සෞ. සේ. අධිකාරිට	... 4
(ඊ) කෑගල්ලැ සෞ. සේ. අධිකාරිට	... 4
(උ) අනුරාධපුර සෞ. සේ. අධිකාරිට	... 1
(ඌ) කොළඹැ සෞ. සේ. අධිකාරිට	... 4
(එ) මඩකලපුවැ සෞ. සේ. අධිකාරිට	... 4
(ඒ) පුත්තලමැ සෞ. සේ. අධිකාරිට	... 1
(ඔ) මාතර සෞ. සේ. අධිකාරිට	... 4
(ඕ) (බටහිර දේශයේ) දේශ මහජන සෞඛ්‍ය ඉංජිනේරුවට ...	... 2

දිය-හිර වැසිකිළි බොකු අවවු සැපයුණ ගණන

(අ) රත්නපුර සෞ. සේ. අධිකාරිට	... 15
(ආ) බදුල්ලැ සෞ. සේ. අධිකාරිට	... 2
(ඉ) මාතලේ සෞ. සේ. අධිකාරිට	... 4
(ඊ) වවුනියාව සෞ. සේ. අධිකාරිට	... 14
(උ) ගාල්ල සෞ. සේ. අධිකාරිට	... 2
(ඌ) කෑගල්ලැ සෞ. සේ. අධිකාරිට	... 15
(එ) අනුරාධපුර සෞ. සේ. අධිකාරිට	... 2
(ඒ) යාපනෙයෙ සෞ. සේ. අධිකාරිට	... 2
(ඔ) කොළොඹැ සෞ. සේ. අධිකාරිට	... 12
(ඕ) මඩකළපුවැ සෞ. සේ. අධිකාරිට	... 12
(ක) පුත්තලමැ සෞ. සේ. අධිකාරිට	... 1
(කා) මාතර සෞ. සේ. අධිකාරිට	... 12
(කි) (බටහිර දේශ ම. සෞ. ඉංජිනේරු	... 10

31. අව්වු තැනීම, පොම්ප සවිකිරීම, උපකරණ නඩත්තු කර ගැනීම යනාදි වැඩ සඳහා පාරිසරික සනීපාරක්ෂා යෝජනා ක්‍රමය යටතේ කුඩා වැඩ පොළොක් පිහිටුවන ලදි. පාරිසරික සනීපාරක්ෂා යෝජනා ක්‍රමයේ වැඩ අඩුවීම නිසා, කුරුණෑගල, සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශයේ සියළු දිය සැපයීමේ යෙදුම් සහ පල්දෝරු යෙදුම් නඩත්තු කර ලීම (වයඹ දිග කොටසේ) දේශ මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් භාර ගෙනැ ඇත. මේ වැඩ පිළිවෙල නිසා, මෙම දේශයේ නඩත්තු කිරීමේ වැඩ වුවමනා හැම විටෙකැ දී මැ ඒ ගැන සැනෙකින් වැඩි අවධානයක් යොමු කර ගෙනැ යනු ලැබේ.

දකුණු දේශය

32. ගාල්ල සහ මාතරැ සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්‍ය්‍ය භාර ප්‍රදේශය ද බදුල්ලැ සහ රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්‍ය්‍ය භාර ප්‍රදේශවලින් කොටසක් ද මෙම ප්‍රදේශයට අයත් වෙයි.

මේ දේශයෙහි සේවක පිරිස මෙ සේ යැ :—

දේශ මහජන සෞඛ්‍ය ඉංජිනේරු	1
පරීක්ෂකයින්	නැත
උප පරීක්ෂකයින්	නැත
II වන පෙළ සැළසුම්කරුවන්	1
අර්. ලි. සේ. ලිපිකරුවන්	1
සමීක්ෂණ ඕවර්සියර්	2
සමීක්ෂණ කම්කරුවන්	5
කාර්‍ය්‍යාල කම්කරුවන්	1
මුරකරුවන්	1
අනියම් පරිපාලක ඕවර්සියර්	2
අනියම් පොම්ප ක්‍රියා කරුවන්	2

33. දේශගත කාර්‍යාලයය පිහිටා ඇත්තේ දෙපාර්තමේන්තුව සතු වෙනමැ ගොඩනැගිල්ලෙකැ යැ. මෙම ගොඩනැගිල්ල දැනට තරමක අබලන් තත්ත්වයක පවතින බැවින්, එය මනුෂ්‍ය ප්‍රයෝජනය සඳහා යෝග්‍ය කරවීමට ඉතා ඉක්මණින් මහත්සේ පිරියම් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා ගාල්ලේ විධායක ඉංජිනේරු තැනගෙන් ද රජයේ විදිලි ඉංජිනේරු තැනගෙන් ද වැය තක්සේරු කැඳවා ඇත.

34. එක උප පරීක්ෂකයෙකු විශ්‍රාම ගැනීමත්, තවත් අයෙකු යුද හමුදාවට මුදා හැරීමත් නිසා මෙම දේශයේ පරීක්ෂක මණ්ඩලය සම්පූර්ණයෙන් මැ හිස් වී යැ. පරීක්ෂකයින් අඩු-පාඩු වීම නිසා දේශයේ විමර්ශන වැඩ කටයුතු සියල්ල ඇන හිටියේ යැ. පරීක්ෂක-සංඛ්‍යාවෙන් දැනට පුරවා ඇත්තේ සියයට 50ක් පමණ නිසා ඒ වෙනුවට පරීක්ෂකයින් යෙදවියැ නො හැකි වී තිබේ. අපෙක්ෂකයින් දෙදෙනෙකුගේ පත්වීම සෞ. සේ. අධ්‍යක්ෂ විසින් තහවුරු කරනු ලැබූ පසු මේ දේශයට එක පරීක්ෂකයෙකුවත් පත් කිරීමට පුළුවන් වෙතැයි බලාපොරොත්තු වනු ලැබේ.

35. මතු සඳහන් ඉදි කිරීම් දැනට කර ගෙනැ යනු ලැබේ.

(අ) බෙලිඅත්තැ මැදි බෙහෙත් හල දිය සැපයීමේ යෙදුම.

(ආ) කඹුරුපිටියැ පිරියත් රෝහලේ දනවන ගෙය තැනවීම.

36. මතු සඳහන් අරමුණු විමර්ශනය කරන ලදුවැ, සිතුවම් සහ වැය තක්සේරු නිමාවට පත් කරන ලදි:—

(අ) වැලිගමු රෝහලට දිය සැපයීමේ යෙදුම.

(ආ) ගාලු රෝහලට දිය සැපයීමේ යෙදුම.

(ඉ) දෙවුන්දර මාතෘ නිවාසයට දිය සැපයීමේ යෙදුම.

(ඊ) දෙනිපිටියැ මැදි බෙහෙත්හලට දිය සැපයීමේ යෙදුම.

(උ) උඩුගමු රෝහලට දිය සැපයීමේ යෙදුම.

(ඌ) හික්කඩුවැ රෝහලට ලිහිල් පල්දෝරු යෙදුම.

(එ) ඉඳුරුවැ රෝහලට ලිහිල් පල්දෝරු යෙදුම.

(ඒ) බද්දේගමු රෝහලට ලිහිල් පල්දෝරු යෙදුම.

පාරිසරික සනීපාරක්ෂාව

37. කුරුණෑගලැ පාරිසරික සනීපාරක්ෂා යෝජනා ක්‍රමයේ විහිදුවක් හැටියට ගාලු සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශයේ අවිත්තාව නමැති ගම සනීපාරක්ෂා කටයුතුවලට ඇඳා ගන්නා ලදි.

මතු සඳහන් වැඩ කටයුතු ඉටු කරන ලදි:—

(අ) යෝජනා ක්‍රමයෙන් ආධාර ඇතුවැ වැසිකිළි 50.

(ආ) යෝජනා ක්‍රමයෙන් ආධාර ඇතුවැ පොම්ප සහිත ලිං 8.

උතුරු දේශය

38. යාපනේ, වවුනියා, අනුරාධපුර යන සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාස වලින් මේ දේශය සමන්විත වේ:—

දේශගත කාර්යාලය පිහිටා ඇත්තේ රෝහල් පාරේ පෞද්ගලික මැදුරෙකැයැ. කාර්යාලයක් හැටියට මැදුරක් යොදා ගැනීමෙන් නිතර මැ යම් යම් කරදර ඇති වන හෙයින්, මේ ගොඩනැගිල්ල ඒ තරම් සුදුසු නො වේ. දේශගත මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලය උදෙසා නිසි කාර්යාලයීය ගොඩනැගිල්ලක් තැනීම වුවමනා දෙයකි. රජයේ ඉඩම් ලබා ගැනීමට මෙතෙක් ගත් වෙහෙස පලක් නොවීයැ

39. දේශයේ සේවක පිරිස මෙසේ යැ:—

දේශගත මහජන සෞඛ්‍ය ඉංජිනේරු	1
වැඩ උප පරීක්ෂක	2
ලිපිකරු	1
සැලැසුම්කරුවන්	2
පරිපාලක ඔවර්සියර්වරුන්	5
සමීක්ෂණ ඔවර්සියර්වරුන්	2
සමීක්ෂණ කම්කරුවන්	8
කායික කම්කරුවන්	1
මුරකරුවන්	1

40 මේ දේශයෙන් භාර ගන්නා ලද ප්‍රධාන වැඩ, එනම්,

(අ) යාපනේ රෝහලේ දිය සැපයීමේ යෙදුම

(ආ) යාපනේ හෙදි ඇබැසි පාසල

(ඉ) යාපනේ රෝහලේ පල්දොරු යෙදුම—

නිම කරනු නො ලැබුයේ, පළමු කී දෙ විෂය සම්බන්ධයෙන් කොන්ත්‍රාත් කරුවන් ගිවිසුම පැහැර හැරීමත්, පන්නාසි උස් වැටි මග ඔස්සේ ර.වැ.දෙ. මගින් සැලෙන පාලමක් තැනීම නිසා, මහ නගර සභාව තුන් වැන්නට හරස් වී එය වෙනස් කිරීම අවශ්‍ය වීමත් යන කරුණු නිසා ය. පළමු වැ කී කොන්ත්‍රාත් දෙක අවලංගු කරන ලදින් වැය සැපයීම යෙදුම දෙපාර්තමේන්තුවෙන්මැ නිම කිරීමට අදහස් කරනු ලැබේ. යාපනේ හෙදි ඇබැසි පාසලේ ඉතුරුවැඩ කොටස නිම කිරීමට කොන්ත්‍රාත් තුවක් අත්සන් කරන ලදි.

41. මතු සඳහන් වැඩ දැනට කරගෙන යනු ලැබේ :—

(අ) පුංගුදුතිවු පිරියත් රෝහලේ දිය සැපයීම් යෙදුම.

(ආ) චාවාකච්චේරි දිසා රෝහලේ දිය සැපයුම් යෙදුම.

(ඉ) කින්නියා පිරියත් රෝහලේ දිය සැපයුම් යෙදීම.

42. මතු සඳහන් අරමුණු විමසා බලන ලදුව, වැය තක්සේරු සපයන ලදි.

(අ) මාන්තොට දිසා රෝහලේ දිය සැපයුම් යෙදුම.

(ආ) මුරුක්කන් ගැමි රෝහලේ දිය සැපයුම් යෙදුම.

(ඉ) වල්වෙට්ටිතුරේ පවුල් සංවිධාන චිකිත්සාගාරය.

43. මතු සඳහන් වැඩ සම්බන්ධයෙන් විමසා බැලීම් සහ සමීක්ෂණ හමාර කොට ඇත :—

(අ) මුත්තූර් ගැමිරෝහලේ කසළ බැහැර කිරීමේ යෙදුම

(ආ) පල්ලෙයි මැ. බෙ. සහ ඇපො. නිවාසයට දිය සැපයීමේ යෙදුම

(ඉ) තලේමන්නාරම නිරෝධයන කඳපුරේ දිය සැපයුම් යෙදුම.

44. මතු සඳහන් නඩත්තු කිරීමේ වැඩ භාර ගන්නා ලදුව නිම කරන ලදී :—

(අ) කංකසන්තුරේ ජන රෝහලේ දිය සැපයුම් යෙදුම.

(ආ) පුන්ගුඩුතිවු පිරියත් රෝහලේ දිය සැපයුම් යෙදුම.

(ඉ) චාවාකච්චේරි දිසා රෝහලේ පල්දෝරු යෙදුම.

(ඊ) චන්කානෙයි පිරියත් රෝහලේ දිය සැපයුම් යෙදුම.

(උ) මණ්ඩයිතිවු පිරියත් රෝහලේ දිය සැපයුම් යෙදුම.

(ඌ) කෝපායි පිරියත් රෝහලේ දිය සැපයුම් යෙදුම.

45. ව්‍යාප්ති පාරිසරික සනීපාරක්ෂාව උදෙසා විහිදුවීමේ අරමුණක් හැටියට කුල මන්ගල් නමැති ගම යොදා ගන්නා ලදී. මුදුන්පත් වූ අරමුණ මෙසේ යැයි වාර්තා වී යැ. :—

(අ) යෝජනා ක්‍රමයෙන් ආධාර ලත් වැසිකිළි.

(ආ) යෝජනා ක්‍රමයෙන් ආධාර ලත් ලිං.

මධ්‍යම දේශය

46. මධ්‍යම දේශයට අයත් වන්නෝ මහනුවර සහ මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාසයෝය.

දනටැ කාර්යාලය පිහිටා ඇත්තේ පරණ කච්චේරි ගොඩනැගිල්ලේ කුඩා පියස්සෙකැ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය පිටු පසින් යැ. ගොඩනැගිල්ල විහිදු වීම අරබයා පරණ කච්චේරිය මුදා දෙන ලෙස කටුගෙය බලධාරීහු පෙරත්ත කරත්. (මධ්‍යම දේශයේ) දේශගත මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලය තැන්පත් කිරීමට සුදුසු නිවහනක් සොයා ගැනීම අවශ්‍ය යි. දැනට ගබඩා පහසුකම් නො මැත් තෙන් ඒ සඳහා පාසැල් වෛද්‍ය නිලධාරියාගේ රිය මඩුව පාවිච්චි කරනු ලැබේ.

47. දේශයට අයත් සේවක පිරිස මෙසේයැ :—

දේශගත මහජන සෞඛ්‍ය ඉංජිනේරු	1
වැඩ උප පරීක්ෂක	2
ලිපිකරු	1
සැලැසුම්කරු	1
පරිපාලක ඕවර්සියර්	9
සමීක්ෂණ ඕවර්සියර්	2
සමීක්ෂණ කම්කරු	7
කාර්යාල කම්කරු	1

48. වර්ෂය තුළැ දී මතු සඳහන් වැඩ නිම කරන ලදි :—

(අ) දිඹුල්ල රෝහලේ දිය සැපයුම් යෙදුම.
(ආ) මල්දෙනියැ රෝහලේ දිය සැපයුම් යෙදුම.
(ඉ) වැල්ලවායැ රෝහලේ දිය සැපයුම් යෙදුම.
(ඊ) කොස්ලන්දැ රෝහලේ දිය සැපයුම් ක්ලොරීනු මුසුව.
(උ) බදුල්ල සෞ. සේ. අධිකාරිගේ නිල මැඳුර.

49. මතු සඳහන් වැඩ කොටස් තැනෙමින් තිබේ.

(අ) තෙල්දෙනියැ රෝහලේ පල් දෝරු යෙදුම.
(ආ) මහනුවර රෝහලේ දිය සැපයුම වැඩි කරලීම.
(ඉ) අග්‍රපතනැ රෝහලේ දිය සැපයුම් යෙදුම.
(ඊ) හපුතලේ රෝහලේ දිය සපයුම් යෙදුම.
(උ) මදුගොඩ රෝහලේ දිය සැපයුම් යෙදුම.

50. මතු සඳහන් කම් පිටියේ සෝදිසි නිමාවට පත් කොටැ ඇත :—

(අ) වැලිමඩැ රෝහලේ පල්දෝරු යෙදුම.
(ආ) දෙල්තොටැ රෝහලේ පල් දෝරු යෙදුම.
(ඉ) මතුරටැ රෝහලේ පල්දෝරු යෙදුම.
(ඊ) මොරයායැ රෝහලේ පල්දෝරු යෙදුම.
(උ) මැද වලැ රෝහලේ පල් දෝරු යෙදුම.
(ඌ) පස්සරැ රෝහලේ පල් දෝරු යෙදුම.
(එ) බිබිලේ පිරියත් රෝහලේ පල්දෝරු යෙදුම.
(ඒ) බණ්ඩාරවෙලැ රෝහලේ පල් දෝරු යෙදුම.
(ඔ) මඩුල්සිම රෝහලේ පල් දෝරු යෙදුම.
(ඕ) වැලිමඩැ රෝහලේ දිය සැපයුම් යෙදුම.

(ක) මාරස්සනෑ රෝහලේ දිය සැපයුම් යෙදුම.

(කා) උඩ පුස්සැල්ලාවෑ රෝහලේ දිය සැපයුම් යෙදුම.

(කි) පස්සරැ රෝහලේ දිය සැපයුම් යෙදුම.

(කී) මහනුවර රෝහලේ (විශ්ව විද්‍යාල යෙදුම).

(කු) අලුත් නුවරැ රෝහලේ දිය සැපයුම් යෙදුම.

(කූ) අක්කරපත්තුවෑ රෝහලේ දිය සැපයුම් යෙදුම.

(කෙ) බදුල්ලැරෝහලේ (අඩු පිරි පොම්පය).

(කේ) වැලිමඩ රෝහලේ තාවකාලික දිය සැපයුම.

(කො) උඩ පුස්සැල්ලාවෑ රෝහලේ තාවකාලික දිය සැපයුම් යෙදුම.

(කෝ) මැදගමැ රෝහලේ දිය සැපයුම් යෙදුම.

(ග) බොරලන්දැ මැ. මෙ. සහ ඇපෝ. නිවාසයේ දිය සැපයුම් යෙදුම.

51. අංශය මගින් එම ප්‍රදේශයේ තනවන ලද දිය සැපයුම් යෙදුම් සහ පල් දෝරු යෙදුම් නඩත්තු කැරැ ගැනීමේ වග කීම ද දේශගත කාර්යාලය දැරී යැ. ගමන්-බිමන් පහසුකම් මේ පෙදෙසේ අඩුවීම අති මහත් අවහිරයක් වී පවතින අතරැ, විමර්ශන වැඩට ද එයින් සැහෙන තරම් බාධා පැමිණෙයි.

IX වැනි පරිච්ඡේදය

මහජන සෞඛ්‍ය අධ්‍යාපනය

හැඳින්වීම

(1) වර්ෂය තුළ දී ජාතික සෞඛ්‍ය අධ්‍යාපන යෝජනා ක්‍රමය බොහෝ සෙයින් දියුණු විය. එතෙක් පැවති වැඩ සටහන් ප්‍රබල කිරීමත් ස්ථාවර කිරීමත් සිදු වූ අතර සෞඛ්‍ය සේවාවේ නානා අංශවලට අයත් තම වැඩ සටහන් රාශියක් අරඹන ලදි.

ජාතික සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රමය යටතේ ලබන ලද විශිෂ්ට දියුණුවක් නම් සේවයේ නියුක්ත නා නා තරාතිරම්වලට අයත් මහජන සෞඛ්‍ය සේවකයින් සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳව පුහුණුවක් ලබා දීමය. සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාස බොහොමයකට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට දින තුනකටත් සතියකටත් අතර කාලයකට සීමාවූ සෞඛ්‍ය අධ්‍යාපන පාඨමාර්ගය පවත්වනු ලැබිණ. මෙම වැඩ සටහන් වලදී දැනට කෙරෙන සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු පිළිබඳ සමාලෝචනයක් කිරීමටත් සෞඛ්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ලා මෑත දී සිදු වූ සංවර්ධකයන් ගැන පුනරාවබෝධයක් ලබා ගැනීමටත් හැකි විය. සෞඛ්‍ය අධ්‍යාපන උප අංශය ආරම්භ කිරීමෙන් පසු ප්‍රථමවරට ජ්‍යෙෂ්ඨ පරිපාලක සෞඛ්‍ය පරිපාලක වරුන් (ප්‍රාදේශීය) හා සෞඛ්‍ය ශික්ෂකවරුන් එකමුතුව පොල්ගොල්ලේ සමුපකාර අභ්‍යාස විද්‍යාලයේ දී පවත්වන ලද සෞඛ්‍ය අධ්‍යාපන සංස්කරන පාඨමාර්ගය හදාරන ලදි. මෙම පුහුණුව නිසා ක්ෂේත්‍රයෙහි සේවය කරන මහජන සෞඛ්‍ය නිලධාරීන්ට සෞඛ්‍ය අධ්‍යාපනයන් දිය යුතු උපදෙස් හා මග පෙන්වීම නිසි ලෙස කෙරෙනු ඇතැයි අපෙක්ෂා කෙරේ.

ජාතික මට්ටමෙහි ලා කෙරෙන ප්‍රජා සංවර්ධන වැඩ සටහනෙහි සීඝ්‍ර දියුණුවක් වර්ෂය තුළ දී දක්නා ලදි. ස්වෙච්ඡාවෙන් වැඩ කිරීම පිළිබඳව ඇති වූ ඉමහත් උද්‍යෝගයක් විශේෂයෙන් තරුණ පිරිස අතර දක්නා ලදි. විශේෂයෙන් ම මෙම උද්‍යෝගය දක්නා ලද්දේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ජාතික ප්‍රතිශක්ති කරන ව්‍යාපාරය මෙහෙයවන ලද අවස්ථාවේ දීය. මෙම ව්‍යාපාරයේ දී තරුණ තරුණී

යන් 1,00,000ක් පමණ ඊට සහභාගි වී ළමයින්ගේ සංඛ්‍යා ලේඛන සකස් කිරීම, වාර්තා පිළියෙල කිරීම, ප්‍රතිශක්ති කරණ මධ්‍යස්ථාන බාරව සිටීම සහ සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රචාරක වැඩ කිරීම යන ආදි පිළිවලක් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහාය වූහ. මෙම ජාතික ව්‍යාපාරය සාර්ථක කර ගැනීමේ දී මෙම ස්වේච්ඡා සේවක යන්ගෙන් ලැබුණු සහයෝගය සුළුපටු නොවීය.

මහජනයා විසින් ම සංවිධානය කරන ලද වෙනත් ක්ෂේත්‍රයන්ට අයත් වැඩ කඳවුරුවලටද ස්වෙච්ඡා සේවකයින් ඉතා උනන්දුවෙන් සහභාගි වී වැසිකිළි ගොඩ නැගීමේ සමූහ වැඩ සටහන්, කුඩා මාර්ග ඉදිකිරීම්, කුඩා වාරිමාර්ග තැනීම්, වගුරු බිම් ගොඩ කිරීම් හා පිරිසිදු කිරීමේ සමූහ ව්‍යාපාරද අරඹන ලදි. බරවා රෝග මර්ධන යෙහි ලා මෙම වැඩ කඳවුරු ව්‍යාපාරය යටතේ වැලිගම නගරයේ විනි කබල්, හා පොල්කටු එකතු කිරීමත් වල් පැලැටි විනාශ කිරීමත් සාර්ථක ලෙස සිදු කෙරින.

ස්වෙච්ඡා වැඩ කඳවුර ක්‍රමය ඒකාබද්ධකර ප්‍රබල අන්දමින් ක්‍රියාත්මක කිරීමේ අරමුණ පිට දැනට අවුරුදු කීපයකට පෙර පිහිටුවන ලද ඉඩම් සංවර්ධන දෙපාර්ත මේන්තුවේ ජාතික සේවා අංශය සමග මෙම දෙපාර්තමේන්තුව ඉතා සහයෝගයෙන් කටයුතු කළේය. සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි ජාතික සේවා කමිටුවේ සාමාජිකයකු ලෙස දීමට කටයුතු කෙළේය.

ඒකාබද්ධ පාඨශාලා සෞඛ්‍ය කමිටුවේ සංවිධානය තවදුරටත් ශක්තිමත් කෙරින. පාඨශාලා සෞඛ්‍ය කටයුතු පෘථුල අන්දමින් කිරීමේ පරමාර්ථයෙන් තම ප්‍රදේශයට අයත් පාසල් දෙක බැගින් හෝ ඒකාබද්ධ පාඨශාලා සෞඛ්‍ය කමිටු පිහිටුවන ලෙස සියලුම මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්ට නියෝග කරන ලදි. සෞඛ්‍ය හා අධ්‍යාපන යන දෙපාර්තමේන්තු අතර පිහිටුවා ගත් සුහද සම්බන්ධතාවය තවදුරටත් ලංකර මින් ප්‍රාදේශිය හා ජාතික ඒකාබද්ධ පාඨශාලා සෞඛ්‍ය කමිටු වර්ෂය තුළ දී ඉතා සාර්ථක අන්දමින් පවත්වා ගෙන යන ලදි. දිවයින පුරා පිහිටි ගුරු අභ්‍යාස විද්‍යාලවල ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩ සටහන් ඉතා සාර්ථක අයුරින් පවත්වා ගෙන යන ලදි.

සේවක මණ්ඩලය

2. සෞඛ්‍ය අධ්‍යාපන අංශයේ සේවක මණ්ඩලයේ වෙනසක් සිදු නොවී ය.

ඉඩකඩ

3. පැරණි වික්ටෝරියා ඇස් රෝහලෙහි පිහිටුවන ලද සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ නිෂ්පාදනාගාරයට වැඩි ඉඩ පහසුකම් ලැබිණ. බෝවිහවුස්හි පිහිටි පුස්තකාලය එම ඉඩමේ ම පිහිටි වෙනත් ගොඩනැගිල්ලකට ගෙනයන ලදි.

උපකරණ

4. ඇමෙරිකානු රුපියල් අරමුදලෙන් ලබාදුන් මුදල් වලින් සිනමා උපකරණ පෝස්ටර් පුවරු හා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ වැනි වැදගත් උපකරණ රාශියක් මිලයට ගත හැකි විය.

කරන ලද වැඩ පාරිසරික සෞඛ්‍ය ඒකක ක්‍රමය

5. සෞඛ්‍ය අධ්‍යාපන අංශයේ පාඨමාර්ගවලට සහභාගිවූ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්ගේ සහාය ඇති ව පාරිසරික සෞඛ්‍ය ඒකක ක්‍රමය පිළිබඳ සමාලෝචනයක් අරඹන ලදි. මෙම අධ්‍යයනයේ දී ඒකක ක්‍රමය යටතේ ලැබිය හැකි ප්‍රගතිය සෑම ප්‍රදේශයේ ම ඒකාකාර නොවන බැව් අනාවරනය විය. පාරිසරික සෞඛ්‍යය යටතේ ලැබෙන ප්‍රතිඵල ද ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් විය. මෙම ප්‍රතිඵල මෙසේ වෙනස් වීමට හේතු වූයේ ඔවුන්ගේ දිළිඳුකම, නියම නායකත්වයක් නොමැති වීම හා ප්‍රජා සංවිධාන නොමැති වීම නිසා බැව් දක්නා ලදි. ලබන වසරේ දී ඒකක ක්‍රමය යටතේ ප්‍රජා සංවිධාන කටයුතු දියුණු කිරීමට යෝජනා කර ඇත.

සාර්ථක ලෙස සකස් වූ ප්‍රජා සංවර්ධන වැඩ සටහනක් සමග ඒකක ක්‍රම එක් කිරීමෙන් මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි විප්ලවයක් ඇති කළ හැකි බැව් පිළිගෙන තිබේ. ඒකක ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග දැනට මත් සහයෝගීව කටයුතු කරනු ලැබේ. ප්‍රජා සංවර්ධන කාර්යයෙහි නිරතවූ සෑම දෙපාර්තමේන්තුවක් විසින් ගනු ලබන උත්සාහයක් තනි ඒකකයකට යොමු කර කිසියම් සැලැස්මකට අනුව වැඩ කිරීම ඉතාමත් ම ඵලදායි වන බැව් අවබෝධ වී ඇත. මෙම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිය තීරණයක් ගැනීම සඳහා දැනටමත් ක්‍රියා කර ඇත. ඒකක ක්‍රමය වැඩ කිරීමෙන් පහත දැක්වෙන වාසි සැලසෙන බැව් හැඟී ගොස් ඇත:—

(i) ප්‍රජා සංවිධානය යනුවෙන් අදහස් කරනුයේ ප්‍රජාවට අයත් සෑම අංශයක් ම සංවර්ධනය කිරීම බැවින් නා නා විෂයන් භාර සෑම ක්ෂේත්‍ර නිලධාරියකුට ම එකමුතුව වැඩ කිරීමට ඉඩ ලැබීම.

(ii) නා නා දෙපාර්තමේන්තුවලට අයත් සේවකයන්, මුදල් හා පහසුකම් වඩා සාර්ථක අයුරින් ප්‍රයෝජනයට ගත හැකිය. උදාහරණයක් වශයෙන් කෘෂිකර්ම සංවර්ධනයෙහි ලා මිශ්‍ර පෝර සකස් කිරීමෙන් කසල බැහැර කිරීම වඩාම ප්‍රයෝජනවත් කාර්යයක් ලෙස කළ හැකි ය. වෙනත් ආකාර යකින් බැලුවහොත් පෝෂ්‍යදායි එළවළු හා පළතුරු වර්ග සපයා දීමෙන් සෞඛ්‍ය තත්ත්වය දියුණු කිරීමට ආධාර වෙයි. නා නා දෙපාර්තමේන්තු වලට අයත් කටයුතු ද ඒකාබද්ධ කිරීමෙන් වෙනත් ක්ෂේත්‍රයන්හි කටයුතු ද එකමුතු කළ හැකි බැව් මෙහිලා සඳහන් කළ යුතු ය.

(iii) එකිනෙකට බැඳී ඇති ප්‍රජා ප්‍රශ්න විසඳීමේ දී නා නා දෙපාර්තමේන්තු මගින් ක්‍රියා කරන විට ඒවා මැනැවින් ඒකාබද්ධ නොකළහොත් දෙ පැත්තකින් ගනු ලබන උත්සාහයන් ප්‍රයෝජන රහිතව අපතේ යාමට ඉඩ ඇත. ප්‍රජා සංවර්ධන කටයුතු වලදී ඒකක ක්‍රමය යටතේ දෙපාර්ත මේන්තු මගින් ගනු ලබන විධි විධානයන් මැනැවින් ඒකාබද්ධ කිරීමට ඉඩ සැලසේ.

(iv) නා නා විෂයයන්හි ව්‍යාප්තව කටයුතු කරණ රජයේ නිලධාරීන්ට නා නා මට්ටමින් කළ යුතු ප්‍රජා සංවිධාන වැඩ ඇත. කවර කටයුත්තක් හෝ වේවා මනා සංවිධානයකින් යුත් ප්‍රජාවක් විසින් මෙහෙයවනු ලබන විට එම කටයුතු තව දුරටත් සාර්ථක කර ගැනීමට ඉඩ සැලසේ. දෙපාර්ත මේන්තු මගින් මෙහෙයවනු ලබන ග්‍රාමීය සංවිධාන වැඩිවීමෙන් ගැමි ජනතාව අතර විරුද්ධවාදිකම් හා අසමගිකම් මතුවීමට ඉඩ ඇති බැව් මෙහි දී සඳහන් කළ යුතු ය. තවද විශේෂිත පරමාර්ථයන් පිට නොයෙක් සංවිධාන ඇති කිරීමේ දී මහ ජනයා නොමග යාමට ඉඩ ඇත. පර්මාර්ථ රාශියක් මුදුන් පමුණුවා ගැනීම සඳහා සංවිධාන කීපයක් ඇති කිරීමෙන් එම සංවිධාන වඩාත් ශක්තිමත් වීමට ඉඩ තිබේ.

(v) නොයෙක් දෙපාර්තමේන්තුවලට අයත් ක්ෂේත්‍ර නිලධාරීන්ට විශාල ප්‍රදේශ භාරව කටයුතු කිරීමට සිදු වී ඇත. උදාහරණයක් වශයෙන් දක්වතොත් කෘෂිකර්ම උපදේශක වරයාට හෝ ග්‍රාම සංවර්ධන නිලධාරි වරයාට මහ ජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්ගේ කොට්ඨාශ තුනකටත් පහකටත් අතර ඇති විශාල ප්‍රදේශයක් භාරව කටයුතු කිරීමට සිදු වේ. එහෙයින් සිය ප්‍රදේශයේ කටයුතු මනා සංවිධානයකින් යුක්තව ප්‍රබල අන්දමින් කරගෙන යාමට ප්‍රදේශයේ විශාලත්වය නිසා ඔවුන්ට නොහැකි වේ. ඒකක ක්‍රමය අනුගමනය කිරීමෙන් භාරව ඇති කාර්යය වඩා පහසුවෙන් වඩා පලදායි අන්දමිනුත් කිරීමට ඉඩ සැලසේ.

ශ්‍රමදාන වැඩ කටයුතු

ශ්‍රමදාන වැඩ කඳවුරු මගින් මහජන සෞඛ්‍ය කටයුතු මෙහෙය වීමේ දී විශාල උනන්දුවක් හා කැමැත්තක් දක්වනු ලැබේ. ස්වේච්ඡා කටයුතු දැන් හඳුන්වනු ලබන්නේ මේ නමිනි. ඒකක ක්‍රමය අනුව පාරිසරික සෞඛ්‍ය යටතේ වැසිකිළි තැනීමේ සමූහ ව්‍යාපාර මෙහෙය වීමේ දී මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් විසින් වැඩ කඳවුරු ක්‍රමය උපයෝගි කරගනු ලැබිය. වව්නියාව දිස්ත්‍රික්කයේ කුඩා ළමුන්ගේ වැසිකිළි තැනීමේ වැඩ සටහන් මෙම වැඩ කඳවුරු ක්‍රමය යටතේ මෙහෙය වනු ලැබූ බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය. පිරිසිදු කිරීමේ සමූහ ව්‍යාපාරවල දී හා ගෙවතු පිළියෙල කිරීමේ ව්‍යාපාරවල දී ද මෙම වැඩ කඳවුරු ක්‍රමය ඉතාමත් පුළුල් අන්දමින් උපයෝගි කර ගන්නා ලදි.

ශ්‍රමදාන අරමුණ ක්ෂේත්‍රයට පමණක් සීමා නොවී වෛද්‍යායතන වලට ද ඇතුලු විය. ආරෝග්‍යශාලා භූමි වලට ද ඇතුලු විය. ආරෝග්‍යශාලා භූමි පිරිසිදු කිරීම රෝහල් වතු පිළියෙල කිරීම, රෝහල් ඇඳන් පිරිසිදු කිරීම හා ඒවායේ තීන්ත ගෑම යනාදි කටයුතු කිරීම ස්වේච්ඡා සේවකයන් විසින් කරන ලදි.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජාතික සේවා අංශය සමඟ එකමුතු වී මැනැවින් සංවිධානය කරණ ලද විශේෂිත ශ්‍රමදාන ව්‍යාපාර ඇරඹීමට යෝජනා කර ඇත.

ශ්‍රමදාන වැඩ ක්‍රමය දැන් තහවුරු වී ඇත. ජාතික පෝලියෝ ප්‍රතිශක්ති කරණ ව්‍යාපාරයේ දී ස්වේච්ඡා, සේවකයින් ලක්ෂයක් පමණ ඊට සහභාගි වීමෙන්, මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීමත්, වර්ධනය කිරීමේත් මෙම ක්‍රමය මගින් කළ හැකි බැව් මැනැවින් ප්‍රදර්ශනය කරණ ලදි.

ජාතික පෝලියෝ ප්‍රතිශක්ති කරණ ව්‍යාපාරය

සේබින් දොස්තර මහතාගේ උපදෙස් පිට පෝලියෝ නාශක ජාතික ප්‍රතිශක්ති කරණ ව්‍යාපාරයක් මෙහෙයවිය යුතු යයි රජය විසින් තීරණය කරණ ලදි. මහජන සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයාගේ සභාපතිත්වය හා වසංගත රෝග පිළිබඳ සහකාර අධ්‍යක්ෂ, දෙපාර්තමේන්තු වසංගත රෝග විද්‍යාඥ, සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි හා වෛද්‍ය සංඛ්‍යා ලේඛන නිලධාරිගේ සහභාගිත්වය ද ඇතුව පවත්වන ලද මූලික රැස්වීමේ දී දිවයින පුරා සිටින තුන් මසටත් අවුරුදු අටටත් අතර වයස් සීමාවේ ළමුන් ප්‍රතිශක්ති කරණය කිරීම සඳහා දීප ව්‍යාප්ත ප්‍රතිශක්ති කරණ ව්‍යාපාරයක් මෙහෙයවිය යුතු යයි තීරණය කරන ලදි. මෙම ජාතික ව්‍යාපාරය සතියේ සිට දින දහය දක්වා කාලයකට සීමා විය යුතු යයි තීරණය කරන ලදි. මෙම ව්‍යාපාරයේ මුල් වටය 1963 මැයි මාසයේ දීත් දෙවැනි වටය ජූලි මාසයේ දීත් නිම කිරීමට තීරණය කෙරින. මැනැවින් සංවිධානය කළ සෞඛ්‍ය අධ්‍යාපන ව්‍යාපාරයක අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු වූ කළ අතර හැකි පමණ ස්වේච්ඡා සේවකයන් බඳවා ගැනීමට ද තීරණය කරන ලදි.

සෞඛ්‍ය අධ්‍යාපන ව්‍යාපාරය

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරයාගේ සභාපතිත්වයෙන් කොළඹ දී පවත්වන ලද දිවයින පුරා සිටින සෞඛ්‍ය ශික්ෂක වරුන්ගේ සම්මේලනයක දී විස්තරාත්මක සෞඛ්‍ය අධ්‍යාපන සැලැස්මක් සකස් කරණ ලදි. මෙම සැලැස්ම අනුව මුළු ව්‍යාපාර යට ඡන්ද ව්‍යාපාරයක් ලෙස සංවිධානය කර පාඨශාලා, ප්‍රජාමණ්ඩල, විහාරස්ථාන, දේවස්ථාන, හා වෙනත් මහජන ගොඩනැගිලි වල ප්‍රතිශක්ති කරණ මධ්‍යස්ථාන පිහිටුවිය යුතු විය. මෙම ව්‍යාපාරයේ අරමුණ වූයේ එන්නත මහජනයා වෙත ගෙණ යාම විනා එන්නත තිබෙන තැනට මහජනයා ගෙන්වා ගැනීම නොවීය. එහෙයින් ප්‍රතිශක්ති කරණ ව්‍යාපාරයේ සාර්ථක භාවය මහජනයාගෙන් ලැබෙන සහාය හා සහයෝගය මත පමණක් රඳා පවත්නා බව අවධාරනය කරණ ලදි. තවද ප්‍රධාන කාර්යාලය මගින් සියලුම ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ පත්‍රිකා, පෝස්ටර, දැන්වීම් හා

ප්‍රදර්ශන භාණ්ඩ යනාදිය ලබා දීමටත්, ගුවන් විදුලි හා ප්‍රවෘත්ති පත්‍ර නිවේදන ප්‍රචාරය කිරීමටත් තීරණය කරණ ලදී. ප්‍රතිශක්ති කරණ ව්‍යාපාරයේ දී මහජන සෞඛ්‍ය නිලධාරීන්ට සියලුම දෙපාර්තමේන්තුවලට අයත් නිලධාරීන්ගේ සහාය ලබා ගනු පිණිස රජයේ වෙනත් සියලුම දෙපාර්තමේන්තුවලත් ජාතික සංවිධාන වලත් සහයෝගය බලාපොරොත්තු විය. තවද ජාතික ප්‍රතිශක්තිකරණ ව්‍යාපාරයේ පළමු වටය 1963 මැයි මස 20 ද ආරම්භ කිරීමටත් තීරණය කරණ ලදී.

යෝජනා ක්‍රමය කොට්ඨාශවල ක්‍රියාත්මක කිරීම

ජාතික ප්‍රතිශක්තිකරණ ව්‍යාපාරය පිළිබඳ විස්තරත් එමගින් ගතයුතු ක්‍රියා මාර්ග යනුත් කෙබඳු විය යුතු දැයි සෞඛ්‍ය සේවා අධිකාරීන් විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, ආයතන භාර වෛද්‍ය නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, ඇපෝතිකරිවරුන් මහජන සෞඛ්‍ය හෙදියන් හා මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන් සමග සාකච්ඡා කරන ලදී. සියලුම තරාතිරම් වලට අයත් සේවක සේවිකාවනට මේ ව්‍යාපාරය පිළිබඳවත්, එහි දී කළ යුතු වැඩ පිළිබඳවත් පැහැදිලි අවබෝධයක් ලබා දෙන ලදී.

මෙවැනි සාකච්ඡා වෙනත් දෙපාර්තමේන්තුවලට හා ස්වේච්ඡා සංවිධානවලට අයත් නිලධාරීන්, සමඟ ද පැවැත්විය. මෙම ජාතික ව්‍යාපාරයේ දී සියලුම රජයේ දෙපාර්තමේන්තුත් ස්වෙච්ඡා සංවිධානත් ඉතාමත් උනන්දුවෙන් ඊට සහභාගි වී කටයුතු කරනු දැක්ම සතුටට කරුණකි.

ස්වෙච්ඡා සේවකයන්

ව්‍යාපාරයේ කොඳු ඇටය වූ ස්වෙච්ඡා සේවකයන් බඳවා ගැනීම කරන ලද්දේ සෞඛ්‍ය ශික්ෂකයන්, මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරීන් හා ස්වෙච්ඡා සංවිධාන වල ඒකාබද්ධ උත්සාහයෙනි. දසදහසක් පමණ ජනගහනයකින් යුත් එක් එක් කොට්ඨාසවල සේවය කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 800 දෙනෙක් ලංකා වේ සිටිති. ප්‍රතිශක්ති කරණ ව්‍යාපාරය මෙහෙයවීම සඳහා මෙම එක් එක් කොට්ඨාශය ජනගහනයෙන් දහසක් පමණ සිටින සේ කොටස් 7වත් 10වත් අතර ගණනකට නැවත බෙදනු ලැබී ය. එක් ඒකකයක් මාස 3වත් අවුරුදු 8වත් අතර වයසේ සිටින ළමුන්ගේ ගණන 100වත් 300වත් අතර සංඛ්‍යාවක් වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. ස්වෙච්ඡා සේවකයන් බඳවා ගනු ලැබුයේ ඒකකයකට 5ත්, 10ත් අතර සංඛ්‍යාවක් සිටින සේ ය. මේ අනුව ස්වෙච්ඡා සේවකයන් 50,000 වනු ඇතැයි අපේක්ෂා කෙරින. ස්වෙච්ඡා සේවකයන් ගෙන් මෙහි දී ලත් උනන්දුව කොතරම් විශාල වීද යත් ඇතැම් ස්ථානවලදී ස්වේච්ඡා සේවකයන් බොහෝ දෙනෙක් ආපසු යැවීමටත් බඳවා ගැනීමේ දී සුදුසුකම් නියම කිරීමටත් සිදු විය. මුල් අවස්ථාවේ දී ස්වෙච්ඡා සේවකයින් 100,000 දෙනෙකුටත් වඩා ඉදිරිපත් වූහ.

පාඨශාලා, ග්‍රාමසංවර්ධන සමිති, මහිලා සමිති, ප්‍රජා මණ්ඩල, තරුණ ගොවි සමාජ, බාලදක්ෂයින්, බාල දක්ෂිකාවන්, හා වෙනත් ස්වෙච්ඡා සංවිධාන හා වෘත්තීය කණ්ඩායම් අතුරින් ස්වෙච්ඡා සේවකයින් බඳවා ගනු ලැබිය. අඳුනා ගැනීමේ පහසුව සඳහා එක් එක් ස්වෙච්ඡා සේවකයාට පදක්කම බැගින් ප්‍රදානය කරන ලදී.

ස්වෙච්ඡා සේවකයන් පුහුණුකිරීම

පුහුණුව හා මගපෙන්වීම සඳහා පහසු මධ්‍යස්ථාන මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් විසින් පිළියෙල කරන ලද බොහෝ අවස්ථාවන්හි දී පාඨශාලා, ග්‍රාම සංවර්ධන සමිති ශාලා, ප්‍රජා මණ්ඩල, පන්සල්, දේවස්ථාන හා ප්‍රජා ශාලා පුහුණු කිරීමේ මධ්‍යස්ථාන ලෙස යොදා ගනු ලැබිය. පුහුණු කරවීමේ විෂයයන් වශයෙන් පෝලියෝ රෝගය පැතිරීම, වළක්වාගැනීම හා ප්‍රතිකාරයන්, මහජනයා හමුවිය යුතු

ආකාරයන්, සංඛ්‍යා ලේඛන පිළියෙල කිරීමත්, ප්‍රතිශක්ති කරණ මධ්‍යස්ථාන සංවිධානය කිරීම හා පවත්වාගෙන යාමත් ඇතුළත් කරන ලදි. එන්නත කුඩා ළමුන්ට දිය යුතු අන්දම ද්‍රාවනයකට හෝ උණුකර නිවාගත් ජලයට එන්නත් බිංදු දෙකක් දමා දීම, අවුරුදු දෙකකට වඩා අඩු වයස් ළමුන්ට සිත් ද්‍රාවනයට එන්නත දමා දීම හා වයස අවුරුදු දෙකට වැඩි ළමුන්ට ජෑම් විස්කෝත්තුවකට එන්නත දමා ඒවා කැවීම ප්‍රදර්ශනය කර පෙන්වන ලදි.

මෙම කෙටි පුහුණුවේ දී ඔවුනොවුන් විසින් ඉටුකළ යුතු වගකීම් පිළිබඳ නිරවුල් උපදෙස් දෙන ලදී.

සංඛ්‍යා ලේඛන ගැනීම නියමිත දිනටත් කලින් නිම කෙරිනි. බොහෝ කොට්ඨාශ විසින් 1963 මැයි 20 වැනිදාට ජාතික ව්‍යාපාරය ඇරඹීම සඳහා අවශ්‍ය විධි විධාන මැයි මාසයේ පළමු සතියේ දී ම අවසන් කර තිබුණි.

පෝලියෝ එන්නත

මාස 3ත් අවුරුදු 8ත් අතර වයසේ සිටින ළමයින් ගේ මුළු සංඛ්‍යාව 26,00,000ක් යයි ඇස්තමේන්තු කරන ලදින්, එන්නත් වේල් 25 ලක්ෂයක් ලබාගැනීමට තීරණය කරන ලදි. සෝවියට් සමාජ වාදි සමූහ ආණ්ඩුවෙන් මිල දී ගනු ලැබූ සේබින් වර්ගයේ පෝලියෝ එන්නත ත්‍රිත්ව ක්‍රියාකාරි සජීව පෝලියෝ වයිරස්වලින් යුත් ද්‍රාවනයකි. තවද මෙම එන්නත මැග්නීසියම් ක්ලෝරයිඩ් වල ස්ථාවර කරන ලද්දකි. උෂ්ණත්වය අංශක 22 සි (72ඇප්) සිට 31සි (88ඇප්) දක්වා සකස්වන දේශ ගුණයක් පවත්නා ලංකාවේ භාවිතය සඳහා මැග්නීසියම් ක්ලෝරයිඩ්වල ස්ථාවර කරන ලද මෙම එන්නත ඉතාමත් ම යෝග්‍ය බැව් පිළිගෙන ඇත. තවද සීතාකරණය අපහසු ගම්බද පළාත්වලට මෙම එන්නත් ගෙන ගොස් ගබඩා කර තබා ගැනීමට පහසු යි. මෙම එන්නත ඉතාමත් ම ආරක්ෂා සහිතවනවා පමණක් නොව එය දීමට නුසුදුසු අය ද නැත. තවද එය දීමෙන් අතුරු අනතුරු ද ඇති නොවේ. මාස 3ටත් අවුරුදු 8ටත් අතර වයසේ සිටින සියලුම ළමයින්ට මෙම එන්නත දීමට නියම වූ අතර, අවශ්‍ය ප්‍රතිශක්තිය ලබා ගැනීම සඳහා දිය යුත්තේ එන්නත් වේල් දෙකක් පමණකි. එක් වේලක් සඳහා එන්නත් බිංදු දෙකක් දීම ප්‍රමාණවත් යැයි තීරණය විය.

එන්නත් දීමේ ක්‍රමය

ඉහත සඳහන් කළ පරිදි අවුරුදු දෙකකට අඩු වයසේ සිටි ළමුන්ට සීනි හෝ ජලය සමග දීමටත් අවුරුදු දෙකකට වැඩි වයසේ සිටි ළමුන්ට ජෑම් විස්කෝත්තු සමග දීමටත් තීරණය කරන ලදී. එන්නත ජෑම් විස්කෝත්තු වලට දමා දීම අළුත් අදහසකි. ජෑම් විස්කෝත්තුවක් වට ප්‍රමාණයෙන් අඟලක් පමණ වේ. එන්නත විස්කෝත්තුවට වත්කළ විට එය ඊට මැනවින් උරා ගන්නා අතර එහි රසයට ද හානියක් සිදු නොවේ. මෙම විස්කෝතු දේශීය විස්කෝතු නිෂ්පාදක සමාගමකින් සකස් කර ජාතික පෝලියෝ එන්නත් ව්‍යාපාරයට පරිත්‍යාග කරන ලදි. මෙම සමාගම මගින් වාර දෙක සඳහාම අවශ්‍ය වූ විස්කෝතු පනස් ලක්ෂයක් පමණ පරිත්‍යාග කරන ලදි.

එන්නත බෙදා හැරීම

එන්නත ගබඩා කර තැබීමේත් බෙදාහැරීමේත් ප්‍රධාන ස්ථානය වූයේ වෛද්‍ය පර්යේෂණායතනයයි. පළාත් බදව එම කටයුත්ත මෙහෙය වනු ලැබූයේ සෞඛ්‍ය සේවා අධිකාරීන් විසිනි. ප්‍රාදේශීය වශයෙන් එන්නත බෙදාහරිනු ලැබූයේ ඒ පිළිබඳ සංඛ්‍යා ලේඛන පිළියෙල කළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් හා සෞඛ්‍ය කාර්යාලයාධිපතිවරුන් විසිනි. ඔවුන් විසින් ඇති පමණ එන්නත ඒ ඒ මධ්‍යස්ථානවලට

සැලීමට විධි විධාන සොදන ලදි. මධ්‍යස්ථානවලට බෙදා දුන් එන්නත් ප්‍රමාණය අවසන් වූ විට බෙදා දීම සඳහා අමතර එන්නත් ප්‍රමාණයක් සෞඛ්‍ය සේවා අධිකාරීන් වෙත තබා ගන්නා ලදි. කොළඹ සිට පළාත්බඳ ස්ථානවලට එන්නත වහා ගෙනයාම සඳහා විධි විධාන සොදන ලදි.

සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රචාරක ව්‍යාපාරය

1963 අප්‍රේල් මාසයේ දී ඇරඹුන සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රචාරක ව්‍යාපාරය මැයි මාසයේ දී වඩාත් ප්‍රබල කරන ලදි. අධ්‍යාපන වැඩ සටහනින් අවසාන කොටස නිම වන ලද්දේ ජාතික ව්‍යාපාරය ඇරඹෙන සතිය වන මැයි 13-20වත් සතියකට කලිනි. වැඩ සටහනට විහාරස්ථාන හා දේවස්ථානවල පැවැත්වූ ආගම් වත්පිළිවෙත් පැවැත් වීම දිවයිනේ ඇති සියලුම ප්‍රවෘත්ති පත්‍රවල සිංහල, දෙමල, හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන් අතිරේක පළ කිරීම, හා විශේෂඥ වෛද්‍යවරුන් විසින් පවත්වන ලද ගුවන් විදුලි කථා, සාකච්ඡා පැවැත්වීමද ඇතුළත් විය. ජාතික ව්‍යාපාරයේ නා නා අංශ විදහා දැක්වෙන අන්දමේ පෙරහර දිවයිනේ නා නා ප්‍රදේශවල පැවැත්වන දිවයිනේ සෑම ප්‍රදේශයකට ම පත්‍රිකා, නිවේදන හා පෝස්ටර් වැනි ශ්‍රව්‍ය දෘශ්‍ය උප කරණ ලක්ෂ ගණනින් සපයා දෙන ලදි. විශේෂයෙන් නිෂ්පාදිත සිනමා චිත්‍රවිදක යන් සිනමා හල්වල පවත්වන ලදි. 1963 මැයි මස 19 වැනි දිනට මහජනයා ප්‍රතිශක්තිකරන ව්‍යාපාරය සඳහා සූදානම් ව සිටියහ. කොළඹ නගරයේ ප්‍රතිශක්ති කරන ව්‍යාපාරය ඇරඹුණේ මැයි මස 19 වැනි දා ය.

මෙම මහා අධ්‍යාපන ව්‍යාපාරයේ දී සෞඛ්‍ය අධ්‍යාපන උප අංශයේ ප්‍රධාන කාර්යාලයේ වැඩ වලට ස්වේච්ඡා සේවකයන්ගේ ආධාරය ද ලැබිණ. හතලිස් ලක්ෂයක් පමණ වූ රෝස හා කහපාට කාඩ්පත් හා පත්‍රිකා බෙදාහැරීම සඳහා ඒවා මිටි බැඳීමේ කාර්යයේ ස්වේච්ඡා සේවකයින් 200ක් පමණ සහභාගි වූයෙන් උදය සිට සවස දක්වා එක් දිනක් වැඩ කිරීමෙන් එක් සති අන්තයකදීම නිම කළ හැකි විය. අධ්‍යාපන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා ද රජයේ දෙපාර්තමේන්තු රාශියක් හා සෙවච්ඡා සංවිධාන රාශියක් සහභාගි වූහ.

ජාතික ප්‍රතිශක්තිකරණ ව්‍යාපාරය

1963 මැයි මස 20 වැනි දා විහාරස්ථාන හා දේවස්ථානවල කළ ඝණ්ඨා නාදයෙන් හා ආගමික උත්සවවලත් ජාතික ප්‍රතිශක්ති කරණ ව්‍යාපාරය ඇරඹිය. ලකිසුරු උතුමාණන් වහන්සේත් ගරු අගමැති තුමියත් විසින් විශේෂ පණිවුඩ, එවා තිබුන අතර ගරු සෞඛ්‍ය ඇමැති තුමා විසින් ජාතික ගුවන් විදුලි සේවා මගින් ජාතිය අමතා කථා කරමින් ව්‍යාපාරය විවෘත කරන ලදි. මේ ව්‍යාපාරයේ දී මුහුණ දීමට සිදු වූ එකම බාධකය වූයේ ඇතැම් පළාත් බඳව පැවති අයහපත් කාල ගුණයයි. උදාහරණයක් වශයෙන් දක්වතොත් ගාලු ප්‍රදේශයේ පැවැති මහ ජලගැල්ම නිසා ව්‍යාපාරය නැවැත්වීමට සිදු විය. ළමා සිය මව් පියන් ද කැවුව ප්‍රතිශක්තිකරණ මධ්‍යස්ථාන කරා සමූහ වශයෙන් පැමිණ ජෑම් විස්කෝතු අනුභව කළහ. ජාතික ව්‍යාපාරය බොහෝ ප්‍රදේශවල මැයි මස 27 වැනිදායින් නිමවන විට ළමයින් විසි ලක්ෂයකට පමණ එන්නත ලබා දී තිබුණ. එන්නත ලැබූ මුළු ගණන 19,19,292 තෙක් වූ අතර එය මුළු ළමා සංඛ්‍යාවෙන් 82.6% ක් විය.

ව්‍යාපාරයේ දෙවැනි වටය

එන්නත් ව්‍යාපාරයේ දෙවැනි වටය පළමු වටය අවසන් වී දෙමසකට පසු එනම් 1963 ජූලි මස 15 වැනිදා ආරම්භමට තීරණය කරන ලදි. මෙම ව්‍යාපාරයේ දී පළමු වාරයේ එන්නත් ගත් මාස 3 සිට අවුරුදු 8 දක්වා වයස් සීමාවට අයත් ළමුන්ට ආරක්ෂක එන්නත් වේලක් දෙන ලදි.

ව්‍යාපාරය පටන් ගැනීමට සතියකට පළමු මුල්වාරයේ දී මෙන්ම මහා අධ්‍යාපන වැඩ සටහන ඉතා ප්‍රබල අන්දමින් මෙහෙයවන ලදි.

මෙම අවස්ථාවේ දී මුල් වතාවේ මුහුණ දීමට සිදු නොවූ ඇතැම් ප්‍රශ්න වලට මුහුණ පෑමට දෙපාර්තමේන්තුවට සිදු විය. මුල් අවස්ථාවේ දී ළමයින්ට ලබාදීමට උනන්දුව තරම් උනන්දුවක් දෙවැනි වාරයේ දී එන්නත ලබා දීම සඳහා මහජනයා උනන්දු නොවූවා බැව් පෙනින. ඇතැම් පළාත්වල ඇතිවූ සුළු උණ රෝග හා පාචන රෝග මෙම එන්නත නිසා සිදු වූවාසේ සිතා ගත්හ. මෙම සැකය මගහැරවීම සඳහා අවශ්‍ය තරම් ප්‍රචාරක විධි විධාන යොදන ලදි. මේ වැඩ පිළිවෙල සාර්ථක විය. කෙසේ හෝ වේවා සෙවිකා සේවකයින් මහ බරක් කරට ගනිමින් අධ්‍යාපන හා ප්‍රචාරක ව්‍යාපාරයෙහි මෙහෙයවීමේ ප්‍රතිඵලයක් වශයෙන් එය සාර්ථක කර ගැනීමට හැකි විය.

ඒකාබද්ධ ජාතික පාඨශාලා සෞඛ්‍ය කමිටුව

ජාතික ඒකාබද්ධ පාඨශාලා සෞඛ්‍ය සභාවත් පාඨශාලා, ප්‍රාදේශීය හා කොට්ඨාශ යන ආදි පිළිවෙලින් සංවිධානය කර ඇති ඒකාබද්ධ කමිටුත් සෞඛ්‍ය හා අධ්‍යාපන යන දෙපාර්තමේන්තු දෙක අතර පවත්නා සහයෝගය තවදුරටත් තහවුරු කරමින් දියුණුවෙන් දියුණුවට පත්විය.

ජාතික පාඨශාලා සෞඛ්‍ය සභාවේ රැස්වීම මාස් පතා පැවැත්විය. එමගින් ගනු ලැබූ වැදගත් විධි විධානයන් පහත පළවේ:—

(i) **පාඨශාලා දන්ත චිකිත්සාගාර.**—දන්ත චිකිත්සාගාර පිහිටු වීම හා පරිපාලනය පිළිබඳ ප්‍රශ්නත් එමගින් ලබා ඇති ප්‍රගතියත් මාසික රැස්වීම් වල දී ජාතික කමිටුව මගින් සමාලෝචනය කරන ලදි.

(ii) **පාසල් ගුරුවරුන්ගේ ඇක්ස්රේ රූප ගැනීම.**—ළමයින්ගේ පමණක් නොව ශික්ෂකයින්ගේ ද යහපත සලකා අවුරුදු තුනකට වරක් සෑම ගුරුවරයකුම ඇක්ස්රේ පරීක්ෂණවලට භාජන කළ යුතු යයි ක්ෂය රෝග මර්ධන ව්‍යාපාරයේ අධිකාරිවරයා විසින් යෝජනා කරන ලදින්, එසේ කරන ලෙස ඒකාබද්ධ ජාතික පාඨශාලා සෞඛ්‍ය කමිටුව තීරණය කළා ය.

(iii) **පෝෂණය පිළිබඳ අධ්‍යාපන වැඩ සටහන.**—ඇදිහැස කිරි ව්‍යාපාරය ගැන ජාතික සෞඛ්‍ය කමිටුවේ දී නොයෙක් වර සාකච්ඡා කරන ලදි. ලංකාවේ සිසුන් ගෙන් සියයට 27ක් පමණක් ඇදිහැස කිරිවේල දිනපතා ගන්නා බැව් ඇදිහැස සංවිධානය විසින් පෙන්වා දෙන ලදි. මෙම කිරිවල ඇති පෝෂණ ගුණයත් නොමිලේ ලැබීමත් යන කරුණු සලකා බලන විට මෙම සංඛ්‍යා ඉතාමත් අසතුටුදායකය. මෙම කිරි බීම වැඩි දියුණු කිරීම සඳහා ප්‍රබල අධ්‍යාපන ව්‍යාපාරයක් ජාතික පාඨශාලා සෞඛ්‍ය කමිටුව මගින් මෙහෙයවීමට විධි විධාන යෙදූ අතර, දිවයින පුරා පිහිටි පාඨශාලාවලට බෙදා හැරීම සඳහා භාෂා තුනෙන් ම මුද්‍රිත දර්ශනීය පෝස්ටරයක් ඇදිහැස සංවිධානය මගින් සපයා දෙන ලදී. ලබන වර්ෂයේ දී ජංගම සෞඛ්‍ය අධ්‍යාපන රථයක් යෙදීමට ද විධි විධාන යොදා ඇත.

(iv) **පාඨශාලා වෛද්‍ය පරීක්ෂණ.**—වෛද්‍ය පරීක්ෂණ ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීම ගැන ජාතික සෞඛ්‍ය කමිටුවේ සැලකිල්ල යොමු විය. මෙහි දී දක්නා ලැබූ එක් දුෂ්කරතායක් නම් මෙම කටයුතුවල නිරතවීමට අවශ්‍ය තරම් වෛද්‍යවරු පළාත් බඳව නොසිටීමයි. පාඨශාලා සෞඛ්‍ය ඇපෝතිකරිවරුන් බඳවා ගන්නා ලෙස ජාතික කමිටුව මතක් කරන ලද යෝජනා වක් පිළිගෙන පාඨශාලා ඇපෝතිකරිවරු බඳවා ගැනීමට ක්‍රියා කරන ලදී.

(v) **කුසගිනි නිවීමේ ව්‍යාපාරය.**—කුසගිනි නිවීමේ කමිටුව සමග සහයෝගිව රට පුරා පිහිටි පාසැල්වල කුසගිනි නිවීමේ ප්‍රබල ව්‍යාපාරයක් ජාතික පාඨශාලා සෞඛ්‍ය කමිටුව විසින් ඇරඹිණ. පාඨශාලා වතු වැවීමේ යෝජනා ක්‍රමයක් සැලසුම් කරන ලදී.

වර්ෂ 1963 සෞඛ්‍ය සති උත්සවය

සමස්ත ලංකා මහජන සෞඛ්‍ය සති උත්සවය 1963 ජූනි මස 10 වැනිදා සිට 16 වැනි දා අතර කාලයේ දී පැවැත්විය. මෙම වර්ෂය සඳහා තෝරා ගත් මාතෘකා පාඨය වූයේ "පූර්ව පාඨශාලා ළමුන්ගේ සෞඛ්‍ය" යි. මේවර සෞඛ්‍ය සති උත්සවයේ වැදගත් අංගයක් වූයේ සෑම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු ගේ කොට්ඨාසයකම මහජන කොමිටි සංවිධානය කිරීමයි. මෙම කමිටුවලට ස්වේච්ඡා සංවිධාන හා පළාත් පාලන ආයතනවලැ නියෝජිතයන් ද වෙනත් ග්‍රාමීය නායකයින් ද ඇතුළත් කර උත්සවයේ නා නා අංශ සංවිධානය කිරීමේ වගකීම් ඔවුන් වෙත පවරා දෙන ලදී. හොඳම මහජන සෞඛ්‍ය සති උත්සවය සංවිධානය කිරීම සඳහා පරිත්‍යාග කෙරෙන මයිකල් ගුණරත්න පළිහ මේවර තෙල්ලිපලෙයි සෞඛ්‍ය උත්සව සංවිධාන කමිටුවට හිමි විය. මහජන සෞඛ්‍ය සති උත්සව සංවිධානය කිරීමේ දෙවැනි ස්ථානය යාපනයේ සෞඛ්‍ය සති උත්සව කමිටුවට හිමි විය. මෙම වැඩසටහනට අධ්‍යාපන, ග්‍රාම සංවර්ධන, පළාත් පාලන, කෘෂිකර්ම යන දෙපාර්තමේන්තු ඉතා උනන්දුවෙන් සහභාගි වූහ.

මේවර සෞඛ්‍ය සති උත්සවයේ දී දක්නට ලැබුන විශේෂ කරුණක් නම්, බොහෝ සෞඛ්‍ය සති කමිටු මගින් ශ්‍රමදාන වැඩ කඳවුරු ක්‍රමය බෙහෙවින් ප්‍රයෝජනයට තැන හිමිවීමයි. පාරිසරික සෞඛ්‍ය කටයුතුවල දී මේ ක්‍රමය විශේෂයෙන් උපයෝගි කර ගෙන තිබුණි.

වෛද්‍ය ආයතනවල සෞඛ්‍ය අධ්‍යාපනය

රෝගියකු තමාගේ සෞඛ්‍යය කෙරෙහි නිසැක වශයෙන් ම සැලකිලි මත් වන්නේ ඔහු ගිලන් හලකට වීමෙන් පසුව බැව් සලකා සෞඛ්‍ය අධ්‍යාපන උප අංශය මගින් විශේෂයෙන් මාතෘ නිවාස, ග්‍රාමීය රෝහල් හා ගෘහ්‍ය රෝහල්වල ක්‍රියාත්මක වන අංග සම්පූර්ණ අධ්‍යාපන වැඩසටහනක් අරඹන ලදී. මහ රෝහල්වලට මේ ක්‍රමය ඇතුළු කිරීම ගැන වැඩි සැළකිල්ලක් නොදැක් විය. එහෙත් ඇතැම් ළය රෝහලක හා දිස්ත්‍රික් රෝහල්වල මේ ක්‍රමය සාර්ථක ලෙස ක්‍රියාත්මක විය. මෙහි මූලික පරමාර්ථය වූයේ රෝගියාගේ ප්‍රජාව කෙරෙහි යොමු කරවා සෞඛ්‍ය අධ්‍යාපනයක් ලබා දීමයි. රෝගියා රෝහලෙන් පිටව ගිය පසු ද ඔහුගේ තත්ත්වය ගැන සොයා බැලීම සඳහා ක්‍රියා කරන ලදී. විශාල රෝහල් කිපයක ද සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කරන ලදී. ළමා රෝහලේ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහනින් පිළිබඳ සම්පූර්ණ වගකීම බාර ගෙන කටයුතු කිරීම සඳහා මහජන සෞඛ්‍ය හෙදියක් 1963.12.15 වැනි දා සිට පත් කරනු ඇත. රෝගීන්ට, නිලධාරීන්ට හා අමුත්තන්ට ප්‍රයෝජනවත් අන්දමේ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහනක් ක්‍රියාත්මක කරවීම සඳහා පූර්ණ කාලීන සෞඛ්‍ය ශික්ෂකයකු පත් කිරීමට විධි විධාන යොදා ඇත.

ප්‍රාදේශීය රෝහල්වල තොරතුරු මධ්‍යස්ථාන

ප්‍රාදේශීය රෝහල්වල තොරතුරු මධ්‍යස්ථාන පිහිටුවීමේ මූලික පියවරක් වශයෙන් කොළඹ රෝහල් මණ්ඩලයත් ප්‍රාදේශීය රෝහල් පිළිබඳවත් තොරතුරු සැපයෙන පොත් පිංචයක් පිළියෙල කර දැනට මුද්‍රණයට සූදානම් කර ඇත. මෙම පොත් පිංචයන් පිළියෙල කිරීමේ අරමුණ වූයේ ඒ ඒ රෝහල්වල ඇත්තාවූ පහසුකම් පිළිබඳ මහජනයාට තොරතුරු සැපයීමය. මෙම පොත් පිංචයන්හි ආරෝග්‍යශාලා සේවාවන් විශේෂිත චිකිත්සාගාර, ප්‍රතිකාර කරන වේලාවන්, නැවතී ප්‍රතිකාර ලැබීමට අවශ්‍ය වූ විට අනුගමනය කළ යුතු පිළිවෙල හා විශේෂඥ ප්‍රතිකාර ලබා ගතයුතු පිළිවෙල ආදි දේ පිළිබඳ තොරතුරු අඩංගු වන බැවින් බොහෝ කාලයක සිට මහජනයාට නොලැබී තිබුණු අවශ්‍යතාවයක් ඉටුවනු ඇතැයි අපෙක්ෂා කෙරේ.

ඕනෑම සෞඛ්‍ය ප්‍රශ්නයක් පිළිබඳ තොරතුරු ලබාදීම සඳහා ප්‍රධාන තොරතුරු මධ්‍ය ස්ථානයක් කොළඹ ඇස් රෝහලේ පිහිටුවීමට ද යෝජනා කර ඇත.

භික්ෂූන් වහන්සේලාට සෞඛ්‍ය අධ්‍යාපනයක් දීම

1958 වර්ෂයේ දී ඇරඹූ මෙම වැඩ සටහනින් අඛණ්ඩ ප්‍රගතියක් ලබා ඇත. රත්මලානේ පිහිටි සමස්ත ලංකා පිරිවෙන් ආචාර්යවරුන් පුහුණු කිරීමේ විද්‍යාලයේ පවත්වා ගෙන ගිය අභ්‍යාස පන්තිය බාධක රහිතව පැවතින. පිරිවෙන් ආචාරියවරුන් සමත් වී ගියවිට ගම්බද පළාත්වල කෙරෙන සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන්වලට නායකත්වයක් දිය හැකිය. සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සම්මේලනය හා බෞද්ධ සම්මේලනය මෙම වැඩසටහන්වලට ඉතා උනන්දුවෙන් සහභාගිවිය. බෞද්ධ භික්ෂූන්ගේ ප්‍රධානියකු වන මඩිහේ පඤ්ඤාසීහ නායක ස්වාමි පාදයන් වහන්සේ විසින් සෞඛ්‍ය තත්ත්වය නගාසිටුවීමේ විශේෂ ප්‍රජා සංවිධායක වැඩ සටහන් කීපයක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංවිධානය කරන ලදි. වෙනත් භික්ෂූන් වහන්සේලා විසින් ද දිවයිනේ නා නා ප්‍රදේශවල සෞඛ්‍ය සංවර්ධනය සඳහා ප්‍රජා සංවිධාන යෝජනා ක්‍රම අරඹන ලදි.

වතුවල සෞඛ්‍ය අධ්‍යාපනය

කම්කරුවන්ගේ හා කායික මණ්ඩලයන්හි ප්‍රයෝජනය සඳහා බදුල්ල රත්නපුර, මාතලේ හා ගාල්ල යන දිස්ත්‍රික්කවල ඇරඹූ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදි. වර්ෂය තුළදී නව වැඩ සටහන් පස්සර වතුයායේ ද මහනුවර දිස්ත්‍රික්කයේ ඔක්වරි වතුයායේ ද ඇරඹිණ. එවැනිම වැඩසටහන් කීපයක් වීරකඩුව, මස්කෙළිය හා දොලොස්බාගේත් රත්නපුර දිස්ත්‍රික්කයේ වටපොත, දොලොස්වෙල හා පින්කන්ද යන වතුවල ද ඇරඹීම සඳහා විධි විධාන සොදන ලදී. මෙම අධ්‍යාපන වැඩ සටහනට ලංකා වැවිලිකරුවන්ගේ වතු සෞඛ්‍ය යෝජනා ක්‍රමයේ සම්පූර්ණ සහයෝගය ලැබේ.

සාගිනි නිවීමේ ව්‍යාපාරය

වැඩිවමින් පවත්නා ලෝක ජනගහණයට අවශ්‍ය පමණ ආහාර සැපයීමේ ප්‍රශ්නය වඩා පැහැදිලි අවබෝධයක් ලබා දීම් වස් පැවැත්වූ සාගිනි නිවීමේ ව්‍යාපාරය කෙරෙහි 1959 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සැලකිල්ල යොමු විය. මෙම ව්‍යාපාරය 1960 දී මෙහෙයවන ලදි. 1963 වර්ෂයේ මාර්තු මස 21 සිට 28 දක්වා කාලය තුළ දී ලෝක ජනතාවගේ සාගිනි නිවීමේ සතියක් පැවැත්වීම මේ අංශයෙහි ලා කළ විශිෂ්ඨ කායිකයකි. සෞඛ්‍ය අධ්‍යාපන උප අංශය මේ කටයුතුවලට ඉතා උනන්දුවෙන් සහභාගි වූ අතර ජාතික සාගිනි නිවීමේ කොමිටිය හා කණිෂ්ඨ වෙළඳ සංගමයේ මෙහෙයීමෙන් සංවිධානය කළ කෘෂිකර්ම, ආහාර හා සෞඛ්‍ය ප්‍රදර්ශනයට ද සහභාගි විය. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කර ප්‍රදර්ශනාගාරය ලංකා විශ්ව විද්‍යාලයේ කුමාර චිකිත්සා අංශයේ සහයෝගය ඇතිව සකස් කරන ලදි. මෙම ප්‍රදර්ශනයෙන් ඌණ පෝෂණය නිසා ඇතිවන ලෙඩ රෝගත් බිළිඳුන්ට, පාසැල් සිසුන්ට, වැඩිහිටි කම්කරුවන්ට හා කිරි මව් වරුන්ට සමබර ආහාරයක් සපයා දීමේ ඇති වැදගත් කම විදහා පාන ලදි. දේශීය වශයෙන් ලබාගත හැකි එළවළු හා වියලි ඇටවර්ගවලින් පෝෂ්‍යදායක ආහාර හා යුෂ වර්ග පිළියෙල කරගන්නා ආකාරය මෙහි දී කර පෙන්වන ලදි.

පාඨශාලා සෞඛ්‍ය සම්මේලන

පාසල් සිසුන් හා සම්බන්ධ ප්‍රශ්න පිළිබඳ අවබෝධයක් ගුරුවරුන්ට ලබාදීමට ප්‍රශ්න ළමුන්ගේ ගුරුවරුන්ගේ හා දෙමාපියන්ගේත්, ප්‍රජා සංවිධානවලත් සහයෝගය ඇතිව විසඳා ගැනීමට මග පාදාගැනීම් වස් පාඨශාලා සෞඛ්‍ය සාකච්ඡා සම්මේලන කීපයක් වර්ෂය තුළ දී පවත්වන ලදි. කුරුණෑගල සහ මාවතගම මණ්ඩල සඳහා පිළියෙල කළ පළමුවන ගුරු සාකච්ඡා සම්මේලනය 1963. 3. 11 වැනි දින කුරුණෑගල කොට්ඨාසයේ දී ඇරඹිණ. පුත්තලමේ ප්‍රාදේශීය පාඨශාලා සෞඛ්‍ය

කමිටුව විසින් සංවිධානය කළ මෙවැනි සාකච්ඡා සම්මේලනයක් 1963 පෙබරවාරි 30 වැනි දා පැවැත්විය. මෙම සාකච්ඡා සම්මේලනයට හලාවත හා මාරවිල මණ්ඩලවලට අයත් ගුරුවරු සහභාගි වූහ.

අමුත්තන් මග ගැන්වීම්

වර්ෂය තුළ දී එක්සත් ජනපද රාජ්‍යයේ ශිෂ්‍යත්වයක් පිට ලැබූ පුහුණුව නිමකර ආපසු යද්දී ලංකාවට පැමිණි ස්කැන්ඩිනේවියානු ජාතිකයින් දෙදෙනෙකු වන සුවාන් ලෝටරංගයි හා ලුවිරඩ් සිල්කාස් යන මහතුන් දෙදෙනාට සති දෙකක මග ගැන්වීමේ වැඩසටහනක් ග්‍රාම සංවර්ධන හා ගෘහකර්මාන්ත දෙපාර්තමේන්තු ද සහයෝගය ඇතිව සංවිධානය කෙරින.

සෞඛ්‍ය අධ්‍යාපන අංශය මගින් කොළඹ, කුරුණෑගල, මහනුවර හා කෑගල්ල යන කොට්ඨාශවල දී, විශෙෂයෙන් පාරිසරික සෞඛ්‍ය යටතේ අධ්‍යයනය කළ යුතු කරුණු හැදෑරීමට අවස්ථාවක් දෙනු සඳහා ප්‍රජා සෞඛ්‍ය යෝජනාක්‍රම හා වැඩසටහන් පිළිබඳ පාඨමාර්ගයක් පිළියෙල කරන ලදි. 1963 මාර්තු මාසයේ දී ලංකාවට පැමිණි ඔස්ත්‍රේලියානු වෛද්‍ය නිලධාරියකු වන දොස්තර ඊ. ඒ. f පිටන් මහතාට දිස්ත්‍රික්ක කීපයක මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරීන් විසින් කරගෙන යනු ලබන ප්‍රජා සෞඛ්‍ය හා පාඨශාලා සෞඛ්‍ය කටයුතු පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය සියලු පහසුකම් සැපයින.

කුරුණෑගල පරිසර සෞඛ්‍ය ක්‍රමය

ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා එක්සත් ජාතීන්ගේ හදිසි ළමා අරමුදලේ අනුග්‍රහයෙන් අරඹන ලද කුරුණෑගල පරිසර සෞඛ්‍ය යෝජනා ක්‍රමය මේ වර්ෂයේ දී නිම විය. යෝජනා ක්‍රමයට අයත් කටයුතු මහජන සංවිධාන මගින් ම කරවනු පිණිස මෙම යෝජනා ක්‍රමයට පත් කරන ලද සෞඛ්‍ය ශික්ෂක වරයා මහජනයා සංවිධානය කිරීමටත් යෝජනා ක්‍රමයට අයත් ගම්වාසීන්ට සෞඛ්‍ය පිළිබඳ අධ්‍යාපනයක් දීමටත් මුළු කාලය වැය කෙළේ ය. 1964 ජනවාරි 1 වැනිදා සිට මෙම සෞඛ්‍ය ශික්ෂකයා වෙනත් ස්ථානයට මාරු කිරීමට යෝජනා කර ඇත. 1964 වර්ෂයේ සිට මෙම කටයුතු කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය ශික්ෂක වෙත පැවරීමට විධි විධාන සොදා ඇත.

ලේ බැංකු සේවය

ලේ දන්දීමේ වැඩ සටහන සම්බන්ධයෙන් කළයුතු සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රචාරක කටයුතු මෙහෙයවීමේ සම්පූර්ණ වගකීම ලේ බැංකුව සඳහා පත්කර ඇති සෞඛ්‍ය ශික්ෂකවරයාගේ වගකීම විය. මෙහි දී වැඩි සැලකිල්ල මෙහෙය වූයේ ලේ දායක කණ්ඩායම් ප්‍රතිසංවිධානය කිරීම කෙරෙහි ය. දියන්තිවරුන්, ආදායම් පාලක නිලධාරීන් දෙපාර්තමේන්තු නිලධාරීන් හා සෙවක්ෂා සංවිධානවල නායකයන් අතර ඉතා කිට්ටු සම්බන්ධතාවයක් පවත්වා ගන යනු ලැබීය. ලේ බැංකු සේවය මගින් ලේ දායකයන් අතර බෙදාදීම සඳහා පත්‍රිකා හා සහතික පත්‍ර සංඛ්‍යාවක් මුද්‍රණය කරවන ලදී. ලේ දීමේ සේවයේ දී දක්නට ලැබුණ විශෙෂ ලක්ෂණය වූයේ ඒ කාර්‍යය සාර්ථක කරගැනීම සඳහා ග්‍රාමසංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ග්‍රාමසංවර්ධන නිලධාරීන්ගේ විශිෂ්ඨ සහයෝගය ලැබීම ය. දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිල ධාරීන්ගේ නොමසුරු සහයෝගය ලැබීම නිසා වඩ වඩා සොදවන ලද ජංගම ඒකක යන්ගේ වැඩ වඩා සාර්ථක අයුරින් කළ හැකි ය.

මහනුවර ප්‍රාදේශීය රෝහලේ ද ලේ බැංකු සේවයක් ඇරඹීමේ සැලසුම් නිම කර ඇති අතර ලබන වර්ෂයේ දී මහනුවර සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු වඩාත් ප්‍රබල කෙරෙනු ඇත.

ගෘහය අනතුරු වැළැක්වීම හා ආරක්ෂක ලාම්පු තැනීම

ගම්බද ජනතාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන කුප්පි ලාම්පුව ගෘහ්‍ය අනතුරු ඇති කිරීමේ ප්‍රධාන හේතුවක් වී තිබෙන අතර ඒ නිසා අවුරුදු පතා විශාල සංඛ්‍යාවක් මරණයට ගොදුරු වෙති. කුප්පි ලාම්පුව නිසා ඇතිවන අනතුරු සංඛ්‍යාව වැළැක්වීම සඳහා ආරක්ෂා සහිත භූමිතෙල් ලාම්පුවක් නිෂ්පාදනය කිරීමට දෙපාර්තමේන්තු පුරෝගාමී විය. ජාතික ආරක්ෂක කමිටුව මගින් තෝරාගන්නා ලද සැලැස්මක් අනුව ආරක්ෂිත ලාම්පුවක් ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් නිෂ්පාදනය කරන ලදි. මේවායින් 5000ක් සෞඛ්‍ය අධ්‍යාපන උප කමිටුව මගින් මිළ දී ගෙන නියම යෝජනා ක්‍රම කිපයක අත්හදා බලන ලදි. මෙම අත්හදා බැලීමේ දී එම ලාම්පුව ගෙවල එදිනෙදා පාවිච්චියට නුසුදුසු බැව් අනාවරණය වී ඇත. මෙම ලාම්පුවක් නිෂ්පාදිත තවත් ලාම්පු සමහරකුත් පර්යේෂණ කටයුතු සඳහා ලංකා විද්‍යාත්මක හා කර්මාන්ත පර්යේෂණ ආයතනය වෙත යවන ලදි. ලාම්පුවේ නිර්මානය හා එයින් ලැබෙන ආලෝක ප්‍රමාණය ගැන පිරිස්සු එම ආයතනය එම ලාම්පුව තව දුරටත් දියුණු කළ යුතුව ඇති බැව් නිර්දේශ කරන ලදි. ලංකා විද්‍යාත්මක හා කර්මාන්ත පර්යේෂණායතනයේ නිර්දේශයන් දැනට ජාතික කමිටුව මගින් අධ්‍යයනය කරගෙන යනු ලබන අතර මේ සඳහා ජාත්‍යන්තර ආයතනවලින් ආධාර ලබා ගැනීමට දැනටමත් විධි විධාන ගෙන ඇත.

විශේෂ ව්‍යාපාරවල සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු

(1) **ක්ෂය රෝග නාශක ව්‍යාපාරය.**—මෙම ව්‍යාපාරය මගින් වර්ෂය පුරා පැවැත්වූ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන්වලට පහත සඳහන් දේ අයත් විය.

(1) මහා ප්‍රචාරක වැඩ සටහන් හා සමූහ සාකච්ඡා සංවිධානය කිරීමෙන් ලක්දිව නානා ප්‍රදේශයන් පවත්වන ලද සමූහ ඇක්ස්රේ ව්‍යාපාරවලට සහාය වීමේ අධ්‍යාපන වැඩසටහන් මෙහෙයවීම.

(2) වැඩ සටහන්වලට ආධාර කිරීම සඳහා ශ්‍රමදාන ව්‍යාපාර මෙහෙයවීම.

(3) වදුරුස්ස, මිරිගම, දොම්පේ හා කෑගල්ල යන ස්ථාන ඇතුළු කිප පළක ප්‍රදර්ශන පැවැත්වීම.

(4) ක්ෂය රෝග මර්ධනය කෙරෙහි ව්‍යාවෘත වන ප්‍රජා සංවිධානවලට ආධාර දීම.

(5) ලංකාව පුරාම ලංකා ක්ෂය රෝග නාශක ජාතික සංගමය මගින් මෙහෙයවන අධ්‍යාපන කටයුතුවලට ආධාර දීම.

(i) වැලිසර අභ්‍යාස විද්‍යාලයේ ක්ෂය රෝග හෙදියන් 56 දෙනෙකුටත් කළුතර දී මහජන සෞඛ්‍ය හෙදියන්ගේ හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ වෛද්‍ය නිලධාරීන්ගේ හා මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන්ගේ කණ්ඩායම් කිපයකටත් මධ්‍යස්ථාන 15 ක දී ග්‍රාම සේවකයන් සංඛ්‍යාවකටත් ක්ෂය රෝගය පිළිබඳ අභ්‍යාස අධ්‍යාපන වැඩ සටහන් මෙහෙයවන ලදි. ක්ෂය රෝග මර්ධන පිළිබඳ අත්පොතක් පිළියෙළ කර මහජන සෞඛ්‍ය නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා බෙදා දෙන ලදි. සෑම ක්ෂය රෝග රෝහලකදීම ක්ෂය රෝගීන්ට අධ්‍යාපන වැඩසටහන් පිළියෙළ කෙරිණ.

(ii) **සමාජ රෝග නාශක ව්‍යාපාරය.**—පැල්පත් වාසීන්ගේ ප්‍රයෝජනය සඳහා කොළඹ නගරයේ මධ්‍යස්ථාන 20 ක දී පමණ නිතිපතා පැවැත්වුන අධ්‍යාපන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදි. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 16 දෙනෙකු, මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන් 58 දෙනෙකු වෛද්‍ය නිලධාරීන් 27 දෙනෙකු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 8 දෙනෙකු හා පාඨශාලා ඇපෝතිකිරිවරුන් 3 දෙනෙකු සඳහා අභ්‍යාස පන්ති 18ක් පැවැත්විය. මීට අමතර වශයෙන් කොළඹ හෙද ශිෂ්‍ය ශිෂ්‍යාවන්, සමාජ රෝග චිකිත්සාගාරවල නිලධාරීන්ට කළුතර සෞඛ්‍ය ඒකකයේ

සිසු සිසුවියන්ට, ග්‍රාම සේවක කණ්ඩායම් 9කට ටැලිපෝන් සේවකයන් කණ්ඩායමකට, ගුරු අභ්‍යාස විද්‍යාල කිපයක ශිෂ්‍ය ගුරුවරුන්ට හා ගිනි නිවන හමුදාවේ නිලධාරීන්ට පුහුණුවීමක් ලබා දෙන ලදී.

සියලුම සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශවලට හා පූර්ණ කාලීන හා අර්ධ කාලීන සමාජ රෝග චිකිත්සාගාරවලට අධ්‍යාපන උපකරණ සපයා දෙන ලදි. සියලුම සෞඛ්‍ය හා සමාජ සේවකයින් ගේ ප්‍රයෝජනය සඳහා "සෑම සෞඛ්‍ය සේවකයාම දතයුතු කරුණු" යන ශීර්ෂය යටතේ පත්‍රිකාවක් ප්‍රකාශ කිරීමට ක්‍රියා කර ඇත. සමාජ රෝග පිළිබඳ වර්ණ ඡායාරූප ඇල්බම් 25ක් පිළියෙළ කර චිකිත්සාගාරවලට බෙදා හරින ලදි. දිවයිනේ නා නා පළාත්වල ප්‍රදර්ශන කීපයක් පැවැත්විය. ග්‍රාමසංවර්ධන සමිති කාන්තා සමිති, ගොවි පාසල්, නා නා දෙපාර්තමේන්තුවලට හා සංයුක්ත මණ්ඩලවලට අළුත් අභ්‍යාස විද්‍යාල වැනි නා නා ප්‍රජා සංවිධාන හා ආයතනවල ඇරඹු වැඩකටයුතු වර්ෂය තුළ දී අඛණ්ඩව පවත්වා ගෙන යන ලදි.

(iii) **බරවා නාශක ව්‍යාපාරය.**—මිගමුවේ සිට මාතර දක්වා විහිදී මුහුදුබඩ ප්‍රදේශයේ පවත්නා බරවා රෝගය මර්දනය කිරීමේ අධ්‍යාපන කටයුතු සැලසුම්කර එම කටයුතු ප්‍රජා සංවිධාන පාඨශාලා හා ස්වේච්ඡා සේවක කණ්ඩායම්වල ආධාරය ඇතිව මෙහෙයවන වදි. ගුරුවරුන් ආධුනික ගුරුවරුන්, විශ්ව විද්‍යාලය සිසුන්, ග්‍රාම සේවකයින් හා සෞඛ්‍ය සේවකයින් පුහුණු කිරීම අවුරුද්ද පුරාම සිදු විය. බරවා රෝගය මර්ධනය කිරීමෙහි ලා කුඩා ශ්‍රමදාන ව්‍යාපාර සමහරක් සාර්ථක ලෙස පවත්වනු ලැබිය. මෙම විෂයෙහි ලා විශේෂයෙන් පිළියෙළ කරනලද චිත්‍රපටි ප්‍රදර්ශන, පෝස්ටර්, පත්‍රිකා හා ප්‍රදර්ශන භාණ්ඩ උපයෝගී කර ගෙන ප්‍රබල අන්දමේ ප්‍රචාරක ව්‍යාපාරයක් මෙහෙයවන ලදි.

(iv) **මැලේරියා නාශක ව්‍යාපාරය.**—ප්‍රධාන කාර්යාලයේ දී නිතිපතා පැවැත්වුන චිත්‍රපටි ප්‍රදර්ශන හා සාකච්ඡා මාර්ගයෙන් සේවකයින් සඳහා අධ්‍යාපන වැඩසටහන් මෙහෙයවිය. මැලේරියාව පිළිබඳ අධ්‍යාපන වැඩසටහනක් ග්‍රාම සේවක කණ්ඩායම් 9ක් හා ටැලිපෝන් සේවකයින් කණ්ඩායමක් සඳහා පැවැත්විය. "ලංකා මැලේරියා මර්ධනයේ ප්‍රගතිය" නමින් ප්‍රකාශනයක් පිළියෙළ කර සෞඛ්‍ය සේවා අධිකාරිවරුන් ගේ සාකච්ඡා සම්මේලනයේ දී බෙදා හරින ලදි. අධ්‍යාපනික වචනාකමකින් යුත් වාර්තා හා සංඛ්‍යා ලේඛන පිළියෙළ කර ව්‍යාපාරයේ නිලධාරීන් අතර බෙදා දෙන ලදි.

රජයේ දෙපාර්තමේන්තුවල සහායවීම

(I) **ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජාතික සේවා අංශය**—ශ්‍රමදාන කටයුතු ඒකාබද්ධ කිරීම සඳහා අරඹන ලද ජාතික සේවා අංශයේ කටයුතුවලදී සෞඛ්‍ය අධ්‍යාපන උප අංශය ද සහභාගි විය. ස්වේච්ඡා සේවක වැඩසටහන්වලට ආධාර කිරීමෙන්, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරන හා ද්‍රව්‍ය සැපයීමෙන් හා ස්වේච්ඡා සේවකයින්ට සෞඛ්‍ය පිළිබඳ අධ්‍යාපනයක් දීමෙන් ද ජාතික සේවය යටතේ ඇරඹූ වඳුරුස්ස, නෙළුව හා පැලවත්ත යන නියමු යෝජනා ක්‍රමවලට සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි වරයාගේ සේවය අඛණ්ඩව පරිත්‍යාග කෙරිනි.

(II) **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.**—සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාසවල සිටින සෞඛ්‍ය ශික්ෂකයින් විසින් ලංකාවේ සෑම පළාතකම පිහිටි කෘෂිකර්ම පාසල්වල දී සෞඛ්‍ය අධ්‍යාපන අභ්‍යාස පාඨමාර්ග මෙහෙයවන ලදි. කෘෂිකර්ම උපදේශකවරු සහ ඔවසියර්වරු සෞඛ්‍ය ඒකක වල වැඩට සහභාගි වූහ.

(III) **ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව.**—සෞඛ්‍ය දෙපාර්තමේන්තුවත් ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවත් අතර ඉතා කිට්ටු සම්බන්ධතාවයක් පැවැත්විය. ග්‍රාම සංවර්ධන අභ්‍යාස මධ්‍යස්ථානවල දී සෞඛ්‍ය අධ්‍යාපන පුහුණුවක් ඇරඹූ අතර, අපේ ප්‍රජා සංවර්ධන කටයුතුවල දී ග්‍රාම සංවර්ධන නිලධාරීහු සහාය වූහ.

(IV) **පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව.**—පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමග සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඉතා කිට්ටු සම්බන්ධතාවයකින් යුක්තව කටයුතු කරමින් දිවයින පුරා පැවැත්වූ ලෝක ළමා දින උත්සවවලට සහභාගි විය. ළමා දින උත්සවය සඳහා ආසියා අප්‍රිකා ශිෂ්‍ය සංවිධානය මගින් අනුරාධපුරයේ දී පැවැත්වූ සාකච්ඡා සම්මේලනයට හා ප්‍රදර්ශනයට සෞඛ්‍ය අධ්‍යාපන අංශය සහභාගි විය.

(V) **සමුපකාර දෙපාර්තමේන්තුව.**—දෙපාර්තමේන්තුව දෙකට අයත් ක්ෂේත්‍ර නිලධාරීන් අතර ඉතා කිට්ටු සම්බන්ධතාවයක් තහවුරු කරගන්නා ලදී. ඉතාමත් සහයෝගයෙන් ඒකාබද්ධ ප්‍රජා සංවර්ධන වැඩසටහන් සංවිධානය කරන ලදී. පොල් ගොල්ල සමුපකාර පාසැලේ දී සමුපකාර පරීක්ෂකවරුන් හා සමුපකාර සමිතිවල නිලධාරීන් පුහුණු කිරීමේ වැඩවලට මෙම දෙපාර්තමේන්තුව සහභාගි විය.

(VI) **ප්‍රවෘත්ති හා ගුවන් විදුලි දෙපාර්තමේන්තුව.**—ප්‍රචාරක වැඩසටහන්වලදී ප්‍රවෘත්ති හා ගුවන් විදුලි දෙපාර්තමේන්තුව අප දෙපාර්තමේන්තුවට සහාය විය. නිති පතා පැවති ගුවන් විදුලි වැඩසටහන්වලට අමතර වශයෙන් ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් සෞඛ්‍ය ලිපි තුන් බසින්ම ශ්‍රී ලංකා සඟරාවෙහි පළ කෙරින.

සෙවවශ්‍ය සංවිධානවල සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු

(i) **ලංකා මහිලා සමිති.**—ලංකා මහිලා සමිති මගින් සංවිධානය කළ අභ්‍යාසය පාඨමාර්ගවල දී සෞඛ්‍ය අධ්‍යාපනික උප අංශය ඉතා කිට්ටු සම්බන්ධතාවයකින් යුක්ත ව කටයුතු කළේ ය. කඩුවෙල පිහිටි ලංකා මහිලා සමිති අභ්‍යාස මධ්‍යස්ථානයේ දී ස්වෙච්ඡා සේවක මහිලාවන්ට සෞඛ්‍ය අධ්‍යාපන පන්ති පැවැත්විය. සියලුම මහිලා සමිතිවලට බෙදා දීම සඳහා සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ, පත්‍රිකා, පෝස්ටර් හා දෙපාර්තමේන්තුවේ ත්‍රෛමාසික ප්‍රකාශනය වන "සැපත" සඟරාව ද ප්‍රධාන කාර්යාලය වෙත සපයන ලදී. ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් නිෂ්පාදිත ආරක්ෂා සහිත කුප්පි ලාම්පු මහිලා සමිති මගින් බෙදාදීම සඳහා මෙම සංවිධානය වෙත සපයා දෙන ලදී.

(ii) **ලංකා පවුල් සංවිධාන සංගමය.**—පසු වර්ෂවල දී මෙන්ම මෙම වර්ෂයේ දීත් මෙම සංගමයේ ප්‍රධාන වැඩසටහන්වල දී පරිවර්තනය හා සංස්කරනය කටයුතු කර දීමෙනුත් පත්‍රිකා, පොත් පිංචයක් හා පෝස්ටර් මුද්‍රණයකර දීමෙනුත්, සෞඛ්‍ය අධ්‍යාපන උප අංශයේ සහාය එම සංගමයට ලබා දුන්නේ ය. පවුල් සංවිධාන සංගමයට දස වර්ෂයක් පිරීම නිමිත්තෙන් සංවිධානය කළ සාකච්ඡා සම්මේලනයට හා ප්‍රදර්ශනයක සෞඛ්‍ය අධ්‍යාපන අංශයේ සහයෝගය නො අඩුව පරිත්‍යාග කෙරිණි. මෙම සංගමය වෙනුවෙන් තේ ප්‍රචාරක මධ්‍යස්ථානයේ දී විශේෂ ප්‍රදර්ශනයක් සෞඛ්‍ය අධ්‍යාපන අංශය මගින් සංවිධානය කරන ලදී.

(iii) **ලංකා අමද්‍යප සංගමය.**—මේ වර්ෂයේ නොවැම්බර් මාසයේ දී උක්ත සංගමය මගින් මෙහෙයවන ලද අමද්‍යප සතියට සෞඛ්‍ය අධ්‍යාපන අංශය සහභාගි විය. විෂ මත් බීමේ විපාක දැක්වෙන පත්‍රිකාවක් මුද්‍රණය කර අමද්‍යප සතිය තුළ දී බෙදාහරින ලදී.

(iv) **ලංකා පිළිකා සංගමය.**—පිළිකා රෝග පිළිබඳ මහජන අධ්‍යාපන වැඩසටහනක් මෙම අංශය මගින් ප්‍රබල අයුරින් මෙහෙයවන ලදී. පිළිකා රෝගය පිළිබඳ පත්‍රිකාවක් පිළියෙල කර මහජනයා අතර බෙදාහරින ලදී. විකිරනය නිසා ඇතිවන උවදුරු පිළිබඳ අවබෝධයක් නිලධාරීන්ට ලබා දීම සඳහා පුළුල් අධ්‍යාපනික වැඩසටහන් මහරගම පිළිකා රෝහලේ දී පැවැත්වීමට සියලු සැලසුම් නිමකර ඇත.

(v) **ක්ෂය රෝග වැළැක්වීමේ ලංකා ජාතික සංගමය.**—ප්‍රචාරක හා අධ්‍යාපන වැඩසටහන්වල දී සෞඛ්‍ය අධ්‍යාපන උප අංශය ක්ෂය රෝග මර්ධන ලංකා ජාතික සංගමයට සහාය විය. තවද 1963 මාර්තු මස 30 දා හා 31 දා පැවැත්වූ ක්ෂය රෝග මර්ධන

ලංකා ජාතික සංගමයේ ශාඛා සංගම් රැස්වීමට ද සහභාගි විය. ලබන වර්ෂයේ දී ලංකා ජාතික ක්ෂය රෝග මර්දන සමිතියේ ජාතික ක්ෂය රෝග නාශක ව්‍යාපාරයේ හා කොළඹ නාගරික සභාවේ නියෝජිතයින් ගෙන් සමන්විත ඒකාබද්ධ බල මණ්ඩලයක් පිහිටුවීමට යෝජනා කර ඇත.

(vi) **සමාජ සේවා ආයතනය.**—සමාජ සේවා ආයතනයේ අභ්‍යාස පාඨමාර්ගවල දී හා ක්ෂේත්‍ර වැඩසටහන්වල දී මෙම අංශය සහාය විය.

(vii) **සෞඛ්‍ය දාන ව්‍යාපාරය.**—සේවය කෙරෙහි කැපවූ වෛද්‍යවරු, හෙදියන්, ඇපෝතිකරිවරුන්, උපස්ථායකයන් හා සෙසු සෙවවඡා සේවකයින් කණ්ඩායමක් විසින් අවුරුදු කීපයකට පෙර ඇරඹූ සෞඛ්‍යදාන ව්‍යාපාරය දිනෙන් දින වැඩි දියුණු විය. ප්‍රධාන ආගමික උත්සව වන ශ්‍රී පාදය, මහියන්ගනය, කතරගම, අනුරාධපුරය හා කැළණිය යන සිද්ධස්ථානවල පැවැත්වූ උත්සවවලදී සෞඛ්‍යාදාර කඳවුරු පිහිටුවන ලදි. මේ වර්ෂයේ දී දකුණු පළාතේ ඇති වූ මහා ජලගැල්මෙන් අනාථ වූවන්ට මෙම ව්‍යාපාරය මගින් ආධාර කරන ලදි. මෙම වෛද්‍යාදාර හා සමාජ සේවා කටයුතු වල මෙම දෙපාර්තමේන්තු ආධාර කෙළේය. මෙම ව්‍යාපාරයේ සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රජා සංවර්ධන වැඩකටයුතුවලට ද දෙපාර්තමේන්තුවේ ආධාරය ලැබිණ.

(viii) **වෙනත් සෙවවඡා සංවිධාන සමග කළ වැඩ.**—බටහිර පෙදෙසේ තරුණ සංගමය බාල දක්ෂිකා සංගමය, කණිෂ්ඨ වෙළෙඳ මණ්ඩලය, සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සම්මේලනය, බෞද්ධ සම්මේලනය, ප්‍රධාන තරුණ ක්‍රිස්තියානි සංගමය, තරුණ මුස්ලිම් සංගමය, තරුණ බෞද්ධ සංගමය හා තරුණ ක්‍රිස්තියානි කාන්තා සංගමය, වැනි සෙවවඡා ආයතනයන්හි නා නා කාටයුතුවලට සෞඛ්‍ය අධ්‍යාපන අංශය සහභාගි විය.

අභ්‍යාස වැඩසටහන්

(i) **සෞඛ්‍ය අධ්‍යාපන සංස්කරන පාඨමාර්ග හා සාකවඡා සම්මේලන.**—පූර්ණ කාලීන සෞඛ්‍ය ශික්ෂකයින් හා ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන තනතුරු දරන ජ්‍යෙෂ්ඨ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් යන ඒකාබද්ධ කණ්ඩායම් දෙකක ප්‍රයෝජනය සඳහා ලංකාවේ ප්‍රථමවරට සතියක නේවාසික අභ්‍යාස පාඨමාර්ගයක් පවත්වන ලදි. ඉපාල්ගොල්ලේ සමුපකාර පාසලේ දී පැවැත්වූ මෙම පාඨමාර්ගයට සෞඛ්‍ය ශික්ෂකයින් 25 දෙනෙක් හා ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 15 දෙනෙක් සහභාගි වූහ.

මෙම පාඨමාර්ගයේ සාමාන්‍ය අරමුණ වූයේ සෞඛ්‍ය අධ්‍යාපනයේ දී දැනට අනුගමනය කෙරෙන අංග හා ක්‍රම තක්සේරු කර, වැඩසටහන් පිළියෙල කිරීමේ දී නව දර්ශනයන් හා න්‍යායන් මත පිහිටා මහජනයා පිළිබඳ කරුණු අවබෝධ කිරීමේ හා අධ්‍යාපනයක් දීමේ ක්‍රම සංවර්ධනය කිරීම ය.

චයනී විද්‍යාවක් පිළිබඳ විශ්ව විද්‍යාලයීය විශෙෂඥයින්ගේ රජයේ දෙපාර්තමේන්තුවලට අයත් නිලධාරීන්ගේ හා වෙනත් සංවිධානවලට අයත් වූවන් ගේ සහභාගිත්වයෙන් පැවැත්වුන මෙම පාඨමාර්ගය මැනවින් සාර්ථක වූ බැව් ඊට සහභාගි වූවන් විසින් පිළිගැනිණ.

(ii) **මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ හා මහජන සෞඛ්‍ය හෙදියන්ගේ සංස්කරණ පාඨමාර්ගය.**—කොළඹ, කළුතර, මාතර, කෑගල්ල, මහනුවර, මාතලේ, යාපනය, වව්නියාව හා පුත්තලම යන සෞඛ්‍ය කොට්ඨාශවල සේවයේ නියුක්ත මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ හා මහජන සෞඛ්‍ය හෙදියන්ගේ ප්‍රයෝජනය සඳහා තෙදිනක සංස්කරණ පාඨමාර්ග පැවැත්විය. මේ පාඨමාර්ගවලදී විචක්ෂකයින් වශයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරු සෞඛ්‍ය කාර්යාලයාධිපතිවරු හා ප්‍රාදේශීය

පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු සහභාගි වූහ. ඒ ඒ සෞඛ්‍ය සේවා අධිකාරීන් ගේ හා ප්‍රධාන කාර්යාලයේ මග පෙන්වීම අනුව මෙම පාඨමාර්ග සංවිධානය කිරීමේ වගකීම ප්‍රධාන වශයෙන් පැවරුනේ ප්‍රාදේශීය සෞඛ්‍ය ශික්ෂකවරුන් මතය.

මෙම සංස්කරණ පාඨමාර්ගයේ මූලික අරමුණ වූයේ තම තමන්ගේ ප්‍රදේශවල සෞඛ්‍ය අධ්‍යාපනය යටතේ ලබා ඇති දියුණුව තක්සේරු කර බැලීමට අවස්ථාවක් සැලසීම හා සිය කටයුතුවල දී අධ්‍යාපනික අංශයට වැඩි සැලකිල්ලක් යොමු කිරීමට හැකිවන අයුරු එකමුතුව සොයා බැලීම ය.

(iii) **ග්‍රාම සේවකයන් පුහුණු කිරීම.**—ප්‍රජා සේවකයන් වශයෙන් ග්‍රාම සේවකයන් වෙත පැවරෙන වගකීම් පිළිබඳ අවබෝධයක් ලබා දෙනුවස් වඩාත් ක්‍රමවත් සෞඛ්‍ය අධ්‍යාපන පාඨමාර්ගයක් අළුතින් පත් කරන ලද ග්‍රාම සේවකයන් උදෙසා පවත්වන ලදී. ඔවුන් සඳහා දෙන ලද පුහුණු කිරීමේ වැඩ සටහනට පැය 20ක් පමණ වෙන්කර තිබීම සතුටට කරුණකි. මෙම අභ්‍යාස පාඨමාර්ගයට ප්‍රජා සෞඛ්‍ය ප්‍රශ්න පිළිබඳ දේශන, සාකච්ඡා හා ප්‍රායෝගික නිරූපනයක් ද ඇතුළත් විය.

(iv) **හෙදි ඇබැසි විදුහල්වල සෞඛ්‍ය අධ්‍යාපනය.**—සෑම සාත්තු සේවා අභ්‍යාස විද්‍යාලයක දීම සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ පුහුණුවක් ලබා දෙන ලදී. කොළඹ හෙදි ඇබැසි විදුහලේ පශ්චාත් උපාධි පුහුණුව ලැබූ හෙදියන් සඳහා ද සෞඛ්‍ය අධ්‍යාපන පන්ති පැවැත්විය.

(v) **ඇපොතිකරිවරුන් හා ආධුනික වෛද්‍යවරුන් පුහුණු කිරීම.**—ඇපෝතිකරිවරුන්ගේ පාඨමාර්ගයට සෞඛ්‍ය අධ්‍යාපනය ඇතුළු කිරීම හා දේශනා හයක් පැවැත්වීම කරන ලදී. නිර්දේශ පත්‍රයෙහි සඳහන් කාලසීමාව ප්‍රමාණවත් නොවූයෙන් මෙම කාලසීමාව ලබන වර්ෂයේ සිට වැඩි කරවා ගැනීම සඳහා මේ ප්‍රශ්නය ලංකා වෛද්‍ය සභාව වෙත ඉදිරිපත් කර ඇත.

වර්ෂය තුළ දී සමත් වූ ආධුනික වෛද්‍යවරුන්ට සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ කෙටි පුහුණුවක් ලබා දෙන ලදී.

(vi) **ගුරු අභ්‍යාස විද්‍යාල.**—ජාතික පාඨශාලා සෞඛ්‍ය සභාව මගින් සකස් කළ වැඩ සටහනක් අනුව ගුරු විදුහල්වල පුහුණුව ලබන ගුරු මහතුන්ගේ දැවුරුදු අභ්‍යාස මාර්ගයට සෞඛ්‍ය අධ්‍යාපනය සඳහා පැය 108ක් වෙන් කරන ලදී. මෙම පුහුණුව දිවයිනේ පිහිටි සෑම ගුරු අභ්‍යාස විද්‍යාලයයක දීම වාගේ ලබා දෙන ලදී. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ පර්යන්ත ඒකකය භාර වෛද්‍ය නිලධාරි හෝ විසින් ව්‍යවහේද විද්‍යාව, ශරීර විද්‍යාව හා ශිල්පීය කරුණු පිළිබඳ දේශනා පැවැත්වූ අතර සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ දේශන සෞඛ්‍ය ශික්ෂකවරයා විසින් පැවැත්විය.

(vii) **වෙනත් අභ්‍යාස කටයුතු.**—ප්‍රාදේශීය ජ්‍යෙෂ්ඨ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සෞඛ්‍ය ශික්ෂකයින් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා පැවැත්වූ සේවා යුක්ත සෞඛ්‍ය අධ්‍යාපන පාඨමාර්ගයන්ට අමතර වශයෙන් කළුතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහාත් මහජන සෞඛ්‍ය හෙදියන් හා මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන් ගේ සංස්කරණ පාඨමාර්ග පැවැත්වීම සඳහාත් සෞඛ්‍ය අධ්‍යාපන උප අංශය සහභාගි විය. කළුතර දී කෙරෙන මහජන සෞඛ්‍ය පරීක්ෂක ආධුනිකයන් පුහුණු කිරීමේ දී සෞඛ්‍ය අධ්‍යාපනය වැදගත් විෂයක් වශයෙන් නොකඩවා ගැණිත.

ප්‍රචාරක වැඩ

සෞඛ්‍ය අධ්‍යාපන අංශයේ ප්‍රචාරක කටයුතු වඩාත් ප්‍රබල කෙරින. මේ සඳහා ගුවන් විදුලිය, පුවත් පත් හා වෙනත් මාධ්‍යයන් සාර්ථක ලෙස උපයෝගි කරගනු ලැබිය.

(i) **ගුවන් විදුලි වැඩසටහන්.**—දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කරන ලද ගුවන් විදුලි වැඩසටහන් කල් ඇතුව පිළියෙල කර අසන්නන්ට නා නා විධ සෞඛ්‍ය ප්‍රශ්න ගැනත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සලසනු ලබන නා නා විධ වෛද්‍ය

පහසුකම් ගැනත් තොරතුරු සපයන ලදි. සෞඛ්‍ය කොට්ඨාශවල කරගෙන යනු ලබන සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රජා සංවර්ධන යෝජනා ක්‍රමවලට ප්‍රචාරයක් ලබා දෙනු සඳහා සාකච්ඡා පවත්වන ලදි.

"මගේ සෞඛ්‍ය ප්‍රශ්නය" යන හිසින් නව වැඩ සටහනක් මසකට වරක් ගුවන් ගත කෙරින. නා නා සෞඛ්‍ය ප්‍රශ්න අලලා දිවයිනේ නොයෙක් පළාත්වල අසන්නන් විසින් එවන ලද ප්‍රශ්නවලට වෛද්‍ය විශේෂඥයින් පිළිතුරු සපයන ලදි. මෙම වැඩ සටහන අසන්නන් අතර ජනප්‍රිය වූ බැව් පෙනේ. පෝලියෝ ප්‍රතිශක්ති කරණ ව්‍යාපාරය හා ලෝක සෞඛ්‍ය දිනය සඳහා විශේෂ ගුවන් විදුලි කථා හා විචිත්‍රාංග ගුවන් ගත කෙරින. **ලෝක ජනතාවගේ සාගිනි රෝග** යන මාතෘකාව යටතේ පැය බාගයක විචිත්‍රාංගයක් ලෝක සෞඛ්‍ය දිනයේ දී ප්‍රචාරය කරන ලදි. බරවා රෝග මර්ධනය, ස්නායු වේද සේවා හා පාරිසරික සෞඛ්‍යය යන මාතෘකා යටතේ පිළියෙල කළ විශෙෂ සංවර්ධන වැඩසටහන් අමාත්‍යාංශයට සපයා දෙන ලදි.

(ii) **ප්‍රකාශන—**

සැපත.—දෙපාර්තමේන්තුවේ ත්‍රයි මාසික සඟරාව මගින් මහජනයාට සෞඛ්‍ය පිළිබඳ දැනුම ප්‍රචාරය කිරීම දිගටම කරන ලදි. විවිධ සෞඛ්‍යය මාතෘකා යටතේ ලිපි පළවූ අතර සඟරාවේ දැන් ග්‍රාමීය පාඨකයන්ගේ ප්‍රසාදයට ලක් වී තිබේ. සඟරාව බෙදාහැරීමේ ක්‍රමය ප්‍රතිසංවිධානය කරන ලදින්, දැන් සෑම ප්‍රජා මණ්ඩල, ග්‍රාම සංවර්ධන සමිති, මහිලා සමිති, මධ්‍යම මහා විද්‍යාල හා මහා විද්‍යාලවලට පිටපත බැගින් යැවේ. මේ සම්බන්ධයෙන් අධ්‍යාපන සහකාර අධ්‍යක්ෂවරුන්, පළාත් පාලන සහකාර කොමසාරිස් වරුන්, ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිවරුන් හා මහිලා සමිති ප්‍රධාන කාර්යාලයෙන් ලැබුණු සහයෝගය මෙහිලා සටහන් කළ යුතු ය.

සුව පුවත්.—දෙපාර්තමේන්තුවේ මාසික ප්‍රවෘත්ති සංග්‍රහය අඛණ්ඩව පවත්වා ගෙන යන ලදි. ප්‍රවෘත්ති සංග්‍රහයේ පළ කෙරෙන සෞඛ්‍ය ප්‍රවෘත්ති නා නා ප්‍රදේශවල සිට සෞඛ්‍ය ශික්ෂකවරුන් විසින් සපයන ලදි.

(iii) **වෙනත් ප්‍රකාශන.**—සුව පුවත් හා දෙමළ ප්‍රකාශනය පාඨකයන් විශාල සංඛ්‍යාවක් අතට පත්කළ හැකි විය. මෙම ප්‍රකාශනය සඳහා දකුණු ඉන්දියාවෙන් ඉල්ලීම් ලැබී ඇත. "ලක්සිරි" සඟරාවේ දෙවැනි කලාපය වර්ෂය තුළ දී ප්‍රකාශ කරන ලදින්, එය නා නා ජාත්‍යන්තර සෞඛ්‍ය සංවිධානවල ප්‍රසාදයට ලක්විය. පෝලියෝ ප්‍රතිශක්ති කරණ ව්‍යාපාරය හා සෞඛ්‍ය සතිය වෙනුවෙන් විශේෂ ප්‍රවෘත්ති පත්‍ර අතිරේක පුවත් පත් මගින් සංවිධාන කරන ලදි. මෙම තොරතුරු දිවයිනේ ඈත ප්‍රදේශවලට ගෙන යෑම සඳහා පුවත් පත් අතිරේක සංස්ථාක මාධ්‍යයක් විය. පුස්තකාලයට එකතු කරන ලද අළුත්ම පත් පොත් පිළිබඳ තොරතුරු පාඨකයින් වෙත ගෙනයෑම සඳහා ත්‍රයි මාසික පුස්තකාල "ප්‍රවෘත්ති සංග්‍රහය" නොකඩවා පළ කෙරිනි. තොරතුරුමය හා ශාස්ත්‍රීය වචනාකම්වලින් යුත් පොත් පත්වලින් උපුටාගත් ලිපි "නව සාහිත්‍ය උධෘත පාඨ" යන සංග්‍රහය මගින් රෝනියෝ කර යැවිනි. අවුරුද්ද තුළ දී බෙදාදීම සඳහා පත්‍රිකා සංඛ්‍යාවක් මුද්‍රණය කරවන ලදි.

සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ නිෂ්පාදනාගාරය

(i) දැනට පවත්නා සෞඛ්‍ය ප්‍රශ්න පිළිබඳ මහජනතාවට අවබෝධයක් ලබා දෙනු පිණිස ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යාපන ඒකක හා විශේෂ ව්‍යාපාරවලට අයත් සෞඛ්‍ය අධ්‍යාපන ඒකක වලට සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ නිෂ්පාදනාගාරය විසින් උපකරණ හා ප්‍රදර්ශන භාණ්ඩ සැපයීම දිගටම කරගෙන යන ලදි. මීට අමතරව 1963 නිදහස් උත්සවය සඳහා මෙම ඒකකය මගින් අනුරාධපුරයේ දී සෞඛ්‍ය ප්‍රදර්ශනයක් පවත්වන ලදි. තවද සාගිනි නිවීමේ සතිය තුළ දී කොළඹ දීත්, කෘෂිකර්ම හා

කර්මාන්ත ප්‍රදේශනයේ දී මිරිගම දීත් ලෝක ළමා දින උත්සවය සඳහා නැවත වරක් අනුරාධපුරයේ දීත් ප්‍රදර්ශන සංවිධාන කරන ලදී. මෙම අංශය මගින් දිවයිනේ මධ්‍යස්ථාන 18ක දී සෞඛ්‍ය ප්‍රදර්ශන පැවැත්වීමත් වෛද්‍යායතන විවෘත කිරීමේ උත්සව හා සම්බන්ධ විශේෂ කාර්යන්හි නිරත වීමත් කරන ලදී.

(ii) මෙම අංශය මගින් විදේශය තානාපති සේවාවන් වලින් ණයට ලබාගත් සෞඛ්‍ය චිත්‍රපටි 250ක් ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යාපන ඒකකයන් අතර බෙදා දෙන ලදී. ජාතික සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී මෙම චිත්‍ර පටිවලට වැදගත් ස්ථානයක් හිමිවිය.

(iii) පාරිසරික සෞඛ්‍යය, පෝෂනය, පවුල් සංවිධානය හා වටපනු උවදුර යන විෂයයන් යටතේ ශ්‍රව්‍ය දෘශ්‍ය චිත්‍ර රාමු සකස් කර සාර්ථක සෞඛ්‍ය අධ්‍යාපන මාධ්‍යයක් වශයෙන් ප්‍රයෝජනයට ගනු ලැබිය. නා නා සෞඛ්‍ය ප්‍රශ්න නිරූපනය කිරීම සඳහා චිත්‍ර පට ස්ලයිඩ් ද විනිවිදකයන්, ලැක්ටර්න් ස්ලයිඩ්, සටහන් ඡායාරූප පෝස්ටර් නිපදවන ලදී.

පුස්තකාල සේවය

දෙපාර්තමේන්තුවේ පුස්තකාල සේවය ගතවූ වර්ෂයේ දී මෙන් ම මෙම වර්ෂයේ දී ප්‍රධාන කාර්යාලයේ පිහිටි පුස්තකාලය හා ප්‍රාදේශීය ආයතනවල පිහිටි පුස්තකාල 63 කින් පුස්තකාල පහසුකම් ලබාදුන්නේය.

ප්‍රධාන පුස්තකාලය මගින් දෙපාර්තමේන්තුවට අයත් සියලුම නිලධාරීන්ට කියවීමේ පහසුකම් ලබාදුන් අතර, සෙසු පුස්තකාල වලින් ඒ ඒ ආයතනවලට අයත් නිලධාරින්ගේ අවශ්‍ය තාවයන් පිරිමසන ලදී. හෙදි අභ්‍යාස විද්‍යාලයන්හි හා වෙනත් අභ්‍යාස ආයතනයන්හි පිහිට පුස්තකාලවල ඒ ඒ ක්ෂේත්‍රයන්ට අයත් සඟරා හා අධ්‍යයන ග්‍රන්ථ සපයා දීමෙන් ආධුනිකයින්ට ආධාර කරන ලදි. සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශවල පිහිටි සෞඛ්‍ය අධ්‍යයන පුස්තකාල, විශේෂ ව්‍යාපාරවලට අයත් පුස්තකාල හා රෝහල්වල පිහිටි පුස්තකාල කාර්‍යක්ෂම අයුරින් පවත්වා ගෙන යන ලද අතර ඒවායේ සේවය එම ආයතනවල සේවය කරන නිලධාරීන්ට ලැබින.

දෙපාර්තමේන්තුවේ පුස්තකාල පහසුකම් සියලුම නිලධාරීන්ට ලබා දෙන්නේ නොමිලයේය. පිටපළාත්වල සිටින සාමාජිකයින්ට තැපැල් මගින් පොත් සපයනු ලබන අතර ප්‍රධාන පුස්තකාලයට පැමිණෙන්නෝ පෞද්ගලිකව පොත් ලබා ගෙන යති.

ප්‍රධාන පුස්තකාලයට පැමිණ පොත් බැලීමේ කාර්‍යය සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කරන ලදී. සකලාංගයන්ගෙන් අනූන පැමිණ පොත් බැලීමේ අංශයක් පිහිටුවීම සඳහා උත්සාහ දරන ලදී.

මුදල් හිඟය නිසා ප්‍රධාන පුස්තකාලයට එකතු කළ හැකි වූයේ වෙළුම් 36ක් පමණක් වූ වද ප්‍රවර්තන ප්‍රකාශනයක් සියල්ලක්ම වාගේ නිතිපතා සාමාජිකයන් අතට පත් කෙරින. ගිය වසරේ දී මෙන් ම ආයතනවල පිහිටි පුස්තකාලවලට ද කාලීන සඟරා සපයන ලද අතර මෙම පුස්තකාලවලට සැලකිය යුතු අළුත් පොත් ප්‍රමාණයක් ද සැපයින. පොත් ගෙනයාම ද කලට වඩා වැඩිවී ඇති අතර අළුත් හා කාලනුරූපවූ පොත් සඳහා ලැබෙන ඉල්ලීම් ද අධික වී ඇත.

තෙමසකට වරක් පළ කෙරෙන පුස්තකාල ප්‍රවෘත්ති සංග්‍රහය නොකඩවා පළ කරමින් පුස්තකාල පහසුකම් සම්බන්ධ අළුත් ම තොරතුරු මෙම සංග්‍රහය මගින් සපයා දෙන ලදී.

ගතවූ වර්ෂයේ දී ප්‍රාදේශීය රෝහල්වල අංග සම්පූර්ණ වෛද්‍ය පුස්තකාලයන් පිහිටුවීම සඳහා සැලැස්මක් පිළියෙල කෙරින. 1962/63 වර්ෂයේ දී මේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම ඇරඹින. අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, මහනුවර හා

රත්නපුරය යන ප්‍රාදේශීය රෝහල්වල පුස්තකාල පිහිටුවීමට විධි විධාන යොදන ලදි. වෛද්‍ය විද්‍යාපීඨයේ නා නා මහාචාර්යවරුන්ගේ නිර්දේශ අනුව තෝරාගත් පොත් සංඛ්‍යාවක් මූලික වශයෙන් පැමිණ කියවීම සඳහා ප්‍රාදේශීය පුස්තකාල ඇරඹීමට මුල පිරීමක් වශයෙන් උක්ත රෝහල්වලට සපයන ලදි.

ඇතැම් මහ රෝහල් රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා ද පුස්තකාල අරඹා තිබේ.

X වැනි පරිච්ඡේදය

අභ්‍යාස පරිපාටි

මතු සඳහන් වර්ගවලට අයත් නිලධාරීන්ට ඒ ඒ වර්ගවලට නියමිත අභ්‍යාස පරිපාටිවල පුහුණුව ලබා දෙන ලදි.

වෛද්‍ය නිලධාරීන්

1. දෙපාර්තමේන්තු ශිෂ්‍යත්ව පරිපාටිය යටතේ කිසිවකුට ශිෂ්‍යත්වයක් ප්‍රදානය නොකරන ලදි. තෝරාගනු ලැබූ නිලධාරියාගේ වියදමින් එතෙර දී පුහුණුව ලැබීමේ පශ්චාත් උපාධි පරිපාටිය යටතේ, II වෙනි ශ්‍රේණියේ සිට I වෙනි ශ්‍රේණියට උසස් කිරීමේ සුදුසුකම් ලබාගනු පිණිස වෛද්‍ය නිලධාරීන්ට මාස 14ක නිවාඩුවක් දෙනු ලැබේ. මෙම පරිපාටිය යටතේ නිර්වින්දක ශාස්ත්‍රය, චක්ෂු විද්‍යාව, ව්‍යාධිවේදය, මහජන සෞඛ්‍ය සහ පොදු ශල්‍ය කර්මය යන විෂයන් පුරුදු පුහුණු කරවීම පිණිස නිලධාරීන් 11 දෙනකු තෝරාගත් නමුත් එම නිවාඩුව ලබා ගත්තේ 9 දෙනකු පමණයි.

ලංකා විශ්ව විද්‍යාලයේ අවුරුද්දක කාලසීමාවක් තුළ දී ලංකා ඩී. ටී. එම්. හා (එච්) යන පාඩම් මාලාව හදාරන පිණිස මෙම පරිපාටිය යටතේ නිලධාරීහු 6 දෙනෙක් නිවාඩු ලබාගත්හ.

දන්ත ශල්‍ය වෛද්‍යවරයන්

2. වර්ෂය තුළ දී අරඹන ලද අළුත් පාඨ මාලාවක් නොවීය.

හෙදකම

(අ) **හෙද ශිෂ්‍යාවන්.**—පුහුණුව සඳහා හෙද ශිෂ්‍යාවන් 617 දෙනකු බඳවා ගන්නා අතර අභ්‍යාස පාසල්වල පුහුණුව ලැබූ හෙදියන් 265 දෙනකු මාණ්ඩලික හෙදියන් වශයෙන් පත්කරන ලදි.

(ආ) **පශ්චාත්-උපාධි පාඨමාලා.**—වාර්ටු සොයුරියන් වශයෙන් පුහුණුව ලැබීම සඳහා හෙදියන් 52 දෙනකු 1963.6.1 වැනි දින පත් කරන ලදි. එම හෙදියක් තම පුහුණුව 1964 දෙසැම්බර් මාසයේ දී අවසාන කර වාර්ටු සොයුරියන් ලෙස පත්වීම් ලබනවා ඇත.

(ඇ) **විශේෂිත පාඨමාලා.**—මාණ්ඩලික හෙදියන් 16 දෙනෙකුට ඇස්හෙදි පුහුණුවක් 27 දෙනකුට ශල්‍යාගාර පුහුණුවත්, 8 දෙනකුට විකලාංග වෙදකම ගැනත් 10 දෙනකුට ලේ බැංකු ගැනත් පුහුණුවක් ලබා දෙන ලදි.

(ඈ) **ආධාර හෙදියන්.**—සැලකිල්ලට භාජන වූ වර්ෂය තුළ දී ආධාර හෙද ශිෂ්‍යාවන් 500 දෙනකු බඳවා ගන්නා අතර එම කාලසීමාව තුළ දී පුහුණුව ලබා 335 දෙනකු පත්වීම් ලබා ගන්නා ලදි.

මහජන සෞඛ්‍ය හෙදකම

4. (අ) **පශ්චාත් ප්‍රාථමික පාඨමාලාව.**—1962 ඔක්තෝබර් සිට 1963 ජූනි අවසානය දක්වා පශ්චාත්-මූලික පාඨමාලා සංවිධානය කෙරින. මහජන සෞඛ්‍ය හෙද ශිෂ්‍යාවන් 21 දෙනෙක් 62.10.1 වැනි දින ඇරඹූ මහජන සෞඛ්‍ය හෙද පාඨමාලාව මාස 9ක් තුළදී හදරා 1963 ජූනි අන්තිමේදී අවසාන කළහ.

නවපත්වීම් ලත් මහජන සෞඛ්‍ය හෙද ශිෂ්‍යාවන් 22 දෙනෙක් වින්නඹු කර්මය විෂයයෙහි පුහුණුවක් 63.1.1 වැනි දින ද සොයිසා ගැහැණු රෝහලේදී ආරම්භ කළහ. ඔවුන් අතුරෙන් 18 දෙනෙක් තම පාඨමාලාව 1963 සැප්තැම්බර් මාසයේ දී අවසාන කොට මහජන සෞඛ්‍ය හෙද පුහුණුව සඳහා කළුතර ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෙත ඉදිරිපත් වූහ. අතිරේක නිවාඩු ලැබ සිටීමේ හේතුවෙන් පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකිවූ අනෙක් සිව්දෙනා 1963 දෙසැම්බර් මාසයේදී පරීක්ෂණයට පෙනී සිට 64.1.1 වැනි දින කළුතර ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් වෙනවා ඇත.

(ආ) **සංස්කරණ පංති.**—1963 අගෝස්තු මාසයේ දී මහජන සෞඛ්‍ය හෙදියන් 17 දෙනකුගෙන් සමන්විත වූ පංතියක් පවත්වන ලදි.

(ඇ) **ශිෂ්‍ය හෙද ප්‍රාථමික පාඨ මාර්ග.**—මතු සඳහන් සෑම හෙද අභ්‍යාස විදුහලකම පාහේ මහජන සෞඛ්‍ය හෙදකම පිළිබඳ ප්‍රාරම්භක හැඳින්වීමක් සතියක කාලයක් තුළදී කරන ලදී.

කොළඹ හෙ.ඇ.වි.	—	කළුතර සෞඛ්‍ය ආයතනය
මහනුවර හෙ.ඇ.වි.	—	කඩුගන්නාව සෞඛ්‍ය ආයතනය
යාපනය හෙ.ඇ.වි.	—	තෙල්ලිපලේ සෞඛ්‍ය ආයතනය
රත්නපුර, හෙ.ඇ.වි.	—	රත්නපුර සෞඛ්‍ය ආයතනය

මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්

5. මහජන සෞඛ්‍ය ශිෂ්‍යයින් 49 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් තෝරාගෙන 1963 අප්‍රේල් 1 වැනි දින සිට ඔවුන් පුහුණුවේ යොදවන ලදි.

1962 පෙබරවාරි මාසයේදී පුහුණුව ඇරඹූ ශිෂ්‍යයින් 40 දෙනා අතුරෙන් 39 දෙනකු මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් ලෙස පත් කරන ලදි.

මහජන සෞඛ්‍ය වින්නඹුවන්

6. (අ) **වින්නඹු ශිෂ්‍යාවන්.**—සමාලෝචනයට භාජන වූ වර්ෂය තුළ දී ක්ෂේත්‍ර අභ්‍යාසයක් ලබා දෙන ලද්දේ මතු විස්තර දැක්වෙන අයුරිනි.

කළුතර	...	65
පානදුර	...	39
කුරුණෑගල	...	45
තෙල්ලිපලේ	...	12 (3 9)

(ආ) **සංස්කරණ පාඨමාර්ග.**—මතු සඳහන් ස්ථානවල මෙම පංති සංවිධානය කෙරින.

කළුතර	...	1	පානදුර	...	1
කුරුණෑගල	...	2	තෙල්ලිපලේ	...	1
රත්නපුර	...	1	බදුල්ල	...	1

(ඇ) **මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන් සඳහා සූතිකා හා ළදරු කටයුතු සම්බන්ධ විශේෂ පාඩම් මාලාව.**—පරිපාලන මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන්ගේ රාජකාරි කටයුතු කිරීම සඳහා තෝරා ගනු ලැබූ අයගේ ප්‍රයෝජනය පිණිස මෙම පාඩම් මාලාව විශේෂයෙන් පවත්වන ලදි.

කළුතර—අවුරුදු දහයකට අධික පළපුරුද්දක් ඇති මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන් 10 දෙනකු තෝරා ගන්නා ලදි. ඔවුන් අතුරෙන් තිදෙනෙක් සමත්වූහ.

මේ හැරුණුකොට, කළුතර දී සංවිධානය කරන ලද වෙනත් සෑම ඉගැන්වීම් පාඩම් මාලාවලට මහජන සෞඛ්‍ය ශික්ෂකයින් ද මහජන සෞඛ්‍ය ජ්‍යෙෂ්ඨ ශික්ෂකයින් ද සහභාගිවන ලදි.

ඇපෝතිකරිවරුන්

7. ලංකා වෛද්‍ය විද්‍යාල සභාව විසින් දෑඅවුරුදු කාලසීමාවක් තුළ පවත්වන පාඨ මාර්ගය සඳහා අපෙක්ෂකයින් 49 දෙනෙකු බඳවා ගන්නා ලදි. වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුවට පත් කරනු ලැබූ ඇපෝතිකරිවරුන් ගේ සංඛ්‍යාව 33කි. තෝරා ගනු ලැබූ ජ්‍යෙෂ්ඨ ඇපෝතිකරිවරු දහදෙනෙක් කුරුණෑගල රජයේ රෝහලේ දී තුන් මාසයක කාලයක් තිස්සේ සංස්කරණ පාඨමාලාවක යෙදුනහ.

හෙසජ්ජකයන් (පාමසිස්ට්ස්)

8. එක් අවුරුද්දක පුහුණුව සඳහා ලංකා වෛද්‍ය විද්‍යාලීය සභාව විසින් අපෙක්ෂක යින් 32දෙනෙකු බඳවා ගන්නා ලදි. ආධුනික හෙසජ්ජකයින් 12 දෙනකු පුහුණුවීම සඳහා අනුමත කරන ලද රෝහල්වල පුහුණු කිරීමේ යොදන ලදි.

විකිරණ ශිල්පීන්

9. 62.1.1. වැනි දින සිට පුහුණු කිරීම සඳහා බඳවා ගන්නා ලද අපෙක්ෂකයින් 5 දෙනාගෙන් එක අපේක්ෂකයෙක් පසුව පාසලෙන් අස්විය. අනෙක් සිව්දෙනාට 1963 නොවැම්බර් මාසයේ පවත්වනු ලබන එම්. එස්. ආර්. පරීක්ෂණයට ඉදිරිපත් කරනවා ඇත. 16 දෙනකුගෙන් සමන්විත පුහුණුව ලබන්නන්ගේ තවත් කණ්ඩායම 63.2.1 වැනි දින සිට බඳවා ගනු ලැබීය. ඔවුන් අතුරෙන් 5 දෙනෙක් පාසැල අත්හැර ගියහ.

කායික චිකිත්සකයන්

10. 61.3.15 වැනි දින සිට පුහුණුව ඇරඹූ ආධුනිකයින් 15 දෙනකු අවසාන පරීක්ෂණය සඳහා 63.3.12 වැනි දින ඉදිරිපත් කෙරින. මේ අය අතුරෙන් පරීක්ෂණයෙන් සමත් වූයේ තිදෙනෙක් පමණයි. ඒ අය 63.3.12 වැනි දින සිට සහකාර කායික චිකිත්සකයන් ලෙස පත් කරන ලදි. සෙසු 9 දෙනා 63.6.13 වැනි දින පැවැත් වූ පරීක්ෂණය පෙනී සිටියහ. ඔවුන්ගෙන් 7 දෙනෙක් මෙම පරීක්ෂණයෙන් සමත්වූහ. ඒ අය 63.6.13 වැනි දින සිට සහකාර කායික චිකිත්සකයන් වශයෙන් පත්වීම් ලදහ. ඉතිරි වූ දෙදෙනා 63.9.9 වැනි දින පැවැත්වූ පරීක්ෂණයෙන් සමත්වූ අතර ඔවුහු 63.9.9 වැනි දින සිට සහකාර කායික චිකිත්සකයන් ලෙස පත්වීම් ලැබූහ.

වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥයන්

11. 1962 ඔක්තෝබර් මාසයේ දී බඳවා ගනු ලැබූ ආධුනිකයින් 26 දෙනා තමන්ගේ එක අවුරුදු පුහුණුව ඇරඹූ අතර, අවුරුද්දක අධ්‍යයන දේශනා සහ ප්‍රායෝගික වැඩ

නිමකළා වූද, පරීක්ෂණය සාර්ථක අන්දමින් අවසන් කළා වූද, ආධුනිකයින් 24 දෙනෙක්, වෛද්‍ය පර්යේෂණ ආයතනය ඇතුළු කොළඹ නා නා විධ ආයතනවල දී 1962 ඔක්තෝබර් මාසයේ සිට තම සීමාවාසික කාලය ඇරඹූහ.

XI වැනි පරිවේජදය

පරිපාලනය හා සේවක සංඛ්‍යා

පරිපාලනය

1. දෙපාර්තමේන්තුව විමධ්‍යගත කිරීමේ කටයුතු පරිපූර්ණ කිරීම සඳහා තවදුරටත් විධි විධාන යොදන ලදි. එහෙත් පවරා දෙන ලද බලතල යටතේ කළ යුතු වැඩ සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ඉල්ලීම බොහෝ විමධ්‍යගත ආයතන මගින් කරන ලදින් ඒ සම්බන්ධ නියෝග නිකුත් කරනු ලැබිය.

භාණ්ඩාගාරයේ ආධාර ඇතිව අභ්‍යාස පන්ති පවත්වන ලදි. මෙම පාඨ මාර්ග මගින් විමධ්‍යගත කොට්ඨාශවල ප්‍රධානීන් සමහරෙකුටත් ලේකම්වරුන් පිරිසකටත් පරිපාලනය පිළිබඳ සමසක ක්ෂේත්‍රමය අල්ලා උපදෙස් දෙන ලදි. මෙම පුහුණුව නිසා දැනට පවතින තත්ත්වය හා අඩුපාඩුකම් මග හැරෙනු ඇතැයි විශ්වාස කෙරේ.

සේවක සංඛ්‍යා

2. දෙපාර්තමේන්තුව සඳහා අනුමත මුළු සෙවක සංඛ්‍යාව 32,139 දෙනෙකි. මෙම සංඛ්‍යාව සේවාවන් සතර යටතේ වෙන්කළ විට පහත සඳහන් පරිදි බෙදේ :—

(i) වෛද්‍ය සේවා	24,749
(ii) මහජන සෞඛ්‍ය සේවා	5,437
(iii) රසායනාගාර සේවා	896
(iv) ඒකාබද්ධ සේවා	1,084
	32,139

වෛද්‍ය නිලධාරීන් හා හෙදි සේවිකාවන් සම්බන්ධයෙන් පැවැති දරුණු හිඟය එසේම පවතින බැව් හැඟී ගියෙන් මෙම තත්ත්වය මගහැරවීම සඳහා විධි විධාන යෙදින.

වෘත්තීය සමිති

3. දෙපාර්තමේන්තුවේ නා නා තරාතිරම්වලට අයත් සේවක සේවිකාවන් නියෝජනය කෙරෙන වෘත්තීය සංගම්වල සංඛ්‍යාව 61ක් දක්වා වැඩි විය. මේ නිසා දෙපාර්තමේන්තුවට ලැබුණු නියෝජනයන්ගේ සංඛ්‍යාව අධික වූ අතර ඉදිරිපත් කරන ලද ප්‍රශ්න අතුරින් බොහොමයක් සමථයකට පත්කරන ලදි. අදාල වෘත්තීය සංගම් හා සාකච්ඡා කිරීමේ මාර්ගයෙන් එතෙක් අතපසුව පැවති කරුණු සංඛ්‍යාවක් නිරාකරණය කෙරිනි.

රාජ්‍ය භාෂාව

4. රාජ්‍ය භාෂා පණත ක්‍රියාත්මක කිරීම අතින් විශාල දියුණුවක් ලැබිය. ගණක හා පොදු පරිපාලනමය වශයෙන් කෙරෙන ලිපි ගනුදෙනුවලදී රාජ්‍ය භාෂා මාධ්‍යය පුළුල් ලෙස යොදවනු ලැබිය. දෙපාර්තමේන්තුවේ කාර්‍ය සංවිධාන සංග්‍රහයන් වැදගත් ආඥා පණතුත් පරිවර්තනය කිරීම සඳහා ක්‍රියා කරන ලදි. සිංහල යතුරු ලියන යන්ත්‍ර වැඩි

ගණනක් ලබා ගත් නමුදු තවමත් අවශ්‍ය ප්‍රමාණය ලැබී නැත. මෙම යන්ත්‍ර පරිහරණය කිරීම සඳහා යතුරු ලේඛක ලේඛිකාවන් වැඩි සංඛ්‍යාවක් පුහුණු කරවනු ලැබිය. ප්‍රධාන වශයෙන් සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයෙන් යුත් නිලධාරීන් හිඟවීම නිසාත් ඇතැම් කොටස්වලට අයත් ශිල්පිය හා කාර්මික නිලධාරීන් රජයේ සේවයේ රැඳී සිටීම සඳහා සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වය ලැබීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම නිසාත් ශිල්පිය කරුණුවලදී සිංහල භාෂා මාධ්‍යය යොදා ගැනීම අපහසු වී ඇත.

XII වැනි පරිච්ඡේදය

සෞඛ්‍ය සභාව

1962/63 මුදල් වර්ෂය ගෙවී යන විට සෞඛ්‍ය සභාව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුනේ විය :—

සභාපති—වෛද්‍ය ඩබ්ලිව්. ඒ. කරුණාරත්න, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

වෛද්‍ය වී. ටී. එච්. ගුණරත්න, නියෝජ්‍ය අධ්‍යක්ෂ (වෛද්‍ය සේවා).

වෛද්‍ය බී. කේ. ද සිල්වා, වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ, (මහජන සෞඛ්‍ය සේවා).

වෛද්‍ය ඩී. බී. ගුණසේකර, වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ, (රසායනාගාර සේවා).

වෛද්‍ය පී. ආර්. අන්තෝනිස්, ශල්‍ය වෛද්‍ය මහාරෝහල, කොළඹ.

වෛද්‍ය ඇම්. ඕ. ආර්. මැඩොන්සා, වෛද්‍යාඥ, මහ රෝහල, කොළඹ.

වෛද්‍ය ජී. වී. ද කෘස්, දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි, මීගමුව.

වෛද්‍ය ඊ. ඩබ්. ජයරත්නම්, ප්‍රසව විද්‍යාඥ, කාසල් වීදියේ කාන්තා රෝහල.

වෛද්‍ය ජේ. හිලරි ගුණවර්ධන.

මහාචාර්ය ජී. එච්. කුරේ.

වෛද්‍ය ලූෂන් ගුණසේකර.

වැඩබලන ලේකම් ඩී. පී. පී. සමරසේකර.

සෞඛ්‍ය සභාව ආරම්භයේ සිටම එහි ලේකම්වරයාව සිටි පී. සත්‍යනාදන් මහතා 1963 ජනවාරි මාසයේ දී රජයේ සේවයෙන් විශ්‍රාම ලැබිය. ඔහු වෙනුවට ස්ථිර පත්වීමක් කරන තුරු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරයාගේ පෞද්ගලික සහකාර ඩී. පී. පී. සමරසේකර මහතා වැඩබලන ලේකම් ලෙස පත් කෙරින. වෛද්‍ය පී. ආර්. ත්‍යාගරාජා 1963. 4. 15 වැනි දින රජයේ සේවයෙන් විශ්‍රාම ලැබීමේ හේතුවෙන් ඔහුගේ සෞඛ්‍ය සභා සාමාජිකත්වය අහිමි විය. ඔහු වෙනුවට 1963. 9. 14 වැනි දින සිට වෛද්‍ය ඊ. ඩබ්. ජයරත්නම් පත්විය. දැවැන්ත සේවා කාලය අවසන් වූ වෛද්‍ය පී. ආර්. අන්තෝනිස් තවත් දෙවසරක කාලයක් සඳහා 1963. 9. 14 වැනි දින පත්කරනු ලැබිය. මෙම සභාවේ සාමාජිකයකු ලෙස කටයුතු කළ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මහජන සෞඛ්‍ය සේවා) වෛද්‍ය පී. රාජසිංහම් 1 963.8.25 දින රජයේ සේවයෙන් විශ්‍රාම ලැබීමෙන් පසු එම සාමාජිකත්වයට වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (මහජන සෞඛ්‍ය සේවා) වෛද්‍ය බී. කේ. ද සිල්වා පත් කෙරින.

වර්ෂය තුළ රැස්වීම් වාර 9 යක් පැවැත්විය. 1962. 10. 3 වැනි දින පැවැත්වූ රැස්වීම් වාරයේ දී පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා මිළයට ගත යුතු උපකරණ ගැන සොයා බැලීම සඳහා පත් කරන ලද උප කාරක සභාවේ වාර්තාව සුළු වෙනස් කිරීම්

කීපයක් සහිතව අනුමත කෙරින. කොළඹ මහරෝහලේ විශේෂඥ චිකිත්සාගාර සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා 1962. 11. 13 වැනි දින පැවැත්වූ රැස්වීමේ දී පත්කරන ලද උපකාරක සභාවේ වාර්තාව සජිර ලේකම් වෙත යැවීමට තීරණය කරන ලදී. සෞඛ්‍ය සභාවේ නිරීක්ෂණය සඳහා ස්ථිර ලේකම් විසින් යොමු කරවන ලද කරුණු අතර පහත සඳහන් විෂයයන් ද විය:—

(1) අධ්‍යාපන, ප්‍රාදේශීය හා මූලික රෝහල් වලට පත් කළ යුතු විශේෂඥ වෛද්‍යවරුන්ගේ සුදුසු කම්.

(2) පත්කිරීම සඳහා විශේෂඥ වෛද්‍යවරුන් තෝරා ගැනීමේ දී ඔවුන්ගේ ගෘහයන් ගතයුත්තේ ශ්‍රේණිය ජ්‍යෙෂ්ඨත්වය ද නැත්නම්, විශේෂඥතා ජ්‍යෙෂ්ඨත්වය ද?

(3) විශේෂඥ සුදුසුකම් වර්ග කිරීම.

(4) ඔප්ටිමෙට්‍රි පිළිබඳ පාසලක් හා රෝහලක්/ලංකාවේ පිහිටුවීමේ ප්‍රශ්නය.

ඉහත සඳහන් විෂයයන්ගෙන් 1, 2 හා 3 පිළිබඳ සෞඛ්‍ය සභාවේ උපදෙස් ස්ථිර ලේකම් වෙත යවන ලදී. විශේෂඥ වෛද්‍යවරුන් වර්ග කිරීමේ ප්‍රශ්නය පහත නම් සඳහන් උප කමිටුව මගින් සලකා බලන ලදී.

වෛද්‍ය වී. ටී. එච්. ගුණරත්න, නියෝජ්‍ය අධ්‍යක්ෂ (වෛද්‍ය සේවා)

වෛද්‍ය ඩී. බී. ගුණසේකර, වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ, (රසායනාගාර සේවා)

වෛද්‍ය පී. ආර්. න්‍යාගරාජා, ප්‍රසව විද්‍යාඥ, ද සොයිසා කාන්තා රෝහල, කොළඹ

වෛද්‍ය ඇම්. ඕ. ආර්. මැඩොන්සා, වෛද්‍යඥ, මහාරෝහල, කොළඹ

ඩී. පී. පී. සමරසෙකර මහතා, වැඩ බලන ලේකම්.

සෞඛ්‍ය සභාව මගින් අනුමතිත විස්තරාත්මක වාර්තාවක් වැඩිදුර ක්‍රියා කිරීම සඳහා ස්ථිර ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

ඔප්ටිමෙට්‍රි පාසලක් හා රිප්රැක්ෂන් රෝහලක් පිහිටුවීම පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් ලංකා ආක්ෂිවේද සංගමයේ අදහස් ලබාගත යුතු යයි තීරණය විය. මෙම කරුණ සංගමයේ ලේකම් වෙත ඉදිරිපත් කර පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිටී.

XIII වැනි පරිච්ඡේදය

ප්‍රවාහන සේවය

පවත්නා ප්‍රවාහන සේවයට වර්ෂය තුළ දී රෙනෝල්ට් ගිලන් රථ 14ක් ද ඔස්ටින් කන්ට්‍රිමන් 3ක් ද ලෙපාක්ස්වාගන් මයික්‍රොබස් 3ක් ද ඔස්ටින් බස් 1ක් ද මිට්සිසුහි ජීප් 1ක් ද වැඩිපුර සපයන ලදී. මෙසේ වාහන ප්‍රමාණය 336 දක්වා වැඩිවිය. මෙම අළුත් වාහනවලින් මයික්‍රො බස් තුනක් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (යු.ඇන්.අයි.සී.ඊ.ඇෆ්) සම්බන්ධව සංවිධානය මගින් පුහුණු කිරීමේ කටයුතු පහසු ලෙස ඉටු කිරීමේ අභිලාසයෙන් හෙදි ඇබැසි විදුහලේ ප්‍රයෝජනය සඳහා ලැබූ ආධාර වේ.

දෙපාර්තමේන්තුවේ දැනට ඇති ගිලන් රථ 98න් 38ට වැඩි ගණන් අවුරුදු පහකට වැඩි වයස්ගත වී ඇති අතර ඒවායින් සමහරක් ප්‍රයෝජනයට ගත නොහැකි තරම් ය.

(අනතුරු සිදුවූ වාහන ඇතුලුව) සෑම වර්ගයට අයත් වාහනවල විශාල වශයෙන් අලුත් වැඩියා කිරීමට දල වශයෙන් රු. 55,000ක් වැය කර ඇත.

තවත් ගිලන් රථ 10ක් ලබා ගැනීම සඳහා වර්ෂය තුල දී කටයුතු සලස්වන ලද අතර එම වාහන ලබන මුදල් වර්ෂය තුළ දී ලැබේ යයි විස්වාස කළ හැක.

දෙපාර්තමේන්තුවේ වාහන අලුත් වැඩියා කිරීම් හා ගැනීමත් ඒවායේ යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය මනාසේ තබා ගැනීමත් සඳහා දෙපාර්තමේන්තුවට මධ්‍යම වාහන අළුත් වැඩියා කිරීමේ කම්හලක් ඇති කිරීමේ හැකියාව ගැන සොයා බලා වාර්තා කරන ලෙස මහා භාණ්ඩාගාරය මගින් මැලේරියා මර්ධන ව්‍යාපාරයේ අධිකාරිගේ සභාපතිත්වය යටතේ කමිටුවක් පත් කරන ලදී. එම වාර්තා කල්නොයවා පිටවේ යයි විශ්වාස කෙරේ.

රථ වාහන වලට සිදුවන අනතුරු වැඩිවෙමින් පැවතුන අතර සුළු හා විශාල අනතුරු 23ක් සිදු විය. වාර්තා කරන ලද අනතුරුවලින් බොහොමයක් වැලැක්විය නොහැකි ඒවා ලෙස අනාවරනය විය. සවලපයක් රියදුරන්ගේ නොසැලකිලිමත්කම නිසා සිදුවූ බැව් ද පෙනේ. අළුත් ලෙපාක්ස්වාගන් සහ රෙනෝල්ට් ගිලන් රථවල සේවයේ යෙදෙන රියදුරන් සඳහා පසුගිය වර්ෂයේ දී ආරම්භකළ පුහුණු කිරීම් කටයුතු ලබන වර්ෂයේ දී අළුත් ගිලන් රථ ලැබුණු විට ද ඒ ලෙස ම පවත්වා ගෙන යනු ලැබේ.

XIV වැනි පරිවෙජදය

ජාත්‍යන්තර සම්මේලනය

1963 දී එතෙරැ ජාත්‍යන්තර සම්මේලන දසයෙකැ දී ලංකාව වෙනුවෙන් නියෝජිතයෝ සහභාගි වූහ.

1. එක්සිය දොළොස් රටෙකින් නියෝජිතයින් පැමිණැ සහභාගි වූ ජගත් සෞඛ්‍ය සම්මේලනයේ දහසය වන රැස්වීමේ වාරය 1963 මැයි 7 වන දා සිටැ 24 වනදා දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවරැ දී පැවැත්විණ. එම රැස්වීම් වාරයේ දී ලංකාව වෙනුවෙන් පෙනී සිටියේ මොවුහු යැ.

(i) ජර්මන් පෙඩරල් ජන රජයේ ලංකා තානාපති බී. එෆ්. පෙරේරා මැතිඳුන් නියෝජිත පිරිසේ නායකයා හැටියට.

(ii) වෛද්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍යාචාර්ය වී. ටී. එච්. ගුණරත්න මහතා.

මෙම රැස්වීමේ දක්නට ලැබුණ විශේෂාංගයක් නම්, ජගත් සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ, එම්. ඩී. නාමධාරි වෛද්‍යාචාර්ය එම්. ජී. කැන්දො මහතා තවත් පස් අවුරුදු කාල සීමාවකට ඒකමතිත්වයෙන් යළි පත් කර ගැනීමයි.

රැස්වීම ඇමතූ ලංකා නියෝජිත පිරිසේ නායක බී. එෆ්. පෙරේරා මැතිඳුන්, මහ අධ්‍යක්ෂ තැනගේ මහඟු සේවය ගැන ඔහුට සතුට පළ කොටැ, පසු ගිය අවුරුදුවල දී ලංකාවට ගෙනැ දුන් අනගි ආධාර නිමිත්තෙන් ජගත් සෞඛ්‍ය සංවිධානයට ලංකාවේ ස්තුතිය පුද කළේයැ. රටෙන් මැලේරියා සහමුලින් මැ නැති කර දැමීමෙහි ලංකාව ලැබූ ප්‍රගතිය සැකෙවින් ගෙනැ හැර දැක්වූ එතුමෝ, එහි ප්‍රතිඵලයක් හැටියට අද දිනැ ලංකාවේ ඉඩම් අක්කර කෝටි 0.14ක් අස්වැද්ද ඇති බැව් පැවසූහ. ලංකාවේ මරණ ප්‍රමාණය පහළ ගිය නියාවත්, ඒ හේතුවෙන් ජනගහනය 100කට 28ක් පමණ

සවභාවයෙන් වැඩි වූ නියාවත් ඔහු සඳහන් කළේ යැ. බෝවෙන රෝග සම්බන්ධයෙන් ක්ෂය රෝග මර්ධන සහ බරවා මර්ධන ව්‍යාපාර ගැනත් සඳහන් කළේ යැ. අප රටේ පැවැති බාලක පක්ෂාඝාත උවදුර අහෝසි කිරීම සඳහා පටන් ගත් ජාතික බාලක පක්ෂාඝාත ප්‍රතිශක්ති කරණී ව්‍යායාමය ගැන ද ඔහු සඳහන් කළේ යැ.

රැස්වීමේ වැඩ කටයුතු කරගෙනැ යන ලද්දේ (i) වැඩ සටහන් සහ අයවැය ලේඛන කමිටුව (ii) පාලන, මුදල් සහ නීති කටයුතු කමිටුව නම් ද කමිටුව මගිනි. පාලනය, මුදල් සහ නීති කටයුතු කමිටුවේ රැස්වීම්වලට බී. එෆ්. පෙරේරා මැතිඳුන් සහභාගි වූ අතරැ, වෛද්‍යාචාර්ය හේරත් ගුණරත්න මහතා වැඩ සටහන් සහ අයවැය ලේඛන කමිටුවේ රැස්වීම්වලට සහභාගි වී යැ.

මේ අවුරුද්ද සඳහා පාරිභාෂික සාකච්ඡා සොමු වූයේ "ශාස්ත්‍රීය ක්‍රියා විධිවල සමාජ හිසිය සහ වැළැක්වීමේ අංශ කෙරෙහි වෛද්‍යවරුන්ට උගැන්වීම සහ පුහුණුව දීම" පිළිබඳව යි. මේ මැයෙන් කතා කළ වෛද්‍යාචාර්ය ගුණරත්න මහතා, ලංකාවේ සෞඛ්‍ය සේවා නිර්මාණය ගැනත් නගර බද සහ ගම්බද පෙදෙස්වල ජනයාට සේවය දෙනු වස් සැලසුණ ආයතන වර්ග ගැනත් සඳහන් කෙළේ යැ.

2. ජගත් සෞඛ්‍ය සංවිධානයේ විධායක මණ්ඩලයේ දෙ-තිස් වන රැස්වීම් වාරය 1963 මැයි 27 වන දා ජිනීවාහි දී අරඹන ලදු වැ ඕව් දිනක් මුලුල්ලේ එය පැවැත්විණ. එම රැස්වීම් වාරයේ දී ලංකාව වෙනුවෙන් පෙනී සිටි (වෛද්‍ය සේවා) නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍යාචාර්ය වී. ටී. හේරත් ගුණරත්න මහතා, (ඉංග්‍රීසි) ප්‍රමුඛයා හැටියට ඡන්දයෙන් තේරුණි. තවද, පාලනය සහ මුදල් කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවටත් සෞඛ්‍ය ප්‍රතිපත්තිය අරබයා එ. ජා. අ. ළ. හ. අරමුදලේ සහ ජ. සෞ. සංවිධානයේ හවුල් කමිටුවේ සාමාජිකත්වයටත් පත්වීයැ.

3. ජගත් සෞඛ්‍ය සංවිධානයේ අග්නි දිග ආසියාතික දේශාන්විත කමිටුවේ සොළොස් වන රැස්වීම් වාරය 1963 සැප්තැම්බර 10 වන දා සිටැ 16 වන දා දක්වා බැංකොක් නුවරැ පැවැත්විණ. එම රැස්වීම් වාරයේ දී, නියෝජිතයා හැටියට (මහජන සෞඛ්‍ය සේවා) නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍යාචාර්ය බී. කේ. ද සිල්වා මහතාත් දෙවන නියෝජිතයා හැටියට ගාල්ලේ තාසිම් ලය චිකිත්සාගාරය භාර වෛද්‍ය නිලධාරී වෛද්‍යාචාර්ය පී. වී. කුරේ මහතාත් ලංකාව වෙනුවෙන් පෙනී සිටියහ.

මෙකී දේශයට අයත් රට-රාජ්‍ය නවයෙකැ නියෝජිතයෝ ද, එක්සත් ජාතීන් ගේ සහ එහි විශේෂිත බලමණ්ඩලවල නියෝජිතයෝ ද, රාජ්‍යාන්තර සංවිධානවල සහ රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයෝ ද මෙම රැස්වීම් වාරයට සහභාගි වූහ.

ලංකාව, ඉන්දියාව, ඇෆ්ගනිස්ථානය සහ මොන්ගෝලියාව යන රටවලින් යුක්ත වැඩ සටහන් සහ අය-වැය වාර්තා කමිටුවේ මුලසුනට වෛද්‍යාචාර්ය බී. කේ. ද සිල්වා මහතා තේරී පත් වී යැ. එය තෙ වරක් රැස් වී සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කළෙන්, දේශාන්විත කමිටුව එම වාර්තාව ඉක්බිති අනුමත කළා යැ.

රෝගීන් සොයා ගැන්ම සහ ක්ෂය රෝග මර්දනයට ගෙවලට ගොස් ප්‍රතිකාර කිරීම විෂයයෙහි පාරිභාෂික සාකච්ඡාවේ දී වෛද්‍යාචාර්ය පී. වී. කුරේ මහතා ප්‍රමුඛයා හැටියට තේරී පත් විණ. පාරිභාෂික සාකච්ඡාවේ දී ආ නිර්දේශ යළි සලකා බැලූ දේශාන්විත කමිටුව පසලොස් වන වාර්ෂික වාර්තාවෙන් දේශාන්විත අධ්‍යක්ෂ දුන් ප්‍රකාශය තහවුරු කළ අතරැ අවශ්‍ය ඖෂධ වර්ග නොවරදවා, දිගට මැ සපයා ගැනීමෙහි ලා ඒ ඒ ආංඛුවලට උපකාරී වීමේ මං සෙවීමටත් හැකි හැම විටෙක මැ එම ඖෂධ වර්ග තත් දේශවල මැ නිපදවීම දිරි ගැන්වීමටත් නිසි සේ නිර්මානය කරන ලද ජාතික වැඩ සටහන් සඳහා වුවමනා යැයි තක්සේරු කරන ලද ඖෂධ ප්‍රමාණ සම්බන්ධයෙන් ඒ ඒ ආංඛුවලින් විමසා බලන මෙන් ද දේශාන්විත අධ්‍යක්ෂගෙන් ඉල්ලා සිටියා යැ.

සාකච්ඡාවට ලක් වූ අනෙකුත් ප්‍රධාන කරුණු නම්, දේශාන්විත අධ්‍යක්ෂයේ පසළොස් වන වාර්ෂික වාර්තාව, ජගත් සෞඛ්‍ය රැස්වීම සහ විධායක මණ්ඩලය අනුගමනය කරන දේශයේ යහපත සඳහා වූ යෝජනා, මැලේරියා සමූලනාශක වැඩ සටහන්වලින් ලත් ලේ පටල බාහිර වශයෙන් මිශ්‍ර කොට පරීක්ෂා කිරීම, යා බද දේශවල වසූරි රෝගය මුලිනුපුටා දැමීමේ ජාතික ව්‍යාපාර සමකාලීන කිරීම, ගුරුන් සහ විශේෂඥයින් පුරුදු පුහුණු කරවීම ගැන අවධාරනය සහිත පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනයෙහි වැදගත් කම යනුවෙන් වීය.

4. ජගත් සෞඛ්‍ය සංවිධානයේ ආන්ත්‍රික රෝග සම්බන්ධ පණ්ඩිත උපදේශක කමිටුවේ රැස්වීම 1963 නොවැම්බර 12 වන දා සිටැ 18 වන දා දක්වා ජිනීවාහි දී, පැවැත්විණ. එම කමිටුවේ සාමාජිකයෙක් වූ සෞ. සේ. අධ්‍යක්ෂගේ වසංගත විද්‍යාඥ වෛද්‍යාචාර්‍ය පී. අරුමනායගම් මහතා රැස්වීමට ගියේ ය.

5. ජගත් සෞඛ්‍ය සංවිධානයේ අනුග්‍රහය ඇති වැ ළමුන්ගේ ප්‍රෝටීන් මන්ද පෝෂණ රසායනාගාරයේ පවත්වන ලදී. ලංකා විශ්ව—විද්‍යාලයේ ළමා රෝග චිකිත්සාව විෂයයෙහි මහාචාර්‍ය වූ මහාචාර්‍ය සී. සී. ද සිල්වා මහතාත්, කොළඹ වෛද්‍ය පර්යේෂණායතනයේ පෝෂණ අංශයේ වෛද්‍ය නිලධාරි වෛද්‍යාචාර්‍ය කේ. මහාදේව මහතාත් ලංකාව වෙනුවෙන් ඊට සහභාගි වූහ. වැඩ කිරීමේ ලියකියවිලි පහක් ඉදිරිපත් වී තිබුණේ ඒ ගැන සඳහන් සාකච්ඡා කැරිණ.

(i) ඉන්දියානු පයෙෂණ සභාවේ පෝෂණකාරි පයෙෂණ රසායනාගාරවල අධ්‍යක්ෂ, එම්. ඩී. පී. එච්. ඩී. නාමධාරි වෛද්‍යාචාර්‍ය සී. ගෝපාලන් මහතා විසින් අග්නිදිග ආසියාවේ ප්‍රෝටීන් මන්දපෝෂණය එහි බහුලත්වය සහ වැදගත්කම.

(ii) මහාචාර්‍ය ජෝන් වෙබ් සහ වෙල්ලෝර්හි ක්‍රෛස්ත වෛද්‍ය විද්‍යාලයේ සිටින ඔහුගේ සගයින් විසින් ප්‍රෝටීන් මන්දපෝෂණය, ශාරීරික අංග සහ ව්‍යවස්ථාවේදය.

(iii) මයිසූර් මධ්‍යම දේශයේ ආහාර භාවිතා ක්‍රම පර්යේෂණ ආයතනයේ වෛද්‍යාචාර්‍ය ඒ. ශ්‍රීන්වාහන් මහතා විසින් රෝග වැළැක්වීමෙහි සහ ප්‍රතිකාර කිරීමෙහි එළවලු ප්‍රෝටීන් වර්ග යෙදීමට ශාරීරික විද්‍යානුකූල සහ ජීව විද්‍යානුකූල පදනම.

(iv) මදුරාසියේ ළමා රෝග විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්‍ය ඒ. ටී. ආචාර් විසින්, ළමුන් අතර එළවලු ප්‍රෝටීන් ආහාර වර්ග භාවිතා කිරීමෙහි ශාරීරික සහ ක්ෂේත්‍ර අත්දැකීම්.

(v) කල්කටාවේ සමස්ත භාරත ස්වස්ථතා සහ මහජන සෞඛ්‍ය ආයතනයේ වෛද්‍යාචාර්‍ය කේ. බාව් මහතා විසින්, ප්‍රෝටීන් මඳ ආහාර ගන්නා බිළිඳුන්ට සහ ළමුන්ට අතිරේක ආහාරයක් හැටියට එළවලු ප්‍රෝටීන් පාවිච්චි කිරීම.

6. සැරසුන දෙමාපිය කම පිළිබඳ සත් වන ජාත්‍යන්තර සම්මේලනය 1963 පෙබරවාරි 10 වන දා සිටැ 16 වනදා දක්වා, ජාත්‍යන්තර සැරසුන දෙමාපිය බල මණ්ඩලයේ අනුග්‍රහය ඇති වැ සිංගප්පූරුවේ දී පැවැත්විණ. එම සම්මේලනයේ දී ලංකාව වෙනුවෙන් මේ අය පෙනී සිටියහ :—

(1) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍යාචාර්‍ය වී. අ. කරුණාරත්න.

(2) ස්වීඩන්—ලංකා පවුල් සංවිධාන නියමු අරමුණේ අධ්‍යක්ෂට ඔබින ජාතික ප්‍රතිරූපකයා වන වෛද්‍යාචාර්‍ය ඒ. එස්. රේබල් මහතා.

(3) රාගම රජයේ රෝහලේ ආගන්තුක සෝම රෝග විද්‍යාඥ සහ ප්‍රසව චිකිත්සිකා වෛද්‍යාචාර්‍ය එස්. චින්නතම්බි මෙනෙවිය.

(4) ස්වීඩන්—ලංකා පවුල් සංවිධාන නියමු අරමුණේ වෛද්‍යාචාර්ය එල්. ජී. අරුමුනායගම් මහත්මිය.

(5) ස්වීඩන්—ලංකා පවුල් සංවිධාන නියමු අරමුණේ ලේඛිකා ඊ. සී. ප්‍රනාන්දු මහත්මිය.

7. ලය රෝග පිළිබඳ සත්වන ජාත්‍යන්තර සම්මේලනය, ඇමරිකානු ලය වෛද්‍ය විද්‍යාලයේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ සභාවේ අනුග්‍රහය ඇති වැ 1963 පෙබරවාරි 20 වන දා සිටැ 24 වන දා දක්වා ඉන්දියාවේ නව දිල්ලියේ දී පැවැත්විණ. එම සම්මේලනයේ දී ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයේ අධිකාරි වෛද්‍යාචාර්ය ජේ. ආර්. විල්සන් මහතා ලංකාව වෙනුවෙන් පෙනී සිටියේ යැ.

8. 1963 සැප්තැම්බර් 25 වන දා සිටැ 28 වන දා දක්වා පීකිං නුවර පැවැත්වූ ජගත් විද්‍යා සේවක සම්මේලනයේ පූර්වගාමි රැස්වීමේ දී, චීන මහජන රජයේ විද්‍යාත්මක සහ කාර්මික සමාගමයේ ආරාධනය පරිදි, විද්‍යාව නගා සිටුවීමේ ලංකා සංගමයෙන් නම් කරනු ලැබූ ඩබ්. ටී. අයි. අලගරත්නම් මහතාත්, කොළඹ, වෛද්‍ය පර්යේෂණාය තනයේ වෛද්‍ය පර්යේෂණ නිලධරි වෛද්‍යාචාර්ය ජී. සී. එන්. ජයසූරිය මහතාත් ලංකාව වෙනුවෙන් සහභාගි වූහ. මෙම රැස්වීමේ දී සාකච්ඡාවට භාජනය වූ ප්‍රධාන අරමුණ වූයේ 1964 අගෝස්තු මසැ පීකිං නුවර පැවැත්වීමට යන ශාස්ත්‍රීය සම්භාෂණයේ න්‍යාය පත්‍රය යි.

9. චීන වෛද්‍ය සමාගමේ ශල්‍ය කර්ම සමිතියේ 8 වන සම්මේලන වාරය 1963 සැප්තැම්බර් 19 වනදා සිටැ 26 වනදා දක්වා පීකිං නුවර පැවැත්විණ. මෙම සම්මේලන වාරයට ලංකාව වෙනුවෙන් කොළඹ, මහා රෝහලේ වෛද්‍යාචාර්ය එල්. ඩී. සී. ඔස්පින් මහතා හා වෛද්‍යාචාර්ය කේ. ජී. ජයසේකර මහතා සහභාගි වූහ.

10. "මහජන සෞඛ්‍ය සේවාවෙහි විශේෂ ගැටලු" විෂයයෙහි පාඨ සාකච්ඡාවක්, දියුණුව ලබන රටවල් උදෙසා වූ ජර්මන්, ආයතනය විසින් සංවිධානය කරන ලදු වැ 1963 මාර්තු 29 වනදා සිටැ අප්‍රේල් 25 වනදා දක්වා ජර්මන් පෙඩරල් ජන රජයේ සහ (බටහිර) බර්ලිනයේ පවත්වන ලදි. ලංකාව වෙනුවෙන් මේ අය සහභාගි වූහ :—

(1) නායක නියෝජිතයා හැටියට (වෛද්‍ය සේවා) නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍යාචාර්ය වී. ටී. හේරත් ගුණරත්න මහතා, සහ

(2) නියෝජිතයෙකු හැටියට කුරුණෑගල ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෛද්‍යාචාර්ය සී. එච්. මුණසිංහ මහතා.

වෛද්‍යාචාර්ය හේරත් ගුණරත්න මහතා අවර කමිටුවේ මුලසුනට එකච්ඡන්දයෙන් තේරී පත් වී යැ. නොයෙක් වෛද්‍ය කම්පිටිවල විශෙෂඥයින් විසින් කතා කිහිපයක් පවත්වන ලද අතරැ, එකී මාතෘකා විෂයයෙහි ප්‍රාණවත් සාකච්ඡා මෙහෙයවන ලදි. සාකච්ඡා අවසානයේ දී අවර කමිටුවේ මුලසුන් පති හැටියට වෛද්‍යාචාර්ය ගුණරත්න මහතා කණ්ඩායමේ අදහස් විමසා නිර්දේශ පිළිගත්තේ යැ.

XV වැනි පරිච්ඡේදය

සුඛසාධක කටයුතු

දෙපාර්තමේන්තුවට අයත් නා නා ආයතනවල පිහිටුවා ඇති සුඛ සාධක කමිටු හා සංගම් මගින් කාර්යක්ෂම සුඛ සාධක සංවිධාන රැසියක් මෙහෙයවීම හේතුකොට ගෙන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩලයනට ඵලදායි වූත් විනෝදය ලබා දෙන්නාවූත් සුව පහසුකම් රැසක් ලැබිණ. භාණ්ඩාගාරය මගින් සුඛ සාධනය

යටතේ වෙන් කර දෙන ලද මුදල් අලුතින් අරඹන ලද සුඛසාධක ඒකකයන් සමහරකට ගෘහ භාණ්ඩ සපයා සම්පූර්ණ කිරීමටත් එතෙක් පැවති ඒකකයන්ගේ අඩුපාඩු කම් සම්පූර්ණ කිරීමටත් යොදවන ලදි.

විනෝදය හා සුව පහසුකම් සම්බන්ධයෙන් සේවක මණ්ඩලවලට මුහුණ දීමට සිදුවූ ප්‍රශ්නවලින් බොහෝමයක් සුඛසාධක පහසුකම් සපයා දී ඇති ආයතනයන්හි සතුටුදායක අන්දමින් විසඳනු ලැබිය.

ක්‍රීඩා

සේවක සාමාජිකයන් සඳහා සලසා දී ඇති පහසු කම් අතර සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා සමාජය ද වේ. මේ අංශයෙන් ලබා ඇති නවතම දියුණුව නම්, ටැනිස් පිටියට විදුලි ආලෝක ධාරා සැපයීමය. ක්‍රිකට් ක්‍රීඩා පිටිය ද වැඩි දියුණු කළ අතර, ක්‍රීඩා සමාජයේ සෙසු සෑම කටයුත්තක් ම මැනවින් රැකබලාගන්නා ලදි.

ක්‍රීඩා සමාජය මගින් සංවිධානය කරන ලද තරඟ හා සම්භාෂණවලින් සේවක මණ්ඩල අතර පැවතිය යුතු සම්බන්ධතාවය තහවුරු කරන ලද අතර ඒවාට බොහෝ දෙනෙක් පැමිණිය හ.

ඉතිරි කිරීම

දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම් හා සුභසාධක සංගමය තවත් පියවරක් ඉදිරියට තැබිය. මුදල් ආධාර ලැබිය යුතු සාමාජිකයන්ට සහන ලබා දෙන ලදී.

XVI වැනි පරිච්ඡේදය

ගොඩනැගිලි

මෙම දෙපාර්තමේන්තුවේ වෛද්‍යමය ගොඩනැගිලි ඉදි කිරීම සඳහා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු ශීර්ෂ 168 වැය ශීර්ෂ 5 යටතේ රුපියල් 1,19,45,910ක් 1962-63 වර්ෂයේ ඇස්තමේන්තුවලින් වෙන් කරන ලදි. රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් මෙම මුදලින් රුපියල් 52,90,426.82 වැය කර ඇත.

ප්‍රධාන වශයෙන් වෛද්‍යමය ගොඩනැගිලිවලට ජල සම්පාදනයත් නල මගින් කසල බැහැර කිරීම හා උපකරණ සඳහාත් රුපියල් 52,24,832ක් 127 ශීර්ෂය 5 වැය සම්මතය යටතේ වෙන් කර දෙන ලදී. වෛද්‍යමය ගොඩනැගිලිවලට ජල සම්පාදනය හා නල මගින් කසල බැහැර කිරීම සඳහා වෙන් කළ මුදලින් රුපියල් 11,50,000ක මුදලකින් රුපියල් 3,66,103.00ක් ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුවරයා විසින් වැය කරන ලදී. ලුනුවලට අයොඩින් වත් කිරීමේ නියමු යන්ත්‍රයක් සවි කිරීම සඳහා ලුණු කොමසාරිස්වරයා විසින් ඒ සඳහා වෙන්කළ රුපියල් 10,000කින් රුපියල් 2,345.48ක් වැය කරන ලදී.

රජයේ වැඩ අධ්‍යක්ෂවරයා විසින් නිමවන ලද ගොඩනැගිලි හා නිම කිරීමට ඇති ගොඩනැගිලි මහජන සෞඛ්‍ය ඉංජිනේරුවරයා විසින් නිම කිරීමට භාර ගෙන ඇති ජල සම්පාදන හා නල මගින් කසළ බැහැර කිරීමේ ක්‍රමත් I වැනි II වැනි පරිශිෂ්ටවල දක්වා ඇත.

1 පරිශිෂ්ටය

1962/63 වර්ෂයේ දී නිමවන ලද ගොඩනැගිලි ලේඛනය

කොට්ඨාශය	ආතතනය	වැඩය
රත්නපුර, සෞ.සේ.අධි. ...	(i) බලංගොඩ දි.රෝ.	... පාලන ගොඩනැගිල්ල
	(ii) නිවිතිගල මා.නි.	... මාතෘ නිවාසය—ඇඳන් 12
	(iii) රත්නපුර ම.රෝ.	... රෙදි වේලන ගෙය
	(iv) මහවෙලතැන්න ග්‍රා.රෝ.	... ඇපෝතිකරිගේ නිවස ග්‍රාමීය රෝහලක් බවට පත් කිරීම
ගාල්ලේ සෞ.සේ.අධි. ...	නැත.	
බදුල්ලේ සෞ.සේ.අධි. ...	(i) හපුතලේ දි.රෝ.	... නව ළමා වාට්ටුව—ඇඳන් 12
	(ii) නුවරඑළියේ මූ.රෝ.	... වාට්ටුවක්—ඇඳන් 20 (ප්‍රතිසංස්කරණය)
	(iii) රම්බොඩ දි.රෝ.	... නව මාතෘ වාට්ටුව
	(iv) ඌරනීය ම.බෙ.ශා.	... නව මාතෘ නිවාසය—ඇඳන් 12
	(v) ඇතිරියංකුඹුර ම.බෙ.ශා.	... නව බෙ.ශා. හා ඇපොතිකරි නිවාසය
	(vi) වැලිමඩ ග්‍රා.රෝ.	... නව වාට්ටුව—ඇඳන් 24
	(vii) ඇටම්පිටිය මා.නි.	... නව බෙ.ශා. හා ඇපොතිකරි නිවස
යාපනය සෞ.සේ.අධි. ...	(i) යාපනයේ ම.රෝ.	... රසායනාගාරය, මෘතශරීරාගාරය
මාතලේ සෞ.සේ.අධි. ...	(i) ගල්අමුන ම.බෙ.ශා.	... මධ්‍ය බෙහෙත් ශාලාව (ඉ.ස.දෙ. මගින් නිමවන ලදී)
	(ii) ගලේවෙල ප.ඒ.	... වාට්ටුවක්—ඇඳන් 32
	(iii) ඉලුක්කුඹුර මා.නි.	... අළුත් මා.නි.—ඇඳන් 12
	(iv) හිඟුරක්ගොඩ ම.රෝ.	... ගැහැණු හා පිරිමි වාට්ටුව—ඇඳන් 72. මාතෘ වාට්ටුව —ඇඳන් 24. වෙන්කර තැබීමේ වාට්ටුව—ඇඳන් 8 (ඉ.ස.දෙ. විසින් නිමවන ලදී.)
මාතර සෞ.සේ.අධි. ...	නැත.	
අනුරාධපුරය සෞ.සේ.අධි.	නැත.	
ක්ෂ.රෝ.නා.ව්‍යාඅධි. ...	(i) කන්කසන්තුරේ විවේකාගාරය	... අළුත් සැහැල්ලු වාට්ටු 1—ඇඳන් 32
	(ii) රාගම ල.රෝ. ...	... අළුත් මුළුතැන් ගෙයකි
	(iii) වැලිසර ල.රෝ.	... සුළු සේවකයන්ගේ භෝජනාගාරය
වව්නියා සෞ.සේ.අධි. ...	(i) තලේමන්නාරමේ ම.රෝ.	... සුළු සේවකයින් සඳහා කාමර 4 වැසිකිළියක්.
	(ii) මාන්තොට දි.රෝ.	... සුළු සේවකයන්ගේ නිවාස සඳහා ජල මුද්‍රිත වැසිකිළි 4ක්.
	(iii) ආනන්දපුරම් ශා.බෙ.	... ශාඛා බෙහෙත් ශාලාව (ඉ.ස.දෙ. මගින් නිමවන ලදී.)
	(iv) පාවත්කුලම් මා.නි.	... අළුත් මාතෘ නිවාසය (ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් නිමවන ලදී.)
	(v) වව්නියාවේ ම.රෝ.	... පාලන ගොඩනැගිල්ල, ශල්‍යාගාරය හා ඇඳන් 48ක ශල්‍ය වාට්ටුවක්
	(vi) මන්නාරම ම.රෝ.	... ශල්‍යාගාරය හා ඇඳන් 48ක ශල්‍ය වාට්ටුවක්

කොට්ඨාශය	ආයතනය	වැඩය
මහනුවර සෞ.සේ.අධි. ...	(i) පුස්සැල්ලාව ම.රෝ.	... ළමා වාට්ටුව —ඇඳන් 12
	(ii) මහනුවර ම.රෝ.	... තට්ටු 4ක ගොඩනැගිල්ලක්
කොළඹ සෞ.සේ.අධි. ...	(i) බෝකොළගම ම.බෙ.ශා.	... මධ්‍ය බෙහෙත් ශාලාව හා ඇපෝතිකරිගේ නිවාසය
	(ii) මීගමුවේ ර.රෝ.	... අළුත් ශල්‍ය වාට්ටුව—ඇඳන් 32
	(iii) දොම්පේ ර.රෝ.	... පිරිමි වාට්ටුව—ඇඳන් 24
	(iv) දකුණු කොළඹ ර.රෝ.	... අළුත් රසායනාගාරය හා වෛද්‍ය අධිකාරිගේ නිවාසය
	(v) උතුරු කොළඹ ර.රෝ.	... නව ශල්‍යාගාරය
කෑගල්ල සෞ.සේ.අධි. ...	කරවනැල්ල ර.රෝ.	... අළුත් මුළුතැන් ගෙය
අංගොඩ මා. රෝ. ...	මුල්ලේරියාව මා. නී.	... සේවක මණ්ඩලය සඳහා නිවාස 20ක්. පුස්තකාලය
කළුතර සෞ.සේ.අධි. ...	නැත.	
මඩකළපුවේ සෞ.සේ.අධි.	(i) එරාවූර් ග්‍රා.රෝ. ...	... මාතෘ වාට්ටුව—ඇඳන් 12
	(ii) පළුගම ම.බෙ.ශා.	... මුළුතැන් ගෙය හා ඇපෝතිකරි නිවාසය
පුත්තලම සෞ.සේ.අධි. ...	නැත.	
කුරුණෑගල සෞ.සේ.අධි....	(i) කුලියාපිටිය ර.රෝ.	... නව මාතෘ වාට්ටු—ඇඳන් 42
	(ii) කොස්හේන ම.බෙ.ශා.	... මධ්‍ය බෙ.ශා. හා ඇපෝතිකරි නිවාසය
	(iii) කුලියාපිටිය ර.රෝ.	... සහකාර වෛ.නි.ගේ නිවාසය
කොළඹ රෝ.ම. අධිකාරි	(i) අංගොඩ උණ රෝ.	... රසායනාගාරය (ප්‍රතිසංස්කරණය)
	(ii) කාසල් වී.කා.රෝ.	... රසායනාගාරය
	(iii) රෝගපසමන නිවාසය, තලගොල්ල	සැහැල්ලු වාට්ටු 2—ඇඳන් 42

1962/63 වර්ෂයේදී නිමවන ලද ජල සම්පාදන හා කසල බැහැර කිරීමේ වැඩ

කොට්ඨාශය	ආයතනය	වැඩය
බටහිර ...	(i) රාගම ර. රෝ.	... බෙදා හැරීමේ ක්‍රමය
	(ii) කිතුල්ගල ර. රෝ.	... ජල සම්පාදනය
	(iii) තලාහේන මා. නී.	... ජල සම්පාදනය—බෙදාහැරීමේ ක්‍රම සකස් කිරීම හා පොම්ප සවි කිරීම.
	(iv) මහරගම ද. හෙ. අ. වී.	... උරාගැනීමේ ක්‍රමය
	(v) රාගම රෝ.	... ශල්‍යාගාරය හා එක්ස්රේ ගොඩනැගිල්ලේ කසල කාණු ක්‍රමය
	(vi) රත්නපුර රෝ.	... දි. වෛ. නි. සහ ස. දි. වෛ. නි. නිවාස වල කසළ කාණු ක්‍රමය
වයඹ ...	(i) දඹුල්ල රෝ.	... ජල සම්පාදනය
	(ii) කිඹුල්වාන ඔය ඇපෝ. නිවාසය ...	ඇපෝ. නිවාස වැඩි දියුණු කිරීම

කොට්ඨාශය	ආයතනය	වැඩය
මධ්‍ය ...	(i) දිඹුල්ල රෝ.	... ජල සම්පාදනය
	(ii) මල්දෙනිය රෝ.	... ජල සම්පාදනය
	(iii) වැල්ලවාය රෝ.	... ජල සම්පාදනය
	(iv) කොස්ලන්ද රෝ.	... ජල සම්පාදන ''ක්ලෝරිනී'' කෘත කිරීම
	(v) සෞ. සේ. අධි. නිවාස	... බදුල්ල කසළ කාණු ක්‍රමය

දැනට කෙරිගෙන යන ජල සම්පාදන හා කසළ බැහැර කිරීමේ වැඩ

කොට්ඨාශය	ආයතනය	වැඩය
බටහිර ...	(i) ගොඩිගමුව ප. ඒ.	... ජෙනරේටර් ගොඩනැගිල්ල
	(ii) කරවනැල්ල රෝ.	... ජල සම්පාදනය
	(iii) මොරටුව රෝ.	... එම
වයඹ ...	(i) කුරුණෑගල ම. රෝ.	... එම
	(ii) කෝන්ගහවෙල ප. ඒ.	... එම
	(iii) කුරුණෑගල ප්‍රා.ම.සෞ.ඉ. කාර්යාල ගොඩනැගිල්ල ...	... කාර්යාල ගොඩනැගිල්ල
දකුණ ...	(i) බෙලිඅත්ත ම. බෙ.	... ජල සම්පාදනය
	(ii) කඹුරුපිටිය ප. ඒ.	... ජෙනරේටර් ගොඩනැගිල්ල
උතුර ...	(i) යාපනයේ රෝ.	... ජල සම්පාදනය
	(ii) යාපනයේ හෙ. ඇ. වී.	... එම
	(iii) යාපනයේ රෝ.	... කසළ කාණු ක්‍රමය
	(iv) පුන්ගුඩුදිව් ප. ඒ.	... ජල සම්පාදනය
	(v) වාවකච්චේරිය දි. රෝ.	... ජල සම්පාදනය
	(vi) කින්නියාව ප. ඒ.	... එම
මධ්‍යම ...	(i) තෙල්දෙනිය රෝ.	... කසළ කාණු ක්‍රමය
	(ii) මහනුවර රෝ.	... ජල සම්පාදනය දියුණු කිරීම
	(iii) අගරපතන රෝ.	... ජල සම්පාදන ක්‍රමය
	(iv) හපුතලේ රෝ.	... ජල සම්පාදන ක්‍රමය
	(v) මාඩුගොඩ රෝ.	... ජල සම්පාදන ක්‍රමය

1963-64 වර්ෂයේදී නිමකිරීමට බලාපොරොත්තුවන ගොඩනැගිලි උපලේඛනය

කොට්ඨාශය	ආයතනය	වැඩය
රත්නපුර සෞ.සේ.අධි. ...	නැත	
ගාල්ල සෞ. සේ. අධි. ...	(i) අම්බලන්ගොඩ ර. රෝ.	... ක්ෂ. රෝ. වාට්ටුව ඇඳන් 46
	(ii) අක්මීමන මා. නි.	... මා. නි. ඇඳන් 12යි (සීමාසහිත මැලිබන් බිස්කට් නිෂ්පාදකයන් විසින් පරිත්‍යාග කරන ලදී).
	(iii) ඇල්පිටිය ර. රෝ.	... ගිලන්රථ ගරාජය
	(iv) අම්පෙගම ශා. බෙ.	... ශාඛා බෙහෙත් ශාලාව, (අම්පෙගම ග්‍රමදාන මණ්ඩලයේ පරිත්‍යාගයකි).

කොට්ඨාශය	ආයතනය	වැඩය
පුත්තලම සෞ. සේ. අධි. ...	(i) පුත්තලම ර.රෝ. ...	මුළුතැන්ගෙය හා මෘත ශරීරගාරය
යාපනය සෞ. සේ. අධි. ...	(i) යාපනයේ ම.රෝ. ...	හෙදි අභ්‍යාස විද්‍යාලය
	(ii) යාපනයේ ම. රෝ. ...	ජල කුළුණ
බදුල්ල සෞ. සේ. අධි. ...	(i) මොනරාගල දී. රෝ. ...	නව පාලන ගොඩනැගිල්ල
	(ii) මැදගම දී. රෝ. ...	නව විදුලි බල මධ්‍යස්ථානය
මාතලේ සෞ. සේ. අධි. ...	(i) ලැලිඅඹේ ම. බෙ. ශා. ...	මධ්‍ය බෙහෙත් ශාලාව හා ඇපෝ නිවාසය.
	(ii) දේවහුව ම. බෙ. ශා. ...	මා. නි. ඇඳන් 12යි. (ඉ.ස.දෙ. නිමවින)
මාතර සෞ. සේ. අධි. ...	(i) වීරකැටිය මා. නි. ...	මා. වාට්ටුව ඇඳන් 12 යි. හා වින්නඹු වන්ගේ නිවාසය
	(ii) කිරින්ද මා. නි. ...	මා. නිවාසය ඇඳන් 12යි.
	(iii) අකුරැස්ස ප. ඒ. ...	ළමා වාට්ටුව ඇඳන් 12 යි. (හේනේගම බලපාත ග්‍රා. ස. සමිතියේ පරිත්‍යාගයකි)
අනුරාධපුර සෞ. සේ. අධි. ...	(i) යකල්ල ම. බෙ. හා මා. නි.	ම. බෙ. හා මා. නි. 63/64 දී ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් නිමවේ.
ක්ෂ. රෝ. නා. ව්‍යා. අධි. ...	නැත	
වව්නියාව සෞ. සේ. අධි. ...	(i) දෙවුපුරම් ශා. බෙ. ...	ශාඛා බෙහෙත් ශාලාව, ඉ. ස. දෙපාර්ත මේන්තු මගින් නිම කිරීමට ඇත.
	(ii) මුලතිව් ර. රෝ. ...	අළුත් මුළුතැන් ගෙය
	(iii) තලේමන්නාරම ර. රෝ. ...	සුළු සේවකයන්ගේ මුළුතැන් ගෙය
මහනුවර සෞ. සේ. අධි. ...	නැත	
කොළඹ සෞ. සේ. අධි. ...	(i) දිවුලපිටිය ර. රෝ. ...	හෙදි අභ්‍යාස විද්‍යාලය
	(ii) ගම්පහ ර. රෝ. ...	නව ළමා වාට්ටුව ඇඳන් 24යි
	(iii) දකුණු කොළඹ රෝ. ...	ගබඩාව
කුරුණෑගල සෞ. සේ. අධි. ...	(i) කුරුණෑගල ම. රෝ. ...	නව ශල්‍යාගාරය
	(ii) කුලියාපිටිය ර. රෝ. ...	නව මුළුතැන් ගෙය
	(iii) වාරියපොල ර. රෝ. ...	එම
	(iv) වැල්ලව ශා. බෙ. ...	ම. බෙ. හා ඇපෝ. නිවාසය
	(v) නාරාංගොඩ ම. බෙ. ...	ම. බෙ. ශා. (පරිත්‍යාගයකි)
	(vi) බෝපිටිය ම. බෙ. ශාලාව...	ම. බෙ. ශා. (පරිත්‍යාගයකි)

කොට්ඨාශය		ආයතනය		වැඩය
කෑගල්ල සෞ. සේ. අධි.	...	(i) රහල ම. බෙ. ශාලාව	...	ම. බෙ. ශා. හා ඇපෝ. නිවාසය
		(ii) කෑගල්ල නව රෝහල	...	පාලන ගොඩනැගිල්ල
අංගොඩ මා. රෝ.	...	(i) පැලවත්ත මා. රෝ.	...	වාට්ටු 2ක් ඇඳන් 100යි
කළුතර සෞ. සේ. අධි.	...	(i) මතුගම ග්‍රා. රෝ.	...	මා. වාට්ටුව ඇඳන් 12යි
මඩකළපුව සෞ. සේ. අධි.	...	(i) මඩකළපුව ර. රෝ.	...	හෙදි නිවාසය
		(ii) අම්පාරේ දි. රෝ.	...	ශල්‍ය වාට්ටුව ඇඳන් 46යි
		(iii) ඉඟිනියාගල දි. රෝ.	...	සුළු සේවක නිවාස 2ක්
		(iv) ඉඟිනියාගල දි. රෝ.	...	සම්බන්ධිත මාර්ග
		(v) කොක්කඩෙයිවෝලෙයි ම. බෙ. ශාලාව	...	ම. බෙ. හා ඇපෝ. නිවාසය
කොළඹ රෝ. ම. අධි.	...	(i) මහරගම පිළිකා ආයතනය		විදුලි සෝපාන සවි කිරීම
		(ii) කාසල් වී. කා. රෝ.	...	වෛද්‍ය නිලධාරීන්ගේ නිවාස
		(iii) රිජ්වේ ළමා රෝහල	...	හෙදියන්ගේ නව නිවාස හා නව ශල්‍යාගාරය.

XVII වැනි පරිවෙජදය

මුදල්

1961-62 වර්ෂයේදී වැය ශීර්ෂය යටතේ රුපියල් දස ලක්ෂ 142.9ක මුදලක් දෙපාර්ශ්වයේ මෙන්තුව මගින් වැය කරන ලදී. 1960-61 වර්ෂයේ දී ද වැය වූයේ රුපියල් දසලක්ෂ 142.9කි. දෙවසර තුළ සමහර අංකයන් යටතෙහි වැයවූ ප්‍රමාණයන්හි වෙනස පහත දැක්වේ.

		වැඩිවීම රුපියල් (දසලක්ෂ)		අඩුවීම රුපියල් (දසලක්ෂ)
පෞද්ගලික දීමනා ...	... ...	3·3	...	—
විදුලිය බලය ...	... ...	·3	...	—
යුනිපෝම් හිලව්වට යුනිපෝම් සහ දීමනා	...	·07	...	—
ආහාර ...	... ...	·4	...	—
ප්‍රවාහන ...	... ...	·1	...	—
බෙහෙත් ද්‍රව්‍ය වර්ග ...	... ...	—	...	·9
වෙනත් භාණ්ඩ සහ සැපයීම්	... ...	—	...	·4
ක්‍රියාකරවීමේ වියදම්	... ...	—	...	·3
ප්‍රධාන වියතියදම් . .	... ...	·5	...	—
		4·67		1·6

2. (අ) එක් එක් ශීර්ෂයන්, සේවාවන් හා ප්‍රධාන වියදම් යටතේ වැය කරන ලද වියදම් පහත දැක්වේ :—

	1961/62 නියම වියදම	1962/63 නියම වියදම
වැය ශීර්ෂ 1 සහ 4		
ඒකාබද්ධ සේවාවන්	34,43,161 ...	47,86,758
වෛද්‍ය සේවාවන්	10,86,46,084 ...	10,90,04,489
මහජන සෞඛ්‍ය සේවාවන්	2,40,12,086 ...	2,56,29,699
රසායනාගාර සේවාවන්	34,64,650 ...	34,79,143
වැය ශීර්ෂ 4		
අඩු කිරීම	16,64,533 ...	18,28,498
වැය ශීර්ෂ 2—		
සම්මාදම් මුදල්	1,17,965 ...	2,15,552
වැය ශීර්ෂ 5—		
ප්‍රධාන වියදම්	14,83,927 ...	20,10,338
	14,28,32,406	14,69,54,477

නව ගොඩනැගිලි, අළුතින් කොටස් යා කිරීම් හා ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම් සහ ඒවා නඩත්තු කිරීම් සම්බන්ධව වැය වූ ප්‍රමාණය පහත පළවේ :—

	1961/62 වර්ෂය තුළ දී වැය රු.	1962/63 වර්ෂය තුළ දී වැය රු.
ශීර්ෂය 127		
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—වැය ශීර්ෂ 5 ප්‍රධාන වියදම	59,18,763 ...	20,56,064
ශීර්ෂය 168		
රජයේ වැඩ දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 3 පාලන කටයුතු ප්‍රධාන වියදම් උප ශීර්ෂ 8, ගොඩනැගිලිවලට අළුතින් කොටස් යා කිරීම සහ අළුත් වැඩියා කිරීම් අංක 2 වෛද්‍ය ගොඩනැගිලි	2,30,022 ...	1,56,151
ශීර්ෂය 168		
රජයේ වැඩ දෙපාර්තමේන්තුව ශීර්ෂය 2, පාලන වියදම්, උප ශීර්ෂ 14 ගොඩනැගිලි නඩත්තුව අංක 3 වෛද්‍ය ගොඩනැගිලි නඩත්තුව	7,61,593 ...	8,79,564
එකතුව ...	69,10,378	30,91,779

(ආ) **විදේශීය ආධාර.**—විදේශීය රාජ්‍යයන් ගෙන් ලැබුණු ආධාර මුදල් සහ 1962 සැප්තැම්බර් අග දක්වා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් එම මුදලින් කළ වියදම පිළිබඳ විස්තර දැක්වෙන ලැයිස්තුවකි පහත පළ වන්නේ.

1963.9.30 ලැබුණු මුළු ආධාර රු.		ආධාර දුන් අය	1963.9.30 තෙක් කළ වියදම් රු.
79,34,690	1.	මැලේරියා සමූල නාශක ව්‍යාපාරය සඳහා "එක්සත් ජනපද ආධාර" යන අංක 83.51.015 දරණ 1957.8.5 දින කරන ලද ලියවිල්ලේ පරිදි ජාත්‍යන්තර සුහදතා සහ පාලන යටතේ අමෙරිකා එක්සත් ජනපදයෙන් ...	44,39,608
20,40,000	2.	"කොබෝල්ට්" ප්‍රතිකාර යන්ත්‍රයක් මිලයට ගැනීම සඳහා කොළඹ ක්‍රමය යටතේ කැනඩා රජයෙන් ආධාර	

(ආ) **විදේශීය ආධාර.**—විදේශීය රාජ්‍යයන්ගෙන් ලැබුණු ආධාර මුදල් සහ 1962 සැප්තැම්බර් අග දක්වා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් එම මුදලින් කළ වියදම පිළිබඳ විස්තර දැක්වෙන ලැයිස්තුවකි පහත පළ වන්නේ.

1963.9.30 ලැබුනු මුළු ආධාර රු.		ආධාර දුන් අය	1963.9.30 තෙක් කළ වියදම් රු.
79,34,690	1.	ළය චිකිත්සාගාර සඳහා කොළඹ ක්‍රමය යටතේ ඕස්ට්‍රේලියා රජයෙන් ලත් ආධාර	44,39,608
20,40,000	2.	සනීපාරක්ෂක ආයතනය සඳහා කොළඹ ක්‍රමය යටතේ ඕස්ට්‍රේලියා රජයෙන් ලද ආධාර	5,40,869
13,49,021	3.	ක්ෂය රෝග නාශක ඖෂධ මිළදී ගැනීම සඳහා කොළඹ ක්‍රමය යටතේ ඕස්ට්‍රේලියා රජයෙන් ලත් ආධාර	—
7,11,499	4.	මහරගම දත් හෙදි ඇබැසි විදුහල හා නේවාසිකාගාරය සඳහා නවසීලන්ත රජයෙන් ලත් ආධාර	5,97,595
39,578	5.	ජංගම බෙහෙත් රථ ගැනීම සඳහා නවසීලන්ත රජයෙන් කොළඹ ක්‍රමය යටතේ ලත් ආධාර	39,578
1,85,080	6.	මෝටර් ගිලන් රථ ලාන්චියක් මිලදී ගැනීම සඳහා කොළඹ ක්‍රමය යටතේ නවසීලන්ත රජයෙන් ලත් ආධාර	1,85,080
2,41,522	7.	කෝබෝල්ට් චිකිත්සා යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා කොළඹ ක්‍රමය යටතේ කැනඩා රජයෙන් ලත් ආධාර	2,19,328
11,90,500	8.	මැලේරියා සමූල නාශක සඳහා "එක්සත් ජනපද ආධාර" යන අංක 85-51-015 දරන ලියවිල්ල පරිදි ජාත්‍යන්තර සුහදතා සහ පාලන යටතේ අමෙරිකා එක්සත් ජනපදයෙන් දුන් ආධාර ...	11,90,392
7,00,000	9.	ඇමෙරිකා එක්සත් ජනපද ජාත්‍යන්තර සම්බන්ධතා පාලන (අයි. සී. ඒ.) පී. ඇල්. 480 (විෂය 1) දරන මැලේරියා සමූල නාශක ව්‍යාපාරය සඳහා ආධාර	3,98,246
5,22,500	10.	ඇමෙරිකා එක්සත් ජනපද ජාත්‍යන්තර සම්බන්ධතා පාලනය (අයි.සී.ඒ.) පී. ඇල්. 480 (විෂය 1) යටතේ පාරිසරික සෞඛ්‍ය සඳහා ආධාර ...	52,347
47,380	11.	ඇමෙරිකා එක්සත් ජනපද රාජ්‍යයේ ජාත්‍යන්තර සම්බන්ධතා පාලනය (අයි.සී.ඒ.) පී. ඇල්. 480 (විෂය 1) යටතේ මහජන සෞඛ්‍ය අධ්‍යාපනය සඳහා ලත් ආධාර	29,630
95,240	12.	මැලේරියා සමූලනාශනය සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලත් ආධාර	95,241
1,50,570,010			77,87,941

(ඇ) 1961-62 වර්ෂය තුළදී සෞඛ්‍ය සේවා අංක VII දරණ අය ශීර්ෂය යටතේ දෙපාර්තමේන්තුවට ලැබුණු ආදායම 1961/62 සහ 1962/63 වර්ෂ තුළ ආදායම් රුපියල්

1961/62		*1962/63*
12,33,336	... රෝහල් සහ බෙහෙත් ශාලාවලින් ලැබුණු ආදායම	13,15,317
17,154	... බෙහෙත් ද්‍රව්‍ය වෙළඳාමෙන්	6,640
12,210	... අඩිං වෙළඳාමෙන්	14,583
148	... වෛද්‍ය අවශ්‍යතා ආඥාපණත යටතේ බෙහෙත් ද්‍රව්‍ය වෙළඳාමෙන් ...	34
2,99,251	... වෛද්‍ය අවශ්‍යතා ආඥාපණත යටතේ සංක්‍රමික කම්කරුවන් සඳහා අයවිය යුතු රෝහල් හා ඔවුන් බැලීමට යාමේ ගාස්තු	270,047
44,205	... ශාක විද්‍යා සම්බන්ධයෙන් අයකළ ගාස්තු	36,046
8,47,268	... නිරෝධායන දෙපාර්තමේන්තුවට ලැබුණු ආදායම	2,73,493
33,965	... ඇපෝතිකරිවරුන් ගේ හා වින්නඹු මාතාවන්ගේ ගාස්තු මුදල ...	23,821
2,289	... සාත්තු නිවාස ලියා පදිංචි කිරීමේ ගාස්තු මුදල	2,700
1,41,033	... වෙනත් ආදායම්	247,754
26,30,859		20,90,435

I වැනි සටහන—1946–1962 පිළිබඳ උපත් සහ මරණ

TABLE I—BIRTHS & DEATHS—1946–1962

වර්ෂය *Year*	වර්ෂය මැද ජනගහනය *Mid year Population*	ලියා පදිංචි කළ උපත් සංඛ්‍යාව *No. of births registered*	ජනගහන යෙන් 1000ට උපත් ගණන *Birth rate per 1,000 population*	ලියා පදිංචි කළ මරණ සංඛ්‍යාව *Deaths registered*	ජනගහන යෙන් 1000ට වූ මරණ සංඛ්‍යාව *Deaths rate per 1,000 population*	සජීව ළදරු 1000ට වූ මරණ සංඛ්‍යාව *Infant mortality rate per 1,000 live births*	සජීව උපත් 1000ටවූ මව් මරණ සංඛ්‍යාව *Maternal mortality rate per 1,000 live births*
1946—50*	7,253,600	282,320	38.9	103,044	14.3	101	9.3
1951—55*	8,296,600	315,569	38.1	93,107	11.2	75	5.0
1956	8,929,000	325,967	36.4	87,561	9.8	67	3.8
1957	9,165,000	334,135	36.5	92,759	10.1	68	3.7
1958	9,388,000	335,690	35.8	90,815	9.7	64	3.9
1959	9,625,000	356,336	37.0	89,971	9.1	58	3.4
1960	9,896,000	361,702	36.6.	84,918	8.6	57	3.0
1961	10,168,000	363,677	35.8	81,653	8.0	52	2.6
1962	10,443,000	370,947	35.3	88,935	8.5	53	...

* පස් වර්ෂයක් පාසා වූ සාමාන්‍ය ගණන.

** ලැබී නැත

* Five-years averages

** Not available

ප්‍රස්තාර අංක 1

GRAPHS No 1

ජනගහනයෙන් 1000 කට උපත් හා මරණ

BIRTHS AND DEATHS PER 1000 POPULATION



ප්‍රස්තාර අංක II GRAPH No II

සජීව උපත් 1000 කට බිළිඳු හා මව් මරණ

INFANT AND MATERNAL DEATHS PER 1000 LIVE BIRTHS

බිළිඳු මරණ අනුපාතය •———• INFANT DEATH RATES

මව් මරණ අනුපාතය •- - - - - - - - • MATERNAL DEATH RATES



II වැනි සටහන—ලංකාවේ සහ රටවල් සමහරක බිලිඳු මරණ සංඛ්‍යාව

TABLE II—INFANT MORTALITY RATES IN CEYLON AND CERTAIN OTHER COUNTRIES

	1945-1949	*1950-1954*	*1955*	*1956*	*1957*	*1958*	*1959*	*1960*	*1961*	*1962*
ලංකාව/Ceylon	111	77	72	67	68	64	58	57	52	53
එංගලන්තය සහ වේල්සය England and Wales	39	28	25	24	23	3	22	22	21*	21*
ස්කොට්ලන්තය Scotland	51	35	30	29	29	28	28	26	26	27
ඕස්ට්‍රේලියාව/Australia	28	24	22	22	21	20	22	20	20	..
කැනඩාව/Canada	47	37	31	32	31	30	28	27	27	..
නවසීලන්තය/New Zealand	31	27	24	23	24	23	24	23	23	20*
ප්‍රන්සය/France	72	46	39	36	34	32	30	27	26	26*
ජර්මන් සමූහාණ්ඩුව/The Federal Republic of Germany	75	49	42	39	36	36	34	34	32	29*
ඉතාලිය/Italy	79	61	51	49	50	48	45	44	40*	40*
නෙදර්ලන්තය/Netherlands	40	23	20	19	17	17	17	16	15	15*
ස්වීඩනය/Sweden	26	20	17	17	18	16	17	17	16*	15*
එක්සත් ජනපද රාජ්‍යය/U. S. A.	33	28	26	26	26	27	26	26	25	25*

*ප්‍රාදේශීය සංඛ්‍යා. Provisional figures.

*ලැබී නැත Not available

III වැනි සටහන—ප්‍රමාණානුකූල මරණ සංඛ්‍යා දර්ශනය (අවුරුදු 50 සහ ඊට වැඩි වයස්වූවන්ගේ සියයට මරණ ගණන සම්පූර්ණ මරණ සංඛ්‍යාව හා සැසඳීම)

TABLE III—PROPORTIONAL MORTALITY INDICATOR (PERCENTAGE OF DEATHS AT AGES 50 AND OVER TO TOTAL DEATHS)

වර්ෂය Year	සම්පූර්ණ මරණ ගණන Total Deaths	අවුරුදු 50 හෝ ඊට වැඩි වූ අයගේ මරණ සංඛ්‍යාව No. of Deaths 50 Years of age and over	ප්‍රමාණානුකූල කරන සංඛ්‍යා දර්ශනය Proportional Mortality indicator
1950	95,142	28,546	30.0
1951	1,00,072	29,736	29.7
1952	95,298	29,600	31.1
1953	89,003	29,403	33.0
1954	86,794	29,101	33.5
1955	94,368	33,374	35.4
1956	87,561	32,229	36.8
1957	92,759	34,587	37.3
1958	90,815	34,112	37.6
1959	87,971	35,909	40.8
1960	84,918	34,189	40.3
1961	81,653	34,672	42.5
1962	88,935	..	..

** ලැබී නැත Not available.

IV වැනි සටහන—රජයේ ආයතන ඇතුළත ප්‍රතිකාර ලැබූ රෝගීන් වර්ෂය අනුව

TABLE IV—IN-PATIENTS TREATED IN GOVERNMENT INSTITUTIONS BY YEARS

වර්ෂය *Year*	රෝහල් තුළ සිටි රෝගීන්ගේ මුළු ගණන *Total No. of In-Patients*	සියයට ගණන, වාර්ෂික වැඩිවීම *Percentage annual increase*
1952	8,42,527	–0.75*
1953	9,04,956	7.41
1954	9,13,034	9.89
1955	10,42,581	14.19
1956	11,44,710	9.80
1957	13,52,720	18.17
1958	12,77,706	–5.55*
1959	13,54,549	6.01
1960	13,91,867	2.76
1961	14,29,304	2.69
1961–62	16,09,218	—
1962–63	16,67,414	3.62

*Percentage decrease.

V වැනි සටහන—වර්ෂය මැද ජනගහනය සහ ප්‍රතිකාර කළ රෝගීන් වර්ෂය අනුව

TABLE V—MID-YEAR POPULATION AND PATIENTS TREATED BY YEARS

වර්ෂය *Year*	වර්ෂය මැද ඇස්තමේන්තු කරණ ලද ජනගහනය *Estimated Mid-Year population*	අභ්‍යන්තර *In-patients*	බාහිර රෝගීන් (පළමු පැමිණීම) *Out-patient Visits (First)*	අභ්‍යන්තර සහ බාහිර රෝගීන්ගේ මුලු ගණන *Total In-patients and Out-patients*	රෝගීන්ගේ මුලු ගණන සියයට *% of Total (Patients visits population)*
1952	8,074,000	842,527	13,288,754	14,131,281	175.02
1953	8,290,000	904,956	13,946,794	14,851,750	179.15
1954	8,520,000	913,034	15,416,023	16,329,057	191.66
1955	8,723,000	1,042,581	17,631,826	18,674,407	214.08
1956	8,929,000	1,144,710	20,633,779	21,778,489	243.91
1957	9,165,000	1,352,720	21,245,125	22,597,845	246.57
1958	9,388,000	1,277,706	21,444,851	22,722,557	242.04
1959	9,625,000	1,354,549	25,109,533	26,464,082	274.95
1960	9,896,000	1,391,867	23,217,623	24,609,490	248.68
1961	10,168,000	1,429,304	24,484,925	25,914,229	254.87
1961–1962	10,443,000*	1,609,218	26,249,901	27,859,119	266.77
1962–63	1,645,000†	1,667,414	—	—	—

ප්‍රතිකාර ලැබූ රෝගීන්ගේ ගණන මේ සංඛ්‍යාවන්ගෙන් නොකියවේ. ප්‍රථමවරට පසු පැමිණි රෝගීන් ද අලුත් රෝගීන් සේ සලකා ඇත.

These figures do not indicate the number of patients treated. Repeated visits of the same patient after short intervals have been regarded as new cases.

* 1962 වර්ෂය මැද අනුව
As at Mid- year 1962

† 1963 ජූලි 8 අනුව (සංඛ්‍යා ලෙඛන)
As at 8th July 1963 (Census figures.)

VI වැනි සටහන—ආයතන සහ පළාත් අනුව අභ්‍යන්තර රෝගීන්ගේ සංඛ්‍යාවන්

TABLE VI—IN-PATIENTS STATISTICS OF ALL INSTITUTIONS BY TYPE AND AREA

සෞ. සේවා අධි. කොට්ඨාශය S. H. S. Area	සාමාන්‍ය GENERAL								විශෙෂ SPECIAL							
	ප්‍රදේශීය මූලික දිස්ත්‍රික්ක සහ ගත්තිය රෝහල් Provincial, Base, District and Cottage Hospitals		සම්පූර්ණ පරයන්ත ආයතන Complete Peripheral Units		ග්‍රාමීය රෝහල් Rural Hospitals		මාතෘ රෝහල් Maternity Hospitals		ලය රෝහල් සහ විවේකාගාර Chest Hospital and Sanatoria*		මානසික රෝහල් Mental Hospitals*		ලාදුරු රෝහල් Leprosy Hospitals*	
	ප්‍රතිකාර කළ සංඛ්‍යාව No. treated	මරණ Deaths	ප්‍රතිකාර කළ සංඛ්‍යාව No. treated	මරණ Deaths	ප්‍රතිකාර කළ සංඛ්‍යාව No. treated	මරණ Deaths	ප්‍රතිකාර කළ සංඛ්‍යාව No. treated	මරණ Deaths	ප්‍රතිකාර කළ සංඛ්‍යාව No. treated	මරණ Deaths	ප්‍රතිකාර කළ සංඛ්‍යාව No. treated	මරණ Deaths	ප්‍රතිකාර කළ සංඛ්‍යාව No. treated	මරණ Deaths
අනුරාධපුරය Anuradhapura	42,987	614	8,323	36	11,511	27	—	—	—	—	—	—	—	—
බදුල්ල Badulla	109,113	1,880	24,268	147	9,667	60	—	—	—	—	—	—	—	—
මඩකලපුව Batticaloa	39,621	505	9,396	45	2,083	10	—	—	—	—	—	—	192	2
කොළඹ Colombo†	140,185	1,305	9,705	32	2,869	17	—	—	5,518	222	8,632	225	1,048	41
ගාල්ල Galle	68,940	1,446	16,158	92	4,180	10	—	—	—	—	—	—	29	—
යාපනය Jaffna	54,843	759	9,184	48	4,043	10	—	—	296	7	—	—	—	—
